# වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2019

## ශ්‍රී ලංකා රේගුව

**සැකසුම: ප්‍රතිපත්ති, සැලසුම් සහ  පර්යේෂණ අංශය**



## රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

2019 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රේගුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරනු ලබන්නේ ඉමහත් සතුටිනි. සමාලෝචිත වර්ෂය තුළ පැන නැගුණු විවිධ අභියෝග මධ්‍යයේ වුව, ශ්‍රී ලංකා රේගුව සිය අරමුණු සාක්ෂාත් කර ගැනීමට මෙවර ද සමත්ව ඇත.

විවිධවූ සමාජ ආර්ථික සාධක හේතුවෙන් වර්ෂය තුළ ජාත්‍යන්තර වෙළඳාම පහත වැටී තිබියදී පවා රු. බිලියන 813.10 ක රාජ්‍ය බදු ආදායමක් අත්කර දීමට ශ්‍රී ලංකා රේගුවට හැකි වීම, ලබා ඇති එකී ප්‍රධාන ජයග්‍රහණයන්ගෙන් එකකි.

මෙම ප්‍රයත්නයේ තවත් ප්‍රධාන සාධන ඵලයක් නම්, නීත්‍යානුකූල ජාත්‍යන්තර වෙළඳාමට පහසුකම් සැලසීම යන අරමුණ ප්‍රකාරව ආනයන හා අපනයන භාණ්ඩ නිෂ්කාශන කාලය අවම කිරීම සම්බන්ධව ලබා ගත් ප්‍රගතියයි. කාලය යනු, නිත්‍ය වශයෙන්ම පිරිවැය හා සබඳතා දක්වන්නක් හෙයින්, කාලයෙහි සිදුකරන ඕනෑම ප්‍රමාණාත්මක අඩු කිරීමක් ආර්ථික සුසාධ්‍යකරණය කෙරෙහි අනුපූරක වශයෙන් දායකත්වයක් ලබා දේ. ලෝක රේගු සංවිධාන (WCO) නිර්දේශ අනුව 2018 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ (ශ්‍රී ලංකා දේශසීමා සන්දර්භය තුළ ප්‍රධාන පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන්) සිදුකරනු ලදුව 2019 දී ප්‍රකාශයට පත් වූ, නිෂ්කාශන කාල නිර්ණ අධ්‍යයනය (TRS) මේ සම්බන්ධයෙන් පුළුල් පරාසයක අවබෝධයක් ඇතිකරන ලදී. ශ්‍රී ලංකා රේගුව විසින් 2018 වර්ෂයේදී කරන ලද නිෂ්කාශන කාල නිර්ණ අධ්‍යයන සමීක්ෂණයට අනුව, ආනයනික භාණ්ඩ තොග සම්බන්ධයෙන් බහාලුම් භාරය නිෂ්කාශනය කිරීමට ගතවන සාමාන්‍ය කාලයෙහි සැලකිය යුතු අඩු වීමක් වාර්තා විය. රේගු ක්‍රියාවලීන් ස්වයංක්‍රීයකරණය තුළින් අත් කරගත් ප්‍රගතිය මෙකී ජයග්‍රහණවල අනිවාර්ය අංගයක් වන බව කිව මනාය.

ඉහත කරුණු වලට සමගාමීව, ජාතික හා ජාත්‍යන්තර බැඳීම් අවශ්‍යතා අනුව යමින් වර්ෂය තුළ සමාජ ආරක්ෂණය සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග වඩාත් ඵලදායී රේගු පාලනයක් සඳහා දායක වී තිබේ.

ඵලදායී රේගු පාලනය සඳහා ලෝක රේගු සංවිධානය (WCO) සහ වෙළඳ පහසුකම් සැපයීමේ ගිවිසුම (WTO -TFA) විසින් නිර්දේශ කරන ලද ජාත්‍යන්තර වශයෙන් විශිෂ්ට බවට සම්මත කර ඇති පරිචයන් (හොඳම භාවිතයන්) සහ ඵලදායී පාලන මූලාරම්භයන් යොදා ගැනීමත් සමග, නීතිය බලාත්මක කිරීම සහ වෙළඳ කටයුතු සඳහා පහසුකම් සැලසීම යන විෂය ද්විත්වයම කැපී පෙනෙන අයුරින් උසස් මට්ටමක පැවතුණි. අසිකුඩා මෘදුකාංග පද්ධතියෙහි (“ASYCUDA - WORLD” ) නව යාවත්කාලීනය යටතේ රේගු ක්‍රියාවලීන් ස්වයංක්‍රීයකරණය සහ “ අවදානම් පදනම් කරගත් නවීනතම පරීක්ෂණ ක්‍රමවේදයන් යොදාගැනීම” යන ද්විත්ව නිර්ණායකයන් මෙකී මූලික පියවර මගින් ආවරණය වේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස, පුරෝකථනය කිරීමේ හැකියාව සහ විනිවිදභාවය වැඩි කිරීමේ විවිධ ඉලක්ක සපුරා ගැනීමට ශ්‍රී ලංකා රේගුව සමත්ව ඇත. එමෙන්ම, නිසි අනුකූලතාවය සඳහා පෙළඹවීමක් මෙන්ම වෙළෙඳ ප්‍රජාව තුළ අනුකූලතා අනුපාතයන්හි ඉහළ යාමක් ද සිදුව ඇති බව නිරීක්ෂණය වේ. මෙම සාර්ථකත්වයෙහි මූලික පදනම සැලසීමේ කර්තව්‍යය ඉටුව ඇත්තේ රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය මගින් සැලකිය යුතු දායකත්වයක් ලබා දීම තුළිනි.

ගරු අග්‍රාමාත්‍ය සහ මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා, භාණ්ඩාගාරයේ ලේකම් තුමා ඇතුළු භාණ්ඩාගාරයේ සියලුම නිලධාරීන් හා විවිධ වාණිජ මණ්ඩල සහ වෙළඳ ප්‍රජාව වෙත අපගේ ප්‍රයත්නය සාර්ථක කර ගැනීම සඳහා නොමසුරුව ලබාදුන් සහයෝගය වෙනුවෙන් මගේ කෘතඥතාවය මෙයින් පිරිනමමි.

මෙම වසංගත වාතාවරණය සමඟ සාර්ථකව කටයුතු කරන අතරම, මෙම ජයග්‍රහණය සඳහා ඉමහත් දායකත්වයක් ලබා දුන් මගේ කාර්ය මණ්ඩලයට සහ මෙවැනි අති දුෂ්කර තත්ත්වයක් මධ්‍යයේ වුව ද මෙම වාර්තාව සම්පාදනය කිරීම පිළිබඳව ද මාගේ ප්‍රසාදය හෘදයාංගමව පළකර සිටිමි.

**විශ්‍රාමික මේජර් ජනරාල් ජී.වී. රවිප්‍රිය**
රේගු අධ්‍යක්ෂ ජනරාල්

# අන්තර්ගතය


**පළවන පරිච්ඡේදය - ආයතනික පැතිකඩ .......... 1**

**1.1** හැඳින්වීම .......... 1

**1.2** ආයතනයේ දැක්ම, මෙහෙවර සහ අරමුණු .......... 1

**1.3** ප්‍රධාන කාර්යයන් .......... 2

**1.4** සංවිධාන සටහන .......... 3

**1.5** ශ්‍රී ලංකා රේගුවේ ප්‍රධාන අංශ .......... 4

**1.6** ප්‍රමුඛ නිලධාරී මණ්ඩලය .......... 5

**දෙවන පරිච්ඡේදය - 2019 වර්ෂය තුළ ලබාගත් ප්‍රගතිය .......... 7**

**2.1** මූල්‍ය කාර්ය සාධනය .......... 7

**2.2** ඉහළ බදු ආදායම් උපදවන භාණ්ඩ වර්ග පනහ (HS කේතය අනුව) .......... 9

**2.3** විශේෂ ජයග්‍රහණ .......... 10

**2.3.1** ලෝක රේගු සංවිධානය විසින් නිර්දේශිත නිෂ්කාශන කාල නිර්ණ අධ්‍යනය (TRS) .......... 10

**2.3.2** 2019 වර්ෂය තුළ වෙළඳාම සඳහා පහසුකම් සැපයීම යටතේ ශ්‍රී ලංකා රේගුව විසින් ගත් ප්‍රාරම්බක ක්‍රියාමාර්ග .......... 12

**තුන්වන පරිච්ඡේදය- සමස්ත මූල්‍ය කාර්ය සාධනය .......... 13**

**3.1** මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය .......... 13

**3.2** මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය .......... 14

**3.3** මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය .......... 15

**3.4** ආදායම් එකතු කිරීම පිළිබඳ කාර්ය සාධනය .......... 16

**3.5** වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය .......... 16

**3.6** මු.රෙ. 208 ප්‍රකාරව වියදම් සඳහා මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන .......... 17

**3.7** මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය .......... 17

**3.8** විගණකාධිපති වාර්තාව .......... 17

**4.1** ආයතනයේ කාර්ය සාධන දර්ශක .......... 18

**පස්වන පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය .......... 19**

**5.1** හඳුනාගන්නා ලද අදාල තිරසාර සංවර්ධන අරමුණු .......... 19

**හයවන පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ .......... 20**

**6.1** සේවක සංඛ්‍යා කළමනාකරණය .......... 20

**6.2** මානව සම්පත් සංවර්ධනය .......... 20

**හත්වන පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව .......... 29**

**අටවන පරිච්ඡේදය - එක් එක් අංශවල කාර්ය සාධනය .......... 33**

**8.1** නීති බලාත්මක කිරීමේ පර්ෂදය .......... 33

**8.1.1** නිවාරණ අංශය .......... 33

**8.1.2** සමාජ ආරක්ෂණ අංශය .......... 35

**8.1.3** මධ්‍යම විමර්ශන අංශය .......... 46

**8.1.4** නීති කටයුතු අංශය .......... 48

**8.1.5** මධ්‍යම බුද්ධි අංශය ........ 49

**8.2** ආදායම් හා සේවා පර්ෂදය ........ 54

**8.2.1** ප්‍රකාශන අංශය ........ 54

**8.2.2** කර්මාන්ත හා සේවා අංශය ........ 56

**8.2.3** මධ්‍යම භාණ්ඩ පරීක්ෂණ අංශය ........ 59

**8.2.4** මගී සේවා අංශය ........ 63

**8.2.5** අපනයන අංශය ........ 66

**8.3** සහාය සේවා පර්ෂදය ........ 68

**8.3.1** ප්‍රතිපත්ති, සැලසුම් හා පර්යේෂණ අංශය ........ 68

**8.3.3** තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය ........ 79

**8.3.4** මධ්‍යම මිල පිරික්සුම් අංශය ........ 81

**8.3.5** විශේෂ සේවා අංශය ........ 82

**8.4** මානව සම්පත් පර්ෂදය ........ 88

**8.4.1** මානව සම්පත් කළමනාකරණ අංශය ........ 88

**8.4.2** මානව සම්පත් සංවර්ධන අංශය ........ 89

**8.4.3** කාර්ය මණ්ඩල සේවා අංශය ........ 92

**8.5** පළාත් පර්ෂදය ........ 94

**8.5.1** මගී සේවා (කටුනායක) අංශය ........ 94

**8.5.2** ආදායම් හා සේවා (කටුනායක ) අංශය ........ 96

**8.5.3** ආදායම් සහ සේවා (ප්‍රාදේශීය) අංශය ........ 98

**8.6** සෘජුවම රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා යටතේ පවතින අංශ ........ 100

**8.6.1** පද්ධති හා ක්‍රියාපටිපාටි අනුකූලතා විගණන අංශය ........ 100

**8.6.2** මූල්‍ය අංශය ........ 102

**8.6.3.** ආදායම් කාර්යසාධක බලකාය ........ 105

**8.6.4.** නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) අංශය ........ 106

**8.6.5** අභියාචනා අංශය ........ 108

# පළවන පරිච්ඡේදය - ආයතනික පැතිකඩ

## 1.1 හැඳින්වීම

වර්ෂ 1806 දී ස්ථාපනය කර ඇති, ශ්‍රී ලංකාවේ පැරණිතම දෙපාර්තමේන්තු වලින් එකක් මෙන්ම ලොව පැරණිතම රේගු පරිපාලනයන්ගෙන් එකක් ද වන ශ්‍රී ලංකා රේගුව ප්‍රධාන වශයෙන් ආදායම් එකතු කිරීමේ සහ නීතිය බලාත්මක කිරීමේ වගකීම දරන අංගසම්පූර්ණ රාජ්‍ය ආයතනයකි.

## 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර සහ අරමුණු

### දැක්ම

"ශ්‍රී ලංකාවේ සුරක්ෂිතභාවය සහ සශ්‍රීකත්වය නංවන්නා වූ රේගු පරිපාලන කටයුතු මෙහෙයවන ආසියාවේ විශිෂ්ටතම ආයතනය බවට පත්වීම."

### මෙහෙවර

"ජාතික හා ජාත්‍යන්තර රේගු ප්‍රමිති යථා යෝග්‍ය ලෙස පිළිගනිමින් නීත්‍යානුකූල වෙළඳාම, ප්‍රවාහනය හා කර්මාන්ත සඳහා පහසුකම් සලසාලමින්, ආදායම, සාමාජීය හා පාරිසරික සුරක්ෂිතතාවට අදාළ රේගු නීති සහ අනෙකුත් අදාළ නීති බලාත්මක කිරීම සහ එම නීතිවලට අනුකූලවීම වැඩිදියුණු කිරීමට කැපවීම."

### ශ්‍රී ලංකා රේගුවේ ප්‍රධාන පරමාර්ථ

- **ආදායම් රැස්කිරීම**

  ආදායම් රැස්කිරීමේ කාර්යය ඉටු කරනු ලබන ශ්‍රී ලංකාවේ ප්‍රධාන රාජ්‍ය ආයතනය ශ්‍රී ලංකා රේගුව වේ. රාජ්‍ය බදු ආදායමෙන් 50% කට අධික ප්‍රමාණයක් රැස් කිරීමේ ප්‍රධාන වගකීම දරනු ලබන්නේ ශ්‍රී ලංකා රේගුව විසිනි.

- **සමාජ ආරක්ෂණය**

  නීති විරෝධී මත්ද්‍රව්‍ය හා අනෙකුත් හානිකර භාණ්ඩ වර්ග රට තුළට පැමිණීම සහ රටේ ජෛව සම්පත් සහ පුරාවස්තු රටින් පිටමං කිරීමේ ජාවාරම් කටයුතු වලකාලන පලිහක් ලෙස ක්‍රියාත්මක වෙමින් ශ්‍රී ලංකා රේගුව ඉතා වැදගත් මෙහෙවරක් ඉටු කරනු ලැබේ. ශ්‍රී ලංකාව ජෛව විවිධත්වයෙන් අනූන වූ රටක් බැවින් ශ්‍රී ලංකා රේගුවේ ජෛව විවිධත්ව හා ජාතික උරුම ආරක්ෂණ අංශය, ශ්‍රී ලාංකේය ජාතිය වෙනුවෙන් මෙම උරුමයන් රැක දෙනු වස් අප්‍රතිහත කැපවීමකින් යුතුව කටයුතු කරනු ලබයි. ශ්‍රී ලංකාවේ අනෙකුත් නීති බලාත්මක කිරීමේ ආයතන අතර රේගු මත්ද්‍රව්‍ය පාලන ඒකකය ද ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරනු ලැබේ .

- **වෙළඳාම සඳහා පහසුකම් සැලසීම**

  1993 දී ශ්‍රී ලංකා රේගුවේ කටයුතු ස්වයංක්‍රීයකරණයත් සමඟ රේගු ක්‍රියා පටිපාටි සරල කිරීම සඳහා පියවර කිහිපයක් හඳුන්වා දීමට මං පෙත් විවර වූ අතර, අවදානම් කළමනාකරණ පද්ධතිය ආරම්භ කිරීම, තනි කවුළු ක්‍රමය හඳුන්වා දීම සහ රේගු ක්‍රියා පටිපාටි යථාවත් කිරීම ආර්ථිකය තුළ වෙළඳ කටයුතු වලට ගතවන කාලය සහ පිරිවැය ඉතිරි කර ගැනීමට සුපැහැදිලි දායකත්වයක් ලබාදෙන ලදී. ලෝක වෙළඳ සංවිධානයේ වෙළඳ පහසුකම් සැපයීමේ ගිවිසුම අනුමත කිරීමෙන් පසුව, ශ්‍රී ලංකා රේගුව එහි ක්‍රියා පටිපාටිවල හා නීතිමය රාමුවේ කැපී පෙනෙන වෙනස්කම් සිදු කරමින් වෙළඳ කටයුතු උදෙසා තවදුරටත් පහසුකම් සැලසීම සඳහා ඉදිරියට යමින් සිටී.

- **නීති බලාත්මක කිරීම**

## 1.3 ප්‍රධාන කාර්යයන්

- තීරුබදු, වෙළඳ සහ සමාජ ආරක්ෂණ නීතිවලට අදාල රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.
- ආනයනය හා අපනයන රේගු බදු තක්සේරු කිරීම සහ එකතු කිරීම.
- අනෙකුත් පනත් සහ රාජ්‍ය ආයතන වෙනුවෙන් තීරුබදු / බදු සහ අනෙකුත් අයබදු තක්සේරු කිරීම සහ එකතු කිරීම.
- තීරුබදු (බදු) ඉවත් කිරීම්, නිදහස් කිරීම්, බදු සහන (ලබාදීම)ක්‍රියාත්මක කිරීම.
- තීරුබදු සහ අනෙකුත් අයබදු සුරක්ෂිත කිරීම සහ ඒවා ගණනය කිරීම.
- රේගු බදු ආපසු ගෙවීම්, බදු සහන සහ වට්ටම් ලබාදීම.
- හොර බඩු ජාවාරම්, වාණිජ වංචා සහ මත්ද්‍රව්‍ය ප්‍රවාහනය හසුකරගැනීම හා නිවාරණය.
- තහනම් කරන ලද සහ සීමා කරනලද භාණ්ඩවලට අදාළ නීති බලාත්මක කිරීම.
- රේගු නීති සහ අනෙකුත් අදාල නීති යටතේ සිදුකරනු ලබන වැරදි පිළිබඳ විමර්ශනය කිරීම හා පරීක්ෂණ පැවැත්වීම.
- වැරදිකරුවන්ගෙන් දඩ අයකරගැනීම / භාණ්ඩ රාජසන්තක කිරීම.
- රාජසන්තක කරන ලද භාණ්ඩ අපහරණය කිරීම.
- ආනයන අපනයන භාණ්ඩ නිෂ්කාශනය කිරීම.
- මගීන් සහ මගී ගමන් මලු නිෂ්කාශනය කිරීම.
- භාණ්ඩ සහ මගීන් නිෂ්කාශන ක්‍රියාපටිපාටි පරිගණකගත කිරීම.
- දේශීය කර්මාන්ත සහ කෘෂි නිෂ්පාදන සුරක්ෂිත කිරීම සඳහා රජය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම.
- අපනයන සඳහා පහසුකම් සැලසීමේ වැඩසටහන් කළමනාකරණය කිරීම.
- භාණ්ඩ ගුදම්ගත කිරීම කළමනාකරණය කිරීම (බැදුම්කර සැලසුම්).
- අපනයන පාදක කර්මාන්ත සැලසුම් අධීක්ෂණය කිරීම.
- වෙළඳ සංඛ්‍යාලේඛන රැස් කිරීම හා නිකුත් කිරීම.
- තොරතුරු / වර්ගීකරණ කිරීමේ රීති යනාදිය සැපයීම.
- වෙළඳ මණ්ඩල-නිෂ්කාශන නියෝජිතවරුන් සමඟ නිරතුරුව කටයුතු කිරීම
- පුහුණු / දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම
- නාමකරණය, වර්ගීකරණය, තක්සේරු කිරීම සහ බලාත්මක කිරීමේ ශිල්පීය ක්‍රමවේදයන්ට අදාල කාරණා පිළිබඳ ලෝක රේගු සංවිධානය සමඟ අඛණ්ඩව තොරතුරු හුවමාරු කරගැනීම.
- තොරතුරු හුවමාරු කරගැනීම සඳහා රේඛීය ආයතන, රජයේ දෙපාර්තමේන්තු සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම : (මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, අපනයන සංවර්ධන මණ්ඩලය, සුරාබදු දෙපාර්තමේන්තුව යනාදිය)

## 1.4 සංවිධාන සටහන



රේගු අධ්‍යක්ෂ ජනරාල්
අති.රේ.අ.ජ. (බලාත්මක කිරීමේ
රේගු අධ්‍යක්ෂ - නිවාරණ අංශය
රේගු අධ්‍යක්ෂ - සමාජ ආරක්ෂණ අංශය
රේගු අධ්‍යක්ෂ - මධ්‍යම විමර්ශන අංශය
රේගු අධ්‍යක්ෂ - මධ්‍යම බුද්ධි අංශය
රේගු අධ්‍යක්ෂ - නීති කටයුතු අංශය
රේගු අධ්‍යක්ෂ - මධ්‍යම අපහරණ අංශය
අති.රේ.අ.ජ. (ආදායම් හා සේවා පරිෂදය)
රේගු අධ්‍යක්ෂ - ප්‍රකාශන අංශය
රේගු අධ්‍යක්ෂ - කර්මාන්ත හා සේවා අංශය
රේගු අධ්‍යක්ෂ - මධ්‍යම භාණ්ඩ පරීක්ෂණ අංශය
රේගු අධ්‍යක්ෂ - අපනයන අංශය
රේගු අධ්‍යක්ෂ - මඟී සේවා අංශය
රේගු අධ්‍යක්ෂ - ආයෝජන මණ්ඩල සම්බන්ධීකරණ අංශය
අති.රේ.අ.ජ. (සහාය සේවා)
රේගු අධ්‍යක්ෂ - ප්‍රතිපත්ති, සැලසුම් හා පර්යේෂණ අංශය හා ජාත්‍යන්තර සබඳතා අංශය
රේගු අධ්‍යක්ෂ - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය
රේගු අධ්‍යක්ෂ - මධ්‍යම මිල පිරික්සුම් අංශය
රේගු අධ්‍යක්ෂ - අනුගතවීමේ හා පහසුකම් සැලසීමේ අංශය
රේගු අධ්‍යක්ෂ - විශේෂිත සේවා අංශය
අති.රේ.අ.ජ. (මානව සම්පත්)
රේගු අධ්‍යක්ෂ - මානව සම්පත් කළමනාකරණ අංශය
රේගු අධ්‍යක්ෂ - මානව සම්පත් සංවර්ධන අංශය
රේගු අධ්‍යක්ෂ - සේවා සැපයුම් අංශය
රේගු අධ්‍යක්ෂ - කාර්ය මණ්ඩල සේවා අංශය
අති.රේ.අ.ජ. (ප්‍රාදේශීය)
රේගු අධ්‍යක්ෂ - මඟී සේවා (කටුනායක) අංශය
රේගු අධ්‍යක්ෂ - ආදායම් හා සේවා (කටුනායක) අංශය
රේගු අධ්‍යක්ෂ - ආදායම් හා සේවා (ප්‍රාදේශීය) අංශය
ප්‍ර.මූ.නි.
අධ්‍යක්ෂ - මුදල් අංශය
රේගු අධ්‍යක්ෂ - ආදායම් කාර්යසාධන බලකාය
රේගු අධ්‍යක්ෂ - අභියාචනා අංශය
රේගු අධ්‍යක්ෂ - පද්ධති හා ක්‍රියාපටිපාටි අනුකූලතා විගණන අංශය
අධ්‍යක්ෂ - නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන)
සංඛ්‍යාඥ
අ.රේ.අ.ජ. - අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල්
ප්‍ර.මූ.නි. - ප්‍රධාන මූල්‍ය නිලධාරී
රේ.අ. - රේගු අධ්‍යක්ෂ

## 1.5 ශ්‍රී ලංකා රේගුවේ ප්‍රධාන අංශ

**නීති බලාත්මක කිරීමේ පර්ෂදය**

1. නිවාරණ අංශය
2. සමාජ ආරක්ෂණ අංශය
3. මධ්‍යම විමර්ශන අංශය
4. මධ්‍යම බුද්ධි අංශය
5. නීති කටයුතු අංශය
6. මධ්‍යම අපහරණ අංශය

**ආදායම් හා සේවා පර්ෂදය**

7. ප්‍රතකාශන අංශය
8. කර්මාන්ත හා සේවා අංශය
9. මධ්‍යම භාණ්ඩ පරීක්ෂණ අංශය
10. අපනයන අංශය
11. මගී සේවා අංශය
12. ආයෝජන මණ්ඩල සම්බන්ධීකරණ අංශය

**සහාය සේවා පර්ෂදය**

13. ප්‍රතිපත්ති, සැලසුම් හා පර්යේෂණ අංශය
14. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය
15. මධ්‍යම මිල පිරික්සුම් අංශය
16. අනුගතවීමේ සහ පහසුකම් සැලසීමේ අංශය
17. විශේෂ සේවා අංශය

**මානව සම්පත් පර්ෂදය**

18. මානව සම්පත් කළමනාකරණ අංශය
19. මානව සම්පත් සංවර්ධන අංශය
20. සේවා සැපයුම් අංශය
21. කාර්ය මණ්ඩල සේවා අංශය

**පළාත් පර්ෂදය**

22. මගී සේවා (කටුනායක) අංශය
23. ආදායම් හා සේවා (කටුනායක ) අංශය
24. ආදායම් සහ සේවා (ප්‍රාදේශීය) අංශය

**රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා යටතේ සෘජුව පවතින අංශ**

25. මූල්‍ය අංශය
26. ආදායම් කාර්යසාධක අංශය
27. පද්ධති හා ක්‍රියාපටිපාටි අනුකූලතා විගණන අංශය
28. නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) අංශය
29. සංඛ්‍යාලේඛන අංශය

## 1.6 ප්‍රමුඛ නිලධාරී මණ්ඩලය

(2019.12.31 දිනට) ජ්‍යෙෂ්ඨත්වයෙහි අනුපිළිවෙලට නොවේ.

**ඒ.වී. ජනාදර මහතා (වැඩ ආවරණ)**
රේගු අධ්‍යක්ෂ ජනරාල්

**එච්.පී.ජයනන්ද මහතා**
අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් (මානව සම්පත්)

**අයි.ඒ.එම්. අර්ථනායක මහතා**
අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් (සහාය සේවා)

**එච්.කේ.එම්.එස්. ජයරත්න මහතා**
අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් (ආදායම් හා සේවා)

එල්.ගජදීර මහතා
අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් (නීති බලාත්මක කිරීම)

**ඩී.පී.සේනානායක මහතා**
අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් (ප්‍රාදේශික )

**එම්. ජේ.ආර්. පුවිරාජ් මහතා**
ප්‍රධාන මූල්‍ය නිලධාරි

**ජේ.එල්. එච්.කේ ජයතිලක මහතා**
රේගු අධ්‍යක්ෂ (අනුකූලවීම සහ පහසුකම් සැලසීම)

සී.පේරින්පනායගම්
රේගු අධ්‍යක්ෂ (භාණ්ඩ පරීක්ෂණ)

**එස්.ඒ.එස්.පී. සේනානායක මහතා**
රේගු අධ්‍යක්ෂ (නිවාරණ)

**එම්.ආර්.රණරාජා මහතා**
රේගු අධ්‍යක්ෂ (මධ්‍යම බුද්ධි)

**කේ.ජී. ජයවර්ධන මහතා**
රේගු අධ්‍යක්ෂ (විශේෂ සේවා)

**කේ.එච්. ධර්මකීර්ති මහතා**
රේගු අධ්‍යක්ෂ (මධ්‍යම මිල පිරික්සුම)

**පී. සී. එම්. නන්දගෝපාලන් මහතා**
රේගු අධ්‍යක්ෂ (සේවා සැපයුම්)

**සී.මුම්මුල්ලගේ** මහත්මිය
රේගු අධ්‍යක්ෂ (කාර්ය මණ්ඩල සේවා)

**එච්.ආර්.එන්.සී. හේරත් මහතා**
රේගු අධ්‍යක්ෂ (විශේෂ කාර්ය හා සුපරීක්ෂණ)

**එස්. ආනන්දීස්වරන් මහතා**
රේගු අධ්‍යක්ෂ (මගී සේවා - කොළඹ)

**ඩබ්.ජී. චන්ද්‍රිකා මහත්මිය**
අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)

**ජී. සරත් කුමාර මහතා**
ප්‍රධාන ගණකාධිකාරි

**ඒ.පී.එන්.එච්. අබේරත්න මහතා**
රේගු අධ්‍යක්ෂ (මධ්‍යම විමර්ශන)

**එච්.එම්.රාජරත්න මහතා**
රේගු අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති, සැලසුම් හා පර්යේෂණ)

**ආර්.ගන්කේවෙල මහත්මිය**
රේගු අධ්‍යක්ෂ (මගී සේවා - කටුනායක)

**ආර්.රුෂාන්දන් මහතා**
රේගු අධ්‍යක්ෂ (ආදායම් හා සේවා - කටුනායක)

**පී.ජී. සුමනපාල මහතා**
රේගු අධ්‍යක්ෂ (කර්මාන්ත හා සේවා)

**එස්.කේ. ද සිල්වා මහතා**
රේගු අධ්‍යක්ෂ (ප්‍රකාශන)

**එස්. පී.අයි.බාලසූරිය මහතා**
රේගු අධ්‍යක්ෂ (සමාජ ආරක්ෂණ)

**ඩබ්ලිව්.කේ. රන්දෙනිය මහතා**
රේගු අධ්‍යක්ෂ (අපනයන)

**ඩබ්ලිව්.එල්.ඩී.ආර්. ද අල්විස් මහතා**
රේගු අධ්‍යක්ෂ (තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ)

**එස්. නියාස් මහතා**
රේගු අධ්‍යක්ෂ (නීති කටයුතු)

**එම්.ඒ.එම්.අරීෆා මහත්මිය**
රේගු අධ්‍යක්ෂ (මානව සම්පත් කළමනාකරණ)

**ඊ.එම්.එන්. එදිරිසිංහ මහතා**
රේගු අධ්‍යක්ෂ (මානව සම්පත් සංවර්ධන)

**එම්.ඩී.ජේ.සී.මුරගේ මහතා**
අධ්‍යක්ෂ (නිෂ්පාදන බදු)

**ජී.වී.යූ.ඩී. සිල්වා මහතා**
රේගු අධ්‍යක්ෂ (අභියාචනා)

**ඩී.එල්.බන්දුතිලක මහතා**
රේගු අධ්‍යක්ෂ (ආදායම් හා සේවා - ප්‍රාදේශීය)

**ආර්.ඩී.එන්. ප්‍රේමවංශ මහතා**
නියෝජ්‍ය අධක්ෂ (සංඛ්‍යාලේඛන)

# දෙවන පරිච්ඡේදය - 2019 වර්ෂය තුළ ලබාගත් ප්‍රගතිය

## 2.1 මූල්‍ය කාර්ය සාධනය

2019 වර්ෂය තුළ රේගු ආදායම් කාර්ය සාධනය

| ආදායම් කේතය | විස්තරය | 2019 ජනවාරි 01 සිට දෙසැ.31 දක්වා කාර්ය සාධනය (ශ්‍රී.ල.රු.මිලියන) | | | | |
|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තු | තථ්‍ය අගය | කාර්ය සාධනය % | අපගමනය | අපගමනයෙහි ප්‍රතිශතයක් ලෙස |
| | | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | | | | |
| 1001.01.00 | ආනයන තීරු බද්ද | 140,000 | 98,427.38 | 70% | (41,572) | -30% |
| 1001.02.00 | අපනයන තීරු බද්ද | 40 | 170.44 | 425% | 130. | 325% |
| 1001.04.00 | වරාය හා ගුවන් තොටුපළ සං.බද්ද | 115,000 | 112,174.18 | 98% | (2,825) | -2% |
| 1001.05.01 | ආනයන සෙස් බද්ද | 52,000 | 48,403.02 | 93% | (3,597) | -7% |
| 1001.05.02 | අපනයන සෙස් බද්ද | 2,000 | 2,299.69 | 115% | 299.69 | 15% |
| 1001.08.00 | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද | 90,000 | 70,363.87 | 78% | (19,636) | -22% |
| | | නිෂ්පාදන (විශේෂ විධි විධාන) බද්ද | | | | |
| 1002.05.01 | නිෂ්පාදන බද්ද- සිගරට් | 115,000 | 87,367.37 | 76% | (27,632.6) | -24% |
| 1002.05.02 | නිෂ්පාදන බද්ද -මත් පැන් | | 58.76 | | 58.8 | |
| 1002.05.03 | නිෂ්පාදන බද්ද -ඛනිජ තෙල් | 90,000 | 61,740.30 | 69% | (28,260.0) | -31% |
| 1002.05.04 | නිෂ්පාදන බද්ද - මෝටර් වාහන | 240,000 | 130,377.88 | 54% | (109,622.2) | -46% |
| 1002.05.99 | අනෙකුත් නිෂ්පාදන බදු | 13,000 | 4,549.40 | 35% | (8,450.6) | -65% |
| | | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | | | | |
| 1002.01.04 | එකතු කළ වටිනාකම් මත බද්ද (VAT) | 205,000 | 169,914.09 | 83% | (35,086) | -17% |
| 1002.12.03 | ජාතිය ගොඩනැගීමේ බද්ද (NBT) | 26,000 | 18,226.84 | 70% | (7,773) | -30% |
| 1002.10.00 | සමාජ වගකීම් බද්ද (SRL)) | - | - | | | |
| 1003.01.00 | සුඛෝපභෝගී වාහන බද්ද | | 1,859.52 | | 1,859 | |
| 1003.07.10 | වාහන හිමිකම් බදු | 2,200 | 1,498.60 | 68% | (702) | -32% |
| | | ආදායම් හා ලාභ මත බදු | | | | |
| 1004.04.02 | ආර්ථික සේවා ගාස්තු (ESC) | 8,000 | 1,661.56 | 21% | (6,338) | -79% |
| | | බදු නොවන ආදායම් | | | | |
| 2003.02.17 | ඇහලුම්- දේශීය අලෙවිය මත ගාස්තු | 350 | 145.95 | 42% | (204) | -58% |
| 2003.03.01 | දඩ සහ රාජසන්තක කිරීම් | 5,425 | 3,379.83 | 62% | (2,046) | -38% |
| 2003.02.99 | විවිධ | 350 | 312.0 | 89% | (38) | -11% |
| 2003.99.00 | වෙනත් ලැබීම් | 175 | 172.0 | 98% | (3) | -2% |
| | මුළු එකතුව | **1,104,540** | **813,100.1** | **74%** | **(291,439)** | **-26%** |

| කාණ්ඩය | ආදායම (ශ්‍රී ලං. රු.මි.) | මුළු ආදායමෙහි ප්‍රතිශතයක් ලෙස% |
|---|---|---|
| ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 331,838.58 | 40.81% |
| නිෂ්පාදන (විශේෂ විධි විධාන) බද්ද | 284,093.71 | 34.94% |
| දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 191,499.05 | 23.55% |
| බදු නොවන ආදායම් | 4009.78 | 0.20% |
| ආදායම් හා ලාභ මත බදු | 1,661.56 | 0.49% |

මුළු ආදායමෙහි ප්‍රතිශතයක් වශයෙන්




ජාතික බදු ආදායමේ ප්‍රතිශතයක් වශයෙන් ( රු. මිලියන)




* තාවකාලික දත්ත, 2019 ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තා

## 2.2 ඉහළ බදු ආදායම් උපදවන භාණ්ඩ වර්ග පනහ (HS කේතය අනුව)

| HS කේතය | HS විස්තරය | ආදායම (රු) |
|---|---|---|
| **27101220,21,22,29** | පෙට්‍රල් | 82,425,193,584 |
| **87032169** | ස්ටේෂන් වැගන් සහ රේසිං කාර් ඇතුළු අනෙකුත් මෝටර් රථ < අවු1 | 36,201,067,180 |
| **87112010** | යතුරු පැදි, > සිලින්ඩර ධාරිතාව 50 cc & =< 200 cc, වසර තුනකට වඩා නො පැරණි, පරස්පර අභ්‍යන්තර දහනය | 34,494,112,521 |
| **27101940,41,42,49** | ඩීසල් | 31,082,678,864 |
| **15119030** | පිරිපහදු නොකරන ලද පාම් ඔලෙයින් | 21,031,677,358 |
| **87032250** | ස්ටේෂන් වැගන් සහ රේසිං කාර් ඇතුළු මෝටර් රථ අවුරුදු තුනකට වඩා නො පැරණි | 15,437,160,281 |
| **17019910** | සුදු ස්ඵටිකරූපී උක් සීනි | 14,664,758,684 |
| **04022100** | සීනි හෝ වෙනත් රසකාරක අඩංගු නොකළ කිරි සහ යොදය අඩංගු මේද ප්‍රමාණය > 1.5 | 14,315,237,000 |
| **22071000** | රසායන ද්‍රව්‍ය නොයෙදූ එතිල් මද්‍යසාර, මද්‍යසාර සාන්ද්‍රණය >=80% | 12,553,457,558 |
| **69072190** | වෙනත් | 8,125,654,394 |
| **87043193** | වෙනත්, වසර 04කට වඩා නො පැරණි | 7,942,219,017 |
| **10019910** | තිරිඟු | 6,843,193,374 |
| **25232930** | කිලෝග්‍රෑම් 50ට වැඩි ඇසුරුමක හෝ තොග වශයෙන් ආනයනය කරනු ලබන අනෙකුත් පෝට්ලන්ඩ් සිමෙන්ති | 6,741,098,505 |
| **7019000** | අර්තාපල් අල ,අලුත් සහ ශීතකළ, අර්තාපල් බීජ හැර | 6,176,742,151 |
| **27011200** | ගල්කීලමය ගල් අඟුරු, සම්පිණ්ඩනය නොකල | 5,559,959,770 |
| **87032154** | වෙනත්, අවුරුදු එකකට අඩු ත්‍රීරෝද රථ | 5,266,270,972 |
| **25231000** | සිමෙන්ති මිශ්‍රණ ද්‍රව්‍ය | 5,124,907,209 |
| **72071110** | ක්ෂේත්‍රඵල මුහුණතකින් යුතු යකඩ කඳන් (Billets) | 5,102,405,690 |
| **25232920** | කිලෝග්‍රෑම් 50 ඇසුරුමක හා ඊට අඩු ප්‍රමාණයකින් ආනයනය කරනු ලබන අනෙකුත් පෝට්ලන්ඩ් සිමෙන්ති | 4,976,721,943 |
| **7031020** | ලොකු ළූණු | 4,771,704,322 |
| **27101980** | ස්නේහක තෙල් | 4,708,618,312 |
| **23040000** | සෝයා බෝංචිවලින් ගන්නා තෙල්- මුරු සහ අනෙකුත් ඝන අවශේෂ කොටස් | 4,249,699,083 |
| **27090010** | පෙට්‍රෝලියම් තෙල් | 4,138,330,382 |
| **85176290** | ශබ්දය යනාදිය ග්‍රහණය, හැරවීම සහ සම්ප්‍රේෂණය හෝ ප්‍රතිනිර්මාණය සඳහා වන යන්ත්‍ර | 3,853,262,041 |
| **14049010** | බීඩි කොළ | 3,747,302,680 |
| **39041000** | ප්‍රාථමික ස්වරූපය දරන කිසියම් ද්‍රව්‍යයක් සමග මිශ්‍ර නොවූ පොලිවයිනිල් ක්ලෝරයිඩ් | 3,201,037,220 |
| **27111910** | ද්‍රවීකරණය කරන ලද පෙට්‍රෝලියම් වායු | 3,053,458,525 |
| **87042191** | වෙනත්, වසර 3.5 කට වඩා නොපැරණි | 2,942,819,617 |
| **85176210** | සම්ප්‍රේෂණ උපකරණ ග්‍රාහක උපකරණ සමග හෝ නොමැතිව | 2,708,037,137 |
| **40111090** | වෙනත් | 2,697,554,255 |
| **39021000** | ප්‍රාථමික තත්ත්වයේ ඇති පොලිප්‍රොපලින් | 2,638,517,848 |
| **87036058** | වෙනත්, වසර 3කට වඩා නොපැරණි | 2,550,181,012 |
| **87034028** | වෙනත්, වසර 3කට වඩා නොපැරණි | 2,502,990,890 |
| **17011400** | වෙනත්, උක් සීනි | 2,470,023,374 |
| **39011000** | ප්‍රාථමික ස්වරූපය දරන විශේෂ ගුරුත්වය<0.94, වූ පොලිඑතිලීන් | 2,403,581,504 |
| **15179000** | වෙනත් | 2,337,599,471 |
| **72107000** | පින්තාරු කළා වූ,වාර්නිෂ් ආලේපිත හෝ ප්ලාස්ටික් ආලේපිත පළල >=600mm රෝල් වශයෙන් ඇති යකඩ වානේ | 2,300,329,277 |
| **48025790** | ලිවීම, මුද්‍රණය යනාදිය සඳහා භාවිතා කළ හැකි වෙනත් ආලේපිත නොවන කඩදාසි , බර =<40g/m2 සහ >=150 | 2,039,183,303 |
| **85171220** | අනෙකුත් සෙලියුලර් ජංගම දුරකථන | 2,016,201,041 |
| **87042193** | වෙනත්, වසර 4කට වඩා නො පැරණි | 1,976,357,500 |
| **74081100** | පිරිපහදු කළ තඹ රැහැන්, උපරිම හරස්කඩ මානය >මි.මී 6 | 1,919,886,175 |
| **40112019** | වෙනත් | 1,897,671,482 |
| **15119090** | පාම් තෙල් ,රසායනිකව නවීකරණය නොකල, ශුද්ධ නොකළ තෙල් හා ඇසුරුම් ගත පාම් ඔලේන් =< ලීටර 210 හැර ) | 1,819,683,395 |
| **84181090** | භාවිතා නොකරන ලද හෝ නැවත සකස් කර නොමැති, වෙන්වූ බාහිර දොරවල් සවි කළ ඒකාබද්ධ ශීතකරණ | 1,794,078,567 |
| **27101970** | ස්නේහක නිපදවීමට ගන්නා ලිහිසි තෙල්(Base-oils) | 1,782,616,695 |
| **73089000** | වෙනත් | 1,758,881,200 |
| **87034035** | ස්ටේෂන් වැගන් හා රේසිං කාර් ඇතුළු මෝටර් කාර් , වසර 3කට වඩා නො පැරණි | 1,748,006,745 |
| **87042163** | කි.ග්‍රෑ.800 ක හෝ ඊට වැඩි භාණ්ඩ ප්‍රවාහනය කරන වසර හතරකට වඩා නොපැරණි වාහන, ඉදිරිපස leaf springs සහිත | 1,690,912,500 |
| **72259200** | තුත්තනාගම් ආලේප කළා වූ හෝ ආවරණය කළා වූ (විද්‍යුත් ආලෝපනයෙන් ) පැතලි/ රෝල් වශයෙන් ඇති වානේ මි.මී 600 | 1,690,246,228 |
| **48025590** | කඩදාසි, බර> =.40g / m2 සහ = <150 g / m2, කාබන් කඩදාසි හැර | 1,685,566,185 |

## 2.3 විශේෂ ජයග්‍රහණ

### 2.3.1 ලෝක රේගු සංවිධානය විසින් නිර්දේශිත නිෂ්කාශන කාල නිර්ණ අධ්‍යනය (TRS)

ආනයන අපනයන භාණ්ඩ තොග නිෂ්කාශන කාලය සැපයුම් දාමයේ කාර්යක්ෂමතාවයට සෘජු බලපෑමක් එල්ල කරන අතර අවසානයේ දේශ සීමා හරහා සිදුවන වෙළඳ කටයුතු වල පිරිවැය කෙරෙහි ද බලපෑමක් ඇති කරනු ලබන හෙයින් භාණ්ඩ තොග නිෂ්කාශන කාලය අඩු කිරීම නීත්‍යානුකූල වෙළඳාමට පහසුකම් සැලසීමේ දී ප්‍රධාන අවශ්‍යතාවක් වේ. නිෂ්කාශන කාල නිර්ණ අධ්‍යයනය (TRS) යනු ආනයන / අපනයන භාණ්ඩ තොගයක් නිදහස් කිරීම සඳහා රේගුව හෝ රේගුව ඇතුළු අනෙකුත් අංශ විසින් ගනු ලබන සාමාන්‍ය කාලය ගණනය කිරීම සඳහා ලෝක රේගු සංවිධානය (WCO) විසින් සකස් කරන ලද විශේෂිත වූ, දෝෂ සෙවීමේ මෙවලමක් හෙවත් ක්‍රමවේදයකි. එය සාමාන්‍ය නිෂ්කාශන ක්‍රියාවලිය තුළ පවතින අවහිරතා හඳුනා ගැනීම මෙන්ම ආනයන / අපනයන / මාර්ගස්ථ ක්‍රියාවලීන්හි කාර්යඵල වැඩි දියුණු කිරීමේ මාධ්‍යයක් ලෙස ද පිළිගැනේ. ඉන් ඔබ්බට, වෙනත් රජයේ ආයතන (OGA) විසින් මෙකී සංදර්භය තුළ ඔවුන්ගේ සේවාවන් සැපයීම සඳහා ගතකරන සාමාන්‍ය කාලය ද මෙමගින් මනිනු ලැබේ. මෙවැනි වෑයමක ප්‍රධාන පරමාර්ථය වන්නේ දේශසීමාවන් හරහා භාණ්ඩ ගෙනයාමේදී සමුච්චිත වන "වෙළඳාමට යන පිරිවැය" නමැති සාධකය සැලකිල්ලට ගනිමින් දේශ සීමාවන් තුළ සේවයේ නියුතු රේගු සහ වෙනත් රජයේ ආයතනයන්හි (OGA) කාර්යක්ෂමතාව වඩාත් වැඩිදියුණු කිරීම සඳහා පිළියම් යෙදීමයි. මෙකී පදනම මත සිදුකරනු ලබන නිෂ්කාශන කාල නිර්ණ අධ්‍යයන (TRS) සමීක්ෂණ ප්‍රතිඵල මගින්, පවතින තරඟකාරිත්වය තුළ දේශසීමා ක්‍රියාකාරිත්වයන්හි කාර්යඵල සැලකිල්ලට ගැනීමේදී එක් එක් රටවල එම ක්‍රියාකාරිත්වයෙහි තත්වය හා ස්වරූපය පිළිබිඹු කරයි. 2017 පෙබරවාරි මස ලෝක වෙළඳ සංවිධානය විසින් හඳුන්වා දුන් වෙළඳ පහසුකම් සැපයීමේ ගිවිසුම (TFA) බලාත්මක වූ අවස්ථාවෙහි සිටම, එහි නිර්දේශ ප්‍රකාරව සාමාජික රටවල ආනයන/අපනයන භාණ්ඩ නිදහස් කිරීමට ගතවන සාමාන්‍ය කාලය මැනීම සහ ප්‍රකාශයට පත් කිරීම අවශ්‍යතාවයක් වේ. (වෙළඳ පහසුකම් සැපයීමේ ගිවිසුමෙහි 7.6 වන වගන්තිය).

ඒ අනුව, ශ්‍රී ලංකා රේගුව විසින් එහි දෙවන පුළුල් නිෂ්කාශන කාල නිර්ණ අධ්‍යයන සමීක්ෂණය අනෙකුත් ප්‍රධාන රාජ්‍ය ආයතන වල මෙන්ම පෞද්ගලික අංශයේද සහභාගීත්වයෙන් 2018 වර්ෂයේදී පවත්වන ලද අතර එහි වාර්තාව 2019 වර්ෂයේ ජනවාරි මස ප්‍රකාශයට පත් කරන ලදී. 2014 වර්ෂයේදී සිදු කරන ලද කාල නිර්ණ අධ්‍යයනයේදී අවහිරතා වශයෙන් හඳුනාගන්නා ලද ඇතැම් ක්‍රියාවලීන්හි විශාල වශයෙන් පැවතුණු උදාසීන කාලයක් අවම කිරීම සඳහා සුදුසු පිළියම් යොදා තිබූ බව මෙහිදී අනාවරණය වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස සම්පූර්ණ බහාලුම් භාරයෙහි සාමාන්‍ය ප්‍රතිදාන කාලයේ (රේගු කටයුතු සම්පූර්ණයෙන් ඉටු කිරීමට ගත වන සාමාන්‍ය කාලයේ) සැලකිය යුතු අඩුවීමක් නිරීක්ෂණය විය. ඒ අනුව, සමීක්ෂණයේ අවසන් ප්‍රතිඵල වලින් අනාවරණය වූයේ විශේෂයෙන්ම අසිකුඩා වර්ල්ඩ් පද්ධතිය ඇසුරෙන් රේගු කාර්යයන් ස්වයංක්‍රීයකරණය තුළින් ලද ප්‍රගතිය හේතුවෙන් රේගු ක්‍රියා පිළිවෙත් විධිමත් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ආනයන හා අපනයන භාණ්ඩ නිෂ්කාශනය සඳහා ගතවන කාලය අඩු කිරීම පිළිබඳ සැලකිය යුතු දියුණුවක් ලඟා කරගෙන ඇති බවයි. මෙම ප්‍රගතිය අත් කර ගැනීමෙහිලා කැපී පෙනෙන සාධකයක් වන්නේ දේශසීමා අතර වෙළඳ කටයුතු පවත්වා ගැනීමේදී බාධා විරහිත වෙළඳ ප්‍රවාහයන් උදෙසා සාමූහිකව කටයුතු කළ රේගුව, අනෙකුත් රාජ්‍ය ආයතන හා පෞද්ගලික අංශය යන පාර්ශ්වයන් අතර වූ ශක්තිමත් සබඳතාවයයි.

ශ්‍රී ලංකා රේගුවේ පවත්වන ලද මුල්ම නිෂ්කාශන කාල නිර්ණ අධ්‍යයන සමීක්ෂණය රේගු සන්දර්භය තුළට පමණක් හා ආනයනික මුහුදු භාණ්ඩ සම්පූර්ණ බහාලුම් භාරය (FCL) සම්බන්ධ ක්‍රියාවලිය කෙරෙහි පමණක් අවධානය යොමු කරමින් 2014 වර්ෂයේදී පැවැත්විණ. 2018 නිෂ්කාශන කාල නිර්ණ අධ්‍යයන සමීක්ෂණයෙහි අනාවරණයන්ට අනුව ආනයනික මුහුදු භාණ්ඩ සම්පූර්ණ බහාලුම් භාරය සම්බන්ධයෙන් භාණ්ඩ තොග නිෂ්කාශනය සඳහා පැමිණීමේ සිට නිෂ්කාශනයෙන් අනතුරුව මුදාහැරීම අතර ගත වූ සාමාන්‍ය කාලය පැය 16 මිනිත්තු 29 ක් විය. 2014 වර්ෂයේ සමීක්ෂණ ප්‍රතිඵල හා සසඳන විට මෙය පැය 11 මිනිත්තු 31 ක වැඩිවීම කි. එමෙන්ම මෙම අධ්‍යයනයේ තවත් ප්‍රධාන අනාවරණයක් නම් ආනයනික සම්පූර්ණ බහාලුම් තොගය (FCL) පැය 24 ක් තුළදී 75% නිෂ්කාශනය කිරීම වන අතර, 2014 වර්ෂයේ අධ්‍යයනය තුළ නිරීක්ෂණයන් අනුව මෙම කාලය දින 2 ක් විය.



*(මූලාශ්‍රය: නිෂ්කාශන කාල නිර්ණ අධ්‍යයනය, ශ්‍රී ලංකා රේගුව)*

ජාත්‍යන්තර වෙළඳාම පහසු කරලීම අරමුණු කරගත් විවිධ ක්‍රියාමාර්ගයන්ගේ ප්‍රතිඵලයක් වශයෙන් එක් එක් අංශ විශාල ප්‍රගතියක් අත් කර ගෙන ඇත.රේගු ප්‍රකාශන හෙවත් රේගු සටහන්කර ඉදිරිපත් කිරීමේ සිට අදාළ භාණ්ඩ රේගු පාලනයෙන් නිදහස් කිරීම දක්වා විවිධ කාණ්ඩ යටතේ භාණ්ඩ තොග සඳහා රේගු කටයුතු සිදු කිරීමට ගත වන සාමාන්‍ය කාලය පහත පරිදි වේ.

**ප්‍රධාන කාණ්ඩ යටතේ සාමාන්‍ය ප්‍රතිදාන කාලය (සාරාංශගත)**

| කාණ්ඩය | | නිෂ්කාශන ක්‍රියාවලියට ගතවන කාලය | උදාසීන කාලය | ක්‍රියාවලියට ගතවන සම්පූර්ණ කාලය | 2014 කාලනිර්ණ අධ්‍යයනය අනුව සම්පූර්ණ කාලය | ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|
| මුහුදු මගින් ආනයනය කරන භාණ්ඩ - පූර්ණ බහාලුම් භාරය (FCL) | | පැ.8 මිනි. 31 | පැ.7 මිනි 59 | පැ.16 මිනි 29 | පැ 28 | පැ 11 මිනි. 31 |
| මුහුදු මගින් ආනයනය කරන භාණ්ඩ - අසම්පූර්ණ බහාලුම් භාරය(LCL)) | | පැ. 5 මිනි. 05 | පැ.3 මිනි 05 | පැ.8 මිනි 10 | අධ්‍යයනය නොකරන ලදී. | - |
| ගුවන් මගින් ආනයනික භාණ්ඩ | | පැ.1 මිනි.50 | පැ.1 මිනි 37 | පැ.3 මිනි 27 | | |
| අපනයන – අපනයන පහසුකම් සැලසීමේ මධ්‍යස්ථානය | | මිනි 9 | මිනි 41 | මිනි 50 | | |
| ගුවන් මගින් ගෙනයන අපනයන භාණ්ඩ | | පැ.1 මිනි 14 | මිනි 42 | පැ.1 මිනි 56 | | |
| වාහන | කොළඹ | පැ.3 මිනි 06 | පැ.4 මිනි 10 | පැ.7 මිනි 16 | | |
| | හම්බන්තොට | පැ.5 මිනි 26 | පැ.1 මිනි 25 | පැ.6 මිනි 51 | | |

අනාවරණය කර ගත් ප්‍රධාන කරුණු හා ඉදිරිපත් කළ නිර්දේශ

යාත්‍රා නැංගුරම් ලෑමේ සිට බහාලුම් නිෂ්කාශනය දක්වා වැඩ කරන දින තුනක් (3) සඳහා වන බහාලුම් පමාව වෙනුවෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහන කාලයක් ලබාදේ. ආනයනයකරුවන්ගෙන් බොහෝ දෙනෙකු රේගු ප්‍රකාශය හෙවත් රේගු සටහන්කරය ඉදිරිපත් කරනු ලබන්නේ මෙම සහන කාලයෙහි අවසන් දිනය තුළ වීම කැපී පෙනෙන කරුණකි. මෙම තත්ත්වය, සහන කාලපරිච්ඡේදයෙහි තෙවන දිනය තුළ බහාලුම් පිටතට ප්‍රවාහන කිරීමේදී දැඩි තදබදයක් ඇතිවීමට හේතු වේ. භාවිතයට නොගත් පූර්ව ප්‍රකාශන කාලය භාවිත කිරීම සඳහා ප්‍රමාණවත් පරිදි නිෂ්කාශන නියෝජිතයන් / අපනයනකරුවන් දැනුවත් කළ යුතු බව මෙහිදී නිර්දේශ කරනු ලැබේ. අනෙකුත් සුදුසු පිළියම් සඳහා ක්‍රියාමාර්ග දැනට සමාලෝචනය කරමින් පවතී.

**පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කරන ලදී.**

ලේඛන මධ්‍යස්ථානයේ (DOC Centre) කාර්යයන් ඉවත් කිරීම තුළින් එම කාර්යයන් ආනයන ප්‍රකාශන ක්‍රියාවලියට ඒකාබද්ධ කිරීම ද ඒ අනුව එම කාර්යාලය භෞතිකව දිගු කාමර පරිශ්‍රයට ගෙන ඒම ද සිදු කරන ලදී. මෙම අතිරික්ත කාර්යයන් ඉවත් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දළ වශයෙන් නිෂ්කාශන ක්‍රියාවලිය තුළ පැය 1 මිනිත්තු 38 ක කාලයක් ඉතිරි කර ගැනීමට හැකි වී ඇත.

2018.09.18 දිනැතිව නිකුත් කරන ලද දෙපාර්තමේන්තු නියෝග DOPL 1220 A යටතේ ආනයනික බහාලුම් ප්‍රවාහනය සම්බන්ධව වෙනස් උපාය මාර්ගයක් හඳුන්වා දෙමින් NCT දොරටු ක්‍රියාකාරිත්වය විධිමත් කරන ලද අතර ඒ අනුව NCT දොරටුවේ ආනයන බහාලුමක සාමාන්‍ය ප්‍රතිදාන කාලය මිනිත්තු 15 සිට මිනිත්තු 4 දක්වා අඩු විය.

රේගු නිෂ්කාශන කටයුතු අවසන් කර තිබියදීත් ව්‍යාපාරිකයන් තම ගබඩාවල ඇති ඉඩ ප්‍රමාණවත් නොවීම මත භාණ්ඩ ඉවත් කර ගැනීම හිතාමතාම ප්‍රමාද කිරීමට පෙළඹෙන අතර, එවැනි ක්‍රියා භාණ්ඩ මුදා හැරීමේ සාමාන්‍ය කාලය කෙරෙහි අහිතකර බලපෑමක් ඇති කිරීමට හේතු වේ. ඒ අනුව, රේගු පටිපාටි අවසන් වීමෙන් පැය 1 කට පසු ඉවත් කරගෙන නොමැති බහාලුම් සඳහා ගාස්තුවක් පැනවීමට තීරණය කරන ලද අතර එමගින් පරීක්ෂණ අංගනයේ රැඳෙන අතිරික්ත කාලය ඵලදායි ලෙස අඩුවී ඇති බව නිරීක්ෂණය විය. ශ්‍රී ලංකා රේගුව විසින් වඩාත් පෘථුල හා ඵලදායි ආකාරයෙන් මීළඟට පැවැත්වීමට නියමිත නිෂ්කාශන කාල නිර්ණ අධ්‍යයනය දේශ සීමා කාර්ය පටිපාටීන්හි ඉදිරි උන්නතිය සඳහා ඉතා තීරණාත්මක මෙවලමක් වනු ඇත.

එකී සියළු ප්‍රයත්නයන් මඟින් ආර්ථිකය තුළ වෙළඳාම සම්බන්ධයෙන් වන පිරිවැය පහත හෙලන අතර රේගු පාලනය තුළ කාර්යක්ෂමතා හා ඵලදායිතා වර්ධනය තුළින් රටට අන්‍යොන්‍ය ප්‍රතිලාභ අත්කර දීම පිණිස විනිවිදභාවයෙන් යුත් වාතාවරණයක් ඇති කිරීම සඳහා මහ පාදනු ඇත.

නිෂ්කාශන කාල නිර්ණ අධ්‍යයන (TRS)-2018 වාර්තාව ශ්‍රී ලංකා රේගු වෙබ් අඩවියෙන් බාගත කළ හැකිය:
http://www.customs.gov.lk/public/files/ppr/Time_Release_Study_Report_final.pdf

## 2.3.2 2019 වර්ෂය තුළ වෙළඳාම සඳහා පහසුකම් සැපයීම යටතේ ශ්‍රී ලංකා රේගුව විසින් ගත් ප්‍රාරම්බක ක්‍රියාමාර්ග

**ලෝක වෙළඳ සංවිධානය යටතේ වෙළඳාම සඳහා පහසුකම් සැපයීමේ ගිවිසුම (WTO – TFA) ක්‍රියාත්මක කිරීම පිළිබඳ ප්‍රගතිය**

ඉතිහාසයෙහි වූ විශාලතම බහු පාර්ශවයීය වෙළඳ ගිවිසුම 2013 වර්ෂයේදී බාලි අමාත්‍ය සම්මේලනයේදී නෛතික වශයෙන් විධිගත කරන ලද අතර 2017 පෙබරවාරි 22 දින සිට බලාත්මක කරන ලදී. ශ්‍රී ලංකාව විසින් මෙම ලෝක වෙළඳ සංවිධානයේ වෙළඳ පහසුකම් සැපයීමේ ගිවිසුමට (WTO – TFA) අත්සන් තබන ලද්දේ 2016 මැයි මාසයේදීය. මෙම ගිවිසුමෙහි විධිවිධානයන් පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීම මඟින් ගනුදෙනුවල විනිවිදභාවය වැඩි කිරීම, ගනුදෙනු සඳහා ගතවන කාලය හා පිරිවැය අඩු කිරීම තුළින් භාණ්ඩ සංචලනය, නිෂ්කාශනය හා නිදහස් කිරීම සඳහා පහසුකම් සැපයීම අපේක්ෂා කරන අතර රජය හා පෞද්ගලික අංශය අතර මේ සම්බන්ධව උසස් සංවාදයන් බිහි කිරීමට ද එය පිටිවහලක් වනු ඇත. ශ්‍රී ලංකාව විසින් කාණ්ඩ තුනක් යටතේ මෙහි ක්‍රියාත්මක සැලැස්ම ප්‍රකාශයට පත් කර ඇත. (A කාණ්ඩය යටතේ පියවර 11 ක්, B කාණ්ඩය යටතේ පියවර 2 ක් , C කාණ්ඩය යටතේ පියවර 23ක් වශයෙනි.) සමාලෝචිත වර්ෂය තුළ ගිවිසුම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සහ ඒ තුළින් සාක්ෂාත් කරගත් ප්‍රතිඵල පහත පරිදි වේ.

1. **ලෝක රේගු සංවිධානය විසින් නිර්දේශිත නිෂ්කාශන කාල නිර්ණ අධ්‍යයන සමීක්ෂණය (TRS) මඟින් හඳුනාගත් අවහිරතා ඉවත් කිරීම ( 7.6 වගන්තිය - සාමාන්‍ය මුදාහැරීමේ කාලය ස්ථාපනය කිරීම සහ ප්‍රකාශයට පත් කිරීම.)**

ශ්‍රී ලංකා රේගුව විසින් ප්‍රධාන දේශ සීමා නියෝජිතායතනයන් සහ පෞද්ගලික අංශයේ සහභාගිත්වය සහිතව ලෝක රේගු සංවිධානය මඟින් නිර්දේශිත නිෂ්කාශන කාල නිර්ණ අධ්‍යයන සමීක්ෂණය 2018 වර්ෂයේදී සිදු කරන ලදුව 2019 ජනවාරි මාසයේදී එහි සමීක්ෂණ වාර්තාව ප්‍රකාශයට පත් කළ අතර, ඒ අනුව ලෝක වෙළඳ සංවිධානය යටතේ වෙළඳ පහසුකම් සැපයීමේ ගිවිසුමෙහි 7.6 වන වගන්තියෙහි සඳහන් නියමයන් ප්‍රකාරව අවශ්‍ය ඉලක්ක සපුරා ගනු ලැබිණ.

2. **වටිනාකමින්/ ප්‍රමාණයෙන් ලඝු වූ භාණ්ඩ තොග සඳහා සහන සැලසීම (7.8 වගන්තිය: කඩිනමින් නිෂ්කාශනය කළයුතු නැව් භාණ්ඩ)**

ජාත්‍යන්තර වෙළඳ ක්ෂේත්‍රය තුළ විද්‍යුත් වාණිජ්‍යය හෙවත් ඊ වාණිජ්‍යය ජනප්‍රිය ගැනුම් හා විකුණුම් මාධ්‍යයක් බවට පත්ව ඇති අතර අඩු වටිනාකමින් යුත් කුඩා පාර්සල් කඩිනමින් නිෂ්කාශනය කිරීම හා බෙදා හැරීම එහි අත්‍යවශ්‍ය අංගයකි.
ලෝක වෙළඳ සංවිධානයේ වෙළඳ පහසුකම් සැපයීමේ ගිවිසුමෙහි (WTO – TFA) 7.8. (අ) සහ (ආ) වගන්ති යටතේ කඩිනම් නැව්ගත කිරීම් සම්බන්ධයෙන් අනුරූප චර්යා ධර්මයන් හඳුන්වා දී ඇති අතර එහි වෙළඳ පහසුකම් ලෙස අවධාරණය කර ඇති කරුණු තුළ ලියකියවිලි අවම කිරීම හා කඩිනමින් භාණ්ඩ මුදා හැරීම ප්‍රධාන අවශ්‍යතාවයකි.

ශ්‍රී ලංකා රේගුව උක්ත වගන්තිය සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කරමින් සිය විෂය කාර්යාවලිය යථාවත් කර ඇති අතර ඒ අනුව **වටිනාකමින්/ ප්‍රමාණයෙන් ලඝු** වූ භාණ්ඩ සඳහා වටිනාකම් සීමා (De Minimis values) ප්‍රකාශයට පත් කර ඇත.

පෞද්ගලික ආනයන (තෑගි ඇතුළුව) හා වෙළඳ සාම්පල සඳහා නොසලකා හැරිය හැකි තරම් වූ එනම් වටිනාකමින් ලඝු වූ භාණ්ඩ තොග සම්බන්ධව සහන ලබාදීම සඳහා ජාතික කාර්ය පටිපාටි කේතයන් (Procedure Codes) සකස් කර ඇත. නිශ්චිත වටිනාකමකට වඩා අඩු වටිනාකමින් යුත් පුද්ගලික භාණ්ඩ හා වෙළඳ සාම්පල සඳහා බදු ඉවත් කරනු ලබන්නාවූ භාණ්ඩ De-Minimis සහන සඳහා සුදුසුකම් ලද භාණ්ඩ තොග ලෙස සලකනු ලැබේ. De-Minimis සහන රජයේ ගැසට් නිවේදනවල නියම කර ඇති අතර පාර්සල් තැපෑල, කුරියර් සේවා මගින් බෙදා හරින භාණ්ඩ සහ කැටුව නොඑන මගී ගමන් මලු වැනි පුද්ගලික භාණ්ඩ හා වෙළඳ සාම්පල සඳහා ලබා දෙනු ලබන සහන සහ අදාල ජාතික ක්‍රියා පටිපාටි පිළිබඳ තොරතුරු ශ්‍රී ලංකා රේගු වෙබ් අඩවියෙන් ලබා ගත හැක.
http://www.customs.gov.lk/public/files/personal/Expedited%20Shipments%20PDF.pdf

3. **රේගු විමසුම් සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර තොරතුරු මධ්‍යස්ථානය ස්ථාපනය කිරීම සඳහා ප්‍රාරම්භක පියවර ගැනීම.**

පැය 24 පුරා ක්‍රියාත්මක වන රේගු විමසුම් සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර තොරතුරු මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා ලෝක වෙළඳ සංවිධානය යටතේ වන වෙළඳ පහසුකම් සැපයීමේ ගිවිසුමෙහි 1.3 වගන්තිය කෙරෙහි ජාතික වශයෙන් ඇති බැඳීම ප්‍රකාරව, නව රේගු විමසුම් සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර තොරතුරු මධ්‍යස්ථානය 2020 ජනවාරි 24 දිනට යෙදුනු ලෝක රේගු දින සැමරුමට සමගාමීව ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතියෙහි සමාරම්භක පියවර 2019 වර්ෂය අවසානයේදී ගනු ලැබීය. මෙම නව මධ්‍යස්ථානය විසින් ව්‍යාපාරිකයන් (දේශීය, විදේශීය) ආනයනකරුවන්, අපනයනකරුවන් යන විවිධ පාර්ශ්වයන් සඳහා ආනයන, අපනයන හා ප්‍රතිනැව්ගතකරණ සම්බන්ධ තොරතුරු හා ලියකියවිලි සැපයීම තුළින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා අත්‍යවශ්‍ය තොරතුරු සැපයීම හා සම්බන්ධීකරණය මඟින් පහසුකම් සලසනු ලැබේ.

# තුන්වන පරිච්ඡේදය- සමස්ත මූල්‍ය කාර්ය සාධනය

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය

## 3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

**ACA-F**

**2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාල පරිච්ඡේදය සඳහා වන මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය**

රු.

| අය වැය (වර්තමාන වර්ෂය ) | | සටහන | තථ්‍ය | |
|---|---|---|---|---|
| | | | වර්තමාන වර්ෂය | ඉකුත් වර්ෂය |
| - | **ආදායම් ලැබීම්** | | 619,458,070,988 | 716,277,377,520 |
| | | | | |
| - | ආදායම් බදු | 1 | | |
| **458,000,000,000** | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | 284,093,715,009 | 370,351,175,024 |
| **439,000,000,000** | ජාත්‍යන්තර වෙළදාම මත බදු | 3 | 331,838,575,975 | 340,155,619,009 |
| **5,775,000,000** | බදු නොවන ආදායම් සහ වෙනත් | 4 | 3,525,780,004 | 5,770,583,488 |
| **902,775,000,000** | **මුළු ආදායම් ලැබීම් (අ)** | | **619,458,070,988** | **716,277,377,520** |
| | | | | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | | |
| | | | | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 1,445,240,000 | (885,279,637,684) |
| - | තැන්පතු | | 27,814,765,405 | 30,294,894,379 |
| - | අත්තිකාරම් ගිණුම් - 1 | | 74,880,599 | 78,517,987 |
| | අත්තිකාරම් ගිණුම් - 2 | | 7,235,589 | |
| - | වෙනත් ලැබීම් | | 190,418,103,400 | 170,999,096,126 |
| - | **මුළු ආදායම් නොවන ලැබීම (ආ)** | | **219,760,224,993** | **(683,907,129,191)** |
| **902,775,000,000** | **මුළු ආදායම් ලැබීම් හා ආදායම් නොවන ලැබීම් ඇ= (අ) + (ආ)** | | **839,218,295,981** | **32,370,248,329** |
| | | | | |
| | **අඩු කළා වියදම** | | | |
| | | | | |
| | **පුනරාවර්තන වියදම්** | | | |
| **1,802,000,000** | වේතන වැටුප් සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 1,795,330,535 | 1,466,843,695 |
| **962,150,000** | අනිකුත් භාණ්ඩ හා සේවා | 6 | 778,282,222 | 684,661,486 |
| **18,350,000** | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 18,211,362 | 16,447,557 |
| | පොලී ගෙවීම් | 8 | | |
| | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | | |
| **2,782,500,000** | **මුළු පුනරාවර්තන වියදම් (ඇ)** | | **2,591,824,119** | **2,167,952,738** |
| | | | | |
| | මූලධන වියදම් | | | |
| **236,000,000** | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 10 | 42,019,870 | 56,230,951 |
| **108,600,000** | මූලධන වත්කම් අත්පත්කර ගැනීම් | 11 | 48,301,258 | 52,791,978 |
| | ප්‍රාග්ධන පැවරුම් | 12 | | |
| | මූල්‍ය වත්කම් අත්පත් කරගැනීම | 13 | | |
| **13,850,000** | හැකියා වර්ධනය | 14 | 1,261,878 | 949,350 |
| | වෙනත් මූලධන වියදම් | 15 | | |
| **358,450,000** | **මුළු මූලධන වියදම් (ඉ)** | | **91,583,006** | **109,972,279** |
| | | | | |
| | **ප්‍රධාන ලෙජර වියදම් (ඊ)** | | | |
| | තැන්පතු ගෙවීම් | | 25,859,735,860 | 29,992,512,872 |
| | අත්තිකාරම් ගෙවීම් -1 | | 87,463,872 | 107,350,545 |
| | අත්තිකාරම් ගෙවීම් - 2 | | 9,932,292 | |

| | | | | |
|---|---|---|---|---|
| | | | 25,957,132,024 | |
| 3,140,950,000 | මුළු වියදම උ = (ඈ + ඉ + ඊ) | | 28,640,539,149 | 32,377,788,434 |
| | | | | |
| 899,634,050,000 | 2019 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඈ - උ ) | | 810,577,756,832 | (7,540,105) |

## 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ACA-P

**2019** දෙසැම්බර් **31** දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන | තථ්‍ය | |
|---|---|---|---|
| | | වර්තමාන වර්ෂය | ඉකුත් වර්ෂය |
| | | රු. | රු. |
| <u>මූල්‍ය නොවන වත්කම්</u> | | | |
| දේපළ පිරියත හා උපකරණ | ඒසීඒ -6 | 11,888,828,533 | 11,839,151,053 |
| | | | |
| <u>මූල්‍ය වත්කම්</u> | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ -5/5(අ) | 283,637,596 | 268,357,620 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ -3 | 816,012 | 7,427 |
| මුළු වත්කම් | | **12,173,282,141** | **12,107,516,100** |
| <u>ශුද්ධ වත්කම් /ස්කන්ධය</u> | | | |
| ශුද්ධ වටිනාකම, භාණ්ඩාගාරයට | | (22,888,022,459) | (22,948,272,890) |
| දේපළ පිරියත හා උපකරණ | | 11,888,828,533 | 11,839,151,053 |
| කුලී හා වැඩ අත්තිකාරම් | | | |
| සංචිත | ඒසීඒ -5(ආ) | | |
| <u>ජංගම වගකීම්</u> | | | |
| තැන්පතු ගිණුම | ඒසීඒ -4 | 23,171,660,055 | 21,216,630,510 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ -3 | 816,012 | 7,427 |
| මුළු වගකීම් | | **12,173,282,141** | **12,107,516,100** |

පිටු අංක 13 සිට 14 තෙක් දැක්වෙන ඉහත 1 සිට 6 දක්වා වූ ඒසීඒ ආකෘති පත්‍ර වලින් ඉදිරිපත් කරන විස්තරාත්මක ගිණුම් ප්‍රකාශන මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ . මෙම මූල්‍ය ප්‍රකාශන පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සකස් කර ඇති අතර, මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මඟින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත .ඉහත අවසන්ගිණුම් වල ඇතුළත් සංඛ්‍යාත්මක අගයන් ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමග සැසඳීම් කර ඇති බවත්, ඒවා එකී සංඛ්‍යාවන් සමග එකඟ වන බවටත් මෙයින් සහතික කරමු .

| | | |
|---|---|---|
| ............ | ............ | ............ |
| ප්‍රධාන ගණන් දීමේ නිලධාරි | ගණන් දීමේ නිලධාරි | ප්‍රධාන මූල්‍ය නිලධාරි |
| නම: එස්. ආර්. ආටිගල | නම: විශ්‍රාමික මේජර් ජනරාල් ජී.වී. රවිප්‍රිය | නම: එන්.ජේ. ආර්.පුවිරාජ් |
| තනතුර: මහා භාණ්ඩාගාර ලේකම් | තනතුර: රේගු අධ්‍යක්ෂ ජනරාල් | දිනය: |
| දිනය: | දිනය: 21/08/2020 | |

එස්. ආර්. ආටිගල
මහා භාණ්ඩාගාරයේ සහ මුදල් අමාත්‍යාංශයේ ලේකම්
මුදල් අමාත්‍යාංශය
මහලේකම් කාර්යාලය
කොළඹ 01.

විශ්‍රාමික මේජර් ජනරාල් ජී. වී. රවිප්‍රිය
රේගු අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා රේගුව

එම්. ජේ. ආර්. පුවිරාජ්
ප්‍රධාන මූල්‍ය නිලධාරි
ශ්‍රී ලංකා රේගුව

## 3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ -සී

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

| | තථ්‍ය | |
|---|---|---|
| | වර්තමාන වර්ෂය | ඉකුත් වර්ෂය |
| | රු. | රු. |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් | | |
| මුළු බදු ලැබීම් | (380,515,676) | 716,277,377,520 |
| ගාස්තු, අධිභාර, දඩ මුදල් සහ බලපත්‍ර | | |
| ලාභය | | |
| ආදායම් නොවන ලැබීම් | 139,845,769 | 170,999,096,126 |
| වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | | |
| අග්‍රිම ලැබීම් | 1,695,240,000 | |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (අ)** | **1,454,570,093** | **887,276,473,646** |
| | | |
| අඩු කලා මුදල් වැය කිරීම් | | |
| පුද්ගල පඩි නඩි හා මෙහෙයුම් වියදම් | 2,588,799,789 | 2,165,216,031 |
| සහනාධාර සහ මාරු කිරීම් වියදම් | | |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | | |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 250,816,012 | 885,279,637,683 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ )** | **2,839,615,801** | **887,444,853,714** |
| | | |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)= (අ)-(ආ)** | **(1,385,045,708)** | **(168,380,068)** |
| | | |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් | | |
| පොලී | | |
| ලාභාංශ | | |
| හිමිකම් ඉවත් වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | | |
| උප ණය අයකර ගැනීම | 80,128,968 | |
| අත්තිකාරම් අයකර ගැනීම | 159,361 | |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | **80,288,330** | |
| | | |
| අඩුකලා- මුදල් වැය කිරීම් | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිළ දී ගැනීම් හා වෙනත් | 91,124,006 | |
| ආයෝජන අත්පත් කර ගැනීම් | | 109,972,279 |
| අත්තිකාරම් ගෙවීම් - **247011** | 89,945,906 | |
| අත්තිකාරම් ගෙවීම් – **247020 (ARABA)** | 8,583,527 | |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **189,653,439** | **109,972,279** |
| | | |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ ) = (ඈ) –(ඉ)** | **(109,365,109)** | **109,972,279)** |
| | | |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ)+(ඊ)** | **(1,494,410,817)** | **(278,352,347)** |
| | | |
| මූල්‍ය ක්‍රියාකාරක වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් | | |
| දේශීය ණය ගැනීම් | | |
| විදේශීය ණය ගැනීම් | | |
| ප්‍රදානයන් ලැබීම් | | |
| තැන්පතු ලැබීම | 4,756,791,671 | |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය ( ඌ)** | **4,756,791,671** | |
| | | |
| අඩුකලා- මුදල් වැය කිරීම් | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | | |
| විදේශීය ණය ආපසු ගෙවීම් | | |
| තැන්පතු ගෙවීම් | 3,262,380,854 | 278,606,555 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය ( එ)** | **3,262,380,854** | **278,606,555** |

| | | |
|---|---|---|
| | | |
| මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය ඒ=ළුං-ළු | **1,494,410,817** | **(278,606,555)** |
| | | |
| මුදල් වල ශුද්ධ වෙනස් වීම්(ඔ)=(ළු)-(ඒ) | **0** | |
| ජනවාරි 1 දින ට ආරම්භක මුදල් ශේෂය | **0** | |
| දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය | **0** | |

## 3.4 ආදායම් එකතු කිරීම පිළිබඳ කාර්ය සාධනය

රු. 000

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම් | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව (රු.) | අවසන් ඇස්තමේන්තුව ( රු.) | ප්‍රමාණය (රු.) | අවසාන ආදායම් ඇස්තමේන්තු වේ %ලෙස |
| **1001.01.00** | ආනයන තීරු බද්ද | 140,000,000 | 140,000,000 | 98,427,379 | 70% |
| **1001.02.00** | අපනයන තීරු බද්ද | 40,000 | 40,000 | 170,443 | 426% |
| **1001.04.00** | වරාය හා ගුවන් තොටුපළ සං.බද්ද | 115,000,000 | 115,000,000 | 112,174,180 | 98% |
| **1001.05.01** | ආනයන සෙස් බද්ද | 52,000,000 | 52,000,000 | 48,403,019 | 93% |
| **1001.05.02** | අපනයන සෙස් බද්ද | 2,000,000 | 2,000,000 | 2,299,688 | 115% |
| **1001.08.00** | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද | 90,000,000 | 90,000,000 | 70,363,866 | 78% |
| | | | | | |
| **1002.05.01** | සිගරට් | 115,000,000 | 115,000,000 | 87,367,370 | 76% |
| **1002.05.02** | මත් පැන් | | | 58,762 | |
| **1002.05.03** | ඛනිජ තෙල් | 90,000,000 | 90,000,000 | 61,740,304 | 69% |
| **1002.05.04** | මෝටර් වාහන | 240,000,000 | 240,000,000 | 130,377,882 | 54% |
| **1002.05.99** | අනිකුත් නිෂ්පාදන බදු | 13,000,000 | 13,000,000 | 4,549,397 | 35% |
| | | | | | |
| **2003.02.17** | ඇහලුම්- දේශීය අලෙවිය මත ගාස්තු | 350,000 | 350,000 | 145,948 | 42% |
| **2003.03.01** | දඩ සහ රාජසන්තක කිරීම් | 5,425,000 | 5,425,000 | 3,379,832 | 62% |

*** සටහන –**

**ඉහත ආදායම් විස්තර වල, රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව හා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් වැනි වෙනත් ආයතන වෙනුවෙන් එකතු කරන ලද ආදායම් අන්තර්ගත නොවේ.**

## 3.5 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. 000

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | සත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන,අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 2,814,100 | 2,782,500 | 2,591,824 | 93.14% |
| ප්‍රාග්ධන | 326,850 | 358,450 | 91,583 | 25.54% |

## 3.6 මු.රෙ. 208 ප්‍රකාරව වියදම් සඳහා මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

(**අනෙකුත්** අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට)

රු. 000

| අනුඅංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය /දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයෙහි අරමුණ | ප්‍රතිපාදන | | තථ්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල% ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| - | - | - | - | - | - | - |

## 3.7 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. 000

| වත්කම් කේතය | කේත විස්තරය | 2019.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 2019.12.31 දිනයට මූල්‍ය තත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේ දී ගිණුම්තැබීමට නියමිත | ප්‍රගතිය %ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| **9151** | ගොඩනැගිලි හා ව්‍යුහයන් | කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් ඇතිවූ ප්‍රමාදය නිසා වාර්තාව සකස් කිරීමේ කටයුතු අවසන් කර නැත. | | | |
| **152** | යන්ත්‍රෝපකරණ | | | | |
| **9153** | ඉඩම් | | | | |
| **9154** | අස්පෘශ්‍ය වත්කම් | | | | |
| **9155** | ජෛවීය වත්කම් | | | | |
| **9160** | කෙරී ගෙන යන වැඩ | | | | |
| **9180** | බදු දෙන ලද වත්කම් | | | | |

## 3.8 විගණකාධිපති වාර්තාව

මෙතැන් සිට අමුණා ඇත

# හතරවන පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක

## 4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක

(ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේප්‍රතිශතයක් ලෙස  තථ්‍ය නිමැවුම | | |
| **1.4.1** | | අවසන් කරන ලද, රේගු වැරදි සිදු නොවූ සිද්ධීන් සංඛ්යාව | | | 43 |
| **1.4.2** | | වෙනත් ඒකක/අංශවලට භාර දුන් සිද්ධි සංඛ්‍යාව | | | 1 |
| **1.1.4.3** | | සාමාන්‍ය ක්‍රමය යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා නිදහස් කරන ලද සිද්ධි සංඛ්‍යාව | | | - |
| **1.4.4** | | රඳවා ගැනීමට පෙර භාරදීම් | | | - |
| **1.4.5** | | සාර්ථකව නිම වූ පරීක්ෂණ | | | - |
| | | 1.4.5.1 | දඩ, තහනම් කිරීම් සහිතව / අතිරේක සටහන්කර | | 18 |
| | | 1.4.5.2 | අතිරේක සටහන්කර පමණක් සහිතව (මිල පිරික්සුම් අංශය මගින්) | | 1 |
| | | 1.4.5.3 | අතිරේක සටහන්කර පමණක් සහිතව (නිවාරණ අංශය විසින්) | | 1 |
| | (අ) | අවසන් කළ මුළු සිද්ධි සංඛ්‍යාව (1.4.1 සිට 1..4.5.3 දක්වා එකතුව) | | | 63 |
| **1.5** | අවසන් කර නොමැති පරීක්ෂණ | | | | |
| | 1.5.1 | රේගු පරීක්ෂණ අවසන් නොකළ සිද්ධි | | | 127 |
| | 1.5.2 | විමර්ශන අවසන් නොකළ සිද්ධි | | | 98 |
| | 1.5.3 | ලිහිල් කිරීම සඳහා අභියාචනා (අවසන් නොකළ) | | | - |
| | 1.5.4 | ක්‍රියාමාර්ග ගැනීම සඳහා දැනුම් දුන් | | | 1 |
| | (ආ) | අවසන් කර නොමැති සිද්ධීන් 1.5.1 සිට 1.5.4 දක්වා එකතුව) | | | 232 |

| | | |
|---|---|---|
| | **අයකර ගැනීම් (රු.)** | |
| **2.1** | රාජසන්තක කළ භාණ්ඩවල වටිනාකම | **123,708,141** |
| **2.2** | වර්ෂය ආරම්භයේ දී අයකර ගත යුතු වූ දඩ/තහනම් කිරීම් | **433,169,186** |
| **2.3** | වර්ෂය තුල දී පැන වූ දඩ/තහනම් කිරීම් | **114,727,217** |
| **2.4** | වර්ෂය තුල දී අයකළ දඩ/තහනම් කිරීම් | **196,281,973** |
| **2.5** | වර්ෂය අවසානයේ දී අය කළයුතු දඩ සහ තහනම් කිරීම් | **464,854,432** |
| **2.6** | මිළ පිරික්සුම් අංශයේ දී අය කළ අතිරේක සටහන්කර | **6,942,822** |

## 8.1.2 සමාජ ආරක්ෂණ අංශය

**හැඳින්වීම**

සමාජ ආරක්ෂණය තහවුරු කිරීම සඳහා මෙතෙක් රේගුවේ විවිධ අංශ යටතේ ක්‍රියාත්මක වූ ශාඛා කීපයක් සම්බන්ධ කරමින් සමාජ ආරක්ෂණ ක්‍රියාකාරකම් සඳහා වෙනමම අංශයක් ස්ථාපිත කරන ලදී .රේගු නීතිය සහ අනෙකුත් සම්බන්ධිත නීති දැඩිව බලාත්මක කිරීම පිණිස මත්ද්‍රව්‍ය නිවාරණ අංශය ,වරාය පාලන අංශය,පාරිභෝගික හා පාරිසරික ආරක්ෂණ අංශය සහ ජෛව ජෛව විවිධත්ව, සංස්කෘතික හා ජාතික උරුම ආරක්ෂණ අංශය යන කොටස් හඳුනාගෙන ඇත.

**ප්‍රධාන කාර්යභාරයන්**

රේගු කාර්යාල තුළ දී වෙළඳාම සඳහා පහසුකම් සැලසීමත්, පවතින නීති බලාත්මක කිරීම තුළින් නියමිත බදු ආදායම එකතු කිරීම සහතික කරන අතරම මත්ද්‍රව්‍ය සහ පුද්ගල අවමානසික තත්ත්ව කෙරෙහි බලපාන දෑ නීති විරෝධී ලෙස මෙරටට ඇතුලුවීම හෝ මෙරටින් පිටවීම වැළැක්වීම / තහනම් කිරීමත් පාරිසරික, ජෛව විවිධත්ව, සංස්කෘතික, ජාතික උරුමයන් හා පාරිභෝගික අයිතීන් ආරක්ෂා කිරීමත් මෙම අංශයේ කාර්යභාරය වේ.

### *8.1.2.1 මත්ද්‍රව්‍ය පාලන අංශය*

දැක්ම

විෂ මත්ද්‍රව්‍ය සහ මනෝවර්තක ද්‍රව්‍ය රට තුළට සංසරණය වීම වැළැක්වීම, එම ද්‍රව්‍යවල පූර්වගාමී රසායනික ද්‍රව්‍ය මෙරටට ආනයනය කිරීම සම්බන්ධයෙන් අධීක්ෂණය කිරීම සහ ඒවායේ නීති විරෝධී භාවිතය පිළිබඳව සෝදිසි කිරීම සඳහා, ගතිකව ක්‍රියාත්මක වන, නීති බලාත්මක කිරීමේ ප්‍රමුඛතම නියෝජිතායතනයක් වීම

මෙහෙවර

1. විෂ මත්ද්‍රව්‍ය සහ මනෝවර්තක ද්‍රව්‍ය වල අනිසි හා නීති විරෝධී සංසරණය වැළැක්වීම, පාලනය සහ මර්දනය
2. අදාළ නීති බලාත්මක කිරීම සඳහා රජයේ වෙනත් ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය නොවන බලධාරීන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.
3. විෂ මත්ද්‍රව්‍ය සහ මනෝවර්තක ද්‍රව්‍ය නීතිවිරෝධී ලෙස ප්‍රවාහනය කිරීම සම්බන්ධයෙන් විවිධ ජාත්‍යන්තර සම්මුතීන් යටතේ ජාතික බැඳීම් ක්‍රියාත්මක කිරීම පිළිබඳව සහතික වීම.
4. අදාළ විදේශීය බලධාරීන් හා ජාත්‍යන්තර සංවිධාන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.
5. පවත්නා හා මතුවෙමින් පවතින අභියෝග තක්සේරු කිරීමට සහ විශ්ලේෂණය කිරීමට කාර්ය මණ්ඩලය පුහුණු කිරීම.
6. මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳව සමාජය දැනුවත් කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

**නීති සහ රෙගුලාසි**

1. 1869 අංක 17 දරන රේගු ආඥා පනත
2. 1984 අංක 13 දරන පනත ලෙස සංශෝධනය කරන ලද 1929 අංක 17 දරණ විෂ, අබිං වර්ග හා අන්තරායකර ඖෂධ පිළිබඳ ආඥා පනත
3. 1980 අංක 27 දරන විලවුන්,ආලේපන උපාංග සහ ඖෂධ පනත
4. 2008 අංක 1 දරන මත්ද්‍රව්‍ය සහ මනෝවර්තක ද්‍රව්‍ය නීතිවිරෝධී ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනත
5. පූර්වගාමී පාලන අධිකාරියේ රෙගුලාසි, අංක1653/7 හා 2010 මැයි 10 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනය
6. 1999 අංක 8 දරන දුම්කොළ බදු පනත
7. දුම්කොළ බදු පනතේ රෙගුලාසි, 2009 ජූලි මස 17 දිනැති අංක 1610/28 දරන අති විශේෂ ගැසට් නිවේදනය
8. 1993 අංක 22 දරන දණ්ඩ නීති සංග්‍රහ පනත
9. 2018 අංක 26 දරන සුරාබදු පනත,

**ප්‍රධාන කාර්යයන්**

1. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලේ සහ යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපලේ පැය 24 පුරා සෝදිසි කිරීම.
2. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලේ CCTVආරක්ෂක කැමරා පද්ධති මාර්ගයෙන් මගීන් නිරීක්ෂණය කිරීම සහ ලුහුබැඳීම.
3. මාර්ග, ප්‍රභවස්ථානය, රටාව සහ චර්යා රටා ආදිය සැලකිල්ලට ගනිමින් අවදානම් පැතිකඩ මත පදනම්ව මගීන් හඳුනා ගැනීම සහ මැදිහත් වීම.
4. ගුවන් භාණ්ඩ, මුහුදු භාණ්ඩ, තැපැල් සහ කුරියර් භාණ්ඩ යනාදිය අහඹු ලෙස නිරීක්ෂණය කිරීම.
5. මධ්‍යම තැපැල් හුවමාරුවේ ක්‍රමානුගත චාරිකා සහ අධීක්ෂණය.

6. මධ්‍යම තැපැල් හුවමාරුවේ අවදානම් පැතිකඩ භාවිතා කරමින් මත්ද්‍රව්‍ය ප්‍රභව රටවලින් පැමිණෙන පාර්සල් අහඹු ලෙස රඳවා තබා ගැනීම.
7. ගුවන් හා මුහුදු මාර්ග හරහා ප්‍රවාහනය වන වාණිජ ආනයන හා අපනයන මගින් විෂ මත්ද්‍රව්‍ය සහ මනෝවර්තක ද්‍රව්‍ය ජාවාරම හඳුනා ගැනීම සහ වැළැක්වීම.
8. විශ්වාසදායක තොරතුරු පිළිබඳ පරීක්ෂණ සිදු කිරීම.
9. පොදු හා අභ්‍යන්තර දැනුවත් කිරීමේ හා පුහුණු කිරීමේ වැඩසටහන් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල රජයේ නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ හා පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
10. පූර්වගාමී රසායනික ආනයන, ප්‍රතිනැව්ගත කිරීම් හා අපනයන අධීක්ෂණය කිරීම.
11. පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය වැනි වෙනත් මෙහෙයුම් ආයතන සමඟ ඒකාබද්ධ මෙහෙයුම් සිදු කිරීම.

**පසුගිය වසර 5 තුළ (2015-2019) මත්ද්‍රව්‍ය පාලන ඒකකය මගින් කළ අනාවරණයන්**

| විෂ මත්ද්‍රව්‍ය වර්ගය | 2015 (කි.ග්‍රෑ) | 2016 (කි.ග්‍රෑ) | 2017 (කි.ග්‍රෑ) | 2018 (කි.ග්‍රෑ) | 2019 (කි.ග්‍රෑ) | එකතුව |
|---|---|---|---|---|---|---|
| **කොකේන්** | 5.58 | 1232.04 | - | 2.38 | 8.94 | **1248.94** |
| **හෂිස්** | 2.98 | - | 0.08 | 15.74 | 3.05 | **21.85** |
| **මෙතම්ෆෙටමින්** | - | 0.52 | - | 1.61 | 16.87 | **19** |
| **කංසා** | 0.01 | 5.41 | 1.42 | 8.83 | 3.96 | **19.63** |
| **හෙරොයින්** | 6.14 | 8.83 | 8.86 | 1.83 | - | **25.66** |
| **බාට්** | - | - | 32.00 | 199.64 | 73.50 | **305.14** |
| **ඩයසපාම්** | - | - | - | 19.76 | - | **19.76** |
| **එකතුව** | **14.71** | **1246.8** | **42.36** | **249.79** | **106.32** | **1659.98** |

මත්ද්‍රව්‍ය සිද්ධීන් 33 ක් මෙම වසර තුළ වාර්තා වී ඇති අතර මත්ද්‍රව්‍ය කිලෝග්‍රෑම් 106.32 ක් අත්අඩංගුවට ගෙන තිබේ. 2019 වර්ෂයේ දී මෙම අත් අඩංගුවට ගැනීම් වැඩිම සංඛ්‍යාවක් සම්බන්ධ වූ රටවල් ලෙස ඉන්දියාව, බ්‍රසීලය සහ ඉතියෝපියාව හඳුනාගෙන තිබේ.
පසුගිය වසර පහ තුළ (2015 සිට 2019 දක්වා) මත්ද්‍රව්‍ය කිලෝග්‍රෑම් 1659.98 ක් අත්අඩංගුවට ගෙන ඇති අතර එයට කොකේන්, හෙරොයින්, මෙතම්ෆෙටමින් කංසා, හෂිස්, බාට් සහ ඩයසපාම් ඇතුළත් වේ.

**මත්ද්‍රව්‍ය පාලන ඒකකය මගින් කළ අනාවරණයන් 2015 -2019 - මත්ද්‍රව්‍ය වර්ගය අනුව**

කොකේන්

2019 දී කොකේන් (***Cocaine)*** හසු කර ගැනීමේ සිද්ධි 04 ක් වාර්තා වූ අතර ඒවායේ බර ප්‍රමාණය කිලෝග්‍රෑම් 8.94 කි. සැකකරුවන් වූයේ ගිනි බිසාවු, බොලිවියාව, ඉන්දියාව සහ බ්‍රසීලය යන රටවලින් පැමිණි පුද්ගලයන්ය.

කොකේන් ජාවාරමේ සිදුවූ හදිසි වැඩිවීමට හේතු සොයා බැලීමේ දී විශාල කොකේන් තොග ප්‍රතිනැව්ගත කිරීමේ වරායන් හරහා පිටත්වීමේ හා ගොඩබෑමේ අවස්ථා දෙකෙහිම දූෂිත සේවකයන් යොදා ගනිමින් සිදු කරන "Rip on- rip off " ක්‍රමෝපාය භාවිතා කරමින් ජාවාරම් කිරීමට උත්සාහ කර ඇති බව 2016 වර්ෂයේ දී අනාවරණය කර ගැණිනි. ඒ කෙසේ වෙතත්, ජාවාරම්කරුවන්හට ප්‍රතිනැව්ගතකරණ වරායන්හි දී සැඟවීමට අපොහොසත් වී ඇති බවත් ඒ අනුව මෙම කොකේන් තොග අල්ලා ගැනීමට ශ්‍රී ලංකා රේගුවට හැකිව ඇති බවත් නිරීක්ෂණය වේ.




හෙරොයින් ***( Heroin)***

2019 දී හෙරොයින් සම්බන්ධ කිසිදු හසු කරගැනීමක් පිළිබඳව වාර්තා වී නොමැත.



මෙතම්ෆෙටමින්

2019 දී මෙතම්ෆෙටමින් (***Methamphetamine)*** පෙති හසු කර ගැනීමේ සිද්ධි 09 ක් සහ ක්‍රිස්ටල් මෙතම්ෆෙටමින් ස්ඵටික හසු කර ගැනීමේ සිද්ධි 07 ක් වාර්තා වූ අතර, මෙකී සිද්ධීන් 16 ට අදාල මුළු මෙතම්ෆෙටමින් ප්‍රමාණය කිලෝග්‍රෑම් 19.00 කි. මෙම මත්ද්‍රව්‍යවල ප්‍රභවස්ථාන වූයේ නෙදර්ලන්තය, ඉන්දියාව, ප්‍රංශය, කැමරූන්, පෘතුගාලය සහ බෙල්ජියම ය.




කංසා

2019 දී  නීති විරෝධී අයුරින් කංසා **(Cannabis)** ප්‍රවාහනය **කිරීමේ සිද්ධීන් 04** ක් වාර්තා වූ අතර ඒවායේ මුළු බර ප්‍රමාණය කි.ග්‍රෑ 3.96කි.




**හෂිස්**

හෂිස් ***( Hashish)*** කිලෝග්‍රෑම් 03.05 කට අදාළව සිද්ධීන් 03 ක් 2019 වර්ෂයේ දී අනාවරණය කර ගනු ලැබීය. මෙම මත්ද්‍රව්‍යවල ප්‍රභවස්ථාන රට වූයේ ඉතාලියයි.




ඛාට්

2019 දී කිලෝ ග්‍රෑම් 73.5 ක ප්‍රමාණයකට අදාළව ඛාට් (***Khat)*** හසු කර ගැනීමේ සිද්ධි 06 ක් වාර්තා විය. මෙම අත්පත් කර ගත් ඛාට් වල මුල් රට ඉතියෝපියාව බව අනාවරණය විය.



**මත්ද්‍රව්‍ය පාලන ඒකකය මගින් කළ අනාවරණයන් 2015 -2019 - ස්ථාන අනුව**

| අනාවරණ ස්ථානය | **2019** (කි.ග්‍රෑ) | **2018** (කි.ග්‍රෑ) | **2017** (කි.ග්‍රෑ) | **2016** (කි.ග්‍රෑ) | **2015** (කි.ග්‍රෑ) | එකතුව (කි.ග්‍රෑ) |
|---|---|---|---|---|---|---|
| බ.ජා.ගු | 18.06 | 18.77 | 8.86 | 18.1 | 11.34 | 75.13 |
| තැපැල් තක්සේරු | 83.76 | 222.8 | 33.5 | 0.52 | 0.01 | 340.59 |
| ඩීඑච්එල් | 2.44 | - | - | - | - | 2.44 |
| යූපීඑස් | 2.05 | - | - | - | - | 2.05 |
| නිවාරණ | 0.01 | - | - | - | - | 0.01 |
| ගුවන් භාණ්ඩ | - | 8.22 | - | - | - | 8.22 |
| ආර්සීටී | - | - | - | 1228.18 | - | 1228.18 |
| සීසීඊ | - | - | - | - | 2.98 | 2.98 |
| මිඩ්කෝ | - | - | - | - | 0.38 | 0.38 |
| එකතුව (කි.ග්‍රෑ) | **106.32** | **249.79** | **42.36** | **1246.8** | **14.71** | **1659.98** |

**සිදු කරන ලද විශේෂ මෙහෙයුම්**

**"අයිස් බ්‍රේක්" මෙහෙයුම**

අයිස් බ්‍රේක් මෙහෙයුම යනු රන් ත්‍රිකෝණය තුළ සහ මෙක්සිකෝව ඇතුළු උතුරු ඇමරිකාවෙහි මෙතම්ෆෙටමින් ජාවාරම කෙරෙහි අවධානය යොමු කරනු ලබන ජාත්‍යන්තර මෙහෙයුමක් වන අතර මත්ද්‍රව්‍ය ජාවාරමට එරෙහිව ක්‍රියාශීලී ප්‍රතිචාර දැක්වීම සහ සහයෝගී උත්සාහයන් මගින් නීති විරෝධී මත්ද්‍රව්‍ය සැපයුම් දාමය කඩාකප්පල් කිරීම මෙහි අරමුණයි.

ජාත්‍යන්තර සංවිධානය : ආසියානු පැසිෆික් කලාපීය බුද්ධි සම්බන්ධතා කාර්යාලය (RILO AP)
කාලය : 2019 දෙසැම්බර් 02 - 2019 දෙසැම්බර් 27
ඉලක්කගත ස්ථාන : ගුවන් භාණ්ඩ, කළඹබු කාගෝ, ඩීඑච්එල්, යුනයිටඩ් පාර්සල් සර්විසස් මධ්‍යම තැපැල් හුවමාරුව සහ කැටුව නොඑන ගමන් මලු ගබඩ

**"ට්‍රාන්ස්" මෙහෙයුම**

ජාත්‍යන්තර විෂ මත්ද්‍රව්‍ය පාලන මණ්ඩලයේ (INCB) මනෝවර්තක පිළිබඳ ජාත්‍යන්තර මෙහෙයුම් ගෝලීය ව්‍යාපෘතිය (ION) සහ OPIOIDS ගෝලීය ව්‍යාපෘතිය විසින් ට්‍රාන්ස් මෙහෙයුම යටතේ ඉලක්කගත ප්‍රයත්නයන්ට රුකුල් සැපයීම පිණිස සැක සහිත භාණ්ඩ තොග හෝ කෙටමයින් *(Ketamine)* සහ ට්‍රැමඩෝල් *(Tramadol)* නීති විරෝධී සංසරණ හසු කර ගැනීම සඳහා IONICS මාර්ගගත සන්නිවේදන පද්ධතිය හරහා බුද්ධි තොරතුරු ලබා ගැනීම හා ඒවායේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සිදු කරයි.

ජාත්‍යන්තර සංවිධානය : ජාත්‍යන්තර විෂ මත්ද්‍රව්‍ය පාලන මණ්ඩලය (INCB)
කාලය : 2019 දෙසැම්බර් 02 - 2019 දෙසැම්බර් 22
ඉලක්කගත ස්ථාන : ගුවන් භාණ්ඩ, කළඹබු කාගෝ, ඩීඑච්එල්, යුනයිටඩ් පාර්සල් සර්විසස් මධ්‍යම තැපැල් හුවමාරුව සහ කැටුව නොඑන ගමන් මලු ගබඩා

### *8.1.2.2 ජෛව විවිධත්ව, සංස්කෘතික හා ජාතික උරුම ආරක්ෂණ අංශය*

සමාජය සහ එහි උරුමය ආරක්ෂා කිරීම රේගු දෙපාර්තමේන්තුවේ එක් අරමුණක් වේ. පරිසරය ආරක්ෂා කිරීම මෙම කටයුත්තේ වැදගත් කාර්යයකි. බොහෝ ජාත්‍යන්තර මෙන්ම ජාතික ආයතන මීට සම්බන්ධ වී සිටින අතර, එම ආයතන මෙකී ප්‍රයත්නයේදී ශ්‍රී ලංකා රේගුව සමඟ ඉතා සමීපව කටයුතු කරයි. ආනයනය කිරීමේ දී හා අපනයනය කිරීමේදී ජෛව විවිධත්වයට අදාල විවිධ නීති බලාත්මක කිරීමට ශ්‍රී ලංකා රේගුව බැඳී සිටී.

සර්ම කලාපීය රටක් ලෙස වෘක්ෂලතාවන් හා වන සතුන්ගෙන් ආඩ්‍යයව පවතින ශ්‍රී ලංකාව, ජෛව විවිධත්වයෙන් පොහොසත් රටවලින් එකක් මෙන් ම ලෝකයේ ජෛව විවිධත්වය අතින් වඩාත්ම ආකර්ෂණීය රටවල් අට අතරින් එකක් ලෙස ද සැලකේ. එහි ප්‍රතිඵලයක් වශයෙන්, පර්යේෂණ සඳහා මෙන්ම විනෝදාංශය සඳහා ශාක හා සතුන් රැස් කරන්නන් විශාල ප්‍රමාණයක් ආකර්ෂණය කර ඇති මෙරට ජෛව විශේෂයන් සඳහා ලෝකය පුරා ඉතා ඉහළ ඉල්ලුමක් ජනිත වී ඇත. ඉහළ ප්‍රතිශතයක් වන ඒකදේශිකතාව, දුර්ලභ විශේෂයන්, විසිතුරු බවෙහි ඇති

වටිනාකම්, මෙරට ජෛව විශේෂවල ඇති සුවිශේෂී ස්වභාවය හා ගුණය නිසා මෙම ජෛව සම්පත් අධික උපයෝජනයකට ලක්වීමට හේතු වී ඇත. මේ අතර නීති විරෝධී ජාවාරම් කටයුතු සඳහා නූතන තාක්ෂණය සහ සූක්ෂ්ම ක්‍රමවේද භාවිතයට පෙළඹීම හේතුවෙන් ජෛව විවිධත්වය හා සබැඳි අයිතමයන් නීති විරෝධීව බැහැර කිරීම පිළිබඳව අධීක්ෂණය කිරීමේදී හා ඒවා මැඩ පැවැත්වීමේදී ශ්‍රී ලංකා රේගුවට ප්‍රබල අභියෝගයන් රැසකට මුහුණ පෑමට සිදු වී ඇත.

මෙම අභිමතාර්ථය සාක්ෂාත් කර ගැනීමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන ජෛව විවිධත්ව ආරක්ෂණ ඒකකය ස්ථාපිත කරන ලදී. පවත්නා තොරතුරුවලට අනුව මෙය ලෝකයේ ප්‍රථම රේගු ජෛව විවිධත්ව ආරක්ෂණ ඒකකය වේ.

වසර දෙදහස් පන්සීයයකට වැඩි ලිඛිත ඉතිහාසයක් හා තවත් වසර දෙදහස් පන්සීයයකට වැඩි ප්‍රාග් ඓතිහාසික සාධක සහිතව වසර සිය දහසක් ඈතට දිවයන අනර්ඝ සංස්කෘතියක් හා ජාතික උරුමයක් ශ්‍රී ලංකාවට හිමි වේ.

රටේ මිල කළ නොහැකි උරුමයන් සුරක්ෂිත කිරීම සහ එම උරුමයන්වලට අයත් වංචල කෞතුක භාණ්ඩ නීති විරෝධීව අපහරණය කිරීම වැළැක්වීම රේගු දෙපාර්තමේන්තුවේ එක් අභිමතාර්ථයක් වේ.

2010 වර්ෂයේ රේගු ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය තුළ දී ජෛව විවිධත්ව, සංස්කෘතික හා ජාතික උරුමයන් ආරක්ෂණ අංශය (BCNP) නිර්මාණය කර සමාජ ආරක්ෂණ අංශය යටතේ ස්ථාපිත කරන ලදී. එබැවින් සංස්කෘතික හා ජාතික උරුමයන් පිළිබඳ කටයුතුවලට ඉඩකඩ පහසුකම් සලසා දීම සඳහා ජෛව විවිධත්ව ඒකකයේ විෂය පථය ද වැඩි දියුණු කරන ලදී.

ප්‍රධාන කාර්යභාරයන්

1. ජෛව විවිධත්ව ගණයට අයත් භාණ්ඩ දේශ සීමා අතර සංචලනයේදී අදාල ජාතික හා ජාත්‍යන්තර නීති බලාත්මක කිරීම.
2. සියළුම ජෛව විවිධත්ව සම්බන්ධකම් ඇති ආනයන හා අපනයනවල විස්තර, වර්ගීකරණය හා වටිනාකම පිළිබඳව පරීක්ෂා කිරීම.
3. වන සත්ත්ව හා වෘක්ෂලතා සම්බන්ධ ආනයන හා අපනයන පාලනය සඳහා වන බලපත්‍ර අවශ්‍යතාවයන් සෝදිසි කිරීම හා එවැනි ආනයන හා අපනයනවල අවිධිමත්භාවය නිසා රේගු ක්‍රියාදාමයන්ට වන බලපෑම සොයා බැලීම.
4. ජීව විද්‍යාත්මක සමතුලිතතාවයට, ජෛව උරුමයට හානි නොවන ආකාරයෙන් පමණක් ශාක හා සතුන් ආනයන හා අපනයන සිදුකිරීමට රටේ සංවර්ධන ව්‍යාපෘති දිරිමත් කිරීම

**වැදගත් අනාවරණයන්**

**පණ ඇති ඉබ්බන් හසුකර ගැනීම**

2019 මැයි 18 වන දින ගුවන් තොටුපොල මගින් පිටත්වන පර්යන්තයේ දී මගී ගමන් මල්ලක සඟවා ඉබ්බන් දෙදෙනෙකු නීති විරෝධී අයුරින් රැගෙන යාමට තැත් කිරීමේදී ජෛව විවිධත්ව, සංස්කෘතික හා ජාතික උරුම ආරක්ෂණ අංශයේ සහකාර රේගු අධිකාරීවරයා විසින් එම ප්‍රයත්නය වලකා ලමින්, වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂණ ආඥා පනත සමඟ කියවෙන රේගු ආඥා පනත (235 වන අධිකාරය) උල්ලංඝනය කිරීමක් වශයෙන් මෙම සිද්ධිය අනාවරණයට ලක් කරන ලදී.




**වටිනා ආවේණික දැව හඳුනා ගැනීම - වල්ලපට්ටා *(Gyrinops walla)***





වල්ලපට්ටා (***Gyrinops walla***) ජාවාරම සම්බන්ධ වැදගත් අවස්ථා දෙකක් වනුයේ ශ්‍රී ලාංකිකයන් විසින් ඩුබායි වෙත නීති විරෝධීව රැගෙන යාමට ගත් ප්‍රයත්නයන් 2019 සැප්තැම්බර් 05 සහ 2019 සැප්තැම්බර් 24 දින බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොල පිටත්වීමේ මගී පර්යන්තයේදී හසු කර ගනු ලැබීමයි. සාරාංශයක් ලෙස, වල්ලපට්ටා කැබලි කිලෝග්‍රෑම් 148.27 ක්, වල්ලපට්ටා තෙල් ග්‍රෑම් 722.92 ක් අපනයනය කිරීමේ උත්සාහයන් ඒ මගින් වලක්වන ලද අතර, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලේ මගින් පිටත්වන පර්යන්තයේදී හසුකරගන්නා ලද මෙම භාණ්ඩ ඩුබායි, ඉන්දියාව සහ බහරේන් වැනි රටවල් වෙත නීති විරෝධී අයුරින් රැගෙන යාමට තැත් කිරීමේදී රාජ සන්තක කරන ලදී.

වල්ලාපට්ට කැබලි සහ එයින් ලබාගන්නා තෙල් සුවඳ විලවුන් සහ දුම්මල නිෂ්පාදන කර්මාන්තවලදී අමුද්‍රව්‍යක් වශයෙන් ලෝක වෙළඳපොලේ භාවිතා වේ. මෙම නිෂ්පාදන වලට ලෝක වෙළඳපලේ ඉහළ ඉල්ලුමක් ඇත. එම නිසා ජාවාරම්කරුවන් විසින් ශ්‍රී ලංකාවේ ස්වභාවික වනාන්තරවලින් ඒවා එකතු කර විශාල වශයෙන් මුදල් ඉපයීම සඳහා අපනයනය කරනු ලබන අතර මෙවැනි කටයුතු ශ්‍රී ලංකාවෙහි වනාන්තරවල පැවැත්මට අතිශය හානිදායක වේ.වල්ලාපට්ට වනාන්තර නිෂ්පාදනයක් වන බැවින් අපනයනය කිරීම තහනම් කර ඇත. වනජීවී

දෙපාර්තමේන්තුවේ වලංගු බලපත්‍රයක් රහිතව වල්ලාපට්ට අපනයනය කිරීම වන සංරක්ෂණ ආඥා පනත සමඟ කියැවිය යුතු රේගු ආඥා පනත  (235 වන අධිකාරය) උල්ලංඝනය කිරීමකි .

**සජීවී ඇන්තූරියම් ශාක හඳුනා ගැනීම**



2019 සැප්තැම්බර් 05 වන දින තායිලන්තයේ බැංකොක් නුවර සිට පැමිණි ශ්‍රී ලාංකික මගියෙකු වලංගු බලපත්‍රයක් හෝ සෞඛ්‍ය සහතිකයක් නොමැතිව**,** ප්‍රකාශනයකින් තොරව**,** සජීවී ඇන්තූරියම් පැල රැගෙන ඒමට උත්සාහ කිරීම හේතුවෙන් අත්අඩංගුවට ගනු ලැබීය. තොගයේ වටිනාකම රු.500,000 කි. විනාශ කිරීම සඳහා තොගය ශාක නිරෝධායනයට භාර දෙන ලදී.

**සජීවී මාලු විශේෂ අත්අඩංගුවට ගැනීම.**



2019 ඔක්තෝබර් 18 වන දින සිංගප්පූරුවේ සිට පැමිණි ශ්‍රී ලාංකික මගියෙකු වලංගු බලපත්‍රයක් හෝ සෞඛ්‍ය සහතිකයක් නොමැතිව, ප්‍රකාශ කිරීමකින් තොරව, සජීවී තත්වයේ පැවති මාලු විශේෂයක් රැගෙන යාමට උත්සාහ කිරීම සම්බන්ධයෙන් අත්අඩංගුවට ගනු ලැබීය. තොගයේ වටිනාකම රුපියල් 1,800,000 කි. තොගය නැවත මුල් රටටම අපනයනය කරන ලදී.

කොතල හිඹුටු ***(Salacia reticulata)*** **හසුකර ගැනීම**



2019 වර්ෂයේදී බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොලේ මගීන් පිටත්වන පර්යන්තයේ දී රාජසන්තක කරන ලද කොතල හිඹුටු භාජන සංඛ්‍යාව 167 ක් විය.මේවායින් බහුතරය චීන ජාතිකයන් විසින් චීනයට නීති විරෝධීව ප්‍රවාහනය කිරීමට තැත් කිරීමේදී හසුකර ගන්නා ලද ඒවා වේ.

2019.05.19 දින එම පර්යන්තයේදී කොතල හිඹුටු කැබලි කි.ග්‍රෑ. 17 ක්**,** 2019.01.24 දින තවත් කි.ග්‍රෑ. 10 ක්**,** 2016.03.09 දින කි.ග්‍රෑ 04 සහ 2019.06.06 සහ 2019.08.05 දින කොතල හිඹුටු කැබලි කි.ග්‍රෑ. 02 වශයෙන් රාජසන්තක කළ මේ සියලු අවස්ථා වල වැරදිකරුවන් වූයේ චීන ජාතික මගීන් ය.

දියවැඩියාව, සෙංගමාලය සුව කරන සහ ආහාර ජීර්ණ ක්‍රියාවලිය යනාදියේ දී ඉහළ විශේෂ ඖෂධීය වටිනාකමකින් යුත් කොතල හිඹුටු **(*Salacia reticulata*)** ශ්‍රී ලංකාවෙහි වැවෙන දේශීය ශාකයකි. මෙම ශාකයට දැනට ලබාදී ඇති පේටන්ට් බලපත්‍ර හා ඉදිරිපත් කර ඇති පේටන්ට් අයදුම්පත්‍ර සංඛ්‍යාව 150 කට ආසන්නය. බහුතරය ලබා ගන්නේ ජපන් ජාතිකයන් විසිනි. ජපානය මෙම පැළය භාවිතා කරමින් ඖෂධ නිෂ්පාදනය කරන ප්‍රධාන නිෂ්පාදකයෙකි. ජාත්‍යන්තර වෙළඳපොළ තුල මේ සඳහා වන ඉල්ලුම ඉහළ යමින් පවතින නිසා මේවා නීති විරෝධීව පිටමං කිරීමට බොහෝ අය ප්‍රයත්න දරති. කොතල හිඹුටු වනාන්තර නිෂ්පාදනයක් ලෙස සලකනු ලබන අතර වන සත්ත්ව හා වෘක්ෂලතා ආඥා පනත යටතේ සුරක්ෂිත කරනු ලැබ ඇත. කොතල හිඹුටු වල කිසියම් නිෂ්පාදනයක් අපනයනය කිරීම වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂණ ආඥා පනත සහ වන සංරක්ෂණ ආඥා පනත සමග කියවෙන රේගු ආඥා පනත (අධිකාරය 235) උල්ලංඝනය කිරීමකි.

**සජීවී පක්ෂීන් හසු කර ගැනීම**

**2019 ජනවාරි 24 වන දින බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළේදී වලංගු බලපත්‍ර සහ සෞඛ්‍ය සහතික නොමැතිව බැංකොක් සිට ශ්‍රී ලංකාවට හොර රහසේ ගෙන ඒමට උත්සාහ කරන අතරතුර පණ ඇති පක්ෂීන් 57 දෙනෙකු රේගු නිලධාරීන් විසින් හසු කර ගන්නා ලදී. ජාවාරම්කරුට දඬුවම් නියම කළ අතර සජීවී පක්ෂීන් තායිලන්තයේ බැංකොක් වෙත නැවත අපනයනය කරන ලදී.**






### *8.1.2.3 පාරිභෝගික හා පාරිසරික ආරක්ෂණ අංශය*

දැනට රටේ බලපැවැත්වෙන රෙගුලාසි හා ප්‍රමිතිවලට අනුකූලව ආනයනික භාණ්ඩවල තත්ත්වය පාලනය හා අධීක්ෂණය කිරීමේ අදහසින් 2011 දී පාරිභෝගික හා පාරිසරික ආරක්ෂණ අංශය ස්ථාපිත කරන ලදී. ආනයනික හා අපනයනික භාණ්ඩවල බුද්ධිමය දේපල අයිතීන් සම්බන්ධ නීති බලාත්මක කරන ශ්‍රී ලංකා රේගුවේ කේන්ද්‍රීය ස්ථානය ලෙස පාරිභෝගික හා පාරිසරික ආරක්ෂණ අංශය ක්‍රියාත්මක වේ. ජාත්‍යන්තර සම්මේලනවලදී ගන්නා තීන්දු හා තීරණ මත නීති හා බලාත්මක කිරීම තුළින් වෙනත් සම්බන්ධිත ආයතනවල සහයෝගීතාවය හරහා පරිසරය ආරක්ෂා කිරීමට ද පාරිභෝගික හා පාරිසරික ආරක්ෂණ අංශය දායක වේ.

**ප්‍රධාන කාර්ය භාරයන්**

1. යම් උල්ලංඝනයවීම් හෝ වංචා වළක්වා ගැනීම පිණිස බුද්ධිමය දේපළ අයිතිවාසිකම් පනත **(IPR),** ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනත **(SLSI) ,** ජාතික ඖෂධ නියාමන පනත **(NMRA),** පාරිභෝගික කටයුතු අධිකාරි පනත **(CAA)**, පරමාණු බලශක්ති අධිකාරි පනත **(AEA),** සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සහ ආරක්ෂක අමාත්‍යාංශය නියම කර ඇති රේගුවට සම්බන්ධ නීතිවල අවශ්‍යතාවයන් බලාත්මක කිරීම. ඉහත අධිකාරි බලයන්ගෙන් ආවරණය වන සියළුම ආනයන රේගුවෙන් නිදහස් කර ගැනීමට පෙර පාරිභෝගික හා පාරිසරික ආරක්ෂණ අංශය **(CPU)** වෙත යොමු කිරිම අවශ්‍ය වී ඇත.
2. මෙම අරමුණ උදෙසා එක් එක් ආනයනකරු විසින් ඉහත සඳහන් ආයතන වෙනුවෙන් නිකුත් කරන ලද ඇපකර ලියාපදිංචි කිරීම සඳහා ලේඛන පවත්වා ගෙන යෑම.
3. අදාළ අධිකාරී ආයතනවලින් පැනවූ රෙගුලාසි ක්‍රියාත්මක වන පරිදි රේගු පටිපාටි යාවත්කාලීන කිරිම.
4. අවශ්‍යතාවයන් පැන නැගුණ විට භාණ්ඩ පරීක්ෂණ අංගන සඳහා පාරිභෝගික හා පාරිසරික ආරක්ෂණ අංශයේ නිලධාරින් අනුයුක්ත කිරීම.
5. රේගු ආඥා පනත සහ ඊට සම්බන්ධ වෙනත් අණ පනත් යටතේ මෙතෙක් හඳුනාගෙන ඇති රෙගුලාසි සමාලෝචනය කිරීම.
6. ඉහත ක්‍රියාකාරකම්වලට අදාළව වෙනත් අණ පනත් සමග කියැවිය යුතු රේගු ආඥා පනත ප්‍රකාරව නීති බලාත්මක කිරීම.

**2019 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්ය සාධනය**

| ප්‍රධාන කාර්යයන් | ඉලක්කය | තථ්‍ය | ඉටු කරන නොලද්දේ නම් ඊට හේතු |
|---|---|---|---|
| ප්‍රධාන කාර්යය 01 : මොන්ට්‍රියල් සම්මුතිය මගින් ආවරණය කරනු ලබන ඕසෝන් ස්ථරයට හානිවිය හැකි ද්‍රව්‍ය ආනයනය කිරීමට අදාළ රෙගුලාසි බලාත්මක කිරීමේදී ඵලදායී ඉහළ නැංවීම. | | | |
| පරිසර අමාත්‍යාංශයේ, ජාතික ඕසෝන් ඒකකයේ පූර්ව ලියාපදිංචිය නියම කරමින් සහ ආනයන කිරීමට පෙර ආනයන බලපත්‍රයක් නියම කරමින් භාණ්ඩ පිළිබඳ නිල ලැයිස්තුවක් ලබා ගැනීම සහ සියළුම රේගු ප්‍රකාශන ක්‍රියාවලිය සිදු කරන නිලධාරීන්ට සහ බලාත්මක කරන නිලධාරීන්ට එම තොරතුරු බෙදා හැරීම. | 100% | 100% | |
| ඕසෝන් ස්ථරයට හානි වියහැකි ද්‍රව්‍ය සහ වඩාත් අනුකූලවීම/බලාත්මක කිරීම සඳහා ඉහත ආනයන පාලන බලපත්‍ර අවශ්‍යතා පිළිබඳ රේගු ප්‍රකාශන ක්‍රියාවලිය සිදු කරන නිලධාරීන් සහ බලාත්මක කරන නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් ආරම්භ කිරීම. | 100% | 100% | |
| වඩාත් ස්වෙච්ඡාවෙන් අනුකූලවීම සඳහා ඉහත සඳහන් අවශ්‍යතාවයන් ඇතුළත් කරමින් වාප්පු නිෂ්කාශන නියෝජිතයන්ගේ පුහුණු විෂය මාලාව වැඩි දියුණු කිරීම. | 100% | 100% | |
| ඉල්ලීම් වලට අනුව ඕසෝන් ස්ථරයට හානිවන ද්‍රව්‍ය පිළිබඳ ආනයන දත්ත ජාතික ඕසෝන් ඒකකයට ලබාදීම. | 100% | 100% | |
| ප්‍රධාන කාර්යය 02 : බාසල් ප්‍රඥප්තිය මගින් ආවරණය වන හානිකර අපද්‍රව්‍ය දේශ සීමා හරහා සංක්‍රමණයවීමට අදාළ රෙගුලාසි ක්‍රියාත්මක කිරීමේ කාර්යක්ෂමතාවය ඉහළ දැමීම. | | | |
| බාසල් ප්‍රඥප්තියේ ඇමුණුම් I සහ III හි ඇතුළත් කරනු ලැබූ;<br>ශ්‍රී ලංකාව තුළ ආනයන කිරීම තහනම් කරනු ලැබූ;<br>ආනයන කිරීමට පෙර ආනයන බලපත්‍රයක් නියම කරමින් භාණ්ඩ පිළිබඳ නිල ලැයිස්තුවක් ලබා ගැනීම සහ සියළුම රේගු ප්‍රකාශන ක්‍රියාවලිගත කරන නිලධාරීන්ට සහ බලාත්මක කරන නිලධාරීන්ට එම තොරතුරු බෙදා හැරීම. | 100% | 100% | ආනයන ඉතා අවම මට්ටමක පවතී. |
| බාසල් ප්‍රඥප්තිය යටතේ සඳහන් වන<br>හානිකර අපද්‍රව්‍ය ;<br>ශ්‍රී ලංකාව තුළට අපනයන කිරීම තහනම් කරන ලද අනෙකුත් හානිකර භාණ්ඩ ;<br>ආනයනය කිරීමට පෙර ආනයන පාලන බලපත්‍රයක් ලබාගැනීම අවශ්‍ය වන්නාවූ අනෙකුත් භාණ්ඩ ආනයනය කිරීමේදී සහ ;<br>අන්තරාදායක හානිකර භාණ්ඩ තොග හසු කරගන්නා අවස්ථාවකදී අනුකූල වීම/ බලාත්මක කිරීම සඳහා ගතයුතු ආරක්ෂිත ක්‍රියා මාර්ග සහ තහනම් කිරීමේ තීරණ ;<br>පිළිබඳ රේගු ප්‍රකාශන ක්‍රියාවලිගත කරන නිලධාරී සහ බලාත්මක කරන නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් ආරම්භ කිරීම. | 100% | 100% | |
| 3. ස්වෙච්ඡාවෙන් හා වඩාත් හොඳින් අනුකූලවීම සඳහා ඉහත සඳහන් අවශ්‍යතාවයන් ඇතුළත් කරමින් වාප්පු නිෂ්කාශන නියෝජිතයන්ගේ පුහුණු විෂය මාලාව වැඩි දියුණු කිරීම. | 100% | 100% | |
| ප්‍රධාන කාර්යය 03 : ස්ටොක්හෝම් සම්මුතිය මගින් ආවරණය කරන දිගුකල් පවතින කාබනික දූෂක ද්‍රව්‍ය ආනයන කිරීමට අදාළ රෙගුලාසි බලාත්මක කිරීමේ කාර්යක්ෂමතාවය ඉහළ දැමීම. | | | |
| ස්ටොක්හෝම් සම්මුතියේ ඇමුණුම් අ, ආ, සහ ඇ හි ලැයිස්තුගත කර ඇති ;<br>ශ්‍රී ලංකාව තුළ ආනයනය කිරීම තහනම් කරන ලද;<br>ආනයනය කිරීමට පෙර ආනයනය පාලන බලපත්‍රයක් අවශ්‍ය වන (ඇමුණුම ආ; භාවිතය තහනම් කරන ලද) ;<br>දිගුකල් පවතින කාබනික දූෂක ද්‍රව්‍ය පිළිබඳ නිල ලැයිස්තු ලබාගැනීම සහ සියළුම රේගු ප්‍රකාශන ක්‍රියාවලිගත කරන නිලධාරී සහ බලාත්මක කරන නිලධාරීන් වෙත එම දත්ත බෙදා හැරීම. | 100% | 100% | |
| දිගු කල් පවතින කාබනික දූෂක ද්‍රව්‍ය පිළිබඳව රෙගුලාසි සම්බන්ධයෙන් වඩාත් හොඳින් අනුකූලවීම/බලාත්මක කිරීම සඳහා,<br>ස්ටොක්හෝම් සම්මුතියේ ඇමුණුම් අ, ආ, සහ ඇ හි ලැයිස්තුගත කර ඇති ;<br>ශ්‍රී ලංකාව තුළ ආනයනය කිරීම තහනම් කරන ලද;<br>ආනයනය කිරීමට පෙර ආනයනය පාලන බලපත්‍රයක් අවශ්‍ය වන (ඇමුණුම ආ; භාවිතය තහනම් කරන ලද) ;<br>කාබනික දූෂක ද්‍රව්‍ය පිළිබඳ නිල ලැයිස්තු ලබාගැනීම සහ සියළුම රේගු ප්‍රකාශන ක්‍රියාවලිගත කරන නිලධාරී සහ බලාත්මක කරන නිලධාරීන් වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම. | 100% | 100% | |
| වඩාත් ස්වෙච්ඡාවෙන් අනුකූලවීම සඳහා ඉහත සඳහන් අවශ්‍යතාවයන් ඇතුළත් කරමින් වාප්පු නිෂ්කාශන නියෝජිතයන්ගේ පුහුණු විෂය මාලාව වැඩි දියුණු කිරීම. | 100% | 100% | |
| ප්‍රධාන කාර්යය 04: රොටර්ඩෑම් සම්මුතිය මගින් ආවරණය කරන පූර්ව දැනුම්දීමේ අනුමැතිය (PIC) ක්‍රියාවලිය බලාත්මක කිරීමේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම. | | | |

| | | | |
|---|---|---|---|
| රොටර්ඩෑම් සම්මුතිය තුළ ආවරණය කරනු ලැබූ;<br>ශ්‍රී ලංකාව තුළ ආනයනය කිරීම තහනම් කරනු ලැබූ ;<br>කෘමිනාශක පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයා යටතේ පූර්ව ලියාපදිංචිය අවශ්‍ය වන්නාවූ ආනයනය කිරීමට පෙර කෘමිනාශක පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයාගේ නිර්දේශය මත නිකුත් කරනු ලැබූ ආනයන බලපත්‍රයක් අවශ්‍ය වන්නාවූ අන්තරායදායක රසායන සහ කෘමිනාශක පිළිබඳ නිල ලැයිස්තු ලබාගැනීම සහ සියළුම රේගු ප්‍රකාශන ක්‍රියාවලිගත කරන නිලධාරී සහ බලාත්මක කරන නිලධාරීන්ට එම තොරතුරු බෙදාහැරීම. | 100% | 100% | ආනයන ඉතා අවම මට්ටමක පවතී |
| ප්‍රධාන කාර්යය 05: රසායනික අවි සම්මුතිය යටතේ ගැනෙන භාණ්ඩවලට (රසායනික අවි වැඩි දියුණු කිරීම, නිෂ්පාදනය කිරීම, ගබඩා කිරීම සහ භාවිතය තහනම් කිරීම සහ ඒවා විනාශ කිරීම පිළිබඳ ප්‍රඥප්ති) අදාළ රෙගුලාසි බලාත්මක කිරීමේ කාර්යක්ෂමතාවය ඉහළ දැමීම. | | | |
| රසායනික අවි ප්‍රඥප්තියේ ;<br>ශ්‍රී ලංකාව තුළ තහනම් කරන ලද ආනයනය කිරීමට පෙර ආනයන බලපත්‍රයක් ලබාගැනීමට අවශ්‍ය කරන රසායනික පිළිබඳ නිල ලැයිස්තු ලබාගැනීම සියළුම රේගු ප්‍රකාශන ක්‍රියාවලිගත කරන නිලධාරී සහ බලාත්මක කරන නිලධාරීන්ට එම තොරතුරු බෙදාහැරීම. | 100% | 50% | ආනයන ඉතා අවම මට්ටමක පවතී |
| හානි කර රසායනික ද්‍රව්‍ය ආනයනය කිරීමට අදාළ රෙගුලාසි සහ නියමයන් සම්බන්ධයෙන් රේගු ප්‍රකාශන ක්‍රියාවලිය ගත කරන නිලධාරී සහ බලාත්මක කරන නිලධාරීන් දැනුවත් කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ආරම්භ කිරීම. | 100% | 50% | ආනයන ඉතා අවම මට්ටමක පවතී |
| වඩාත් ස්වෙච්ඡාවෙන් අනුකූලවීම සඳහා ඉහත සඳහන් අවශ්‍යතාවයන් ඇතුළත් කරමින් වාප්පු නිශ්කාශන නියෝජිතයන්ගේ පුහුණු විෂය මාලාව වැඩි දියුණු කිරීම. | 100% | 50% | ආනයන ඉතා අවම මට්ටමක පවතී |
| ප්‍රධාන කාර්යය 06: බුද්ධිමය දේපළ හිමිකම් යටතේ ගැනෙන භාණ්ඩවලට අදාළ රෙගුලාසි බලාත්මක කිරීමේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම. | | | |
| ලියාපදිංචි වෙළඳ සන්නාම ලබාගැනීම;<br>ශ්‍රී ලංකාවේ තහනම් කරන ලද ආනයන<br>අයිතිය දරන්නන්ගේ නිල ලැයිස්තුවක් ලබාගැනීම සහ<br>සියළුම රේගු ප්‍රකාශන ක්‍රියාවලිය ගත කරන නිලධාරී සහ බලාත්මක කරන නිලධාරීන්ට එම තොරතුරු බෙදාහැරීම. | 100% | 100% | |
| බුද්ධිමය දේපළ යටතේ භාණ්ඩ ආනයනය කිරීමට අදාළ රෙගුලාසි සහ නියමයන් සම්බන්ධයෙන් රේගු ප්‍රකාශන ක්‍රියාවලිගත කරන නිලධාරී සහ බලාත්මක කරන නිලධාරීන් දැනුවත් කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ආරම්භ කිරීම. | 100% | 100% | |
| 3. වඩාත් ස්වෙච්ඡාවෙන් අනුකූලවීම සඳහා ඉහත සඳහන් අවශ්‍යතාවයන් ඇතුළත් කරමින් වාප්පු නිෂ්කාශන නියෝජිතයන්ගේ පුහුණු විෂය මාලාව වැඩි දියුණු කිරීම. | 100% | 100% | |
| 4. ලෝක රේගු සංවිධානයේ IPM tool මගින් රේගු නිලධාරීන්ගේ නිවැරදි අයිතිකරුවන් පිළිබඳ දැනුම ඉහළ නැංවීම | 100% | 100% | |
| ප්‍රධාන කාර්යය 07: ශ්‍රී ලංකා ප්‍රමිතිය යටතේ ගැනෙන භාණ්ඩවලට අදාළ රෙගුලාසි බලාත්මක කිරීමේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම. | | | |
| ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ ;<br>ආනයනය සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති සහතිකයක් අවශ්‍ය වන ;<br>ආනයනය කිරීමට පෙර ආනයන පාලන බලපත්‍රයක් අවශ්‍ය වන;<br>නිල භාණ්ඩ ලැයිස්තුවක් ලබාගැනීම සහ සියළුම රේගු ප්‍රකාශන ක්‍රියාවලි ගත කරන නිලධාරීන් සහ බලාත්මක කරන නිලධාරීන්ට එම තොරතුරු බෙදාහැරීම. | 100% | 100% | |
| ශ්‍රී ලංකා ප්‍රමිතිය යටතේ ගැනෙන භාණ්ඩ ආනයනයට අදාළ රෙගුලාසි සහ අවශ්‍යතා සම්බන්ධයෙන් රේගු ප්‍රකාශන ක්‍රියාවලිය ගත කරන නිලධාරී සහ බලාත්මක කරන නිලධාරීන් දැනුවත් කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ආරම්භ කිරීම. | 100% | 100% | |
| වඩාත් ස්වෙච්ඡාවෙන් අනුකූලවීම සඳහා ඉහත සඳහන් අවශ්‍යතාවයන් ඇතුළත් කරමින් වාප්පු නිෂ්කාශන නියෝජිතයන්ගේ පුහුණු විෂය මාලාව වැඩි දියුණු කිරීම. | 100% | 100% | |
| ප්‍රධාන කාර්යය 08: කූටානුකරණය සහ ප්‍රකාශන සොරකමට එරෙහිව ඒකාබද්ධ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම Operation PangeaXI | | | |
| බුද්ධිමය දේපළ අයිතියට අදාළ නීති බලාත්මක කිරීම පිළිබඳ රේගු කාර්ය මණ්ඩලය වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. | 100% | 100% | |
| සැක සහිත ඖෂධ අඩංගු සැක කටයුතු ආනයනික තොග අත්අඩංගුවට ගැනීම | 100% | 100% | |
| බුද්ධිමය දේපළ පනත උල්ලංඝනය කරන භාණ්ඩ සහිත සැක කරනු ලබන ආනයන තොග අල්ලා ගැනීම පිළිබඳ වාර්තා කිරීම. | 100% | 100% | |
| ලෝක රේගු සංවිධානයට සහ ජාත්‍යන්තර අපරාධ පොලිස් සංවිධාන කාර්යාලයට ප්‍රතිඵල පිළිබඳ වාර්තා කිරීම. | 100% | 100% | |
| බුද්ධිමය දේපළ ක්‍රියාමාර්ග ප්‍රතිඵල පිළිබඳ කාර්යන් පසු විපරම් කිරීම | 100% | 100% | |
| ප්‍රධාන කාර්යය - 09: අනෙකුත් පාර්ශවකරුවන් සහ රජයේ ආයතන සමඟ සම්බන්ධීකරණය ඉහළ නැංවීම | | | |
| ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය, සෞඛ්‍ය අමාත්‍යාංශය සහ කෘෂිකර්ම අමාත්‍යාංශය සමඟ රැස්වීම් සංවිධානය කිරීම. | 100% | 100% | |
| පාර්ශවකරුවන් වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම. | 100% | 100% | |
| පාරිභෝගික ආරක්ෂණ කටයුතුවලදී අනෙකුත් ආයතන සමඟ ඒකාබද්ධ මෙහෙයුම් සංවිධානය කිරීම. | 100% | - | සම්බන්ධීකරණ කිරීමට නොහැකි විය |
| ජන මාධ්‍ය හරහා පාරිභෝගික ආරක්ෂණ කටයුතු පිළිබඳ ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් | 100% | 100% | |

| ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයට අදාළ සිද්ධි | |
|---|---|
| | |
| ලියාපදිංචිවූ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනඅවශ්‍යතාවන්ට අදාළ මුළු සිද්ධි සංඛ්‍යාව | 83 |
| පරීක්ෂණ අවසන් කළ සිද්ධි සංඛ්‍යාව | 21 |
| ප්‍රමිති ආයතනයට අදාල සිද්ධීන් වෙනුවෙන් පැනවූ මුළු දඩ ප්‍රමාණය (රු.) | 1,809,000 |
| | පෙට්ටි 6,999 සහ අයිතම2009 |

**2019 වර්ෂය තුළ කාර්ය සාධනය**

| බුද්ධිමය දේපළ අයිතිවාසිකම් වලට අදාළ සිද්ධි | |
|---|---|
| | |
| බුද්ධිමය දේපළ අයිතිවාසිකම් වලට අදාළ මුළු සිද්ධි සංඛ්‍යාව | 21 |
| පරීක්ෂණ අවසන් කළ සිද්ධි සංඛ්‍යාව | 20 |
| බුද්ධිමය දේපළ අයිතිවාසිකම් වලට අදාළ පැනවූ මුළු දඩ ප්‍රමාණය (රු.) | 8,199,025 |
| තහනම් කරන ලද මුළු භාණ්ඩ ප්‍රමාණය (ඇමුණුම II) | අයිතම 79377 |

| පරිසර ආරක්ෂණය ආශ්‍රිත සිද්ධි | |
|---|---|
| ලියාපදිංචිවූ මුළු සිද්ධි සංඛ්‍යාව | 11 |
| පරීක්ෂණ අවසන් කළ සිද්ධි සංඛ්‍යාව | 4 |
| පැනවූ මුළු දඩ ප්‍රමාණය(රු.) | 3,255,000 |
| ප්‍රතිඅපනයනය කළ මුළු ප්‍රමාණය (ඇමුණුම I) | අයිතම 817 |
| රඳවාගෙන සිටින කසළ බහාලුම් සංඛ්‍යාව (අභියාචනාධිකරණයේ නඩු විභාග වෙමින් පවතී) | 112 |




### *8.1.2.4 වරාය පාලන ඒකකය*

**හැඳින්වීම**

දේශ සීමා හරහා සිදුවන අපරාධ මැඩපැවැත්වීමේ අදහසින් මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ සංවිධාන කාර්යාලයේ ලෝක රේගු සංවිධානයේ බහාලුම් පාලන වැඩසටහන යටතේ ශ්‍රී ලංකා රේගුවේ වරාය පාලන ඒකකය පිහිටුවන ලදී. වර්තමානයේ දී මෙම ඒකකය මධ්‍යම විමර්ශන අංශයේ විෂය පථයට යටත්ව පවතී. එමෙන්ම, යාත්‍රා මෙහෙයුම් කරුවන් සහ නැව් තොග වාර්තාකරුවන්ගෙන් භාණ්ඩ පිළිබඳ වැදගත් තොරතුරු මෙම ඒකකය විසින් ලබා ගන්නා අතර ගුවන් යානා මෙහෙයුම් කරුවන්ගෙන් මගීන් පිළිබඳ තොරතුරු ලබා ගැනීම අපේක්ෂා කෙරේ. මූලික විමර්ශනයන් අවදානම් විශ්ලේෂණය පදනම් කරගෙන සිදු කරන අතර ඒ අනුව සුදුසු පියවර ගනු ලැබේ.

ප්‍රධාන කාර්යයන්

1. අතිකාල අයකිරීම් එකතු කිරීම පිළිබඳ අධීක්ෂණය කිරීම

2. භාණ්ඩ ප්‍රවාහනය අධීක්ෂණය කිරීම සඳහා නැව් නියෝජිතයන්, භාණ්ඩ ප්‍රවාහන නියෝජිතයන් සහ ගුවන් ප්‍රවාහන නියෝජිතයින් විසින් නැව්ගත කිරීමේ ලේඛන ඉදිරිපත් කිරීම පිළිබඳව අධීක්ෂණය කිරීම

3. ශ්‍රී ලංකාවේ රේගුව, මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලය (UNODC) සහ ලෝක රේගු සංවිධානය (WCO) සහ UNODC සහ WCO සම්බන්ධීකරණය කිරීම

4. භාණ්ඩ ඉලක්ක කිරීමේ පද්ධති (CTS) සහ අසිකුඩා ASYCUDA වැඩසටහන් භාවිතා කිරීම සහ දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටු කර ගැනීම සඳහා අන්තරායකර ද්‍රව්‍ය නිරීක්ෂණය කරනු ලබන ෆයිබර්ස්කෝප් කැමරා, රසායනික පරීක්ෂණ කට්ටල ආදී පරිලෝකන උපකරණ ක්‍රියාත්මක කිරීම සහ ඉල්ලා සිටින සෑම අවස්ථාවකම වෙනත් ඒකකවලට සහාය වීම.

5. ලොව පුරා බහාලුම් ප්‍රවාහනය පිළිබඳ නියාමනය හා අධීක්ෂණයට සම්බන්ධ අදාළ ජාතික හා ජාත්‍යන්තර ආයතන සමඟ සහයෝගීතාව පවත්වා ගැනීම සඳහා පහසුකම් සැපයීම

6. රේගු විෂය පථයට අයත්, නීතිවිරෝධී භාණ්ඩ, තීරු බදු නොගෙවූ භාණ්ඩ , මත්ද්‍රව්‍ය සහ අන්තර්ජාතික අපරාධ පිළිබඳ ලුහු බැඳීම, අදාළ භාණ්ඩ රඳවා තබා ගැනීම, තහනම් කිරීම සහ රේගු ආඥා පනත සහ වෙනත් අදාළ වන නීතිවලට අනුව එවැනි ආනයන, අපනයන, මගී භාණ්ඩ, පාර්සල් හෝ ප්‍රතිනැව්ගත භාණ්ඩ රඳවා තබා ගැනීම, එකී භාණ්ඩ තහනම් කිරීම, නැවැත්වීම, විමර්ශනය සහ පරීක්ෂණ පැවැත්වීම සඳහා මත්ද්‍රව්‍ය, සමාජ ආරක්ෂණ , අවදානම් කළමනාකරණ හා නිවාරණ යන ඒකකයන් සමඟ අදාළ පරිදි විමර්ශන කටයුතු සිදු කිරීම සම්බන්ධීකරණය කිරීම

| 2019 වර්ෂය තුළ කාර්ය සාධනය | |
|---|---|
| ලියාපදිංචිවූ සිද්ධි සංඛ්‍යාව | 43 |
| කටයුතු අවසන් කළ සිද්ධි සංඛ්‍යාව | 31 |
| අවසන් කිරීමට නියමිත සිද්ධි සංඛ්‍යාව | 15 |
| පනවන ලද දණ්ඩන/ රාජසන්තක කරන ලද භාණ්ඩවල මුළු වටිනාකම | Rs. 74,702,157 |
| විකුණුම් වලින් ලැබෙන මුළු මුදල | Rs. 8,972,200 |
| අය කරගත් අතිරේක සටහන්කර වල මුළු වටිනාකම | Rs. 7,334,180 |
| මුළු අයකර ගැනීම් | Rs. 91,008,537 |
| නැව් නියෝජිතයින්ගෙන් එකතු කරන ලද මුළු යාත්‍රා අතිකාල ගෙවීම් | Rs. 43,320,959 |

**ක්‍රියාකාරී සැලැස්මට අනුව 2019 වර්ෂය සඳහා කාර්ය සාධනය**

2019 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ දක්වා ඇති අපේක්ෂිත සියලු ක්‍රියාකාරකම් සාර්ථක ලෙස 100% සම්පූර්ණව ඉටු කිරීමේ මට්ටම වරාය පාලන ඒකකය විසින් ළඟා කරගෙන ඇත.

## 8.1.3 මධ්‍යම විමර්ශන අංශය

**හැඳින්වීම**

රේගු දෙපාර්තමේන්තුවේ පරමාර්ථයන් ප්‍රකාරව අනෙකුත් මෙහෙයුම් අංශ මගින් හසුකරගනු ලබන රේගු නීති සහ වෙනත් අදාල නීති උල්ලංඝනය කිරීම පිළිබඳ විමර්ශන කටයුතු සිදුකිරීම මධ්‍යම විමර්ශන අංශයේ වගකීම වේ. මධ්‍යම සිද්ධි ලේඛනය පවත්වාගෙන යාම ද එහි වගකීමකි.

**ඒ අනුව, මෙම අංශයේ ප්‍රධාන පරමාර්ථ පහත සඳහන් පරිදි වේ.**

1) සියළුම රේගු විමර්ශන මධ්‍යගත කිරීම සහ වෘත්තීය මට්ටමින් ඒවා විමර්ශනය කිරීම
2) මධ්‍ය සිද්ධි ලේඛනය වඩාත් කාර්යක්ෂම සහ ඵලදායි ලෙස පවත්වාගෙන යාම
3) ත්‍යාග බෙදා දීම මධ්‍යගත කිරීම සහ පාරදෘෂ්‍යභාවයකින් ඒ පිළිබඳ කටයුතු කිරීම.

**ප්‍රධාන කාර්යයන්**

1. අනෙකුත් අංශ (විශේෂ කාර්ය සාධන බලකාය සහ සුපරික්ෂා සහ නිවාරණ අංශ හැර) මගින් හසුකර ගන්නා සිද්ධීන් විමර්ශනයට ලක්කිරීම.
2. රේගු උල්ලංඝනය කිරීම් හසුකර ගැනීම සහ විමර්ශනය කිරීම .
3. මධ්‍යම සිද්ධි ලේඛනය පවත්වාගෙන යාම .
4. විශේෂ කාර්ය සාධන බලකාය සහ සුපරික්ෂණ සහ නිවාරණ අංශ මගින් සිදුකරනු ලබන විමර්ශනවල ප්‍රගතිය අධීක්ෂණය කිරීම.
5. මධ්‍යම සිද්ධි ලේඛනයේ අවසන් කරනු ලැබ ඇති සිද්ධි යාවත්කාලීන කිරීම .
6. දෙපාර්තමේන්තුව තුල අවසන් කරන ලද සියළුම සිද්ධිවල ත්‍යාග මුදල් බෙදාහැරීම.

**2019 වර්ෂය තුළ ප්‍රගතිය**

**1. මධ්‍යම විමර්ශන අංශය විසින් (CIB)- 2019.01.01සිට 2019.12.31 දක්වා සිදු කරන ලද විමර්ශන**

අ. ලියාපදිංචි කරන ලද සිද්ධි සංඛ්‍යාව - 383
ආ. විමර්ශන අවසන් කරන ලද සිද්ධි සංඛ්‍යාව - 283
i.ද ඩ මුදල් /ලිහිල් කරන ලද රාජ සන්තක කිරීම් / තව දුරටත් රාජ සන්තක කිරීම් - රු. 354,088,906.60
ii. ආපසු අය කර ගත් අතිරේක සටහන්කර - රු. 9,468,779.00
iii. අලෙවියෙන් ලද මුදල - රු. 11,261,250.00
ඇ. මධ්‍යම සිද්ධි ලේඛනයේ ප්‍රගතිය
අ. මධ්‍යම සිද්ධි ලේඛනයේ ලියාපදිංචි කළ ගොනු සංඛ්‍යාව - 3,505
ආ. ලේඛනයේ යාවත්කාලීන කළ ගොනු සංඛ්‍යාව - 1,955

**2. අනෙකුත් අංශ මගින් සිදු කරන විමර්ශන**

අ. අනෙකුත් ශාඛා මගින් විමර්ශනය සඳහා මෙම අංශය වෙත එවනු ලැබූ ලිපි ගොනු සංඛ්‍යාව - 00
ආ. විමර්ශනය සඳහා මෙම අංශයෙන් අනෙකුත් අංශ වෙත යවන ලද ලිපි ගොනු සංඛ්‍යාව - 00

**3.මධ්‍යම සිද්ධි ලේඛනය පවත්වාගෙන යාම**

අ. මධ්‍යම සිද්ධි ලේඛනයේ ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරන ලද ලිපි ගොනු ගණන - 3,505
ආ. මධ්‍යම සිද්ධි ලේඛනයේ යාවත්කාලීන කරන ලද සිද්ධි ගණන - 1,955
ඇ. නිර්දේශ කරන ලද ත්‍යාග මුදල් ලැයිස්තු ගණන - 278

**2018 වර්ෂය තුළ ප්‍රගතිය**

**1. මධ්‍යම විමර්ශන කාර්යාංශය විසින් (CIB)- 2018.01.01සිට 2018.12.31 දක්වා සිදු කරන ලද විමර්ශන**

අ. ලියාපදිංචි කරන ලද සිද්ධි සංඛ්‍යාව - 291
ආ. අවසන් වූ සිද්ධි සංඛ්‍යාව - 105
i. දඩ මුදල් /ලිහිල් කරන ලද රාජ සන්තක කිරීම් / තව දුරටත් රාජ සන්තක කිරීම් - රු. 216,174,246.00
ii. ආපසු අය කර ගත් අතිරේක සටහන්කර - රු. 9,348,615.00
iii. අලෙවියෙන් ලද මුදල - රු. 10,425,597.00

**2.** මධ්‍යම සිද්ධි ලේඛනයේ ප්‍රගතිය

අ .මෙම ලේඛනයේ ලියාපදිංචි කළ ගොනු සංඛ්‍යාව - 3,755
ආ.ලේඛනයේ යාවත්කාලීන කළ ගොනු සංඛ්‍යාව - 1,077

**3. අනෙකුත් අංශ මගින් සිදු කරන විමර්ශන**

අ .එම කාලය තුළ අනෙකුත් ශාඛා මගින් විමර්ශනය සඳහා මෙම අංශය වෙත එවනු ලැබූ ලිපි ගොනු සංඛ්‍යාව - 00
ආ .විමර්ශනය සඳහා මෙම අංශයෙන් අනෙකුත් අංශ සඳහා යවන ලද ලිපි ගොනු සංඛ්‍යාව - 00

**4. මධ්‍යම සිද්ධි ලේඛනය පවත්වාගෙන යාම**

අ. මධ්‍යම සිද්ධි ලේඛනයේ ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරන ලද ලිපි ගොනු ගණන - 3,755
ආ. මධ්‍යම සිද්ධි ලේඛනයේ යාවත්කාලීන කරන ලද සිද්ධි ගණන - 1,077
ඇ. නිර්දේශ කරන ලද ත්‍යාග මුදල් ලැයිස්තු ගණන - 278

## 8.1.4 නීති කටයුතු අංශය

හැඳින්වීම

අධිකරණ නඩු හා සම්බන්ධ පරිපාලනය හා අධීක්ෂණය සහ නීතිපති දෙපාර්තමේන්තුව සමඟ ඒ සම්බන්ධයෙන් ලිපි ගනුදෙනු කිරීම නීති කටයුතු අංශයේ කාර්යභාරය වේ. මෙම අංශය අධ්‍යක්ෂවරයෙකු යටතේ පාලනය වන අතර සහාය කාර්ය මණ්ඩලය එක් නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු, රේගු අධිකාරිවරයෙකු, නියෝජ්‍ය රේගු අධිකාරිවරුන් දෙදෙනෙකු සහ සහකාර රේගු අධිකාරිවරුන් දෙදෙනෙකුගෙන් සමන්විතය.

ප්‍රධාන කාර්යයන්

1. **අනෙකුත් අංශ සඳහා අවශ්‍ය නීති උපදෙස් ලබා දීම පිළිබඳව සහතික වීම**

2. **දෙපාර්තමේන්තුවේ සියළු නෛතික කටයුතු හා නඩු පැවරීමේ කටයුතු සම්බන්ධව සහභාගී වීම.**

**ශ්‍රේෂ්ඨාධිකරණය සහ අභියාචනා අධිකරණයේ අයදුම්පත් - 2019**

| | |
|---|---|
| 2019 වර්ෂයේදී ලියාපදිංචි කරන ලද නඩු සංඛ්‍යාව | 48 |
| ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කරන ලද අයදුම්පත් | 22 |
| අභියාචනාධිකරණයට ඉදිරිපත් කරන ලද අයදුම්පත් | 21 |
| මහාධිකරණයට ඉදිරිපත් කරන ලද අයදුම්පත් | 5 |

| | |
|---|---|
| 2017 වර්ෂයේ සිට පවතින නඩු | 125 |

| | |
|---|---|
| 2019 වර්ෂය තුළ අවසන් කරන ලද අයදුම්පත් | 46 |
| ශ්‍රේෂ්ඨාධිකරණ අයදුම්පත් | 8 |
| අභියාචනාධිකරණ අයදුම්පත් | 38 |

**අනෙකුත් නෛතික කරුණු**

| | |
|---|---|
| සිදු කරන ලද අභ්‍යන්තර නෛතික උපදෙස් ලබාදීම් සංඛ්‍යාව | 35 |
| සහයෝගය දක්වන ලද ජාත්‍යන්තර ගිවිසුම් සංඛ්‍යාව | 1 |
| සහයෝගය දක්වන ලද දේශීය ගිවිසුම් සංඛ්‍යාව | 37 |
| නීතිපති දෙපාර්තමේන්තුවෙන් නෛතික උපදෙස් ලබාගැනීමේ සංඛ්‍යාව | 5 |
| සහයෝගය දක්වන ලද මහාධිකරණ/දිසා අධිකරණ/මහේස්ත්‍රාත් අධිකරණ අයදුම්පත්සංඛ්‍යාව | 47 |
| නීතිපති දෙපාර්තමේන්තුව සමග පැවති උපදෙස් සාකච්ඡා වලට සහභාගීවීම. | 59 |

## 8.1.5 මධ්‍යම බුද්ධි අංශය

**හැඳින්වීම**

මධ්‍යම බුද්ධි අංශයේ වගකීම වනුයේ නිවැරදි, කාලානුරූපී හා ඵලදායී බුද්ධි තොරතුරු මෙහෙයුම් ඒකකවලට හා ඉහළ කළමනාකාරිත්වයට ලබාදීම මගින්, ආදායම් අභිමිකර ගැනීමකින් තොරව දෙපාර්තමේන්තුවේ පරමාර්ථ වන "සමාජ ආරක්ෂණ" අරමුණු ළඟාකර ගැනීමය.

මෙම අංශයහි පරමාර්ථයන් පහත පරිදිවේ :

1. ඉහළම තීරණ ගැනීමේ මට්ටම්වලට අවශ්‍ය බුද්ධි තොරතුරු සැපයීම.
2. බුද්ධි තොරතුරු මත පදනම් වන භාණ්ඩ හා මගීන් නිෂ්කාශන පාලන ක්‍රම පිළිබඳව අවධාරණය කිරීම
3. දේශසීමා අතර කෙරෙන භාණ්ඩ හුවමාරුවේදී ජාතික ආරක්ෂාව පිළිබඳව වගකීම.
4. ජාතික හා ජාත්‍යන්තර බුද්ධි සම්බන්ධතා ස්ථානයක් ලෙස හා බුද්ධි තොරතුරු එක්රැස් කිරීමේ/ බෙදා හැරීමේ මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කිරීම සහ නීතිය බලාත්මක කිරීම සඳහා සහාය සැපයීම

**ප්‍රධාන කාර්යයන්**

1. තොරතුරු එක්රැස් කිරීම
2. පැය 24 පුරා ක්‍රියාත්මක මහජන තොරතුරු ලබාගැනීමේ ඒකකය (PIRD) පවත්වා ගෙන යාම සහ කළමනාකරණය කිරීම
3. බුද්ධි තොරතුරු විශ්ලේෂණය කිරීම හා වර්ධනය කිරීම
4. දේශීය වශයෙන් අංශ අතරත් ජාත්‍යන්තර වශයෙන් අනුමත නියම කරන ලද ආයතන සමගත් බුද්ධි තොරතුරු බෙදා හැරීම
5. ජාත්‍යන්තර රේගු තොරතුරු පද්ධති සම්බන්ධිකරණය කිරීම
6. ආසියා ශාන්තිකර කලාපයේ බුද්ධි තොරතුරු සම්බන්ධීකරණ කාර්යාලයේ කලාපීය ජාතික සම්බන්ධක ස්ථානය ලෙස ක්‍රියා කිරීම හා ජාත්‍යන්තර බලාත්මක කිරීමේ සම්බන්ධීකරණයේ කේන්ද්‍රස්ථානය ලෙස කටයුතු කිරීම
7. කොළඹ වරායේ බහාලුම් ආරක්ෂක ආරම්භක ව්‍යාපෘතිය (Container Security Initiative project) ක්‍රියාත්මක කිරීම
8. දෙපාර්තමේන්තුවේ අවදානම් කළමනාකරණ කමිටුවේ සාමාජිකයෙකු ලෙස සහභාගී වීම
9. නැව් බඩු ලේඛන සමාලෝචනය හා බුද්ධි තොරතුරු පාදක කර ගනිමින් අධි අවදානම් භාණ්ඩ තොග හඳුනා කර ගැනීම හා විමර්ශන සිදු කිරීම
10. රේගු පරීක්ෂණ සිදුකිරීම හා වැරදිකරුවන්ට එරෙහිව නඩු පැවරීම
11. පෙර වැරදිකරුවන්ගේ දත්ත පද්ධතිය පවත්වාගෙන යාම (POD)
12. ජාතික රේගු බලාත්මක කිරීමේ ජාලයේ (nCEN) දත්ත පද්ධතිය පවත්වාගෙන යාම

**2019 වර්ෂයේ කාර්ය සාධනය**

*ලබා ගත් හා බෙදා හරින ලද තොරතුරු*

| | 2017 | 2018 | 2019 |
|---|---|---|---|
| PIRD මගින් ලබාගත් තොරතුරු සංඛ්‍යාව | 42 | 55 | 73 |
| වෙනත් මූලාශ්‍ර මගින් (ෆැක්ස් විද්‍යුත් තැපැල්, ලිපි, ප්‍රවෘත්ති) | 02 | 13 | 21 |
| එකතුව | **44** | **67** | **94** |
| | | | |
| **අවශ්‍ය පියවර ගැනීම සඳහා වෙනත් අංශ වෙත බෙදා හරින ලද බුද්ධි තොරතුරු සංඛ්‍යාව** | 43 | 50 | 84 |

*බෙදාහරින ලද බුද්ධි අනතුරු ඇඟවීම් සංඛ්‍යාව*

| | 2017 | 2018 | 2019 |
|---|---|---|---|
| මධ්‍යම බුද්ධි අංශයේ අනතුරු ඇඟවීම් | 06 | 07 | 01 |
| බුද්ධි වාර්තා | 05 | 00 | - |
| WCO CEN අනතුරු ඇඟවීම් | 14 | 05 | - |

*අනෙකුත් අංශ වෙත බෙදාහරින ලද පෙර වැරදිකරුවන්ගේ තොරතුරු සංඛ්‍යාව*

| | 2017 | 2018 | 2019 |
|---|---|---|---|
| පෙර වැරදිකරුවන්ගේ වාර්තා සංඛ්‍යාව | 124 | 114 | 108 |

*රේගු අනු නියෝජිතවරු සහ වැට් බදු ( CHA සහ VAT )ලියාපදිංචි කිරීම් සංඛ්‍යාව*

| | 2017 | 2018 | 2019 |
|---|---|---|---|
| රේගු අනු නියෝජිත බලපත්‍ර අලුත් කිරීම | 6611 | 6885 | 6626 |
| ශ්‍රී ලං. වරාය අධි. වාප්පු බලපත්‍ර ( A අවසර පත්‍ර) | 1424 | 1431 | 2356 |
| ආනයනකරුවන්ගේ වැට් අංකය ලියාපදිංචියට පෙර පරීක්ෂා කිරීම | 1777 | 1963 | 1456 |

*බහාලුම් ආරක්ෂණ මූලික වැඩසටහන යටතේ පරිලෝකනය කරන ලද බහාලුම් සංඛ්‍යාව*

| | 2017 | 2018 | 2019 |
|---|---|---|---|
| ප්‍රතිනැව්ගත බහාලුම් සංඛ්‍යාව | 455 | 469 | 326 |
| දේශීය අපනයන බහාලුම් සංඛ්‍යාව | 07 | 26 | 59 |
| මුළු බහාලුම් සංඛ්‍යාව | 462 | 495 | 385 |

*දේශීය හා විදේශීය විමර්ශන සහ බුද්ධි අංශ සමඟ සම්බන්ධීකරණ*

| නියෝජිතායතනය | ඉල්ලීම් සංඛ්‍යාව | | | ලැබූ පිළිතුරු සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|---|
| | 2017 | 2018 | 2019 | 2017 | 2018 | 2019 |
| ආදායම් බුද්ධි අංශය DRI - ඉන්දියාව | 13 | 16 | 29 | 12 | 16 | 08 |
| කලාපීය බුද්ධි සේවා සම්බන්ධීකරණ කාර්යාල (RILO) හා වෙනත් නියෝජ්‍යායතන | 05 | 20 | 15 | 04 | 16 | 01 |

*ජාතික රේගු බලාත්මක කිරීමේ ජාල (nCen) දත්ත පද්ධතිය*

| | 2018 | 2019 |
|---|---|---|
| වලංගු සිද්ධි සංඛ්‍යාව | 1437 | 1704 |

*නීති බලාත්මක කිරීමේ කාර්ය සාධනය*

| | 2019 |
|---|---|
| වර්ෂය තුළදී කාර්ය මණ්ඩලය විසින් ආරම්භ කරන ලද සෝදිසි කරන ලද - වසිද්ධි සංඛ්‍යා | 05 |
| වර්ෂය තුළදී අවසන් කරන ලද සිද්ධි සංඛ්‍යාව | 11 |
| විමර්ශන අවධියේ පවතින සිද්ධි සංඛ්‍යාව | 05 |
| භාණ්ඩ අලෙවියෙන් මුදල් එකතු කර ගැනීමට නියමිත සිද්ධි සංඛ්‍යාව | 03 |
| තීරණයක් ලබාදීම සඳහා විමර්ශන අවධියේ පවතින සිද්ධි සංඛ්‍යාව | 20 |
| අය කර ගන්නා ලද මුළු මුදල (.රු) | 16,569,279.74 |

**2019 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්ය සාධනය**

මධ්‍යම බුද්ධි අංශය 2019 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ දක්වා ඇති අපේක්ෂිත සියලු ක්‍රියාකාරකම් 100% මට්ටම දක්වා සම්පූර්ණ කර ඇත.

### *8.1.5.1 අවදානම් කළමනාකරණ ඒකකය*

ලෝක රේගු සංවිධානයේ ප්‍රමිතීන්හි ආරක්ෂිත රාමුවට අනුගත වීමේ අරමුණින් ශ්‍රී ලංකා රේගුව 2013 දී අවදානම් කළමනාකරණ ඒකකය පිහිටුවන ලද්දේ එක් පසෙකින් දොරටු පාලකයාගේද අනෙක් පසින් පහසුකම් සපයන්නාගේ ද භූමිකාවන් අතර සමතුලිතතාවයක් ඇති කිරීමේ ආරම්භයක් ලෙසය. කෙසේ වෙතත්, ආයතනික ව්‍යුහය තුළ පැවති විවිධ බාධක හා යල් පිනූ ක්‍රියා පටිපාටි හේතුවෙන් ඒකකය උපරිම ධාරිතාවයෙන් ක්‍රියාත්මක වීමට නොහැකි වීමේ ගැටළුවක් පැවතිණ. අවසානයේදී එම ඒකකය මෙහෙයුම් රේගු අංශයක තත්ත්වයට පුලුල් කිරීමේ අරමුණින් මධ්‍යම බුද්ධි අංශය (CI) යටතට ගෙන එමින් ප්‍රතිව්‍යුහගත කරන ලදී.

ශ්‍රී ලංකා රේගුවේ පද්ධති, ක්‍රියාවලි සහ ක්රියා පටිපාටි වැඩිදියුණු කිරීම මගින් දෙපාර්තමේන්තු අරමුණු සාක්ෂාත් කර ගැනීමේ අරමුණ පෙරදැරිව මෙම ඒකකය අවදානම් කළමනාකරණය කිරීමේ කාර්යය තුළ නිරතව සිටී. මෙම ඉලක්කය වඩා හොඳින් සාක්ෂාත් කර ගැනීම සඳහා, ඒකකය සිය කාර්යයන් වෙනම කණ්ඩායම් පහකට බෙදා ඇත;

1. **වරණීයතාව**
2. ප්‍රතිඉංජිනේරුකරණ ක්‍රියාවලිය
3. විමර්ශන
4. සමාගම් නැවත ලියාපදිංචි කිරීම
5. බලයලත් ආර්ථික මෙහෙයුම්කරුවන්

#### 1. වරණීයතාව

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF), ලෝක බැංකුව (IBRD), ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානය (ITC)) සහ ආසියානු සංවර්ධන බැංකුව (ADB) යන ආධාර සපයන මූල්‍යායතනයන්, අවදානම් මත පදනම් වූ භාණ්ඩ නිෂ්කාශන ක්‍රියාවලියට ප්‍රමුඛතාවය දීම සහ සංවර්ධනය කිරීම ලබා දීම සඳහා, ශ්‍රී ලංකා රේගුව වෙත පැමිණ නිරීක්ෂණය කිරීම තුළින් දෙපාර්තමේන්තුව තුළ වර්තමාන අවදානම් කළමනාකරණ පද්ධතිය ඇගයීමට ලක් කරන ලද අතර, ඒ අනුව, මෙම මූල්‍යායතනයන්ගේ නිර්දේශය පරිදි, තේරීම් භාර කණ්ඩායම 2019 ජනවාරි මාසයේදී පිහිටුවන ලදී. අවදානම් ප්‍රදේශ හඳුනා ගැනීම සහ අවදානම් පැතිකඩ නිර්මාණය කිරීම සඳහා මෙම තෝරා ගැනීම් භාර කණ්ඩායමට අයත් විශ්ලේෂකයින් කණ්ඩායමක් විසින් ආනයන දත්ත අඛණ්ඩව විශ්ලේෂණය කරනු ලබන අතර මෙම විශ්ලේෂණගත තොරතුරු අවදානම් කළමනාකරණ කමිටුව වෙත (RMC) වාර්තා කරනු ලැබේ. අනතුරුව, නිර්මාණය කරන ලද අවදානම් පැතිකඩයන් ( Risk Profiles) කමිටුවේ අනුමැතිය සහිතව තෝරා ගැනීමේ නිර්ණායකයට ඇතුළත් කරනු ලබන අතර එය ASYCUDA හි SELECTIVITY හෙවත් වරණීයතා මොඩියුලය හරහා ඉහළ අවදානම් තොග ඉලක්ක කිරීම සඳහා භාවිතා කරනු ලැබේ. දෙපාර්තමේන්තු අරමුණු සාක්ෂාත් කර ගැනීමට බාධාවක් වන අවදානම් ප්‍රමුඛතා අඩංගු අවදානම් ලේඛනයක් ද මෙකී කණ්ඩායම විසින් පවත්වාගෙන යනු ලැබේ.

**2019 වර්ෂය තුළ ප්‍රගතිය**

- මීට පෙර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය විසින් නඩත්තු කරන ලද අසිකුඩා පද්ධතියෙහි SELECTIVITY මොඩියුලය කළමනාකරණය කිරීමට භාර ගැනීම.
- පවත්නා වරණීය නීති වල ඵලදායීතාවය විස්තරාත්මකව තක්සේරු කිරීම.
- අසිකුඩා (ASYCUDA) පද්ධතියෙහි භෞතික පරීක්ෂා කිරීම්වල ප්‍රතිඵල යාවත්කාලීන කළ හැකි පරිදි හා පසුව වරණීයතා නීති වැඩි දියුණු කිරීම සඳහා ප්‍රතිපෝෂණයන් ලෙස භාවිතා කළ හැකි වන පරිදි පරීක්ෂණ නිලධාරීන්ගේ ප්‍රයෝජනය සඳහා අසිකුඩා පද්ධතියෙහි විමර්ශන කාර්යයට (INSPECTION ACT) වංචා කේත (FRAUD CODES) හඳුන්වා දීම,.
- කොළඹ වරාය තුළ නැව් භාණ්ඩ ප්‍රවාහන තදබදය අවම කිරීමේ උත්සාහයක් ලෙස, ආනයන රටාව සහ අඩු අවදානම් තොග හඳුනා ගැනීම සඳහා අසිකුඩා පද්ධතිය වෙතින් ලබාගත් 2019 ආනයන දත්ත පිළිබඳ පුළුල් විශ්ලේෂණයක් සිදු කිරීම
- එකී විශ්ලේෂණය මත පදනම්ව, යෝජිත භාණ්ඩ පරිලෝකන (Scanning) පද්ධතියට පහසුවෙන් ඉඩ සැලසීමේ අරමුණින් බාධාකාරී හා බාධාකාරී නොවන (Intrusive and non-intrusive) පරීක්ෂණ සඳහා අවදානම් පදනම් කරගත් භාණ්ඩ වරණාත්මකතාව හෙවත් තෝරාගැනීම පිළිබඳ වාර්තාවක් සකස් කර ඉදිරිපත් කිරීම
- පවත්නා අසිකුඩා පද්ධතිය තුළ දැනට පහසුකම් සලසා නොමැති, බහුවිධ තෝරා ගැනීමේ නිර්ණායකයන් මගින් හඳුනාගත හැකි අධි අවදානම් භාණ්ඩ ප්‍රවාහනය ඉලක්ක කර ගැනීම සඳහා ස්වයංක්‍රීය අවදානම් කළමනාකරණ පද්ධතියක් (ARMS) අසිකුඩා පද්ධතිය සමඟ සම්බන්ධ කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගැනීම හා එවැනි ස්වයංක්‍රීය අවදානම් කළමනාකරණ පද්ධතියක් (ARMS ) ලබා ගැනීමේ ශක්‍යතාව අධ්‍යයනය කිරීම, එමෙන්ම ඉහළ කළමනාකරණයේ සලකා බැලීම සඳහා තම නිමැවුම් ඉදිරිපත් කරන ලෙස ප්‍රමුඛ අවදානම් කළමනාකරණ විසඳුම් සපයන ආයතන වලට දැන්වීම.
- ගුවන් භාණ්ඩ ආනයනය සඳහා ස්වයංක්‍රීය තෝරා ගැනීමේ නීති හඳුන්වා දීම (KTIM2) සහ තෝරාගත් භාණ්ඩවල ප්‍රතිපෝෂණය අඛණ්ඩව අධීක්ෂණය කිරීම.
- යෝජිත තෝරා ගැනීමේ ක්‍රියාවලිය සමඟ භෞතික පරීක්ෂණ යාන්ත්‍රණය සැලසුම් කිරීම සඳහා ප්‍රධාන පරීක්ෂණ අංගන තුන වන ආර්.සී.ටී, ග්‍රේලයින් 1 සහ ග්‍රේලයින් 2හි ධාරිතාව තක්සේරු කිරීම.

## 2. ප්‍රතිඉංජිනේරුකරණ ක්‍රියාවලිය

තේරීම් සහ විමර්ශන කණ්ඩායම් විසින් සිදු කරනු ලබන අවදානම් තක්සේරුකරණයන්හි උපකාරය ඇතිව, ක්‍රියාවලි ප්‍රතිඉංජිනේරුකරණ කණ්ඩායම, ක්‍රියාපටිපාටියේ කිසියම් දුර්වලතා හා මග හැරීම් ඇත්නම් ඒවා හඳුනා ගැනීම සඳහා පවත්නා ක්‍රියාවලීන් පිළිබඳ සවිස්තරාත්මක සැලසුම් සටහන් සකස් කරනු ලැබේ. අනතුරුව, දැනට පවත්නා ක්‍රමයේ හඳුනාගෙන ඇති ගැටළු හා එවැනි ගැටළු විසඳීම සඳහා නිර්දේශ ඇතුළත් වාර්තාවක් පිළියෙළ කරන අතර, අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ අවධානය සඳහා එකී වාර්තාව ඉදිරිපත් කෙරේ. ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ අනුමැතිය ඇතිව, අවදානම් කළමනාකරණ ඒකකයේ (RMU) හි සමීප අධීක්ෂණය යටතේ නිර්දේශ ක්‍රියාත්මක කෙරේ. තව දුරටත් සිදු කල යුතු වැඩිදියුණු කිරීම් සඳහා ප්‍රයෝජනවත් වන යම් අවහිරතා සහ ඒ හා සම්බන්ධ ගැටළු වේ නම් හඳුනා ගැනීම සඳහා, ක්‍රියාත්මක කිරීම පිළිබඳව අඛණ්ඩව අධ්‍යයනය කරනු ලැබේ.

රේගුවට කරන ලද ප්‍රකාශ කිරීමකින් පවා තොරව ගුවන් භාණ්ඩ පර්යන්තයෙන් පිටතට යන භාණ්ඩ තොග පිළිබඳව පූර්ව හඳුනාගැනීමක ප්‍රතිඵලයක් ලෙස 2019 වර්ෂයේ දී කණ්ඩායම විසින් කටුනායක ගුවන් භාණ්ඩ පර්යන්තය තුළ වඩාත් වැඩි දියුණු කරන ලද භාණ්ඩ නිෂ්කාශන ක්‍රියාවලියක් ක්‍රියාත්මක කරන ලදී. එම වැඩි දියුණු කරන ලද ක්‍රියාවලිය යටතේ අසිකුඩා පද්ධතිය හරහා නිෂ්කාශනය කිරීමකින් තොරව භාණ්ඩ තොගයකට දොරටු වලින් පිටවීමට තිබූ හැකියාව වලකාලමින් භාණ්ඩ නිෂ්කාශන කටයුතු සම්පූර්ණ වශයෙන් ස්වයංක්‍රීයගත කරනු ලැබිණි.

මීට සමාන ගැටළු කොළඹ වරායෙහි අසම්පූර්ණ බහාලුම් තොග නිෂ්කාශනය කිරීමේ ක්‍රියාවලිය තුළ ද හඳුනා ගැනුණු අතර අවදානම් කළමනාකරණ ඒකකයට, 2020 ජනවාරි 01 දින සිට නව ක්‍රමය ක්‍රියාත්මක කිරීමට සූදානම්ව සිටින බණ්ඩාරනායක තොටුපළ (BQ) ගුදම තුළ භාණ්ඩ තොග නිෂ්කාශන ක්‍රියාවලිය සම්බන්ධව දළ සැලසුම් සටහන් සකස් කිරීමට (mapping), එම ක්‍රියාවලිය විශ්ලේෂණය කිරීමට සහ වැඩි දියුණු කිරීමට හැකිවිය.

**2019 වර්ෂය තුළ ප්‍රගතිය**

- කටුනායක ගුවන් භාණ්ඩ අංශය තුළ ස්වයංක්‍රීය භාණ්ඩ නිෂ්කාශන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම.
- පූර්ණ නොවන බහාලුම් තොග (LCL) නිෂ්කාශනය සඳහා මුළුමනින්ම ස්වයංක්‍රීය නිෂ්කාශන ක්‍රමය BQ ගුදමට හඳුන්වාදීම.
- මධ්‍යම අපහරණ අංශයේ ක්‍රියාවලිය සම්බන්ධව සැලසුම් සටහන් සකස් කිරීම (mapping) සහ ඇගයීම.
- අපනයන අංශයේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් සැලසුම් සටහන් සකස් කිරීම සහ ඇගයීම.
- ප්‍රති නැව්ගත කරනු ලබන භාණ්ඩ තොග සම්බන්ධ ක්‍රියාවලිය පිළිබඳ සැලසුම් සටහන් සකස් කිරීම සහ ඇගයීම.

## 3. විමර්ශන

පලපුරුදු විමර්ශන නිලධාරීන්ගෙන් සමන්විත මෙම කණ්ඩායම විසින් පවත්නා රේගු ක්‍රියාවලීන්හි අවදානම් ක්ෂේත්‍රයන් සහ අඩුපාඩු හඳුනාගැනීමේ අරමුණ ඇතිව විවිධ වංචා හඳුනාගෙන විමර්ශනය කරනු ලැබේ. මෙම පරීක්ෂණයන්හි මූලික පරමාර්ථය වන්නේ විවිධ වූ අවදානම් ක්ෂේත්‍රයන් නිර්ණය කිරීම සහ අදාල ඉලක්ක හඳුනාගැනීමේදී තේරීම් භාර කණ්ඩායමට හා ප්‍රතිඉංජිනේරුකරණ කණ්ඩායමට ඒවා සහාය කර ගැනීම සඳහා ඒවා භාවිතා කිරීමයි. පහත වගුවෙන් සඳහන් වන්නේ 2019 වර්ෂයේදී සිදුකරන ලද විමර්ශනයන්හි සාරාංශයකි.

**2019 වර්ෂය තුළ ප්‍රගතිය**

| | | |
|---|---|---|
| **ලියාපදිංචිගත සිද්ධි සංඛ්‍යාව** | | **99** |
| **අවසන් කරන ලද සිද්ධි සංඛ්‍යාව** | | **59** |
| **අයකරගැනීම්** | දණ්ඩන / රාජසන්තක කිරීම් | **Rs. 99,449,146** |
| | අතිරේක සටහන්කර | **Rs. 231,704** |
| | විකුණුම් ආදායම් | **Rs. 71,888,906** |
| **වැදගත් රාජසන්තක කිරීම්/හසුකරගැනීම්** | සිගරට් (දුම්වැටි ගණන) | **1,690,000** |
| | බීඩි කොළ (අගය) | **Rs. 63,815,391** |

4. නැවත ලියාපදිංචි කිරීම

ආනයන / අපනයනකරුවන් සහ නිෂ්කාශන නියෝජිතයන් ලෙස ලියාපදිංචි කර ඇති බොහෝ ආයතනවල තොරතුරු අසත්‍ය ඒවා බවට නොඑසේනම්, යාවත්කාලීන නොවන බවට මේ වන විට හඳුනාගෙන ඇති අතර මෙම තත්වය හේතුකොට ගෙන විමර්ශන සිදුකිරීමත් ඒවා

අවසන් කිරීමත් පිළිබඳව ඉමහත් දුෂ්කරතා රැසක් උද්ගතව පවතී. මෙම ගැටළුව විසඳීම සඳහා, අවශ්‍ය අනුමැතිය සහිතව අවදානම් කළමනාකරණ ඒකකය විසින් ව්‍යාපාරිකයන් සහ රේගු නිෂ්කාශන නියෝජිතයින් (CHA) නැවත ලියාපදිංචි කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී. අවදානම් කළමනාකරණ ඒකකයෙහි වෙනත් කණ්ඩායමකට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය සමඟ එක්ව මෙම ව්‍යාපෘතියේ සියලුම ප්‍රාරම්භක කටයුතු 2019 දී අවසන් කිරීමට හැකි විය. එහි ප්‍රතිඵලයක් ලෙස
2020 වර්ෂයේ පෙබරවාරි මස දෙවන සතිය පමණ වන විට සමාගම් නැවත ලියාපදිංචි කිරීමේ කටයුතු ආරම්භ කිරීමට හැකි වනු ඇත.

**2019 වර්ෂය තුළ ප්‍රගතිය**

- සමාගම් 26 ක් සම්බන්ධ කර ගනිමින් නියමු වැඩසටහනක් දියත් කිරීම
- වෙබ් යෙදුම (web application) සංවර්ධනය කිරීම (දැනට අවසන් වෙමින් පවතී.)
- 3.ලංකා විදුලි බල මණ්ඩලයේ පාරිභෝගික දත්ත සමුදාය වෙත ප්‍රවේශය ලබා ගැනීම සඳහා ලං.වි.ම සමඟ සම්බන්ධීකරණය ඇති කිරීම
- ප්‍රාදේශීය ලේකම් කාර්යාල සමඟ සම්බන්ධීකරණය ඇති කිරීම සහ වැඩිදුර සම්බන්ධීකරණය ඇති කිරීම සඳහා සම්බන්ධතා ස්ථානයක් (contact point) නිර්මාණය කිරීම
- තොරතුරු හුවමාරුව සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය ඇති කිරීම
- දැනුවත් කිරීමේ සැසි පැවැත්වීම

**5. බලයලත් ආර්ථික ක්‍රියාකරුවන්**

2017 පෙබරවාරි 22 වන දින ලෝක වෙළඳ සංවිධානයේ වෙළඳ පහසුකම් සැපයීමේ ගිවිසුම (TFA) බලාත්මක වන විට, දේශසීමා හරහා වෙළඳාමේ විනිවිදභාවය සහ පුරෝකථනය කිරීමේ හැකියාව වැඩි දියුණු කිරීම සඳහා එකී ගිවිසුම විසින් නියම කර ඇති ප්‍රමිතීන් සපුරාලීමට ශ්‍රී ලංකාව විසින් ඉටු කිරීමට බොහෝ වගකීම් තිබුණි. බලයලත් ආර්ථික ක්‍රියාකරු (AEO) වැඩසටහනක් දියත් කිරීම මෙම වගකීම් ඉටු කිරීමේ කාර්යයෙහි මූලික අවශ්‍යතාවයක් වන අතර ඒ සඳහා බලයලත් ආර්ථික ක්‍රියාකරු (AEO) වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ කණ්ඩායම 2019 මැද භාගයේදී පිහිටුවන ලදී. බලයලත් ආර්ථික ක්‍රියාකරු (AEO) සංකල්පය මගින් අරමුණු කරන්නේ සැපයුම් දාමය සම්බන්ධව ඉහළ මට්ටමේ ආරක්ෂාව, මූල්‍ය ස්ථායිතාව සහ රේගු නීති සමඟ අඛණ්ඩව අනුකූල වීම ප්‍රකට කරන අව්‍යාජ නීතිගරුක ආනයනකරුවන්ට සහ අපනයනකරුවන්ට පහසුකම් සැලසීමයි. පරීක්ෂණයන් අඩු වීම, ප්‍රමුඛතා පදනම් කරගත් නිෂ්කාශනය, සාමාන්‍ය තක්සේරුකරණ යොමු කිරීම් වලින් නිදහස් කිරීම වැනි පහසුකම් ලබා ගැනීමෙන් පාර්ශවයන්ට ප්‍රතිලාභ ලබාගත හැකිය. වැඩසටහන සඳහා මූලික දැනුවත් කිරීමේ වැඩසටහන් 2020 ජනවාරි මාසයේදී පැවැත්වීමට නියමිත වන අතර වැඩසටහන 2020 අප්‍රේල් මාසය වන විට සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**2019 වර්ෂය තුළ ප්‍රගතිය**

- බලයලත් ආර්ථික ක්‍රියාකරු(AEO) වැඩසටහන සඳහා මෙහෙයුම් කමිටුවක් පිහිටුවීම
- AEO ක්‍රියාත්මක කිරීමේ කණ්ඩායම පිහිටුවීම
- AEO වැඩසටහනේ ව්‍යවස්ථාදායක හා මෙහෙයුම් රෙගුලාසි වල කොටසක් ලෙස මෙහෙයුම් මාර්ගෝපදේශ ස්ථාපිත කිරීම
- වලංගුකරණ මාර්ගෝපදේශ සහ වලංගුකරණ පුහුණු මොඩියුල අවසන් කිරීම
- AEO කළමනාකරණ වෙබ් (ජාල) පාදක වේදිකාව සඳහා ක්‍රියාකාරී පිරිවිතරයන් අවසන් කිරීම
- බලයලත් ආර්ථික ක්‍රියාකරුවන් (AEO) පිළිබඳ ලෝක රේගු සංවිධාන කලාපීය වැඩමුළුවේ (කෂිවා, ජපානය) දී දෙපාර්තමේන්තුව නියෝජනය කිරීම: කලාපීය සහයෝගීතාව සහ උපාය මාර්ග සංවර්ධනය සඳහා දැනුවත් කිරීම.

## 8.2 ආදායම් හා සේවා පර්ෂදය

### 8.2.1 ප්‍රකාශන අංශය

**හැඳින්වීම**

"ප්‍රකාශක" යනුවෙන් හඳුන්වන්නා වූ ආනයනකරුවන්ගේ නියෝජතයින් විසින් මුහුදෙන් ප්‍රවාහනය කරන සියළුම භාණ්ඩ සම්බන්ධයෙන් රේගු ප්‍රකාශන ඉදිරිපත් කරනු ලබන්නේ ප්‍රකාශන අංශය වෙත වේ. මෝටර් වාහන සඳහා ඉදිරිපත් කරන රේගු ප්‍රකාශ සම්බන්ධයෙන් කටයුතු කිරීමේ වගකීම මේ වනවිටත් මුළුමනින්ම පවරා ඇත්තේ මෙම අංශය යටතේ ඇති මෝටර් රථ වාහන අංශය වෙතය.
ප්‍රකාශන අංශය පහත සඳහන් ඒකක වලින් සමන්විත වේ.

- **"D" අංශය**
- දිගු කාමරය
- මෝටර් රථ ඒකකය
- කර්මාන්ත හා සේවා ලේඛන සැකසුම් ඒකකය
- ලේඛන (DOC) මධ්‍යස්ථානය
- ආදායම් හා සේවා (කොළඹ) පර්ෂදය යටතේ මෙම සියලු අංශයන් ක්‍රියාත්මක වේ.

**අංශයේ විෂය ක්ෂේත්‍රය**

මෙම අංශයේ ප්‍රධාන විෂය ක්ෂේත්‍රය වන්නේ ආනයනික හා ගුදම්ගත කෙරෙන භාණ්ඩ සඳහා ප්‍රකාශන පහසුකම් සැපයීමයි. මෙය සපුරා ගැනීම සඳහා මෙම අංශය මගින් පහත පරිදි පහසුකම් සපයා ඇත.

- ඍජු ව්‍යාපාරික ආදාන පහසුකම (DT1) මගින් රේගු සටහන්කර ලබාගැනීම.
- යාවත්කාලීන නැව් බඩු ලේඛනය පිළිබඳව සහ රේගු සටහන්කරයේ සඳහන් තීරුබදු සහ අනෙකුත් බදු ගෙවීම් කර ඇති බවට තහවුරු කිරීම
- තෝරාගත් ආනයනකරුවන්ට කඩිනම් නිෂ්කාශන පහසුකම සපයාදීම.
- රේගු අධිකාරි/තක්සේරුකරු විසින් රේගු සටහන්කර අනුමත කිරීම.
- පූර්ණ බහාලුම් තොග (FCL) SLPA SAGT,CICTඅංගන වලින් පිටතට ගෙන යාමට අභ්‍යන්තර අවසර පත්‍ර නිකුත් කිරීම.
- පූර්ණ බහාලුම් තොග (FCL) භාණ්ඩ බහාලුම් මධ්‍යස්ථානවලදීත් පූර්ණ නොවන බහාලුම් තොග (LCL) භාණ්ඩ ගුදම්වලදීත් නිෂ්කාශනය කිරීම
- "Asycuda World" මගින් සම්පූර්ණ ස්වයංක්‍රීයකරණය ක්‍රියාත්මක වන අතර, එමගින් ආනයනකරුවන්ට පහසුවෙන් හා අප්‍රමාදව රේගු සටහන්කර කටයුතු කර ගත හැකි වේ. දැන් දෙවන මහලේ දිගු කාමරයේදී "Asycuda" පද්ධතිය මගින් රේගු සටහන්කරවල සියලු කටයුතු ඉටු කරන අතර DTI පහසුකම මගින් පරිහරණය කරන්නන්ට තමාගේ කාර්යාලයේ සිටම රේගු සටහන්කර ඍජුවම ඇතුලත් කර හැක.
- භාණ්ඩ වර්ගීකරණය සම්බන්ධ කටයුතු පමණක්, නිපුණතාවය සහිත රේගු අධිකාරීවරුන් හා තක්සේරුකරුවන්ගෙන් සමන්විත කාර්යමණ්ඩලයක් විසින් හස්ත ක්‍රමය මගින් සිදු කරනු ලැබේ.

**අරමුණු**

1. ආනයනය භාණ්ඩ නිෂ්කාශනය පහසුකිරිම.
2. භාණ්ඩ ගුදම් ගත කිරීමට පහසුකම් සැලසීම.
3. භාණ්ඩ වර්ගීකරණ කටයුතු හරහා ආදායම් අඩුවීම් හා විදේශ විනිමය අහිමි වීම අවම කිරිම.
4. "D" අංශය හරහා රේගු ආඥා පනත හා අදාළ නීති වලට අනුව බලාත්මක කිරීමේ කටයුතු සිදු කිරීම.
5. ආනයන භාණ්ඩ මත පනවන බදු ආදායම නියමිත පරිදි ගණනය හා එකතු කිරීම.
6. මුදල් අමාත්‍යාංශය අනුමැතිය ඇති භාණ්ඩ නිශ්කාෂණ ව්‍යාපෘති වලට බදු සහන ලබාදීමෙන් පහසුකම සැලසීම.
7. බලපත්‍ර හිමියන්ට/ නීත්‍යානුකූල ආනයනකරුවන්ට තම වාහන / භාණ්ඩ ඉතා ඉක්මනින් නිදහස් කර ගෙන යාමට පහසුකම් සැලසීම.
8. විවිධ රාජ්‍ය දෙපාර්තමේන්තු/අනෙකුත් සංවිධාන/සාමාන්‍ය මහජනයාට තාවකාලික රේගු සටහන්කර හරහා භාණ්ඩ නිදහස් කර ගැනීමට සැලසීම. රජයේ ප්‍රතිපත්ති මත තීරු බදු අඩු කිරීම/ අත්හැර දැමීම හා ප්‍රමාද කිරීම ක්‍රියාත්මක කිරීම.
9. තහනම් කිරිම සහ සීමා කිරීම් පිළිබඳ බලාත්මක කිරීම ක්‍රියාත්මක කිරීම.

**මෙම අංශයේ නිලධාරීන්ගේ වගකීම්**

ආනයනික භාණ්ඩ සඳහා රේගු සටහන්කර ක්‍රියා පටිපාටිය අනවශ්‍ය පමාවකින් තොරව ඉක්මනින් සිදු කිරීමටත් රජයට නියමිත බදු ආදායම එකතු කර දීමටත් දිගු කාමරයේ නිලධාරීහු සහතික වෙති. ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව, ආහාර හා බෙහෙත් වර්ග සඳහා වූ අධිකාරිය, සීනි පර්යේෂණ ආයතනය, සුවඳ විලවුන් උපාංග හා ඖෂධ වර්ග සඳහා වූ අධිකාරිය, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, පරමාණුක බල ශක්ති අධිකාරිය, විදුලි සංදේශ නියාමන කොමිසම වැනි ආයතනවල අධිකාරියට යටත්ව ගෙන්වන භාණ්ඩ සඳහා එම බලපත්‍ර ලබාගෙන තිබේද යන්න සහ, ශාක නිරෝධායන සහතිකය, ධූමායන සහතිකය, කුළුබඩු මණ්ඩල සහතික සහ පූර්ණ නැව් ගතකිරීමේ වාර්තාව යනාදි සහතිකයන් අපනයන කරන ලද රටවලින් නිකුත් කරන්නේ දැයි අවධානයෙන් සිටීමට මෙම නිලධාරීන් විසින් වග බලා ගනු ලැබේ. තවද පහත අවශ්‍යතා ආනයනකරුවන් විසින් සම්පූර්ණ කර තිබේදැයි සලකා බලයි.

- භාණ්ඩ නිදහස් කරගැනීම සඳහා භාණ්ඩ ප්‍රවාහකයාගේ අවසරය
- පරිගණක පද්ධතියේ ඇති නියමිත කේත යොදා ගනිමින් භාණ්ඩවල සම්පූර්ණ විස්තරය
- සංයෝජිත භාණ්ඩ වර්ගීකරණ නාමාවලිය පදනම් කරගෙන සකස් කරන ලද ආනයන තීරුබදු නාමාවලියට අදාළව භාණ්ඩ වර්ගීකරණය නිවැරදිව සිදු කිරීම
- භාණ්ඩවල සත්‍ය හුවමාරු වටිනාකම ප්‍රකාශ කිරීම.
- නියමිත විදේශ විනිමය අනුපාතය හා අදාළ මුදල් වර්ගය යොදා ගනිමින් භාණ්ඩවල වටිනාකම ප්‍රකාශ කිරීම
- භාණ්ඩ සඳහා අනුමත බැංකුවකින් විදේශ විනිමය හුවමාරුව සිදුවී ඇත්ද යන බව
- අවශ්‍ය පරිදි අදාළ අනුමැති, සහතික, බලපත්‍ර අමුණා තිබීම

## 8.2.2 කර්මාන්ත හා සේවා අංශය

**හැඳින්වීම**

ආනයනය කරන ලද භාණ්ඩ, කර්මාන්ත හා වාණිජ අවශ්‍යතාවයන් පරිදි විශේෂිත ක්‍රියා පටිපාටි යටතේ නිෂ්කාශනය කිරීම සඳහා පහසුකම් සැලසීම පිණිස සුරැකුම් / බැඳුම්කර යටතේ තාවකාලිකව ගබඩා කර තැබීමට අදාල රේගු කටයුතු මෙන්ම, විශේෂයෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ අනෙකුත් අදාළ රේඛීය ආයතන අතර නිසි පරිදි සම්බන්ධීකරණය ඇති කරමින්, ශ්‍රී ලංකාව තුළ සම්ප්‍රදායික අපනයන නැඹුරුතා රටාව විවිධාංගීකරණයට ලක් කිරීමේ මාර්ග පිළිබඳ සොයා බැලීමේ අරමුණින් නිෂ්පාදන හා අපනයන කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම ද කර්මාන්ත හා සේවා අංශය විසින් ඉටු කරනු ලබයි.

**ප්‍රධාන ශාඛා සහ ඒවායෙහි ඒකක**

- පරිපාලන ඒකකය
- බැංකු ඇප ඒකකය
- ආයෝජක පහසුකම් සැලසීමේ ඒකකය (INFAC)
- ව්‍යාපෘති ඒකකය
- ගුදම් තැබීමේ ඒකකය
- පෝෂක බැඳුම්කර ඒකකය
- විමර්ශන සහ සත්‍යාපන ශාඛාව
- බැඳුම්කර විමර්ශන ඒකකය
- තැපැල් තක්සේරු ශාඛාව

**ප්‍රධාන කාර්යයන්**

- වෙළඳාම සඳහා පහසුකම් සැපයීම පිළිබඳ රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම / පරිපාලනය කිරීම මෙම කාර්යාංශය වෙත පවරා ඇති කාර්යභාරය වේ. කාර්යාංශයේ ප්‍රධාන කාර්යයන් පහත දැක්වේ.
- රේගු බැඳුම්කර ගබඩා කළමනාකරණය කිරීම.
- අපනයන සැකසුම් සඳහා වන තාවකාලික ආනයන **(TIEP)** හා තීරුබදු ප්‍රතිදාන පටිපාටි ආදී අපනයන සඳහා පහසුකම් සැලසීමේ යෝජනා ක්‍රම කළමනාකරණය කිරීම.
- තීරු බදු නිදහස් වෙළඳසල්වල කටයුතු කළමනාකරණය කිරීම.
- තැපැල් තක්සේරු අංශය විසින් තැපැල් කටයුතු ආශ්‍රිතව සියලු පහසුකම් සැපයීම
- **'විලම්බන රෙජීම (Suspense Regime)'** රේගු සටහන්කර සකස් කිරීමේදී ප්‍රකාශන කාර්යාංශය සමඟ සම්බන්ධීකරණය කිරීම.

**2019 වර්ෂයේ කාර්ය සාධනය**

බැඳුම්කර විමර්ශන ඒකකය

| | |
|---|---|
| 2018 වර්ෂයේ සිට එන නඩු | 41 |
| 2019 වසර තුළදී ආරම්භ කරන ලද නඩු සංඛ්‍යාව | 47 |
| පෙර වර්ෂයේ නඩු ඇතුළුව අවසන් කරන ලද නඩු සංඛ්‍යාව | 13 |
| 2019 වර්ෂයේ තීරණ ලබාදීමට ඇති නඩු සංඛ්‍යාව | 39 |
| 2018 වර්ෂයේ තීරණ ලබාදීමට ඇති නඩු සංඛ්‍යාව | 36 |
| මුළු රාජසන්තක කිරීම් ප්‍රමාණය | Rs. 255,325,000.00 |

**ව්‍යාපෘති ඒකකය**
**බන්ධිත ගුදම් මෙහෙයුම්**

| කාණ්ඩය | සංඛ්‍යාව |
|---|---|
| බැඳුම්කර අළුත්කිරීම් | 107 |
| නිර්දේශිත නව බැඳුම්කර | 06 |
| ප්‍රති බැඳුම්ගත කිරීම් | 02 |
| ගුදම්ගත භාණ්ඩ ප්‍රවාහන අවසර පත් අළුත්කිරීම. | 17 |

**ආයතන/පෞද්ගලික ඇප සහතික**

| කාණ්ඩය | සංඛ්‍යාව |
|---|---|
| ඇප සහතික අළුත්කිරීම, නව ඇපකර | 183 |

**බැංකු ඇපකර**

| කාණ්ඩය | සංඛ්‍යාව |
|---|---|
| භාරගනු ලැබූ ඇපකර | 1998 |
| ඉල්ලා සිටින ලද ඇපකර | 2824 |
| නිදහස් කරන ලද ඇපකර | 29 |

විමර්ශන

| | |
|---|---|
| 2017 වර්ෂයේ සිට ආරම්භ කරන ලද නඩු සංඛ්‍යාව | 25 |
| ආරම්භ කරන ලද නඩු සංඛ්‍යාව | 03 |
| අවසන් කරන ලද නඩු සංඛ්‍යාව | 00 |
| තීරණයක් ලබාදීමට නියමිත නඩු සංඛ්‍යාව | 28 |

අපනයන සැකසුම් සඳහා තාවකාලික අපනයන

| | |
|---|---|
| TIEP-1 New | 68 |
| TIEP-1V New | 16 |
| IBG New | 20 |
| TIEP-1 Renewal | 446 |

එකතු කරන ලද ගාස්තු

| | |
|---|---|
| බාහිර පරීක්ෂණ (O/E ) | Rs.2,260,000.00 |
| ලියාපදිංචි කරන ලද | Rs.357,000.00 |
| අළුත්කිරීම් | Rs.892,000.00 |
| ප්‍රලේඛනය | Rs.892,000.00 |

තැපැල් තක්සේරු ශාඛාව

**කොළඹ ශාඛාව :**

1. **බෙ.හැ. ස (POD) සංඛ්‍යාව** (භාණ්ඩ තොග)

| කාණ්ඩය | සංඛ්‍යාව |
|---|---|
| ගුවන් | 19937 |
| මුහුදු | 9044 |
| සාමාන්‍ය | 12254 |
| විශාල තොග | 835 |
| කඩිනම් | 54863 |

2. නිදහස් කරන ලද භාණ්ඩවල මුළු වටිනාකම: **රු.376,636,721.00**

3. අයකරගත් මුළු බදු ප්‍රමාණය:

| | |
|---|---|
| රේගු ආනයන බදු | Rs. 9,163,720.00 |
| වරාය හා ගුවන් තොටුපල බදු | Rs. 12,137,641.00 |
| එකතු කළ අගය මත බදු | Rs. 16,205,985.00 |
| සෙස් බදු | Rs.10,237,741.00 |
| නිෂ්පාදන බදු | Rs,19,816.00 |
| ජාතිය ගොඩනැගීමේ බදු | Rs.4,443,887.00 |
| පරිගණක ගාස්තු | Rs. 29,400.00 |
| දඩ | Rs.386,642.00 |
| එකතුව | Rs.52,635,832.00 |

4. අයකරගත් මුළු දඩ ප්‍රමාණය : රු.. 386,642.00

5. පිටත වරාය තැපැල් තක්සේරු ශාඛාවලින්- අයකරගත් මුළු බදු ප්‍රමාණය:

| | |
|---|---|
| ත්‍රිකුණාමලය | Rs.2,179.315.00 |
| ගාල්ල | Rs.3,948,654.00 |
| යාපනය | Rs.4,207,045.00 |
| මහනුවර | Rs.3,138,062.00 |
| එකතුව | Rs.13,473,076.00 |

6. 2019 වර්ෂයේ දී මෙහෙයවන ලද සිද්ධි සංඛ්‍යාව:

| | |
|---|---|
| වසර තුළ ආරම්භ කරන ලද සිද්ධි සංඛ්‍යාව | 20 |
| ජෛව,විවිධත්ව සංස්කෘතික ජාතික උරුමයන් ආරක්ෂණ අංශය වෙත භාරදුන් සිද්ධි සංඛ්‍යාව | 03 |
| මත්ද්‍රව්‍ය නාශක අංශයට භාරදුන් සිද්ධි සංඛ්‍යාව | 17 |

## 8.2.3 මධ්‍යම භාණ්ඩ පරීක්ෂණ අංශය

**හැඳින්වීම**

බලයලත් රේගු නිලධාරීන් විසින් ආනයනික මුහුදු භාණ්ඩ පරීක්ෂා කිරීම රේගු නිෂ්කාශන ක්‍රියාපටිපාටිය තුළ සිදුකරනු ලබන ප්‍රධාන කාර්යයන්ගෙන් එකකි. ප්‍රධාන වශයෙන් අවදානම් තක්සේරුව මත පදනම්ව මධ්‍යම භාණ්ඩ පරීක්ෂණ අංශය (CCED) මෙම කාර්යයෙහි නිරත වේ. මෙම අංශයෙහි ප්‍රධාන කාර්යාලය "RANK" බහාලුම් පර්යන්තයෙහි ස්ථාපිත කර ඇති අතර, කොළඹ වරාය තුළ ඇති මෙහි ශාඛාවන් මෙන්ම CSL සහ ග්‍රේලයින් 1, 11 යන අංගනයන් ද මෙම අංශය යටතේ ක්‍රියාත්මක වේ. මෙම අංශය 2000.08.23 දින නිල වශයෙන් ස්ථාපිත කරන ලදී.

රේගු ප්‍රකාශන (CusDecs) සහ වෙනත් අදාළ ලියකියවිලි මැනැවින් පරීක්ෂා කර බැලීමෙන් අනතුරුව භාණ්ඩ පරීක්ෂණය කොතෙක් දුරට සිදු කළ යුත්තේද යන්න තීරණය කරනු ලැබේ.

**මධ්‍යම භාණ්ඩ පරීක්ෂණ අංශයේ ව්‍යුහය**

ආදායම් හා සේවා පර්ෂදය යටතට අයත් මධ්‍යම භාණ්ඩ පරීක්ෂණ අංශය රේගු අධ්‍යක්ෂ (භාණ්ඩ පරීක්ෂණ) මගින් මෙහෙයවනු ලැබේ . මෙම අංශය යටතේ ඒකක 11 ක් ක්‍රියාත්මක වේ.

1. "RANK" බහාලුම් පරීක්ෂණ පර්යන්තය (RCT)
2. ග්‍රේලයින් I
3. ග්‍රේලයින් II
4. අධි අවදානම් භාණ්ඩ කාර්යාලය (HRC)
5. ජය බහාලුම් පර්යන්ත (JCT) කාර්යාලය
6. බණ්ඩාරනායක ජැටියෙහි (BQ ) ගුදම
7. භාණ්ඩ සත්‍යාපන පර්යන්තය (CVT ) ඔරුගොඩවත්ත
8. ආනයන භාණ්ඩ අංශය (ICD) - නව නුගේ පාර (NNR) පෑලියගොඩ
9. නියමු පාලම (Guide Pier) කාර්යාලය
10. ජය බහාලුම් පර්යන්තය( JCT)- පරිලෝකන ඒකකය (Scanning Unit)
11. "RANK" බහාලුම් පරීක්ෂණ පර්යන්තය (RCT)- පරිලෝකන ඒකකය (Scanning Unit)

**පරීක්ෂණ පටිපාටිය**

පරීක්ෂණයට යටත් වන භාණ්ඩ වර්ග

1. ගෘහස්ථ භාවිතය සඳහා ආනයනය
2. ආයෝජන මණ්ඩලය (BOI) අනුමත ව්‍යවසායන් විසින් ආනයනය කිරීම

**වරණීයතාව**

සෑම පූර්ණ බහාලුම් භාණ්ඩ තොගයක් (FCL) සඳහාම අදාළ වන පරීක්ෂාව අසිකුඩා ඉලෙක්ට්‍රොනික වරණීයතා පද්ධතිය ( the electronic selectivity system) විසින් තෝරා ගනු ලැබේ. පරීක්ෂණ ස්ථානය තෝරාගත් පසු රේගු ප්‍රකාශනය (CusDec) සහ එයට සම්බන්ධ ලියකියවිලි අදාළ පරීක්ෂණ ස්ථානයේ දී රේගු අනු නියෝජිතයා (චෝෆ්) විසින් ඉදිරිපත් කරනු ලැබේ. ඒකකයේ නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ විසින් අවදානම් පදනම් කරගත් තක්සේරුව මත පරීක්ෂණය සඳහා ක්‍රමවේදය හෙවත් මාර්ගය තෝරා ගනු ඇත.

**අවදානම මත පදනම්ව භාණ්ඩ පරීක්ෂා කිරීම**

1. පූර්ණ බහාලුම් භාණ්ඩ තොග (FCL)

   අ. අධි අවදානම් භාණ්ඩ: ASYCDA පද්ධතිය මඟින් ඉහළ අවදානම් සහිත භාණ්ඩ තෝරා ගනු ලබන අතර එය GLII හි අධි අවදානම් භාණ්ඩ (HRC) කාර්යාලයේදී පරීක්ෂා කරනු ලැබේ.

   ආ. මැදි අවදානම් භාණ්ඩ: ඒකකයේ නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ විසින් මැදි අවදානම් භාණ්ඩ තෝරා ගනු ලබන අතර එය ග්‍රේලයින් I සහ ග්‍රේලයින් II හි සවිස්තරාත්මක පරීක්ෂණ ක්‍රමවේදය යටතේ පරීක්ෂා කරනු ලැබේ.

   ඇ. අඩු අවදානම් භාණ්ඩ: අඩු අවදානම් සහිත FCL භාණ්ඩ, ඒකකයේ නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ විසින් තෝරා ගනු ලබන අතර සසම්භාවී පරීක්ෂණ ක්‍රමවේදය යටතේ RCT, ග්‍රේලයින් I සහ ග්‍රේලයින් II හි පරීක්ෂා කෙරේ.

   ඇ.රේගුව සමඟ පවත්වාගෙන යන අනුකූලතා මට්ටම මත පදනම්ව, බාහිර සමූහ පරීක්ෂාවන්ට ඉඩ දීම සඳහා සමාගම් ලැයිස්තුවක් මධ්‍යම භාණ්ඩ පරීක්ෂණ අංශ ප්‍රධාන කාර්යාලයේ පවත්වාගෙන යනු ලැබේ. ඒ අනුව තෝරාගත් අඩු අවදානම් තොගයක්, පත් කරන ලද මණ්ඩලයක් විසින් භාණ්ඩ භාරකරුවන්ගේ නම් කරන ලද පරිශ්‍රයේදී පරීක්ෂා කිරීමට ඉඩ දෙනු ලැබේ.

2. පූර්ණ නොවන බහාලුම් භාණ්ඩ තොග (LCL)

   අ. පූර්ණ නොවන බහාලුම් භාණ්ඩ තොග (LCL) වරාය තුළ හෝ NNR ගුදම්වල පිරවූ පසු JCT, BQ සහ NNR වෙත අනුයුක්ත කර ඇති මධ්‍යම භාණ්ඩ පරීක්ෂණ අංශයෙහි කාර්ය මණ්ඩලය විසින් පරීක්ෂා කරනු ලැබේ.

**ආයෝජන මණ්ඩල ව්‍යවසායන්ගේ භාණ්ඩ තොග පරීක්ෂා කිරීම**

නිදහස් වෙළඳ කලාපවලින් පිටත පිහිටුවා ඇති ආයෝජන මණ්ඩල ව්‍යවසායන් සඳහා ප්‍රවාහනය කරනු ලබන භාණ්ඩ CVT (BOI) හිදී පරීක්ෂා කරනු ලැබේ.

**2019 වර්ෂයේ කාර්ය සාධනය**

සාමාන්‍ය භාණ්ඩ

| | | |
|---|---|---|
| ලියාපදිංචි කළ රේගු සටහන්කර(රේගු ප්‍රකාශන) සංඛ්‍යාව | | 286,911 |
| පරීක්ෂණ වර්ගය | | |
| පරීක්ෂා කිරීමට ලක්විය හැකි (Amber) | 141,065 | |
| විස්තර සහිත | 22,715 | |
| ඉහළ අවදානම් සහිත (HRC) | 2,004 | |
| පරීක්ෂා කළයුතු භාණ්ඩ (Red) | 10,007 | |
| ආයෝජන මණ්ඩල | 102,944 | |
| අනිකුත් | 8,207 | |
| ලියාපදිංචි කළ බහාලුම් සංඛ්‍යාව (FCL) | | 261,628 |
| බාහිර සමූහ පරීක්ෂාව | | 122,348 |
| | | |
| ක්‍රියාවලීගතකරන ලද අතිරේක සටහන්කර සංඛ්‍යාව | | 2,253 |
| අයකර ගැනීම් සංඛ්‍යාව (වටිනාකම) රු. | | 270,219,335 |
| අයකර ගැනීම් සංඛ්‍යාව (අනිකුත්) රු. | | 329,605,880 |
| හසුකරගත් සිද්ධි සංඛ්‍යාව | | 272 |
| අයකරගනු ලැබූ දඩ රු. | | 161,839,984 |
| රාජසන්තක කරන ලද භාණ්ඩවල වටිනාකම | | 17,389,901 |
| අතිකාල අයකරගැනීම් | | 24,400,732 |
| ආරක්ෂිත කාමර ගාස්තු | | 31,050 |
| මුද්‍රාගාස්තු | | 46,500 |

**භාණ්ඩ සත්‍යාක්ෂණ පර්යන්තය සහ ආයෝජන පහසුකම් සැලසීමේ මධ්‍යස්ථානය**

| | භාණ්ඩ සත්‍යාක්ෂණ පර්යන්තය CVT | | ආයෝජන පහසුකම් සැලසීමේ මධ්‍යස්ථානය INFAC | |
|---|---|---|---|---|
| | ආනයන | අපනයන | ආනයන | අපනයන |
| රේගු සටහන්කර සංඛ්‍යාව | 21,014 | 42,049 | 10 | |
| බහාලුම් සංඛ්‍යාව | 37,215 | 18,490 | 10 | |
| නිෂ්කාශනය කරන ලද LCLසංඛ්‍යාව | 1,941 | 25,115 | | |

**වැදගත් අනාවරණයන් සහ විමර්ශන සාරාංශය**

අවම සැකසුම් කාලයක් තුළ ආනයන භාණ්ඩ නිෂ්කාශනය කිරීමට පහසුකම් සපයන අතරම, ප්‍රකාශයට පත් නොකිරීම, ප්‍රමාණය ඉක්මවා යාම, වැරදි වර්ගීකරණයන් සහ අඩුවෙන් තක්සේරු කිරීම් වැනි අවස්ථා කිහිපයක් අංශය විසින් 2019 වර්ෂය තුළ දී සාර්ථකව අනාවරණය කර ගෙන ඇත. ඒ අනුව, දඩමුදල්, ලිහිල් කරන ලද අභිමිකර සහ අතිරේක සටහන්කර සැලකිය යුතු ප්‍රමාණයක් අය කරගෙන ඇත.

දඩ අය කර ගැනීම් 116,839,984/-
වෙනත් හේතු මත අතිරේක සටහන්කර අය කර ගැනීම් 329,605,880/-
තක්සේරුගත අගය ඉහළ දැමීම මත අතිරේක සටහන්කර අය කර ගැනීම් 270,219,355/- (මිල පිරික්සුම් අංශය මගින් අය කරනු ලැබේ.)

**2019 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට සාපේක්ෂව කාර්ය සාධනය**

| | ප්‍රධාන පියවර | ගෙන ඇති ක්‍රියා මාර්ග |
|---|---|---|
| 1 | ඊළඟ මාසයේ 7 වන දිනට පෙර මාසික ආදායම් වාර්තාව රේ.අ වෙත ඉදිරිපත් කරන ලෙස අංශයෙහි නි.රේ.අ වරුන් වෙත උපදෙස් නිකුත් කිරීම | ක්‍රියාත්මක කෙරේ. |
| 2 | භාණ්ඩ පරීක්‍ෂණ කටයුතු දැඩි ලෙස අධීක්‍ෂණය කිරීමට සහ නියමිත ආදායම අය කර ගැනීමට වගබලා ගැනීම සඳහා නි.රේ.අ සහ රේගු අධිකාරිවරුන්ට උපදෙස් නිකුත් කිරීම. | ක්‍රියාත්මක කෙරේ. |
| 3 | ආදායම පහසුවෙන් රැස් කර ගැනීම සඳහා භාණ්ඩ ප්‍රකාශන නිසි පරිදි සියුම්ව පරීක්ෂා කර බැලීමට වග බලා ගැනීමට දිගු කාමරයේ නි.රේ.අ වෙත උපදෙස් නිකුත් කිරීම. | දිගු කාමරයෙහි කාර්ය මණ්ඩලය සමඟ කාරණය සාකච්ඡා කරන ලදී. |
| 4 | ආදායම රැස් කිරීම සඳහා භාණ්ඩ තොග භෞතිකව පරීක්ෂා කිරීමට පෙර රූප වාර්තා ලබා ගැනීමට එක්ස් කිරණ පරිලෝකනය සඳහා සැක සහිත තොග යොමු කරන ලෙස දිගු කාමරයේ නි.රේ.අ වෙත උපදෙස් ලබා දීම. | දිගු කාමරයෙහි කාර්ය මණ්ඩලය සමඟ රැස්වීම් මගින් කාරණය සාකච්ඡා කරන ලදී. |
| 5 | ආදායම් වංචාවන්ට විසඳුම් සෙවීම සඳහා අවදානම් පැතිකඩ නිර්මාණය කිරීම සඳහා මධ්‍යම බුද්ධි අංශය හා අනුකූලතා සහ පහසුකම් සැලසීමේ අංශයට අයත් අවදානම් කළමනාකරණ ඒකකය සමඟ සම්බන්ධීකරණය පවත්වා ගැනීම | ක්‍රියාත්මක කෙරේ. |
| 6 | ප්‍රතිපත්ති, සැලසුම් හා පර්යේෂණ අංශය සමඟ සම්බන්ධීකරණය පවත්වා ගනිමින් මාසික ආදායම් විශ්ලේෂණය ලබා ගැනීම සහ පහත වැටෙන ප්‍රවණතා රටාවන්ට අදාළ භාණ්ඩ පරීක්ෂා කිරීම පිළිබඳව සුපරීක්ෂාකාරී වන ලෙස අංශයේ නි.රේ.අ වෙත දැනුම් දීම | ක්‍රියාත්මක කෙරේ. |
| 7 | තාක්ෂණික සම්බන්ධීකරණය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය සමඟ සම්බන්ධීකරණය පවත්වා ගැනීම සහ අත්කර ගත් ආදායම් එකතු කිරීම සම්බන්ධයෙන් තාක්‍ෂණික කරුණු පිළිබඳව සුපරීක්ෂාකාරී වන ලෙස අංශයේ නි.රේ.අ වරුන් වෙත දැනුම් දීම | අර්ධ වශයෙන් ඉටු කර ගෙන ඇත. අඛණ්ඩව ක්‍රියාත්මක කෙරේ. |
| 8 | රේගු පරීක්ෂණයන්හි ප්‍රතිඵල මත පදනම්ව, භාණ්ඩ පිළිබඳ ජාතික ආනයන බදු වල යම් සංශෝධනයක් කළ යුතුව පවතී නම් ජාතික අයවැය රැස්වීම්වලදී සලකා බැලීම සඳහා රේ.අ.ජ වෙත යෝජනා ඉදිරිපත් කිරීම. | මේ සම්බන්ධ අවශ්‍යතාවයක් පැනනැඟී නැත. |
| 9 | සිද්ධි සම්බන්ධ පරීක්ෂණ කටයුතු අවසන් කිරීම සහ භාණ්ඩ අපහරණය සඳහා පියවර ගන්නා ලෙස අංශයේ නි.රේ.අ වෙත උපදෙස් නිකුත් කිරීම | මාසික නි.රේ.අ රැස්වීම්වලදී උපදෙස් නිකුත් කර ඇත |
| 10 | ශ්‍රේලයින් 1, ශ්‍රේලයින් 11 සහ RANK" බහාලුම් පරීක්ෂණ පර්යන්තය (RCT) අංගනයේ රැඳී ඇති බහාලුම් සම්බන්ධ පරීක්ෂණ අවසන් කිරීමට පියවර ගන්නා ලෙස වෙනත් අංශ වෙත දැනුම් දීම | අර්ධ වශයෙන් ඉටු කර ගෙන ඇත. |

පාලන අරමුණු යටතේ සැලසුම් කර ඇති ප්‍රධාන ක්‍රියාකාරකම්

| | ප්‍රධාන පියවර | ගෙන ඇති ක්‍රියා මාර්ග |
|---|---|---|
| 1 | ආරක්ෂිත කාමර රෙජිස්ටරය නිසි ලෙස නඩත්තු කිරීම, රඳවාගෙන සිටින සහ අත්පත් කරගත් භාණ්ඩ සුරක්ෂිතව පවත්වා ගැනීම සහ රේගු ආඥා පනතේ විධිවිධානයන් යටතේ අල්ලා ගන්නා ලද භාණ්ඩ මධ්‍යම අපහරණ ඒකකය සමඟ සම්බන්ධීකරණය වී නිසි කලට අපහරණය කිරීමට පියවර ගන්නා බවට සහතික වන ලෙස නි.රේ.අ සහ රේගු අධිකාරිවරුන්ට උපදෙස් නිකුත් කිරීම. | ක්‍රියාත්මක කෙරේ. |
| 2 | භාණ්ඩ පරීක්‍ෂණ කටයුතු දැඩි ලෙස අධීක්‍ෂණය කිරීම, රේගු නීතිය සහ අදාළ අනිකුත් නීති බලාත්මක කිරීම පිළිබඳව සහතික වීම සහ භාණ්ඩ පරීක්‍ෂණයට අදාළ සියලු ලියකියවිලි සුරක්ෂිතව පවත්වා ගැනීමට නි.රේ.අ සහ රේගු අධිකාරිවරුන්ට උපදෙස් නිකුත් කිරීම | ක්‍රියාත්මක කෙරේ. |
| 3 | සැක සහිත භාණ්ඩ තොග භෞතික පරීක්ෂාවට පෙර රූප වාර්තා ලබා ගැනීම පිණිස එක්ස්රේ පරිලෝකනය (ස්කෑන්) සඳහා යොමු කිරීමට දිගු කාමරයේ සිටින නි.රේ.අධ්‍යක්ෂවරුන් වෙත උපදෙස් දෙන ලෙස රේ.අ (ප්‍රකාශන)ගෙන් ඉල්ලා සිටීම | දිගු කාමරයෙහි කාර්ය මණ්ඩලය සමඟ රැස්වීම් මගින් කාරණය සාකච්ඡා කරන ලදී. ක්‍රියාත්මක කෙරේ. |
| 4 | එක්ස්රේ ස්කෑනිං රූප වාර්තා කෙරෙහි අවධානය යොමු කළ යුතු කරුණු සහ භාණ්ඩ පරීක්‍ෂණය අතරතුරදී ඒවා මෙවලමක් ලෙස භාවිතා කිරීමට පරීක්ෂණ අංගන/ ස්ථාන වල නි.රේ.අ සහ රේගු අධිකාරිවරුන්ට උපදෙස් නිකුත් කිරීම | ක්‍රියාත්මක කෙරේ. |
| 5 | මධ්‍යම බුද්ධි අංශය සමඟ සම්බන්ධීකරණය පවත්වා ගැනීම සහ භාණ්ඩ පරීක්ෂණ කටයුතු සඳහා අංශයේ පරීක්ෂණ අංගනයේ / ස්ථානවල කාර්ය මණ්ඩලයට බුද්ධි වාර්තා / සංඥා හැඟවීම් ලබා දීම. | ක්‍රියාත්මක කෙරේ. |
| 6 | මධ්‍යම බුද්ධි අංශය සහ අවදානම් කළමනාකරණ ඒකකය සමඟ සම්බන්ධීකරණය වී රේගු නීතිය හා ඊට සම්බන්ධිත අනෙකුත් නීති උල්ලංඝනය කිරීම්වලට අදාළව අවදානම් පැතිකඩ නිර්මාණය කිරීම | ක්‍රියාත්මක කෙරේ. |

| | | |
|---|---|---|
| 7 | තාක්ෂණික සම්බන්ධීකරණය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය සමඟ සම්බන්ධීකරණය පවත්වා ගැනීම සහ භාණ්ඩ පරීක්ෂණයන්හිදී තාක්ෂණික කරුණු පිළිබඳව සුපරීක්ෂාකාරී වන ලෙස අංශයේ නි.රේ.අධ්‍යක්ෂවරුන් වෙත දැනුම් දීම. | අර්ධ වශයෙන් ඉටු කර ගෙන ඇත. සැපයුම් සේවා ගැටළු නිසා අවසන් කිරීමට නොහැකිවී ඇත. |
| 8 | පරීක්ෂණ අංගනවල / ස්ථානවල සිදුකරන ලද අනාවරණයන් මාසිකව රේ.අ (භාණ්ඩ පරීක්ෂණ) සහ මධ්‍යම බුද්ධි අංශයට වාර්තා කරන ලෙස නි.රේ.අ (CCED-ප්‍රධාන කාර්යාලය) වෙත උපදෙස් ලබා දීම | ක්‍රියාත්මක කෙරේ. |
| 9 | රේ.අ (මානව සම්පත් සංවර්ධන) සමඟ සම්බන්ධීකරණය වීමෙන් අංශය තුළ සේවයේ නියුතු නි.රේගු අධිකාරිවරුන් සහ ස.රේගු අධිකාරිවරුන් අවදානම් කළමනාකරණය, භාණ්ඩ පරීක්‍ෂණය, ගත යුතු ආරක්ෂිත පියවර සහ භාණ්ඩ පරීක්‍ෂා කිරීමේ ක්‍රියාවලියේදී තාක්‍ෂණික උපකරණ භාවිතය පිළිබඳව පුහුණු / නිපුණතා සංවර්ධන වැඩසටහන් සඳහා යොමු කිරීම | ක්‍රියාත්මක කෙරේ. |

**වෙළඳ පහසුකම් සැපයීමේ අරමුණු යටතේ සැලසුම් කර ඇති ප්‍රධාන ක්‍රියාකාරකම්**

| | ප්‍රධාන පියවර | ගෙන ඇති ක්‍රියා මාර්ග |
|---|---|---|
| 1 | පරීක්ෂණ අංගනයේ / ස්ථානයේ රේගු කාර්යාලයෙහි භාණ්ඩ පිළිබඳ ප්‍රකාශයක් ලියාපදිංචි කළ පසු හැකි තාක් ඉක්මනින් තෝරාගත් පරීක්ෂණ ක්‍රමවේදය යටතේ අදාළ භාණ්ඩ පරීක්ෂණය සිදු කරන ලෙස අංශයේ කාර්ය මණ්ඩලයට උපදෙස් නිකුත් කිරීම | ඉටු කර ඇත. |
| 2 | පරීක්ෂණ උපලේඛනගත කිරීමේදී සජීවී සතුන්, ඉක්මනින් විනාශ වන (නශ්‍ය) භාණ්ඩ සහ හදිසි අවශ්‍යතාවයන් සඳහා ගෙන එන භාණ්ඩ වලට අවශ්‍ය ප්‍රමුඛතා ලබා දීම සඳහා අංශයේ කාර්ය මණ්ඩලයට උපදෙස් නිකුත් කිරීම. | ඉටු කර ඇත. |
| 3 | නශ්‍ය භාණ්ඩ අවම කාල සීමාවක් තුළ යෝග්‍ය පරිදි මුදා හැරීම සඳහා අංශයේ කාර්ය මණ්ඩලයට උපදෙස් නිකුත් කිරීම | ඉටු කර ඇත. |
| 4 | වෙනත් නිසි බලධාරියෙකු/බලධාරීන් විසින් ද භාණ්ඩ පරීක්ෂා කළ යුතු නම්, එම බලධාරීන්ගේ පරීක්ෂණ ද රේගු පරීක්ෂණ සමඟම සම්බන්ධීකරණය කරමින් එකවර සිදු කරන බවට සහතික වන ලෙස අංශයේ කාර්ය මණ්ඩලයට උපදෙස් නිකුත් කිරීම | ඉටු කර ඇත. |
| 5 | ජාතික නීතියට අදාළ වෙනත් විධිවිධාන යෙදීම සහතික කිරීම සඳහා ප්‍රකාශිත භාණ්ඩවල තීරුබදු විස්තරය සහ / හෝ වටිනාකම තහවුරු කිරීම සඳහා අවශ්‍ය යැයි හැඟෙන ස්ථානවල පමණක් සාම්පල ලබා ගන්නා ලෙස සහ එසේ ලබා ගන්නා සාම්පල හැකි තාක් දුරට කුඩා සාම්පල විය යුතු බවට අංශයේ කාර්ය මණ්ඩලයට උපදෙස් නිකුත් කිරීම | ඉටු කර ඇත. |
| 6 | නවෝත්පාදන පරීක්ෂණ සහ ප්‍රලේඛන සංවර්ධනය පිළිබඳ පාර්ශවකරුවන් සමඟ සම්බන්ධීකරණ හා උපදේශන කටයුතු | ඉටු කර ඇත. |

**වෙනත් අරමුණු යටතේ සැලසුම් කර ඇති ප්‍රධාන ක්‍රියාකාරකම්**

| | ප්‍රධාන පියවර | ගෙන ඇති ක්‍රියා මාර්ග |
|---|---|---|
| 1 | 2019 වර්ෂය සඳහා අංශයට අදාලව ප්‍රගති වාර්තාව සකස් කර ප්‍රතිපත්ති, සැලසුම් හා පර්යේෂණ අංශයට යැවීම | ඉටු කර ඇත. |
| 2 | භාණ්ඩ පරීක්ෂා කිරීමේ ක්‍රියාවලියේදී විද්‍යුත් වරණීයතා ක්‍රමය (Electronic Selectivity System) පවත්වා ගැනීම | **ක්‍රියාත්මක කර ඇත.** |
| 3 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයේ සහාය ඇතිව RCT, GL I, GL II, HRC, NNR සහ BQ යන ස්ථාන වල විද්‍යුත් භාණ්ඩ නිෂ්කාශනයන් පවත්වාගෙන යාම | JCT හැර අනෙක් අංශවල ක්‍රියාත්මක කෙරේ. |
| 4 | අංශය සඳහා මධ්‍යගත බැංකු ඇපකර සුරක්‍ෂණ හා අධීක්ෂණ පද්ධතියක් පවත්වාගෙන යාම | ක්‍රියාත්මක කෙරේ. |
| 5 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයේ සහාය ඇතිව JCT හි විද්‍යුත් -භාණ්ඩ නිෂ්කාශනය ක්‍රියාත්මක කිරීම | සැපයුම් සේවා ගැටළු නිසා ඉටු කර ගැනීමට නොහැකිවී ඇත. |
| 6 | 2020 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | ඉටු කර ඇත. |
| 7 | ව්‍යාපාර ක්‍රියාවලිය ප්‍රතිඉංජිනේරුකරණය | ක්‍රියාත්මක කෙරේ. |

## 8.2.4 මගී සේවා අංශය

**අරමුණු**

කොළඹ වරායේදි හා මගීන් හා කැටුව නොඑන භාණ්ඩ (UPB) ගබඩාවලදී මගීන් හා වෙනත් සම්බන්ධිත ආයතනවල භාණ්ඩ නිෂ්කාශනයේදී විදේශගත වූවන් හා මව්බිමට නැවත එන අය සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරමින් ඔවුනට කාර්යක්ෂම හා ආචාරශීලි සේවාවක් සැපයීම.

**ප්‍රධාන කාර්යයන්**

- රටින් බැහැරව හා රටට පැමිණෙන මගීන් හා භාණ්ඩ නිෂ්කාශනය පහසු කිරීම
- ආදායම් සුරක්ෂිත කිරීම හා තහනම් කරන ලද හා සීමා කරන ලද භාණ්ඩ ආනයනය හා අපනයනය වැලැක්වීම
- සමාජ ආර්ථික, සංස්කෘතික හා පාරිසරික අපේක්ෂාවන් ආරක්ෂා කිරීම
- UPB ගබඩා පාලනය හා නියාමනය කිරීම

**ගමන් මලු සංචලනය 2018/2019 - සංසන්දනාත්මකව**

| | **මලු සංඛ්‍යාව 2018** | **මලු සංඛ්‍යාව 2019** |
|---|---|---|
| ගමන් බඩු කාර්යාලය (සමූහ) | | |
| ගමන් බඩු කාර්යාලය -කවුන්ටරය | | |
| ගමන් බඩු කාර්යාලය -විකුණුම් | | |
| ගමන් බඩු කාර්යාලය(NNR) | 20,969 | 15,347 |
| ලක්සිරිසේවා - කොළඹ | 78,847 | 99,698 |
| ලක්සිරිසේවා – නින්දවුර් | 10,852 | 15,773 |
| ට්‍රාන්ස්කෝ – වත්තල | 57,120 | 65,292 |
| ට්‍රාන්ස්කෝ – දඹුල්ල | 7,435 | 9,572 |
| මිඩ්කෝ | 61,045 | 73,802 |
| ට්‍රයිකෝ - කොළඹ | 66,615 | 71,928 |
| ට්‍රයිකෝ – කුරුණෑගල | 39,781 | 36,483 |
| ට්‍රයිකෝ – ගාල්ල | 18,745 | 23,018 |
| CSL- කොළඹ | 64,898 | 88,250 |
| CSL – මහනුවර | 31,088 | 31,150 |
| | | |
| එකතුව (රු) | 457,395 | 530,313 |

**දඩ අයකර ගැනීම් . 2018/2019 - සංසන්දනාත්මකව**

| | 2018 | 2019 |
|---|---|---|
| **ගමන් බඩු කාර්යාලය (සමූහ) - ආනයන** | 1,338,300.00 | |
| **ගමන් බඩු කාර්යාලය (කවුන්ටරය)** | | |
| **ගමන් බඩු කාර්යාලය (විකුණුම්)** | | |
| **ගමන් බඩු කාර්යාලය (NNR)** | 4,527,225.00 | 3,164,940.00 |
| **ලක්සිරිසේවා - කොළඹ** | 774,412.00 | 4,296,093.00 |
| **ලක්සිරිසේවා – නින්දවුර්** | 116,600.00 | 128,983.00 |
| **ට්‍රාන්ස්කෝ – වත්තල** | 1,181,147.00 | 944,116.00 |

| | | |
|---|---|---|
| ට්‍රාන්ස්කෝ – දඹුල්ල | 73,972.00 | 73,000.00 |
| මීඩ්කෝ | 503,089.00 | 651,100.00 |
| ට්‍රයිකෝ - කොළඹ | 2,881,914.00 | 2,393,137.00 |
| ට්‍රයිකෝ – කුරුණෑගල | 960,800.00 | 342,606.00 |
| ට්‍රයිකෝ – ගාල්ල | 290,590.00 | 440,200.00 |
| CSL- කොළඹ | 1,884,773.00 | 1,496,936.00 |
| CSL – මහනුවර | 163,928.00 | 256,259.00 |
| එකතුව (රු) | **14,696,750.00** | **14,187,370.00** |

අතිකාල අයකරගැනීම් 2018/2019 සංසන්දනය කිරීම

| | 2018 | 2019 |
|---|---|---|
| ගමන් බඩු කාර්යාලය ආනයන - (සමූහ) | | |
| ගමන් බඩු කාර්යාලය (කවුන්ටරය) | | |
| ගමන් බඩු කාර්යාලය (විකුණුම්) | | |
| ගමන් බඩු කාර්යාලය (NNR) | | |
| ලක්සිරිසේවා කොළඹ - | 7,834,686.00 | 7,961,732.00 |
| ලක්සිරිසේවා – නින්දවූර් | | |
| ට්‍රාන්ස්කෝ – වත්තල | 2,157,466.00 | 5,719,872.00 |
| ට්‍රාන්ස්කෝ – දඹුල්ල | 914,082.00 | 1,007,834.00 |
| මීඩ්කෝ | 5,203,236.00 | 5,695,434.00 |
| ට්‍රයිකෝ - කොළඹ | 4,869,984.00 | 5,784,589.00 |
| ට්‍රයිකෝ – කුරුණෑගල | 8,317,200.00 | 8,785,830.00 |
| ට්‍රයිකෝ – ගාල්ල | 7,569,000.00 | 9,106,290.00 |
| CSL- කොළඹ | 6,410,625.00 | 7,215,000.00 |
| CSL – මහනුවර | 6,780,872.00 | 7,351,262.00 |
| එකතුව (රු) | **50,057,151.00** | **58,627,843.00** |

බදු අයකරගැනීම් 2018/2019 සංසන්දනාත්මකව

| | 2018 | 2019 |
|---|---|---|
| ගමන් බඩු කාර්යාලය ආනයන - (සමූහ) | 54,841,471.00 | |
| ගමන් බඩු කාර්යාලය (කවුන්ටරය) | | |
| ගමන් බඩු කාර්යාලය (විකුණුම්) | | |
| ගමන් බඩු කාර්යාලය (NNR) | 41,449,526.00 | 47,519,824.00 |
| ලක්සිරිසේවා - කොළඹ | 32,919,230.00 | 42,025,041.00 |
| ලක්සිරිසේවා – නින්දවූර් | 2,558,587.00 | 4,097,845.00 |
| ට්‍රාන්ස්කෝ – වත්තල | 31,987,928.00 | 36,059,977.00 |
| ට්‍රාන්ස්කෝ – දඹුල්ල | 4,108,786.00 | 4,283,183.00 |
| මීඩ්කෝ | 22,782,210.00 | 32,191,337.00 |
| ට්‍රයිකෝ - කොළඹ | 40,237,812.00 | 52,771,691.74 |
| ට්‍රයිකෝ – කුරුණෑගල | 15,006,852.00 | 20,078,034.00 |
| ට්‍රයිකෝ – ගාල්ල | 7,614,726.00 | 7,281,651.00 |
| CSL- කොළඹ | 51,677,842.00 | 38,672,141.00 |
| CSL – මහනුවර | 11,448,234.00 | 15,115,634.00 |
| එකතුව (රු) | **316,633,204.00** | **300,096,358.74** |

කාර්ය සාධනය 2019 (රු.)

| | ගමන්මලු සංඛ්‍යාව | දඩ | අතිකාල | බදු | එකතුව |
|---|---|---|---|---|---|
| ගමන් බඩු කාර්යාලය ආනයන - (සමූහ) | | 1,338,300.00 | | | 1,338,300.00 |
| ගමන් බඩු කාර්යාලය (කවුන්ටරය) | | | | | - |
| ගමන් බඩු කාර්යාලය (විකුණුම්) | | | | | - |
| ගමන් බඩු කාර්යාලය (NNR) | 15,347 | 3,164,940.00 | | 47,519,824.00 | 50,684,764.00 |
| ලක්සිරිසේවා - කොළඹ | 99,698 | 4,296,093.00 | 7,961,732.00 | 42,025,041.00 | 54,282,866.00 |
| ලක්සිරිසේවා – නින්දවූර් | 15,773 | 128,983.00 | | 4,097,845.00 | 4,226,828.00 |
| ට්‍රාන්ස්කෝ – වත්තල | 65,292 | 944,116.00 | 5,719,872.00 | 36,059,977.00 | 42,723,965.00 |
| ට්‍රාන්ස්කෝ – දඹුල්ල | 9,572 | 73,000.00 | 1,007,834.00 | 4,283,183.00 | 5,364,017.00 |
| මීඩ්කෝ | 73,802 | 651,100.00 | 5,695,434.00 | 32,191,337.00 | 38,537,871.00 |
| ට්‍රයිකෝ - කොළඹ | 71,928 | 2,393,137.00 | 5,784,589.00 | 52,771,691.74 | 60,949,417.74 |
| ට්‍රයිකෝ – කුරුණෑගල | 36,483 | 342,606.00 | 8,785,830.00 | 20,078,034.00 | 29,206,470.00 |
| ට්‍රයිකෝ – ගාල්ල | 23,018 | 440,200.00 | 9,106,290.00 | 8,281,651.00 | 17,828,141.00 |
| CSL- කොළඹ | 88,250 | 1,496,936.00 | 7,215,000.00 | 38,672,141.00 | 47,384,077.00 |
| CSL – මහනුවර | 31,150 | 256,259.00 | 7,351,262.00 | 15,115,634.00 | 22,723,155.00 |
| එකතුව (රු) | 530,313 | 15,525,670.00 | 58,627,843.00 | 301,096,358.74 | 375,249,871.74 |

## 8.2.5 අපනයන අංශය

**හැඳින්වීම**

අපනයන අංශය එහි ක්‍රියාපටිපාටීන් සරල කිරීම තුලින් මෙන්ම අපනයන රේගු ප්‍රකාශන විද්‍යුත් ක්‍රමය හඳුන්වා දීම මගින් නිත්‍යානුකූල අන්තර්ජාතික භාණ්ඩ සංචලනය ධෛර්යමත් කරන අතර, ඍජු අපනයන හා ප්‍රතිඅපනයන නිෂ්කාශනය කිරීමේ කටයුතුවලට පහසුකම් සලසාලයි. එමෙන්ම මෙම අංශය රටේ සංස්කෘතික, පාරිසරික හා සමාජ අභිලාෂයන් ආරක්ෂා කිරීම පිළිබඳ වගකීමද දරනු ලබයි.

**ප්‍රධාන කාර්යයන්**

1. මෙම අංශය, වරාය මගින් හා ගුවන් මගින් කරනු ලබන සියලු අපනයන කටයුතු සම්බන්ධයෙන් කටයුතු කිරීම
2. මෙරටින් අපනයනය කරනු ලබන සියලුම භාණ්ඩ පිළිබඳව වන සෑම කරුණක් සම්බන්ධවම ක්‍රියා කිරීම.
3. අපනයන භාණ්ඩ රේගු අවශ්‍යතා සහ ආරක්ෂක අවශ්‍යතා සඳහා පරීක්ෂා කිරීම.
4. අපනයන බදු, සෙස් බදු, රාජ්‍යභාග සියලු අපනයනය කරනු ලබන භාණ්ඩ සම්බන්ධයෙන් අය කිරීම.
5. කොළඹ හා තදාසන්න ප්‍රදේශවල බහාලුම් රඳවා තබන ස්ථාන කළමනාකරණය.
6. බහු දේශ ඒකාබද්ධ තොග ගබඩා ( Multi Country Consolidation Warehouses) පවත්වාගෙන යාම.
7. Carnet ක්‍රමය යටතේ තාවකාලික ආනයන පහසු කරවීම.
8. ආපසු ගෙවීම් ඉල්ලීම් අනුමත කිරීම.
9. නැව්ගත කිරීමේ සහතික නිකුත් කිරීම.
10. තීරුබදු ප්‍රතිදාන ලේඛන සහතික කිරීම.
11. නිදහස් ප්‍රතිඅපනයන සහතික ලියාපදිංචිය.
12. මූලික නීතිරීතිවලට අදාළව වෙළඳ දෙපාර්තමේන්තුව නැව්ගත කිරීම සහතික කිරීම.
13. ප්‍රතිනැව්ගත කිරීම් කටයුතු පහසු කරලීම.
14. ජාතික වෙළඳ සංඛ්‍යා ලේඛන සැපයීම.
15. ජාතියේ සමාජ ආර්ථික, සංස්කෘතික හා පාරිසරික අවශ්‍යතා ආරක්ෂා කිරීම
16. පුද්ගලික අංශය, රාජ්‍ය ආයතන ඇතුළුව සියලු පාර්ශවකරුවන් සමඟ සහයෝගිතාවය ගොඩ නැගීම.
17. සියලු ව්‍යාපාරික ක්‍රියාවලින්හි කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය නිරන්තරයෙන් වර්ධනය වන ආකාරයට පද්ධති හා ක්‍රියාපටිපාටි ක්‍රියාවට නැගීම.
18. අපනයන වෙළඳාම පහසු කිරීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය උපරිම ආකාරයට භාවිතයට ගැනීම .

අපනයන ආදායම් - 2019

| | අපනයන කාර්යාලය EFC, සහ CFS අංගනවල ආදායම (රු.) | ගුවන් භාණ්ඩ අපනයන කාර්යාලය (KTEX1) (රු.) | එකතුව (රු.) |
|---|---|---|---|
| අපනයන තීරුබදු | 38,115,148 | 24 | 38,115,172 |
| අපනයන සංවර්ධන මණ්ඩල සෙස් | 1,612,037,805 | 60,993 | 1,612,098,798 |
| සෙස් රබර් - | 156,258 | | 156,258 |
| සෙස් තේ - | 608,917,756 | 6,375 | 608,924,131 |
| තේ වෛද්‍ය ආධාර සෙස් | 532,316 | 5 | 532,321 |
| සෙස් පොල් - | 153,082,567 | 12,931 | 153,095,498 |
| පරීක්ෂණ ගාස්තු | 58,082,010 | 20,619,700 | 78,701,710 |
| බාහිර පරීක්ෂණ ගාස්තු | 8,872,288 | | 8,872,288 |
| රාජ්‍ය භාගය | 37,618 | | 37,618 |
| සංශෝධන ගාස්තු, සංශෝධන දඩ සහ අවලංගු කිරීමේ ගාස්තු | 2,956,025 | 890,250 | 3,846,275 |
| දඩ සහ තවදුරටත් රාජසන්තක කිරීම් | 50,000 | | 50,000 |
| අතිකාල ගාස්තු | 32,112,390 | 34,722,338 | 66,834,728 |
| නැව්ගත කිරීමේ සහතික ගාස්තු | 175,500 | | 175,500 |
| පරිගණක ගාස්තු | 23,273,750 | 20,864,250 | 44,138,000 |
| එකතුව | **2,538,401,431** | **77,176,866** | **2,615,578,297** |

**2019 වර්ෂය සඳහා කාර්ය සාධනය**

1. ඉදිරිපත් කරන ලද හා අවසන් කරන ලද රේගු ප්‍රකාශන සංඛ්‍යාව.
    a. අපනයන කාර්යාලය – 95,251
    b. ගුවන් භාණ්ඩ – 84,299
    c. එකතුව – 179,550
2. සමූහ පරීක්ෂණ අයදුම්පත්
    a. පරීක්ෂණ සංඛ්‍යාව – 6,888
3. ජංගම ගිණුම්
    a. ජංගම ගිණුම් හිමියන්ගේ සංඛ්‍යාව – 43
    b. ක්‍රියාත්මක වන ජංගම ගිණුම් ගණන – 43
    c. කාල පරිච්ඡේදය තුළ තැන්පත් කිරීම – Rs. 1,092,354,945
    d. කාල පරිච්ඡේදය තුළ හර කරන ලද මුළු මුදල – Rs. 1,059,375,777
4. නිකුත් කළ ප්‍රති-ආනයන නිදහස් කිරීමේ සහතික (FRIC) සංඛ්‍යාව – 1006
5. ගබඩා බිල්පත් ගණන – 129
6. නිකුත් කරන ලද නැව්ගත කිරීමේ සහතික ගණන – 702
7. නැව්ගත කිරීමේ සහතික ගාස්තු – Rs. 175,500
8. රේගු වැරදි සඳහා අයකර ගන්නා දඩ මුදල – Rs. 50,000

## 8.3 සහාය සේවා පර්ෂදය

### 8.3.1 ප්‍රතිපත්ති, සැලසුම් හා පර්යේෂණ අංශය

**හැඳින්වීම**

ප්‍රතිපත්ති, සැලසුම් හා පර්යේෂණ අංශය ප්‍රධාන වශයෙන්ම ප්‍රතිපත්තිමය ගැටළු, තීරුබදු ගැටළු හා අන්තර්ජාතික කටයුතු පිළිබඳ වගකීම දරයි. එම අංශයේ පුළුල් අරමුණු පහත දැක්වෙන පරිදි සංක්ෂිප්ත කොට දැක්විය හැකිය.

1. දෙපාර්තමේන්තුවේ ප්‍රතිපත්ති සැලසුම් සකස් කිරීම හා සංවර්ධනය සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයාට සහාය වීම, එම ප්‍රතිපත්ති අදාළ අංශ මගින් ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාපටිපාටි බවට පත් කිරීම සහ එකී තීරණ නිලධාරීන්ගේ දැන ගැනීම හා අනුගත වීම සඳහා දැනුම් දීම.

2. රේඛීය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ඉල්ලා සිටි විට,
   අ. ආර්ථික/වෙළඳ ප්‍රතිපත්ති සංවර්ධනය කිරීම සහ
   ආ. එම ප්‍රතිපත්ති තීරුබදු උපාය මාර්ග බවට පත් කිරීම යන කටයුතුවලට සහාය වීම

3. තීරුබදු ක්‍රියාමාර්ග මහජනතාවට හා නිලධාරීන්ට අවශ්‍ය පරිදි දැනගැනීමට හා ක්‍රියාත්මක කිරීම සඳහා සහාය ලබාදීම.

4. ජාතික රේගු තීරුබදු නිරතුරුවම යාවත්කාලීන ලෙස පවත්වාගෙන යාම සහතික වීම, සියලුම තීරුබදු සම්බන්ධ විමසුම්වලට අවශ්‍ය කටයුතු කිරීම සහ තීරුබදු සම්බන්ධ ආරවුල් නිරාකරණය කිරීම.

5. රේගු තොරතුරු මධ්‍යස්ථානය මගින් මහජනතාව වෙත ස්වයං අනුගතවීම සඳහා අවශ්‍ය තොරතුරු ලබාදීම.

6. ලෝක රේගු සංවිධානයේදී, එහි කලාපීය සංවිධානවලදී, අනෙකුත් ජාත්‍යන්තර සංවිධාන (ලෝක රේගු සංවිධානය හා බහුවිධ පාරිසරික ගිවිසුම්) හා ද්විපාර්ශවික හා බහු පාර්ශවික වෙළඳ සංවිධානවල දී ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව නියෝජනය කිරීම.

7. දෙපාර්තමේන්තුවේ දැක්ම ළඟා කරගනු පිණිස ලෝක රේගු සංවිධානයේ නිර්දේශ හා සාර්ථක අත්දැකීම් ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි බවට පත් කිරීම මගින් එම සංවිධානයේ කටයුතුවලට අනුකූලතාවය දැක්වීම

**ප්‍රධාන කාර්යයන්**

1. මහා භාණ්ඩාගාරය විසින් දක්වන තීරු බදු ප්‍රතිපත්ති තීරණ දෙපාර්තමේන්තු නියෝග (DOPL) මගින් ක්‍රියාත්මක කිරීම
2. දෙපාර්තමේන්තු නියෝග මගින් රේගු ප්‍රතිපත්ති තීරණ දැනුම් දීම සහ ක්‍රියාත්මක කිරීම
3. ආනයන තීරුබදු මාර්ගෝපදේශය යාවත්කාලීන කිරීම සහ පවත්වාගෙන යාම
4. මහජනතාවගේ මෙන්ම කාර්ය මණ්ඩලයේ ප්‍රයෝජනය සඳහා ජාතික තීරුබදු නාමාවලිය, පොත් හා සංයුක්ත තැටි යන දෙයාකාරයෙන්ම ප්‍රකාශයට පත් කිරීම
5. තීරුබදු ප්‍රතිපත්ති සකස් කිරීමේ කාර්යයේදී අවශ්‍ය විට සංයෝජිත භාණ්ඩ වර්ගීකරණ ක්‍රමය තුළ ජාතික උප අංශ නිර්මාණය කිරීම සඳහා මහා භාණ්ඩාගාරයට සහාය වීම
6. දෙපාර්තමේන්තුවේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම
7. ඒ ඒ අංශයෙහි ප්‍රගතිය සමාලෝචනය කරමින් දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව සකස් කිරීම
8. ලෝක රේගු සංවිධානය (WCO), ලෝක රේගු සංවිධානයේ ආසියා පැසිපික් කලාප කාර්යාලය, ලෝක වෙළඳ සංවිධානය (WTO) අනෙකුත් අන්තර්ජාතික සංවිධාන හා රේගු සංවිධානයන්හි සම්බන්ධීකරණ කේන්ද්‍රය ලෙස කටයුතු කිරීම
9. අනෙකුත් රේගු පරිපාලන ආයතනයන් සමඟ රේගු ආයතන හා අන්‍යෝන්‍ය පරිපාලන සහාය ගිවිසුම්වලට අදාල කරුණු සම්බන්ධ කටයුතු කිරීම
10. වරණීය වෙළඳ ගිවිසුම් (PTAs) සහ නිදහස් වෙළඳ ගිවිසුම් (FTAs) සම්බන්ධ කටයුතු සඳහා සහභාගීවීම
11. නාමකරණ කමිටුව, වෙළඳ පහසුකම් සැපයීමේ කමිටුව සහ අවදානම් කළමනාකරණ කමිටුව යන කමිටුවල ලේකම් කටයුතු සඳහා සහභාගි වීම සහ අනෙකුත් තාක්ෂණ කමිටුවල සම්බන්ධීකරණ කටයුතු
12. තීරුබදු, වෙළඳ හා නිෂ්කාශන පිළිවෙත් ආදියට අදාල කරුණු සම්බන්ධව පර්යේෂණ කටයුතුවල යෙදීම
13. කාර්ය පටිපාටි සංග්‍රහය පිළියෙල කිරීම සහ යාවත්කාලීන කිරීම
14. විනිමය අනුපාත දැන්වීම් පිළියෙල කිරීම සහ ප්‍රකාශයට පත් කිරීම
15. මහජන සම්බන්ධතා කටයුතු සහ රේගු තොරතුරු මධ්‍යස්ථානය සම්බන්ධ කාර්යයන් ඉටු කිරීම
16. වාර්ෂිකව සමරනු ලබන ලෝක රේගු දිනය සංවිධානය කිරීම හා සම්බන්ධීකරණය කිරීම

**2019 වර්ෂය තුළදී නිකුත් කරන ලද දෙපාර්තමේන්තු නියෝග**

| | | | |
|---|---|---|---|
| **දෙ/නියෝග 1301** | 03.01.2019 | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද | උඳු |
| **දෙ/නියෝග 1302** | 08.01.2019 | අත්හිටුවීම | සීමාසහිත ට්‍රාන්ස්ලයිෆ් (පුද්ගලික) සමාගම සඳහා වන රේගු පහසුකම් අත්හිටුවීම |
| **දෙ/නියෝග 1303** | 11.01.2019 | තීරුබදු අත්හැරීම | පෙට්‍රල් සහ ඩීසල් මත ආනයන තීරු බදු අත් හැරීම |
| **දෙ/නියෝග 1192 L** | 11.01.2019 | නිෂ්පාදන බදු | 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ ප්‍රකාශයට පත් කරන ලද ගැසට් නිවේදනය |
| **දෙ/නියෝග 1227 A** | 17.01.2019 | අභියාචනා කමිටුව | අභියාචනා කමිටුව |
| **දෙ/නියෝග 1227 B** | 17.01.2019 | අභියාචනා කමිටුව | අභියාචනා කමිටුව (දෙපා. නියෝග 1227 අ සංශෝධනය) |
| **දෙ/නියෝග 562 I** | 21.01.2019 | NC කමිටුව | නාමකරණය සහ වර්ගීකරණ කමිටුව |
| **දෙ/නියෝග 749 F** | 30.01.2019 | තක්සේරු කමිටුව | තක්සේරු කමිටුව |
| **දෙ/නියෝග 1304** | 24.01.2019 | අත්හිටුවීම | වින්ග්ස් ගාමන්ට්ස් සඳහා වන රේගු පහසුකම් අත්හිටුවීම |
| **දෙ/නියෝග 1305** | 24.01.2019 | අත්හිටුවීම | සීමාසහිත බැරෝස් ලංකා (පුද්) සමාගම සඳහා රේගු පහසුකම් අත්හිටුවීම |
| **දෙ/නියෝග 1306** | 01.02.2019 | විශේෂ වෙ. භා. බද්ද | සීනි, පරිප්පු සහ කොණ්ඩ කඩල පිළිබඳ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| **දෙ/නියෝග 1307** | 07.02.2019 | විශේෂ වෙ. භා. බද්ද | අර්තාපල් පිළිබඳ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| **දෙ/නියෝග 1308** | 08.02.2019 | විශේෂ වෙ. භා. බද්ද | බඩ ඉරිඟු පිළිබඳ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| **දෙ/නියෝග 1309** | 21.02.2019 | ආයෝජන මණ්ඩල සම්බන්ධීකරණ අංශය | ආයෝජන මණ්ඩල සම්බන්ධීකරණ අංශය පිහිටුවීම |
| **දෙ/නියෝග 1310** | 25.02.2019 | විශේෂ වෙ. භා. බද්ද | සෝයා බෝංචි තෙල් ආදිය පිළිබඳ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| **දෙ/නියෝග 1311** | 05.03.2019 | විශේෂ වෙ. භා. බද්ද | බී ළූණු මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| **දෙ/නියෝග 1312** | 05.03.2019 | රේගු ආනයන තීරුබදු | ආදායම් ආරක්ෂණ නියෝගය - 2019 අයවැය |
| **දෙ/නියෝග 1313** | 05.03.2019 | සුඛෝපභෝගී භා.බද්ද | මෝටර් වාහන සඳහා සුඛෝපභෝගී භාණ්ඩ බද්ද (මුදල් පනත) - 2019 අයවැය |
| **දෙ/නියෝග 1314** | 05.03.2019 | නිෂ්පාදන බදු | නිෂ්පාදන බදු නිවේදනය - 2019 අයවැය |
| **දෙ/නියෝග 1315** | 05.03.2019 | සෙස් | සෙස් ගාස්තු සංශෝධනය කිරීම - අයවැය 2019 |
| **දෙ/නියෝග 1316** | 05.03.2019 | නිෂ්පාදන බදු | නිෂ්පාදන බදු සංශෝධනය - අයවැය 2019 |
| **දෙ/නියෝග 1317** | 05.03.2019 | ව. ගු. තො. සං බද්ද | වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්ද - අයවැය 2019 සංශෝධනය කිරීම |
| **දෙ/නියෝග 1313A** | 07.03.2019 | සුඛෝපභෝගී බද්ද | දෙපාර්තමේන්තු නියෝග අංක 1313 සඳහා සංශෝධනය- [මෝටර් වාහන සඳහා සුඛෝපභෝගී භාණ්ඩ බද්ද (මූල්‍ය පනත) - අයවැය 2019] |
| **දෙ/නියෝග 1316A** | 11.03.2018 | නිෂ්පාදන බදු | දෙපාර්තමේන්තු නියෝග අංක1316 හි දෝෂ නිවැරදි කිරීම (නිෂ්පාදන බදු සංශෝධනය - 2019 අයවැය) |
| **දෙ/නියෝග 1316B** | 14.03.2019 | නිෂ්පාදන බදු | දෙපාර්තමේන්තු නියෝග අංක 1316 සංශෝධනය කිරීම (නිෂ්පාදන බදු සංශෝධනය - 2019 අයවැය) |
| **දෙ/නියෝග 1316C** | 14.03.2019 | නිෂ්පාදන බදු | දෙපාර්තමේන්තු නියෝග අංක 1316 සංශෝධනය කිරීම (නිෂ්පාදන බදු සංශෝධනය - 2019 අයවැය) |
| **දෙ/නියෝග 1318** | 19.03.2019 | වැට් බද්ද | ඖෂධ නිෂ්පාදන යන්ත්‍රෝපකරණ සහ උපකරණ සඳහා එකතු කළ අගය මත බදු නිදහස් කිරීම - අයවැය 2019 |
| **දෙ/නියෝග 1319** | 21.03.2019 | අත්හිටුවීම | ද මෙරිට් හෝල්ඩින්ග්ස් සඳහා රේගු පහසුකම් අත්හිටුවීම |
| **දෙ/නියෝග 1320** | 26.03.2019 | බැඳුම්කර (TIEP) | රේගු ආඥා පනතේ 22 අ වගන්තියේ (235 වන පරිච්ඡේදය) (1) සහ (2) උප වගන්ති යටතේ කරනු ලබන දැනුම් දීම (TIEP යෝජනා ක්‍රමය යටතේ භාණ්ඩ කිහිපයක් ආනයනය කිරීම තහනම් කිරීම) |
| **දෙ/නියෝග 1316D** | 27.03.2019 | නිෂ්පාදන බදු | දෙපාර්තමේන්තු නියෝග අංක1316 හි දෝෂ නිවැරදි කිරීම (නිෂ්පාදන සංශෝධනය - 2019 අයවැය) |
| **දෙ/නියෝග 1321** | 29.03.2019 | අපනයන | ගුවන් භාණ්ඩ පර්යන්තයේ අපනයන භාණ්ඩ නිදහස් කිරීම |
| **දෙ/නියෝග 1322** | 29.03.2019 | අපනයන | මුහුදු මගින් ප්‍රවාහනයෙන් ගුවන් ප්‍රවාහනය වෙත භාණ්ඩ මාරුකිරීමේ ක්‍රියාවලිය ස්වයංක්‍රීයකරණය |
| **දෙ/නියෝග 218F** | 01.04.2019 | අතිකාල | යාත්‍රා මෙහෙයුම් සහ භාණ්ඩ ප්‍රවාහනය සඳහා ඒකාබද්ධ ගාස්තු අයකර ගැනීම |
| **දෙ/නියෝග 1315A** | 04.04.2019 | සෙස් | දෙපාර්තමේන්තු නියෝග 1315 සංශෝධනය කිරීම (2019.03.05 දින හෝ ඊට පෙර විවෘත කරන ලද ණයවර ලිපිය (LC) මත පදනම්ව ආනයනය කරනු ලබන භාණ්ඩ සඳහා සෙස් ගාස්තු,) - අයවැය 2019 |

| | | | |
|---|---|---|---|
| **දෙ/නියෝග 1323** | 04.04.2019 | නිෂ්පාදන බදු | 1989 අංක 13 නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ ප්‍රකාශයට පත් කරන ලද ගැසට් නිවේදනය |
| **දෙ/නියෝග 118V** | 04.04.2019 | අවදානම් කළමනාකරණ | අවදානම් කළමනාකරණ ප්‍රතිලාභ සංචිතය (RMRP) පිහිටුවීම |
| **දෙ/නියෝග 1324** | 08.04.2019 | CHA / විශේෂිත සේවා | රේගු නියෝජිතයින්ට සහ වාප්පු සහායකයින්ට නිකුත් කරන ලද බලපත්‍ර අහෝසි කිරීම සහ අවලංගු කිරීම. |
| **දෙ/නියෝග 1313B** | 09.04.2019 | සුඛෝපභෝගී බද්ද | දෙ/නියෝග අංක 1313 හි සංශෝධනය - මෝටර් වාහන සඳහා සුඛෝපභෝගී බද්ද (මුදල් පනත) - අයවැය 2019 |
| **දෙ/නියෝග 1325** | 07.05.2019 | විශේෂ වෙ. හා. බද්ද | අර්තාපල්, කිව් ෆෘට් ආදිය පිළිබඳ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| **දෙ/නියෝග 1326** | 07.05.2019 | වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්ද | වෙළඳ භණ්ඩ කිහිපයක් වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්දෙන් නිදහස් කිරීම (ලෝහ හඳුනා ගැනීමේ උපකරණ, පුපුරන ද්‍රව්‍ය හඳුනා ගැනීමේ උපකරණ ආදිය) |
| **දෙ/නියෝග 1313C** | 09.05.2019 | සුඛෝපභෝගී භා.බද්ද | 2018 අංක 35 දරණ මුදල් පනත යටතේ 2019 අංක 1 දරන මූල්‍ය රෙගුලාසි(මෝටර් වාහන සඳහා සුඛෝපභෝගී භාණ්ඩ බද්ද) මගින් මෝටර් වාහන සඳහා සුඛෝපභෝගී භාණ්ඩ බද්ද අය කිරීම |
| **දෙ/නියෝග 1327** | 14.05.2019 | නිෂ්පාදන බදු | නිෂ්පාදන බදු සංශෝධනය කිරීම - 1989 අංක 13 නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වන වගන්තිය යටතේ කරන ලද නියෝගය (සිගරට් සඳහා නිෂ්පාදන බදු) |
| **දෙ/නියෝග 562 J** | 21.05.2019 | NC කමිටුව | නාමකරණ සහ වර්ගීකරණ කමිටුව |
| **දෙ/නියෝග 1328** | 21.05.2019 | විශේෂ වෙ. හා. බද්ද | භාණ්ඩ කිහිපයක් පිළිබඳ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද (රතු ළූණු, ඇට වර්ග ආදිය) |
| **දෙ/නියෝග 1329** | 21.05.2019 | විශේෂ වෙ. හා. බද්ද | බී ළූණු මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| **දෙ/නියෝග 1330** | 31.05.2019 | වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්ද | වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බද්ද |
| **දෙ/නියෝග 1331** | 03.06.2019 | අත්හිටුවීම | ටිසේවා ඉන්ටර්නැෂනල් සඳහා වන රේගු පහසුකම් අත්හිටුවීම |
| **දෙ/නියෝග 1332** | 06.06.2019 | අත්හිටුවීම | ෂාන් ලංකා ඉම්පෝට්ස් සඳහා වන රේගු පහසුකම් අත්හිටුවීම |
| **දෙ/නියෝග 1333** | 12.06.2019 | භාණ්ඩ පරීක්ෂණ අංශය | බදු අරමුණු සඳහා ටින් කළ නිෂ්පාදනවල බර පිළිබඳ පැහැදිලි කිරීම |
| **දෙ/නියෝග 1334** | 12.06.2019 | තීරුබදු අත්හැරීම | රේගු ආනයන තීරුබදු සාමාන්‍ය අත්හැරීම (පෙට්‍රල් සහ ඩීසල්) |
| **දෙ/නියෝග 1335** | 12.06.2019 | රේගු ආනයන තීරුබදු | ආදායම් ආරක්ෂණ නියෝග අංක 2019 /02 (ඩීසල්) |
| **දෙ/නියෝග 1336** | 13.06.2019 | බැඳුම්කර | කොළඹ වරාය පරිශ්‍රයේ සීමාසහිත සියැම් සිටි (ලංකා) සමාගම විසින් ගබඩා තුළ / සිට දේශීයව නිපදවන සිමෙන්ති ගබඩා කිරීම හා බෙදා හැරීම. |
| **දෙ/නියෝග 1337** | 18.06.2019 | අත්හිටුවීම | රේගු පහසුකම් අත්හිටුවීම- සී/ස R M A කාර් සේල් පුද්ගලික සමාගම |
| **දෙ/නියෝග 1338** | 20.06.2019 | මගී ගමන් මලු / CBMV | කැටුව නොයන මගී ගමන් මලු ගබඩාවලින් මුදා හරින ලද මෝටර් රථ පිළිබඳ තොරතුරු මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධ කිරීම |
| **දෙ/ නියෝග 1339** | 20.06.2019 | අත්හිටුවීම | රේගු පහසුකම් අත්හිටුවීම- - සී/ස ෆෝ එවර් ස්කින් නැචුරල්ස් පුද්ගලික සමාගම |
| **දෙ/නියෝග 1227C** | 21.06.2019 | අභියාචනා | අභියාචනා කමිටුව |
| **දෙ /නියෝග 1340** | 24.06.2019 | නිෂ්පාදන බදු | නිෂ්පාදන බදු නිවේදනය 04/2019 |
| **දෙ/නියෝග 1341** | 04.07.2019 | විශේෂ වෙ. හා. බද්ද | උඳු මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| **දෙ /නියෝග 1337A** | 04.07.2019 | අත්හිටුවීම | රේගු පහසුකම් අත්හිටුවීම සී/ස R M A කාර් සේල් පුද්ගලික සමාගම |
| **දෙ /නියෝග 1342** | 09.07.2019 | ජා.ඖ.නි.අ.(NMRA) | දේශසීමා නිෂ්පාදන සඳහා ජා.ඖ.නි.අ. ( විසින් නිකුත් කරන ලද වර්ගීකරණ වාර්තාව (මූලික ඇගයීම් වාර්තාව) |
| **දෙ /නියෝග 1343** | 09.07.2019 | ශාක නිරෝධායනය | ඇමරිකානු නිවර්තන කලාපයෙන් ධාන්‍ය ආනයනය කිරීම; ඇමරිකානු කොළ අංගමාරය |
| **දෙ /නියෝග 1344** | 11.07.2019 | නිෂ්පාදන බදු | නිෂ්පාදන බදු සංශෝධනය කිරීම - 1989 අංක 13 නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වන වගන්තිය යටතේ කරන ලද නියෝගය (සිගරට් සඳහා නිෂ්පාදන බදු) |
| **දෙ /නියෝග 1345** | 11.07.2019 | තීරුබදු අත්හැරීම | රේගු ආනයන තීරුබදු සාමාන්‍ය නිදහස් කිරීම (සුපිරි ඩීසල්) |
| **දෙ /නියෝග 1346** | 11.07.2019 | විශේෂ වෙ. හා. බද්ද | ඇපල්, දොඩම්, පාම් තෙල් සහ වෙනත් තෙල් ආදිය පිළිබඳ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| දෙ/නියෝග 562K | 12.07.2019 | NC කමිටුව | නාමකරණ සහ වර්ගීකරණ කමිටුව |
| **දෙ/නියෝග 1347** | 17.07.2019 | නිවාරණ | කසල/ අගයෙන් තොර අයිතම ඉවත් කිරීමේ ක්‍රියා පටිපාටිය |
| **දෙ/නියෝග 1348** | 18.07.2019 | වෘ.ස /රේ.අ.ජ | සහකාර රේගු අධිකාරී තනතුරට ඉහළ නිලධාරීන් සඳහා ශ්‍රී ලංකා රේගු නිල ඇඳුම් |
| **දෙ/නියෝග 1349** | 19.07.2019 | අත්හිටුවීම | රේගු පහසුකම් අත්හිටුවීම -COL එක්සිම්, ප්‍රධාන නගර වෙළඳපොල, ප්‍රධාන වීදිය, කොළඹ 11 |

| | | | |
|---|---|---|---|
| **දෙ/නියෝග 1350** | 19.07.2019 | විශේෂ වෙ. හා. බද්ද | උම්බලකඩ, මිරිස්, වෙනත් කුළුබඩු ආදිය පිළිබඳ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| **දෙ/නියෝග 1351** | 25.07.2019 | TFA (කඩිනම් නැව්ගත කිරීම) | කඩිනම් නැව්ගත කිරීම් සඳහා අවම අගයන් (කුරියර්) |
| **දෙ/නියෝග 1352** | 26.07.2019 | අත්හිටුවීම | රේගු පහසුකම් අත්හිටුවීම ලංකා ගල් අඟුරු සමාගම |
| **දෙ/නියෝග 1353** | 01.08.2019 | විශේෂ වෙ. හා. බද්ද | කඩල, පරිප්පු සහ සීනි පිළිබඳ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| **දෙ/නියෝග 1354** | 05.08.2019 | අත්හිටුවීම | ප්‍රකාශයට පත් කර නැත. |
| **දෙ/නියෝග 1355** | 08.08.2019 | විශේෂ වෙ. හා. බද්ද | බඩ ඉරිඟු පිළිබඳ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| **දෙ/නියෝග 1323A** | 08.08.2019 | නිෂ්පාදන බදු | 1989 අංක 13 දරන පනත යටතේ ප්‍රකාශයට පත් කරන ලද ගැසට් නිවේදනය |
| **දෙ/නියෝග 1356** | 10.08.2019 | විශේෂ වෙ. හා. බද්ද | පාම් ඔයිල් මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| **දෙ/නියෝග 1316E** | 10.08.2019 | නිෂ්පාදන බදු | දෙපාර්තමේන්තු නියෝග 1316 සංශෝධනය කිරීම |
| **දෙ/නියෝග 1349A** | 13.08.2019 | අත්හිටුවීම | රේගු පහසුකම් අත්හිටුවීම- COL එක්සිම්, ප්‍රධාන නගර වෙළඳපොළ, ප්‍රධාන වීදිය, කොළඹ 11 |
| **දෙ/නියෝග 562L** | 15.08.2019 | NC කමිටුව | නාමකරණ සහ වර්ගීකරණ කමිටුව |
| **දෙ/නියෝග 1348A** | 19.08.2019 | වෘ.ස /රේ.අ.ජ | සහකාර රේගු අධිකාරී තනතුරට ඉහළ නිලධාරීන් සඳහා ශ්‍රී ලංකා රේගු නිල ඇඳුම් |
| **දෙ/නියෝග 1357** | 26.08.2019 | ප්‍රතිපත්ති සැලසුම් | අපේක්ෂිත දඩ මුදල් අයකර ගැනීම සහ රාජසන්තක කිරීමේ ගෙවීම් සඳහා පොලී අනුපාත නියම කිරීම සඳහා වන රෙගුලාසි |
| **දෙ/නියෝග 1358** | 26.08.2019 | සන්නිවේදන තාක්ෂණ | භාණ්ඩ භාරකරුවන් වෙත මුදා හරින ලද යතුරුපැදි පිළිබඳ තොරතුරු මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධ කිරීම |
| **දෙ/නියෝග 1227D** | 26.08.2019 | අභියාචන | අභියාචනා කමිටුව |
| **දෙ/නියෝග 1359** | 26.08.2019 | අත්හිටුවීම | රේගු පහසුකම් අත්හිටුවීම - ස්ක්‍රීන් ප්ලේ වෙළඳ සමාගම |
| **දෙ/නියෝග 1348B** | 28.08.2019 | වෘ.ස /රේ.අ.ජ | ශ්‍රී ලංකා රේගුවේ සහකාර රේගු අධිකාරී තනතුරට ඉහළ නිලධාරීන් සඳහා වන රේගු නිල ඇඳුම් |
| **දෙ/නියෝග 1359A** | 02.09.2019 | අත්හිටුවීම | රේගු පහසුකම් අත්හිටුවීම - ස්ක්‍රීන් ප්ලේ වෙළඳ සමාගම |
| **දෙ/නියෝග 1360** | 09,09,2019 | විශේෂ වෙ. හා. බද්ද | මැකරල්, කුරක්කන් ආදිය පිළිබඳ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| **දෙ/නියෝග 1357A** | 10.09.2019 | ප්‍රතිපත්ති සැලසුම් | අයකිරීමට අපේක්ෂිත දඩ මුදලෙහි පොලී අයකර ගැනීම සඳහා අනුපාත නියම කිරීම සඳහා පනවන ලද රෙගුලාසි අවලංගු කිරීම |
| **දෙ/නියෝග 1361** | 11.09.2019 | ආ.ආ.නි | ආදායම් ආරක්ෂණ නියෝගය 03/2019 |
| **දෙ/නියෝග 1362** | 11.09.2019 | විශේෂ වෙ. හා. බද්ද | උඳු සඳහා විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| **දෙ/නියෝග 1363** | 11.09.2019 | තීරුබදු අත්හැරීම | රේගු ආනයන තීරුබදු සාමාන්‍ය අත්හැරීම (පෙට්‍රල් 92 ඔක්ටේන්) |
| **දෙ/නියෝග 1352A** | 17.09.2019 | අත්හිටුවීම | රේගු පහසුකම් අත්හිටුවීම- ලංකා ගල් අඟුරු සමාගම |
| **දෙ/නියෝග 1364** | 24.09.2019 | ව. ගු. තො. සං බද්ද | වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බද්ද |
| **දෙ/නියෝග 1365** | 29.09.2019 | ආ.ආ.නි | ආදායම් ආරක්ෂණ නියෝගය - නියෝග අංක 4 |
| **දෙ/නියෝග 1366** | 01.10.2019 | විශේෂ වෙ. හා. බද්ද | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| **දෙ/නියෝග 1367** | 02.10.2019 | නිෂ්පාදන බදු | සීමාසහිත වෙහිකල් ලංකා (පෞද්ගලික) සමාගම විසින් එකලස් කරන ලද වාහන සඳහා බදු ලියාපදිංචි කිරීම සහ අය කිරීම |
| **දෙ/නියෝග 1348C** | 02.10.2019 | වෘ.ස /රේ.අ.ජ | සහකාර රේගු අධිකාරී තනතුරට ඉහළ නිලධාරීන් සඳහා ශ්‍රී ලංකා රේගු නිල ඇඳුම් |
| **දෙ/නියෝග 1368** | 02.10.2019 | විශේෂ වෙ. හා. බද්ද | බී ලූනු පිළිබඳ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| **දෙ/නියෝග 1369** | 02.10.2019 | සෙස් | අපනයන සංවර්ධන පනත සංශෝධනය කිරීම |
| **දෙ/නියෝග 1370** | 14.10.2019 | නිෂ්පාදන බදු | නිෂ්පාදන බදු සංශෝධනය කිරීම - 1989 අංක 13 නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වන වගන්තිය යටතේ කරන ලද නියෝගය (සිගරට් සඳහා නිෂ්පාදන බදු) |
| **දෙ/නියෝග 562M** | 10.10.2019 | NC කමිටුව | නාමකරණ සහ වර්ගීකරණ කමිටුව |
| **දෙ/නියෝග 1371** | 22.10.2019 | භාණ්ඩ ප්‍රකාශන | ආනයන රේගු ප්‍රකාශන සඳහා ණයවර ලිපියෙහි ඈඩ පිටපත් හා ඉන්වොයිසිය මත බැංකු මුද්‍රාව ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවය ඉවත් කිරීම |
| **දෙ/නියෝග 1372** | 24.10.2019 | ආයෝජන මණ්ඩල | ආයෝජන මණ්ඩල දේශීය විකුණුම් පටිපාටිය |
| **දෙ/නියෝග 1373** | 29.10.2019 | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද | මාළු හා මිරිස් සඳහා විශේෂ වෙළඳ භාණ්ඩ බදු අත්හැරීම |
| **දෙ/නියෝග 1348D** | 01.11.2019 | වෘත්තීය සංගම | දෙපාර්තමේන්තු නියෝග 1348 A සහ දෙපාර්තමේන්තු නියෝග අංක 1348 C අත්හිටුවීම |
| **දෙ/නියෝග 1374** | 01.11.2019 | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද | බී ලූනු පිළිබඳ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| **දෙ/නියෝග 1375** | 01.11.2019 | සුඛෝපභෝගී බද්ද | සුඛෝපභෝගී බද්ද |
| **දෙ/නියෝග 1376** | 04.11.2019 | වැට් බද්ද | ආයෝජන මණ්ඩල දේශීය විකුණුම් සඳහා වැට් බද්ද |

| | | | |
|---|---|---|---|
| **දේ/නියෝග 1377** | 08.11.2019 | විශේෂ වෙ. හා. බද්ද | කරවල, දොඩම්, වියලි මිදි සහ කිවිෆෘට් ආදිය පිළිබඳ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| **දේ/නියෝග 1378** | 08.11.2019 | විශේෂ වෙ. හා. බද්ද | රටඉඳි, ඇපල්, දොඩම්, බොරතෙල් සහ පොල්තෙල් ආදිය පිළිබඳ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| **දේ/නියෝග 1379** | 08.11.2019 | එකතු කළ අගය මත බදු / ජාතිය ගොඩනැගීමේ බදු | 2019 අංක 19 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත සහ 2019 අංක 20 දරන ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත |
| **දේ/නියෝග 1380** | 26.11.2019 | අත්හිටුවීම | රේගු පහසුකම් අත්හිටුවීම - සී/ස ජැට් හෝල්ඩින් (පෞද්ගලික) සමාගම |
| **දේ/නියෝග 118W** | 27.11.2019 | ප්‍රතිපත්ති සැලසුම් | නව පොදු සංචිතයක් පිහිටුවීම (ප්‍රතිපත්ති සැලසුම් හා පර්යේෂණ සංචිතය) |
| **දේ/නියෝග 1381** | 29.11.2019 | විශේෂ වෙ. හා. බද්ද | මිරිස් සහ මාළු පිළිබඳ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| **දේ/නියෝග 1382** | 29.11.2019 | එකතු කළ අගය මත බදු / ජාතිය ගොඩනැගීමේ බදු | නව බදු යෝජනා ක්‍රියාත්මක කිරීම |
| **දේ/නියෝග 1383** | 02.12.2019 | නිෂ්පාදන බදු | නිෂ්පාදන බදු සංශෝධනය කිරීම - 1989 අංක 13 නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වන වගන්තිය යටතේ කරන ලද නියෝගය (සිගරට් සඳහා නිෂ්පාදන බදු) |
| **දේ/නියෝග 1382A** | 05.12.2019 | එකතු කළ අගය මත බදු / ජාතිය ගොඩනැගීමේ බදු | නව බදු යෝජනා ක්‍රියාත්මක කිරීම |
| **දේ/නියෝග 1384** | 06.12.2019 | ව. ගු. තො. සං බද්ද | වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්ද 2152/32, 05.12.2019 |
| **දේ/නියෝග 1385** | 09.12.2019 | නිෂ්පාදන බදු | නිෂ්පාදන බදු නිවේදනය 08/2019 |
| **දේ/නියෝග 1386** | 09.12.2019 | ආනයන පාලනය | මෝටර් වාහන සඳහා වායු විමෝචන ප්‍රමිති සහ ආරක්ෂිත මිනුම් / ප්‍රමිති පිළිබඳ මෙහෙයුම් උපදෙස් |
| **දේ/නියෝග 1387** | 10.12.2019 | ආනයන පාලනය | ආනයන පාලන ලැයිස්තුවේ රෙගුලාසි |
| **දේ/නියෝග 1380A** | 10.12.2019 | අත්හිටුවීම | රේගු පහසුකම් අත්හිටුවීම තාවකාලිකව ඉවත් කිරීම- සී/ස ජැට් හෝල්ඩින් පෞද්ගලික සමාගම |
| **දේ/නියෝග 1384A** | 12.12.2019 | ව. ගු. තො. සං බද්ද | වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්ද 2152/32, 05.12.2019 සංශෝධනය |
| **දේ/නියෝග 1375A** | 16.12.2019 | සුඛෝපභෝගී බද්ද | මෝටර් වාහන සුඛෝපභෝගී බද්ද සංශෝධනය කිරීම 2147/72, 31.10.2019 විශේෂ ගැසට් පත්‍රය |
| **දේ/නියෝග 1388** | 16.12.2019 | විශේෂ වෙ. හා. බද්ද | තිරිඟු පිටි සඳහා විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| **දේ/නියෝග 1389** | 16.12.2019 | තීරුබදු අත්හැරීම | තිරිඟු ධාන්‍ය මත තීරුබදු අත්හැරීම |
| **දේ/නියෝග 1384B** | 19.12.2019 | ව. ගු. තො. සං බද්ද | වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්ද 2152/32, 05.12.2019 සංශෝධනය |
| **දේ/නියෝග 1384C** | 19.12.2019 | ව. ගු. තො. සං බද්ද | වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්ද 2152/32, 05.12.2019 සංශෝධනය |
| **දේ/නියෝග 1390** | 26.12.2019 | විශේෂ වෙ. හා. බද්ද | අර්තාපල් මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද, වෙනත් 0701.90 |

**ජාත්‍යන්තර කටයුතු**

**විවෘත කරන ලද දෙපාර්තමේන්තු විෂයය ලිපිගොනු**

| **ලිපිගොනු අංකය** | **විෂයය** |
|---|---|
| PP&R/CIAD/01/2019 | රේගු ජාත්‍යන්තර කටයුතු - විවිධ |
| PP&R/CIAD/02/2019 | ශ්‍රී ලංකාව සහ මෙක්සිකෝව අතර ද්විපාර්ශ්වික ලිපි ගනුදෙනු |
| PP&R/CIAD/03/2019 | ලෝක රේගු සංගමය සමග ලිපි ගනුදෙනු |
| PP&R/CIAD/04/2019 | ලෝක බැංකු කණ්ඩායම- ව්‍යාපාර කටයුතු ව්‍යාපෘතිය |
| PP&R/CIAD/05/2019 | ටිමෝර්-ලෙස්ටේ රේගුව සමග ලිපි ගනුදෙනු |
| PP&R/CIAD/06/2019 | ලෝක රේගු සංගමය- ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ විවිධත්වය |
| PP&R/CIAD/07/2019 | ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘති |
| PP&R/CIAD/08/2019 | කුඩා දූපත් ආර්ථිකයන් |
| PP&R/CIAD/09/2019 | පුද්ගලයන් ජාවාරම් කිරීමේ අපරාධ වැළැක්වීම සහ මර්දනය කිරීම පිළිබඳ සහයෝගීතාවය සඳහා ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර අවබෝධතා ගිවිසුම |
| PP&R/CIAD/10/2019 | ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර ආර්ථික හා තාක්ෂණ සහයෝගීතා ගිවිසුම (ETCA) |
| PP&R/CIAD/11/2019 | ත්‍රෛපාර්ශ්වීය සහයෝගීතා රාමුව |
| PP&R/CIAD/12/2019 | ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග ලිපි ගනුදෙනු |
| PP&R/CIAD/13/2019 | වෙළඳ නැව් ක්ෂේත්‍රයේ සහයෝගිතාව පිළිබඳ ශ්‍රී ලංකා රජය සහ ජෝර්ජියා රජය අතර ගිවිසුම |
| PP&R/CIAD/14/2019 | ලෝක රේගු සංගම් මහලේකම්වරයාගේ ශ්‍රී ලංකා සංචාරය 2020 |
| PP&R/CIAD/15/2019 | ශ්‍රී ලංකාව සහ එක්සත් ජනපදය අතර රේගු අන්‍යෝන්‍ය සහයෝගීතාවය |
| PP&R/CIAD/16/2019 | සංශෝධිත කියෝතෝ සම්මුතිය (RKC) |

ප්‍රතිපත්ති, සැලසුම් හා පර්යේෂණ අංශය විසින් සංවිධානය කරන ලද වැඩසටහන්

1. ජාත්‍යන්තර රේගු දිනය සැමරීම
2. රේගු දින සැමරුමට සමගාමීව ශ්‍රී ලංකා රේගුවේ නිෂ්කාශන කාල නිර්ණ අධ්‍යයන වාර්තාව එළි දැක්වීම.
3. ලෝක වෙළඳ සංවිධානයේ වෙළඳාම සඳහා පහසුකම් සැපයීමේ ගිවිසුම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන්

**වෙළඳ පහසුකම් සැපයීම පිළිබඳ ඒකකය**

ප්‍රතිපත්ති, සැලසුම් හා පර්යේෂණ අංශය යටතේ ඇති වෙළඳ පහසුකම් ඒකකයේ කාර්ය සාධනය පිළිබඳ තොරතුරු 2.3.2 වගන්තියෙන් දක්වා ඇත.

## 8.3.2 අනුකූලතා සහ පහසුකම් සැලසීමේ අංශය

**හැඳින්වීම**

වෙළඳ පහසුකම් සැලසීම සහ රේගු පාලනය අතර සමබරතාවය සහතික කිරීම සඳහා රේගු පශ්චාත් නිෂ්කාශන විගණන ශාඛාව පිහිටුවා ඇත. මෙම විගණනයන්හි ප්‍රධාන පරමාර්ථය වන්නේ රේගු ප්‍රකාශනයන්හි නිරවද්‍යතාවය හා අව්‍යාජභාවය තහවුරු කිරීම සහ ජාත්‍යන්තර වෙළඳාමට පහසුකම් සැපයීම යන කරුණු ඉටු කරන අතරම ඒවා රේගු අවශ්‍යතාවයන්ට අනුකූලද යන්න සහතික කිරීමයි. ජාත්‍යන්තර වෙළඳාමට පහසුකම් සැලසීමටත් රේගු ක්‍රියා පටිපාටි හා ව්‍යාපාරික ප්‍රජාව සඳහා වන අවශ්‍යතා පිළිබඳව ද වඩා හොඳ අවබෝධයක් ලබා දීමටත්, ව්‍යාපාරිකයන් විසින් රේගු නීතියට දක්වන අනුකූලතාව වැඩි කිරීම දිරි ගැන්වීමටත් පශ්චාත් නිෂ්කාශන විගණනයන් (PCA) මගින් රුකුලක් සපයනු ලැබේ.

පශ්චාත් නිෂ්කාශන විගණනයක් අදාළ ව්‍යාපාරිකයාගේ පරිශ්‍රයේදී සිදුවිය හැකි අතර, එක් එක් කාල සීමාව තුළ සිදු කරන ලද තනි ගනුදෙනු හෝ ආනයන / අපනයන සැලකිල්ලට ගැනීමෙන් සිදු කෙරේ. මෙම විගණනයන්, අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය සඳහා ආදානයක් ලෙස ද, අනුකූලතාවය සුරකින වෙළඳුන් සඳහා වැඩිමනත් පහසුකම් ලබා දීම සඳහා නිර්ණායකයක් ලෙස ද භාවිතා කළ හැකිය

මෙහි දැක්ම (vision) ට අනුව, ලෝක වෙළඳ සංවිධානයේ මිල පිරික්සුම් ගිවිසුම සාර්ථකව ක්‍රියාත්මක කිරීම පහසු කරනු පිණිස පශ්චාත් නිෂ්කාශන හා විගණන ශාඛාව (PCAB) ප්‍රථම වරට මිල පිරික්සුම් අංශය යටතේ පිහිටුවන ලදී. මෙම ශාඛාව පිහිටුවන ලද්දේ පශ්චාත් විගණන හා ප්‍රකාශන ඒකකය (PAMU) සහ විගණන හා පරීක්ෂණ ශාඛාව (A&ID) ඒකාබද්ධ කිරීමෙනි.

2010 වර්ෂය අග භාගයේදී රේගු ප්‍රතිසංස්කරණ හා නවීකරණ වැඩ සටහන යටතේ නව සංවිධාන ව්‍යුහය ක්‍රියාත්මක කිරීමත් සමග, මිල පිරික්සුම් අංශය යටතේ ක්‍රියාත්මකවූ පශ්චාත් නිෂ්කාශන සහ විගණන අංශය, නීති බලාත්මක කිරීමේ පර්ෂදය තුළ රේගු අධ්‍යක්ෂකවරයෙකු යටතේ උත්ශ්‍රේණිගත කරනු ලදුව, පශ්චාත් නිෂ්කාශන විගණන අංශය (PCA) වශයෙන් හඳුන්වන ලදී.

දෙපාර්තමේන්තු නියෝග 883 ට අනුව, අනුකූලතාවය සුරකින වෙළෙඳුන්ට පහසුකම් සැලසීමේ අවශ්‍යතාවය සහ රේගු නිෂ්කාශන ක්‍රියාවලියේ අඩුපාඩු හා වංචා හඳුනා ගැනීම යන කරුණු සැලකිල්ලට ගනිමින් පශ්චාත් නිෂ්කාශන විගණන හා අවදානම් කළමනාකරණ ඒකකය පිහිටුවා ඇත. එබැවින් එය සහාය සේවා පර්ෂදය තුළ ඇති එක් අංශයක් යටතට ගෙන 2013 සැප්තැම්බර් 26 දින සිට බලපැවැත්වෙන පරිදි “අනුකූලතා සහ පහසුකම් සැලසීමේ අංශය” (C & F D) ලෙස නම් කරන ලදී.

කෙසේ වෙතත්, පසුකාලීනව අවදානම් කළමනාකරණ ඒකකය, එහි කාර්යයන් පුළුල් කිරීමත් සමඟ අනුකූලතා සහ පහසුකම් සැලසීමේ අංශයෙන් වෙන් කොට මධ්‍යම බුද්ධි අංශය යටතේ ක්‍රියාත්මක විය. වර්තමානයේදී, සහාය සේවා පර්ෂදය තුළ ඇති “පශ්චාත් නිෂ්කාශන විගණන අංශය ”ට පශ්චාත් නිෂ්කාශන විගණන ශාඛාව සහ මුදල් ආපසු ගෙවීමේ ශාඛාව යන ඒකකයන් අයත්වේ. පශ්චාත් නිෂ්කාශන විගණන ශාඛාව රේගු නීතිය ක්‍රියාත්මක කිරීම සහ වෙළඳ පහසුකම් සැපයීම අතර සමබරතාවය සහතික කරයි.

පශ්චාත් නිෂ්කාශන විගණනය යනු අපනයන හෝ ආනයනික භාණ්ඩ නිෂ්කාශනය කිරීමෙන් පසුව සිදු කරන ලබන විගණන ක්‍රියාවලියකි. රේගු ප්‍රකාශනයන්හි අව්‍යාජභාවය සහ නිරවද්‍යතාවය සහතික කිරීම සහ ජාත්‍යන්තර වෙළඳාමට පහසුකම් සැලසීම සඳහා භාවිතා කළ හැකි පරිදි,රේගු අවශ්‍යතාවයන් කෙරෙහි ආනයනකරුවන් විසින් දක්වන අනුකූලතා මට්ටම තක්සේරු කිරීමේ වගකීම මෙම ශාඛාව මගින් ඉටු වේ. එබැවින් පශ්චාත් නිෂ්කාශන විගණනය මගින් රේගු ක්‍රියාවලීන් සහ රේගු අවශ්‍යතා පිළිබඳ අවබෝධය වැඩි කරවන අතරම රේගු රෙගුලාසිවලට අනුකූල වන ලෙස මෙහෙයුම්කරුවන් දිරිමත් කරනු ලැබේ.

මෙම පශ්චාත් නිෂ්කාශන විගණනයන් (PCA) පුද්ගල කාර්යය විගණනය, ආනයනකරුගේ පරිශ්‍රයේ සිදු කරනු ලබන විගණනය ආදිවූ විවිධ ක්‍රමවේදයන් භාවිතා කරමින් කිහිප ආකාරයකින් සිදු කළ හැකිය.වසර තුනක කාලයක් තුළ සිදු කරන ලද ආනයන හා අපනයන පිළිබඳ තොරතුරු පශ්චාත් නිෂ්කාශන විගණනයකදී සැලකිල්ලට ගත හැකි අතර මින් ලබාගන්නා ප්‍රතිඵල එක් එක් ආනයන හෝ අපනයනකරුවන්ගේ අනුකූලතා මට්ටමට අනුව ව්‍යාපාරික පැතිකඩ නිර්මාණය කිරීමට යොදා ගත හැකිය. වැඩි දුරටත් එකී ප්‍රතිඵල අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය සඳහා යෙදවුම් ලෙස භාවිතා කළ හැකිය.

**මූලික අරමුණු**

1. පසුගිය යම් කාලසීමාවක් තුළ රේගු සටහන්කරවල නීත්‍යානුකූලභාවය හා නිරවද්‍යතාව පරීක්ෂා කිරීම
2. වැරදි රේගු සටහන්කර සංශෝධනය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම පිණිස විගණනලාභීන්ට නිර්දේශ ලබා දීම.
3. විගණනලාභීන් රේගු නීතිය හා රෙගුලාසිවලට අනුගතවීම වැඩි කිරීමට පෙළඹවීම.
4. අවදානම් කළමනාකරණ ක්‍රියාවලියට යෙදවුම් වශයෙන් භාවිතා කළ හැකි අවදානම් දර්ශක හඳුනා ගැනීම

**ප්‍රධාන කාර්යයන්**

1. විගණන වැඩසටහන් සකස් කිරීම
2. ASYCuDa පද්ධතියේ ඇති ව්‍යාපාරිකයන්ගේ අතීත වාර්තා භාවිතා කරමින් විගණන ලාභියෙකු තෝරා ගැනීම
3. පුද්ගල කාර්යය විගණන සහ වෙනත් අත්‍යවශ්‍ය විගණන ක්‍රම මගින් විගණනය සඳහා සූදානම් වීම
4. පුද්ගල කාර්යය විගණනය තුළින් කිසියම් විෂමතාවයක් හෙළිදරව් වුවහොත් ක්ෂේත්‍ර විගණනයක් පැවැත්වීම
5. කිසියම් වංචනික ක්‍රියාවක් සිදුවී ඇත්දැයි පරීක්ෂා කිරීම සඳහා විමර්ශන පැවැත්වීම
6. විගණන මගින් අනාවරණය කරගත් වංචා විමර්ශනය කිරීම

7. විමර්ශන අවසන් කිරීම හා වාර්තා කිරීම
8. රේගු නීති උල්ලංඝනය කිරීමක් සනාථ කිරීම සඳහා පැමිණිල්ලට ප්‍රමාණවත් සාක්ෂි තිබේ නම්, දණ්ඩන පැනවීම සහ වෙනත් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම
9. විගණකවරුන්ට ප්‍රතිපෝෂණයන් ලබා දීම
10. අවසාන වශයෙන් මධ්‍යම බුද්ධි ඒකකයේ දත්ත සමුදාය(Database) යාවත්කාලීන කිරීම සහ අවදානම් කළමනාකරණ ක්‍රියාවලියෙහි යෙදවීමක් ලෙස භාවිතා කිරීම
11. අවශ්‍ය වෙනස් කිරීම් සිදු කිරීම සඳහා සමස්ත විගණන ක්‍රියාවලිය ඇගයීම.

### *8.3.2.1 පශ්චාත් නිෂ්කාශන විගණන ඒකකය*

සංශෝධිත කියෝතෝ ගිවිසුම මගින් අර්ථ නිරූපනය කරන පරිදි, පශ්චාත් නිෂ්කාශන විගණනය (PCA) හෝ විගණන පාදක කරගත් පාලනයන් යනු අදාල ව්‍යාපාරිකයන් (පුද්ගලයන්) සතුව ඇති පොත්පත්, වාර්තා, ව්‍යාපාර ක්‍රමවේද සහ වාණිජ දත්ත පරීක්ෂා කිරීම මගින් රේගු ප්‍රකාශනවල නිරවද්‍යතාවය සහ නීත්‍යානුකූලභාවය පිළිබඳව රේගුව සෑහීමකට පත්වනු ලබන මිනුම් ක්‍රම/ක්‍රියාමාර්ගවේ. අතිශයින් ගනුදෙනු පදනම් කරගත් පාලන පරිසරයක සිට වඩා ශක්තිමත් විගණනය පදනම් කරගත් පරිපාලනයක් දක්වා ගමන් කිරීම මගින් බහුවිධ ස්ථරවලදී අවදානම් පාදක කරගත් පාලන ප්‍රවේශයක් යොදා ගැනීමට පශ්චාත් නිෂ්කාශන විගණනය රේගුවට ඉඩකඩ සලසන බැවින්, එය රේගුවට මෙන්ම අනෙකුත් දේශසීමා නියාමන අධිකාරීන් සඳහා ද ඉතා වැදගත් පාලන ක්‍රමවේදයක් වේ. භෞතික පරීක්ෂණය, වටිනාකම, භාණ්ඩවල ප්‍රභවය සහ වර්ගීකරණය සාම්පල සනොක්ෂණය කිරීම, බලපත්‍ර, අවසරපත්‍ර සනොක්ෂණය කිරීම යනාදිය වැනි දේශ සීමාව හරහා ගමන් කරන අවස්ථාවේදී යොදාගනු ලබන පාලන ක්‍රම ගනුදෙනු පදනම් කරගත් පාලන ක්‍රම වේ.
( මූලාශය: ලෝක රේගු සංවිධානය)

භාණ්ඩ හා ව්‍යාපාරිකයන් පිළිබඳ අවදානම් විශ්ලේෂණය මත තෝරාගත් ඉලක්කගත මෙහෙයුම්කරුවන් කෙරෙහි අවධානය යොමු කරමින්, හෝ වාර්ෂික විගණන වැඩසටහන් යටතේ දක්වා ඇති විධිමත් සැලසුම්ගත ක්‍රමයක් මගින් එක් එක් සිද්ධිය පදනම් කර ගනිමින් පශ්චාත් නිෂ්කාශන විගණනයන් සිදුකළ හැකිය. එසේම ආර්ථිකය මෙහෙයවන්නන් හට අවශ්‍ය විශේෂ පිලියම් සැපයීමේ නිර්නායකයන් වශයෙන් ද විගණනය භාවිතා කළ හැකිය.

පහත සඳහන් දෑ පශ්චාත් නිෂ්කාශන විගණන අංශයේ මූලික අරමුණු වශයෙන් සලකනු ලැබිය හැකිය.

- පසුගිය යම් කාලසීමාවක් තුළ රේගු සටහන්කරවල නීත්‍යානුකූලභාවය හා නිරවද්‍යතාව පරීක්ෂා කිරීම.
- වැරදි රේගු සටහන්කර සංශෝධනය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම පිණිස විගණනලාභීන්ට නිර්දේශ ලබා දීම
- විගණනලාභීන් රේගු නීතිය හා රෙගුලාසිවලට අනුගතවීම වැඩි කිරීමට පෙළඹවීම
- අවදානම් කළමනාකරණ ක්‍රියාවලියට යෙදවුම් ලබාදීම

**පශ්චාත් නිෂ්කාශන විගණනය යටතේ පරීක්ෂා කළයුතු අයිතම**

ආනයන ප්‍රකාශනයක් සඳහා අවශ්‍ය වන පහත වගුවේ දක්වා ඇති සෑම අයිතමයක්ම නිෂ්කාශන විගණනය මගින් පරීක්ෂා කළහැකි වේ.

| බදු මූල්‍ය සම්බන්ධ අයිතම | බදු අනුපාත සම්බන්ධ අයිතම | බදු ප්‍රමාණය සම්බන්ධ අයිතම | අනෙකුත් |
|---|---|---|---|
| • වටිනාකම<br>• ප්‍රමාණය<br>• මුදල් වර්ගය<br>• විනිමය අනුපාත | • වර්ගීකරණය<br>• සාමාන්‍ය බදු අනුපාත<br>• වරණීය බදු අනුපාත | • නිදහස් කිරීම්<br>• යුක්ති සාධන<br>• ප්‍රමාණය<br>• බදු ගණනය කිරීමේ නිරවද්‍යතාවය | • සීමා කිරීම්<br>• තහනම් කිරීම්<br>• ආනයන බලපත්‍ර<br>• IPR<br>• CITES<br>• රාජ්‍ය භාගය<br>• විනිමය පාලන |

ඉහත දැක්වෙන අයිතම පශ්චාත් නිෂ්කාශන විගණනයට පෙර, නිෂ්කාශන අවස්ථාවේ දී සහ/හෝ නිෂ්කාශනයට පෙර අවස්ථාවලදී රේගු පරීක්ෂාවට ලක් කළ හැකි බව සැලකිය යුතුය. අනවශ්‍ය ද්විකරණයන් වැලැක්වීම සඳහා පශ්චාත් නිෂ්කාශන විගණනයේ ප්‍රවේශය සාමාන්‍ය රේගු පරීක්ෂාවට (පූර්ව නිෂ්කාශන සත්‍යාපනය) වඩා වෙනස් වියයුතු අතර, පශ්චාත් නිෂ්කාශන විගණනය එහි යහගුණය වැඩි කිරීමත්, දුර්ගුණය අවම කරගැනීමත් සඳහා සිදුකරනු ලබයි. රේගු නිෂ්කාශනයේ ලියකියවිලි පරීක්ෂාවට ලක් කිරීමට පශ්චාත් නිෂ්කාශන විගණන නිලධාරීන්ට බලය පැවරෙනවා පමණක් නොව විගණන පරිශ්‍රයේදී ගිණුම් පොත්, වාර්තා හා අදාල පොත්පත් ද පරීක්ෂාවට ලක්කළ හැකිය.

**2019 වර්ෂයේ කාර්ය සාධනය**

| | **2019** |
|---|---|
| වසර තුළ ලියාපදිංචි කරන ලද විගණන සංඛ්‍යාව | **179** |
| වසර තුළ ලියාපදිංචි කරන ලද පශ්චාත් විගණන සිද්ධි සංඛ්‍යාව | **95** |
| අවසන් කරන ලද පශ්චාත් විගණන සිද්ධි සංඛ්‍යාව (පෙර වර්ෂයේ ලියාපදිංචි සිද්ධි ඇතුළුව) | **52** |
| පද්ධති පාදක විගණන සංඛ්‍යාව | **8** |
| පශ්චාත් විගණන සිද්ධි මගින් වැරදි / අනනුකූලතාවන් ඇති වී තිබෙන බවට අනාවරණය වූ සිද්ධි සංඛ්‍යාව සහ නියම කළ රාජසන්තක කිරීම් /දඩ | **52** |
| අය කර ගන්නා මුළු රාජසන්තක කළ /දඩ මුදල් ප්‍රමාණය (රු.) | **458,422,599** |
| භාණ්ඩ විකිණීමෙන් එකතු කරගත් මුළු මුදල (රු.) | **-** |
| අතිරේක සටහන් කර ලෙස එකතු කරගත් මුළු මුදල (රු.) | **4992** |
| අයකරගත් මුළු මුදල (රු.) | **458,327,591** |

**2016, 2017, 2018 සහ 2019 වර්ෂ තුළ කාර්ය සාධනය**

| | **2016** | **2017** | **2018** | **2019** |
|---|---|---|---|---|
| **වසර තුළ ලියාපදිංචි කරන ලද පශ්චාත් විගණන සංඛ්‍යාව** | 103 | 112 | 102 | 179 |
| අවසන් කරන ලද පශ්චාත් විගණන සිද්ධි සංඛ්‍යාව (පෙර වර්ෂයේ ලියාපදිංචි සිද්ධි ඇතුළුව) | 77 | 54 | 61 | 52 |
| පශ්චාත් විගණන සිද්ධි මගින් වැරදි / අනනුකූලතාවන් ඇති වී තිබෙන බවට අනාවරණය වූ සිද්ධි සංඛ්‍යාව සහ නියම කළ රාජසන්තක කිරීම් /දඩ | 69 | 48 | 61 | 52 |
| **අය කර ගන්නා මුළු දඩ මුදල් ප්‍රමාණය** (රු.) | 938,538,574 | 1,120,608,249 | 604,850,139 | 458,422,599 |
| **රාජසන්තක කරන ලද භාණ්ඩවල මුළු වටිනාකම** | NIL | NIL | NIL | NIL |
| **අතිරේක සටහන්කර ලෙස එකතු කරගත් මුළු** මුදල (රු.) | 61,512,281 | 894,548 | 56,653,753 | 4992 |
| **අය කරගත් මුළු** මුදල (රු.) | 1,000,050,855 | 1,121,502,797 | 661,503,892 | 458,327,591 |

**විගණන ප්‍රගතිය**

| **වර්ෂය** | **සිදුකරන ලද විගණන සංඛ්‍යාව** |
|---|---|
| 2016 | 182 |
| 2017 | 175 |
| 2018 | 160 |
| 2019 | 179 |

විගණන සහ සිද්ධි අතර සංසන්දනය

| වර්ෂය | සිදුකරන ලද විගණන සංඛ්‍යාව | සිද්ධි සංඛ්‍යාව | % |
|---|---|---|---|
| 2016 | 182 | 103 | 57% |
| 2017 | 175 | 112 | 64% |
| 2018 | 160 | 102 | 64% |
| 2019 | 179 | 95 | 53% |

කාර්යසාධන සංසන්දනය

| වසර | වසර තුළ ලියාපදිංචි කරන ලද පශ්චාත් විගණන සංඛ්‍යාව | අවසන් කරන ලද (පෙර වසරේ ලියාපදිංචි සංඛ්‍යාව ඇතුළුව) පශ්චාත් විගණන සිද්ධි සංඛ්‍යාව | විගණන සිද්ධි හරහා රාජසන්තක කිරීම් /දඩ |
|---|---|---|---|
| 2016 | 103 | 77 | 69 |
| 2017 | 112 | 54 | 48 |
| 2018 | 102 | 61 | 61 |
| 2019 | 95 | 52 | 52 |

ඉලක්කගත සහ තථ්‍ය ආදායම එකතුව

| වර්ෂය | එකතු කළ ආදායම (රු.) |
|---|---|
| 2016 | 1,000,050,855 |
| 2017 | 1,121,502,797 |
| 2018 | 661,503,892 |
| 2019 | 458,327,591 |

**2016, 2017 2018 සහ 2019** වර්ෂය තුළ ලියාපදිංචි කළ සහ අවසන් කළ සිද්ධි සංඛ්‍යාව

| වර්ෂය | ලියාපදිංචි කළ සිද්ධි සංඛ්‍යාව (පසුගිය වසරේ ලියාපදිංචි කළ සිද්ධි සංඛ්‍යාව ඇතුළුව) | අවසන් කළ සිද්ධි සංඛ්‍යාව |
|---|---|---|
| 2016 | 103 | 77 |
| 2017 | 112 | 54 |
| 2018 | 102 | 61 |
| 2019 | 95 | 51 |

### *8.3.2.2 ආපසු ගෙවීමේ අංශය*

**හිමිකම් පෑම් සහ ආපසු ගෙවීම් තත්ත්වය - 2019**

| | සංඛ්‍යාව |
|---|---|
| **ලියාපදිංචි කළ අයදුම්පත් /හිමිකම්** | 155 |
| **සම්පූර්ණ කළ ආපසු ගෙවීම් (පසුගිය වසරේ ලියාපදිංචි කළ සිද්ධි ඇතුළුව)** | 138 |
| **ප්‍රතික්ෂේප කරන ලද අයදුම්පත් /හිමිකම්** | 15 |

**ආපසු ගෙවීම් හිමිකම් තත්ත්වය- පසුගිය වර්ෂ (2015 සිට 2019)**

| වර්ෂය | **2015** | **2016** | **2017** | **2018** | **2019** |
|---|---|---|---|---|---|
| ලියාපදිංචි කළ අයදුම්පත්/හිමිකම් | 80 | 219 | 163 | 219 | 155 |
| සම්පූර්ණ කළ ආපසු ගෙවීම් සංඛ්‍යාව (පසුගිය වසරේ ලියාපදිංචි කළ සිද්ධි සංඛ්‍යාව ඇතුළුව) | 06 | 39 | 49 | 36 | 138 |
| ප්‍රතික්ෂේප කරන ලද අයදුම්පත්/හිමිකම් | 01 | 04 | 11 | 03 | 15 |

## 8.3.3 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය

**හැඳින්වීම**

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයේ අරමුණු වන්නේ පැය 24 පුරාම නිරන්තරයෙන් රේගු ප්‍රකාශන ක්‍රියාවලිගත කිරීමේ කටයුතු හා අන්තර්ජාල සේවාවන් ලබාදිමේදී දෙපාර්තමේන්තුව වෙත අවශ්‍ය තාක්ෂණ, සේවා සහ පහසුකම් ලබාදීම වේ. රේගු ප්‍රකාශන ක්‍රියාවලිගත කිරීම පූර්ණ වශයෙන් ස්වයංක්‍රියකරණය කිරීමෙන් ඵලදායි හා ප්‍රතිඵලදායි පරිපාලනයක් උදෙසා වේගවත්, ගුණාත්මක සහ විශ්වාසනීය තොරතුරු පද්ධතියක් සහතික කරයි. මෙම අංශය මේ වනවිට වඩාත් ඵලදායි හා බිඳ වැටීම් වලින් තොර තොරතුරු තාක්ෂණ පදනම් කරගත් පද්ධති ස්ථාපිත කිරීමටත්, රේගු ප්‍රකාශන ඊට අදාළ ලේඛන, ඉලෙක්ට්‍රොනිකව ගබඩා කර තබාගැනීමටත් අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

**ප්‍රධාන කාර්යයන්:**

1. ස්වයංක්‍රියකරණය තුලින් ආයතනික අරමුණු ඉටුකර ගැනීමට සහාය වීම.
2. පද්ධති ජාලය, පරිගණක හා දත්ත සමුදාය සාර්ථක ලෙස නඩත්තු කිරීම.
3. රේගු පාලනයට, අනෙකුත් රේගු අංශයන්ට, අනෙකුත් රජයේ ආයතනවලට හා පාර්ශවකරුවන්ට නිසි කලට නිවැරදි තොරතුරු වාර්තා ලබාදීම.
4. ගෝලීය වැඩි දියුණු කිරීම් වලට සමගාමීව ඵලදායි අයුරින් පවත්නා පද්ධති ("අසිකුඩා" භාණ්ඩ පාලන පද්ධතිය, මෝටර්වාහන තොරතුරු පාලන පද්ධතිය හා "තිනෙත්" පද්ධතිය) පිළිබඳ ඇගයීම් සිදුකිරීම සහ යාවත්කාලීන කිරීම
5. අධීක්ෂණ මෙහෙයුම් අරමුණු ඉටුකර ගැනීම සඳහා මෙම අංශයේ කාර්ය මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ දැනුම සමග වෘත්තීය ගුණාත්මකභාවය වර්ධනය කිරීම
6. දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයේ පරිගණක සාක්ෂරතාව / තොරතුරු තාක්ෂණ දැනුම වර්ධනය කිරීම හා තොරතුරු තාක්ෂණ මොඩියුල ක්‍රියාකාරිත්වය පිළිබඳ පුහුණු වැඩසටහන් පුළුල් කිරීම.

**වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්ය සාධනය**

| පාලන අරමුණු යටතේ ඇති ප්‍රධාන ක්‍රියාකාරකම් | |
|---|---|
| ප්‍රධාන කාර්යාලයෙහි දී ආනයන නැව් භාණ්ඩ ලේඛන සැකසීමේ/ලියාහැරීමේ ක්‍රියාවලිය ස්වයංක්‍රියගත කිරීම. | 100% සම්පූර්ණ කර ඇත. |
| අසිකුඩා පද්ධතියට යොමු කරන භාණ්ඩ ලේඛනවල පරිලෝකන (ස්කෑන්)අනුරූප ලබාගැනීම. | 100% පද්ධතිය සූදානම් තත්වයෙහි පවතී. නීතිපතිවරයාගේ අනුමැතිය අපේක්ෂා කෙරේ. |
| KTIM1 කාර්යාලයේ ස්වංක්‍රියකරණය සම්පූර්ණ කිරීම. | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණඅංශය විසින් ඉටු කළ යුතු කොටස 100% සම්පූර්ණයි. |
| කැටුව නොයන භාණ්ඩ අදාල නියමිත නිවෙස් වලට ප්‍රවාහනය කිරීමට පහසුකම් සැලසීම සඳහා ආගමන විගමන දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා රේගුවේ ජාලයට සම්බන්ධ කිරීම. | ටෙන්ඩර් ප්‍රදානය කරන ලදී. වැඩිදියුණු කිරීම්පිළිබඳව සොයා බැලීමට කමිටුවක් පත් කර ඇත |
| පවත්නා THINETH පද්ධතියෙන් අසිකුඩා ගෝලීය පද්ධතියට මාරුවීම . | 5% සිදු කර ඇත. |
| ඩිජිටල් අත්සන් සහිත කඩදාසි ලේඛන රහිත අපනයන වෙළඳාම ක්‍රියාත්මක කිරීම . | 100% පද්ධතිය සූදානම් තත්වයෙහි පවතී . නීතිපතිවරයාගේ අනුමැතිය අපේක්ෂා කෙරේ. |
| කඩදාසි ලේඛන රහිත ආනයන වෙළඳාම ක්‍රියාත්මක කිරීම. | 10% පද්ධතිය සූදානම් තත්වයෙහි පවතී . නීතිපතිවරයාගේ අනුමැතිය අපේක්ෂා කෙරේ. |
| යාවත්කාලීන කරන ලද අපනයන රේගු තීරුබදු නාමාවලිය ප්‍රසිද්ධ කිරීම. | 100% සම්පූර්ණයි |
| පරීක්ෂා කිරීම සඳහා අපනයන භාණ්ඩ තේරීම ස්වයංක්‍රියකරණය කිරීම. | අපනයන අංශයෙන් තෝරා ගැනීමේ නිර්ණායක අපේක්ෂා කෙරේ. |
| අපනයන නැව් බඩු ලේඛනය පද්ධතියට ඇතුලත් කර ගැනීම. | පද්ධතිය සූදානම් . CASA සමඟ සාකච්ඡා කිරීම සඳහා අති.රේ.අධ්‍යක්ෂ ජනරාල් වෙත යෝජනා ක්‍රම ලබාදී ඇත. |
| PIV විද්‍යුත් ගෙවීමේ ක්‍රමය ක්‍රියාත්මක කිරීම. | 5% සම්පූර්ණයි. කොළඹ පාර්සල් තැපැල් අංශය තුල ක්‍රියාත්මක කරන ලදී |
| ITMIS පද්ධතියට දත්ත සැපයීම. | රේගුව 100% සූදානම්. අමාත්‍යාංශය සූදානම් විය යුතුව පවතී. |
| | |
| ආයෝජන මණ්ඩල කාර්යාලයේ ආනයන නැව් භාණ්ඩ ලේඛනය ලියා හැරීම් කාර්යය ස්වයංක්‍රියගත කිරීම | පද්ධතිය පරීක්ෂා කරන ලද අතර සූදානම් තත්වයෙහි පවතී .ආයෝජන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කිරීමේ තීරණය ගතයුතුව ඇත . |

| | |
|---|---|
| නිෂ්කාශන ලේඛනවල පරිලෝකන (ස්කෑන්) අනුරූප AsyCuda පද්ධතියට ග්‍රහණය කර ගැනීම | ඉන්වොයිසිය ලබාගෙන ඇත. පද්ධතිය 100% සූදානම් තත්වයෙහි පවතී .කළමනාකරණය විසින් ක්‍රියාත්මක කිරීමේ තීරණය ගතයුතුව ඇත. |
| පිටවීමේ සටහන ක්‍රියාත්මක කිරීමෙන් HBIM1 කාර්යාලයේ ස්වයංක්‍රීයකරණය සම්පූර්ණ කිරීම. | පද්ධතිය පරීක්ෂා කරන ලද අතර සූදානම් තත්වයෙහි පවතී. නි.රේ.අ / HBIM1 විසින් ක්‍රියාත්මක කිරීමේ තීරණය ගතයුතුව ඇත. |
| ගුවන් භාණ්ඩ ලේඛනය ක්‍රියාත්මක කිරීම | පද්ධතිය පරීක්ෂා කර සූදානම් තත්වයෙහි පවතී .රේ.අ/ KTIM2 විසින් ක්‍රියාත්මක කිරීමේ තීරණය ගතයුතුව ඇත. |
| බ.ජා. ගුවන් තොටුපළෙහි CCTV දර්ශන නැරඹීමේ පහසුකම රේ.අ.ජ.වෙත ලබා දීම | 100% |
| ප්‍රතිනැව්ගත කිරීමේ භාණ්ඩ යෙදුම ස්වයංක්‍රීයගත කිරීම | 100% |

| **වෙළඳ පහසුකම් සැපයීමේ අරමුණු යටතේ ප්‍රධාන ක්‍රියාකාරකම්** | |
|---|---|
| කැටුව නොයන භාණ්ඩ අදාල නියමිත නිවෙස් වලට ප්‍රවාහනය කිරීමට පහසුකම් සැලසීම සඳහා ආගමන විගමන දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා රේගුවේ ජාලයට සම්බන්ධ කිරීම. | රේගුවේ පද්ධතිය සූදානම්. ආගමන විගමන දෙපාර්තමේන්තුව මගින් දත්ත ලබා දීමට නියමිතය. |
| වර්තමාන තිනෙත් පද්ධතියෙන් අසිකුඩා ගෝලීය පද්ධතියට මාරුවීම. | 20% |
| ඩිජිටල් අත්සන් සහිත කඩදාසි ලේඛන රහිත අපනයන වෙළඳාම ක්‍රියාත්මක කිරීම. | 0% |
| කඩදාසි ලේඛන රහිත ආනයන වෙළඳාම ක්‍රියාත්මක කිරීම | 20% |
| පරීක්ෂා කිරීම සඳහා අපනයන භාණ්ඩ තේරීම ස්වයංක්‍රීයගත කිරීම. | 0% |
| අපනයන නැව් බඩු ලේඛනය පද්ධතියට ඇතුලත් කර ගැනීම. | 0% |
| වෙළඳාම සඳහා අන්තර්ජාලය පදනම් කරගත් තොරතුරු සැපයීම | 50% |
| LPOPP හරහා ලංකා/ මහජන බැංකුව සම්බන්ධ කිරීම. | 75% |
| රේගු ප්‍රකාශනයේ තත්ත්වය දැන ගැනීම සඳහා ව්‍යාපාරිකයන් සඳහා විද්‍යුත් තැපැල් පහසුකමක් ලබා දීම. | 100% |

| **වෙනත් අරමුණු යටතේ ප්‍රධාන ක්‍රියාකාරකම්** | |
|---|---|
| PIV විද්‍යුත් ගෙවීමේ ක්‍රමය ක්‍රියාත්මක කිරීම. | 20% |
| ITMIS පද්ධතියට දත්ත සැපයීම. | රේගුව සූදානම් .ITMIS පද්ධතිය සූදානම් නැත |
| ප්‍රධාන කාර්යාලයේ ජාල උපකරණ වැඩි දියුණු කිරීම සහ ප්‍රතිස්ථාපනය කිරීම | ටෙන්ඩර් ප්‍රදානය කළ යුතුය |
| CERT පද්ධති විගණනයෙන් පසු CERT මාර්ගෝපදේශයන්ට අනුව ආරක්ෂාව වැඩි දියුණු කිරීම | 50% |

## 8.3.4 මධ්‍යම මිල පිරික්සුම් අංශය

**හැඳින්වීම**

රේගු ආඥා පනතේ උපලේඛන 'E' හි සඳහන් වගන්තිවලට අනුව ආනයන භාණ්ඩවල ප්‍රකාශිත මිල සත්‍යොක්ෂණය කිරීම සහ නිර්ණය කිරීමට අදාල කාර්යයන් මධ්‍යම මිල පිරික්සුම් අංශය විසින් ඉටුකරනු ලබයි.

දෙපාර්තමේන්තුවේ අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා දායක වන, මිල පිරික්සුම් ක්‍රියාවලියට අදාල සමස්ත තීරණ රේගු ආඥා පනතේ 51 සහ 52 වගන්තිවල විධිවිධාන යටතේ ක්‍රියාත්මක කරනු ලැබේ.

**අරමුණු**

1. දෙපාර්තමේන්තු ඉලක්ක සඳහා දායක වන අතරම මිල පිරික්සුම් උපකරණ හා හැකියාවන් ගොඩනැගීම තුළින් කාර්යක්ෂමතාව හා ඵලදායීතාව වර්ධනය කිරීම.
2. නීත්‍යානුකූල වෙළඳාමට විධිමත් පහසුකම් සැලසීම සඳහා දායකවීම.
3. ලෝක රේගු සංවිධානය, ලෝක වෙළඳ සංවිධානය සහ අනෙකුත් ජාත්‍යන්තර මෙවලම් සහ උපකරණවලට අනුකූල වන වඩා උසස් පරිචයන් භාවිතා කරමින් පාර්ශවකරුවන්ගේ සහ කාර්ය මණ්ඩලයේ අනුකූල වීමේ මට්ටම වර්ධනය කිරීම.

**ප්‍රධාන කාර්යයන්**

1. රේගු ආඥා පනතේ 51 වන වගන්තිය මගින් බලාත්මක කරන ලද 1994 WTO GATT හි vii වගන්තියේ විධිවිධාන විධිමත් පරිදි යොදා ගන්නා බවට සහතික වීම.
2. පිරික්සුම් නීතිය ඵලදායිව හා ඒකාකාරිව යොදා ගැනීම සඳහා පිරික්සුම් මෙවලම් වැඩිදියුණු කිරීම (එනම් පිරික්සුම් දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම, විටින් විට අනතුරු ඇඟවීම් නිකුත් කිරීම ) වඩාත් ඵලදායී පරිචයන්/ භාවිතයන් යොදා ගැනීම
3. උපලේඛනයේ 'E' වගන්තියට අනුව ප්‍රකාශිත පිරික්සුම් අගයන් සත්‍යොක්ෂණය කිරීම සහ ආනයන භාණ්ඩවල රේගු වටිනාකම් නිර්ණය කිරීම.
4. රේගු මිල පිරික්සුම් පිළිබඳ ප්‍රතිපත්ති සම්බන්ධව මිල පිරික්සුම් කමිටුවට සහයෝගය දීම.
5. මිල පිරික්සුම් ගැටළු නිරාකරණය සඳහා රාජ්‍ය පෞද්ගලික හවුල වර්ධනය කිරීම සහ මිල පිරික්සුම් පර්යේෂණ සඳහා මහජනතාවට ආරාධනා කිරීම.
6. සංවේදී භාණ්ඩවල මිල ප්‍රවණතාව අධීක්ෂණය කිරීම, ආදායමට අදාල අවශ්‍ය පියවර ගැනීම සඳහා මිල පිරික්සුම් පරීක්ෂණ,පර්යේෂණ, විමර්ශන සිදුකිරීම
7. අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සහාය සේවා) සහ ජාත්‍යන්තර කටයුතු අංශයෙහි රේගු අධ්‍යක්ෂ මගින් අදාල ජාත්‍යන්තර සංවිධාන - මූලාශ්‍ර සමඟ රේගු මිල පිරික්සුම් කරුණු සම්බන්ධව සම්බන්ධතාවයන් ඇති කර ගැනීම.

**2017, 2018 සහ 2019 වර්ෂ තුළ කාර්යසාධනය**

| මාසය | අතිරේක සටහන්කර මගින් අය කළ මුදල (රු.) | | |
|---|---|---|---|
| | **2017** | **2018** | 2019 |
| **ජනවාරි** | 96,976,771.01 | 162,436,213.20 | 137,861,340.00 |
| **පෙබරවාරි** | 92,588,732.00 | 197,606,167.74 | 199,983,030.00 |
| **මාර්තු** | 124,223,659.00 | 139,270,365.00 | 120,416,213.00 |
| **අප්‍රේල්** | 115,021,167.83 | 172,654,159.00 | 132,439,443.00 |
| **මැයි** | 133,185,096.00 | 145,106,782.00 | 193,606,520.00 |
| **ජූනි** | 73,950,166.00 | 174,176,732.00 | 139,689,506.00 |
| **ජූලි** | 124,688,097.00 | 118,414,464.37 | 169,113,512.00 |
| **අගෝස්තු** | 156,586,925.58 | 156,252,561.00 | 180,739,571.00 |
| **සැප්තැම්බර්** | 144,727,507.37 | 138,100,571.00 | 152,906,330.00 |
| **ඔක්තෝබර්** | 156,768,427.00 | 176,677,684.00 | 149,523,186.00 |
| **නොවැම්බර්** | 169,522,592.00 | 146,612,176.04 | 191,526,236.00 |
| **දෙසැම්බර්** | 181,737,644.26 | 155,126,605.00 | 145,948,818.00 |
| එකතුව | 1,569,976,785.05 | 1,882,434,480.35 | 1,913,753,705.00 |

| | 2018 | 2019 |
|---|---|---|
| අතිරේක සටහන්කර මගින් අය කළ මුදල | 1,882,434,480.35 | 1,913,753,705.00 |
| දඩ අයකර ගැනීම. | 203,456,000.00 | 47,173,252.00 |
| එකතුව | 2,085,890,480.35 | 1,960,926,957.00 |

## 8.3.5 විශේෂ සේවා අංශය

**හැඳින්වීම**

**විශේෂ සේවා අංශය මගින් රේගු දෙපාර්තමේන්තුවට සහ රේගු සේවය ලබාගන්නා අනෙකුත් ආයතන සඳහා විවිධ සේවාවන් සපයනු ලැබේ. ඒ අතර ආනයන/අපනයන භාණ්ඩ සඳහා සුදුසු සංයෝජිත වර්ගීකරණ කේත නිර්ණය කිරීම, ආනයන/අපනයන රසායන ද්‍රව්‍ය විශ්ලේෂණය, මැණික්, වටිනා ලෝහ වර්ග හා ස්වර්ණාභරණ තක්සේරුකරණය, රේගු නියෝජිතයින්ට බලපත්‍ර නිකුත් කිරීම, ආනයන අපනයන රේගු ප්‍රකාශන ක්‍රියාකරවීම පහසු කිරීම සඳහා මෙම අසිකුඩා ක්‍රමයෙන් ආනයන/අපනයනකරුවන් ලියාපදිංචි කිරීම වැනි සේවාවන් සපයනු ලබයි.**

**ප්‍රධාන කාර්යයන්**

1. භාණ්ඩ වර්ගීකරණය
2. රසායනික සහ ඊට අයත් නිෂ්පාදන හඳුනා ගැනීම සහ වර්ගීකරණය
3. මැණික්, වටිනා ලෝහ හා ස්වර්ණාභරණ හඳුනාගැනීම, වර්ගීකරණය හා වටිනාකම තක්සේකරු කිරීම.
4. රේගු නියෝජිතයන්ට බලපත්‍ර නිකුත් කිරීම සහ ආනයන/අපනයන කරුවන් ලියාපදිංචි කිරීම.

### 8.3.5.1 භාණ්ඩ වර්ගීකරණ අංශය

ආනයන/අපනයන භාණ්ඩ සඳහා වඩාත් සුදුසු වන සංයෝජිත වර්ගීකරණ කේත ක්‍රම ( HS) නිර්ණය කිරීම මෙම අංශයේ වගකීම වේ. රේගු ප්‍රකාශන ක්‍රියාකාරී ඒකකය හෝ බඩු පරීක්ෂා කිරීමේ ඒකකය විසින් එක් භාණ්ඩයකට වර්ගීකරණ කේත අංක ( HS) තීරණය කිරීමේදී ගැටළු මතු වුවහොත් එය මෙම අංශය වෙත යොමු කරනු ඇත. එවැනි අවස්ථාවකදී මතභේදයට තුඩු දුන් අයිතමය සඳහා වඩාත් යෝග්‍ය සංයෝජිත වර්ගීකරණ කේතය යෝජනා කරමින් අභ්‍යන්තර උපදේශයක් මෙම ඒකකය මගින් නිකුත් කරයි.

ඊට අමතරව, වෙළඳාම පහසු කරන ක්‍රියා මාර්ගයක් ලෙස මෙම අංශය ආනයනහෝ අපනයනය කළ යුතුව ඇති භාණ්ඩවලට වර්ගීකරණ පූර්ව තීරණ නිකුත් කරනු ඇත. ආනයන අපනයනකරුවන් රේගු වෙබ් අඩවියේ ඇති ඉල්ලුම් පත්‍ර සම්පූර්ණ කර ඉදිරිපත් කිරීමේදී මෙම තීරණය ගත යුතුව ඇත. මෙම තීරණය ලබාදුන් පසුව එය නිකුත් කළ දින සිට එකම නිෂ්පාදකයෙකුගෙන් ආනයනය කරන ලද ඊට අදාළ භාණ්ඩ අයිතමයට පමණක් වසරක කාල පරිච්ඡේදයක් වලංගු වන්නේය.

එසේ වුවද, සටහන් ඇතුළත් කරන ස්ථානයකින් රේගු ප්‍රකාශන යොමු කරන නිලධාරීන් හෝ නිකුත් කරන ලද තීරණය පිළිබඳ ආනයනකරුවන්/අපනයනකරුවන් සෑහීමකට පත් නොවන්නේ නම් ඒ පිළිබඳ තවදුරටත් විස්තර ලබාගැනීම සඳහා ඔවුන්ට ස්වකීය අයිතමයන් නාමකරණ කමිටුවට (NC) හෝ ලෝක රේගු සංවිධානයේ සංයෝජිත වර්ගීකරණ පද්ධති කමිටුවට වුවද යොමු කළ හැකිය.

**වර්ගීකරණ පූර්ව තීරණ**

| | ජන | පෙබ | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝ | සැප් | ඔක් | නොවැ | දෙසැ | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව | 3 | 4 | 9 | 0 | 17 | 27 | 23 | 49 | 61 | 34 | 24 | 21 | **272** |
| මාසය තුල ලැබුණු අයදුම්පත් සඳහා ලබාදුන් තීරණ සංඛ්‍යාව. | 3 | 4 | 7 | 0 | 14 | 23 | 18 | 39 | 51 | 31 | 15 | 11 | **216** |
| පසුගිය තීරණ ඇතුළුව මාසය තුල නිකුත් කරන ලද මුළු පූර්ව තීරණ සංඛ්‍යාව | 7 | 5 | 5 | 3 | 31 | 37 | 18 | 12 | 24 | 71 | 56 | 17 | **286** |

**අභ්‍යන්තර වර්ගීකරණ උපදෙස්**

| | ජන | පෙබ | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝ | සැප් | ඔක් | නොවැ | දෙසැ | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව | 42 | 25 | 40 | 19 | 46 | 38 | 46 | 41 | 34 | 44 | 31 | 25 | **431** |
| මාසය තුල ලැබුණු අයදුම්පත් සඳහා ලබාදුන් තීරණ සංඛ්‍යාව. | 37 | 24 | 39 | 19 | 42 | 34 | 42 | 39 | 31 | 40 | 21 | 13 | **381** |
| පසුගිය තීරණ ඇතුළුව මාසය තුල නිකුත් කරන ලද මුළු පූර්ව තීරණ සංඛ්‍යාව | 32 | 79 | 24 | 47 | 54 | 39 | 42 | 45 | 43 | 59 | 26 | 26 | **516** |

| **පූර්ව තීරණ සංඛ්‍යාව පසුගිය වර්ෂ හා සංසන්දනය කිරීම** | | | |
|---|---|---|---|
| **වර්ෂ** | ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව | නිකුත් කරන ලද තීරණ සංඛ්‍යාව | සම්පූර්ණ කිරීමේ ප්‍රතිශතය |
| 2018 | 547 | 299 | 55% |
| 2019 | 272 | 216 | 79% |

| **අභ්‍යන්තර වර්ගීකරණ උපදෙස් සංඛ්‍යාව පසුගිය වර්ෂ හා සංසන්දනය කිරීම** | | | |
|---|---|---|---|
| **වර්ෂ** | ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව | නිකුත් කරන ලද තීරණ සංඛ්‍යාව | සම්පූර්ණ කිරීමේ ප්‍රතිශතය |
| 2018 | 596 | 449 | 75% |
| 2019 | 431 | 381 | 88% |

### 8.3.5.2 රේගු පරීක්ෂණාගාර අංශය

**හැඳින්වීම**

ආනයන හා අපනයන කරන රසායනික ද්‍රව්‍ය හා ඊට සමාන ද්‍රව්‍ය හඳුනා ගැනීම සඳහා රේගුවට හා පාර්ශවකරුවන්ට සහායවීමට මෙම අංශය පිහිටුවන ලදී. ආනයනික හා අපනයනික රසායන ද්‍රව්‍ය හා ඒ සම්බන්ධ භාණ්ඩවල හඳුනාගැනීම පිළිබඳ සැකයක් මතුවූ අවස්ථාවලදී ඒවා පරීක්ෂා කිරීම සඳහා ඒවායේ නියැදි රේගු පරීක්ෂණාගාරය වෙත යවනු ලැබේ. එවැනි ද්‍රව්‍යවල වර්ගීකරණය පිළිබඳව මතභේද මතු වූ අවස්ථාවලදී ද අදාළ ද්‍රව්‍ය හා ලිපිලේඛන මෙම අංශයේ තීරණය සඳහා යොමු කරයි.

කාර්මික ඒකකයක් ආකාරයට මෙම අංශය විවිධ සම්මුතීන් සහ පවත්නා රෙගුලාසි ක්‍රියාත්මක කිරීමේදී අනෙකුත් අදාල පාර්ශව සමඟ සම්බන්ධීකරණය සිදුකරනු ලබයි

**2019 වර්ෂය සඳහා කාර්ය සාධනය**

| | | ලැබුණු | අවසන් කළ | සම්පූර්ණ කිරීමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|
| රේගු ප්‍රකාශන සංඛ්‍යාව | හඳුනාගැනීම සඳහා පමණක් රේගු ප්‍රකාශන විශ්ලේෂණය කිරීම. | 24 | 23 | 95.8% |
| | හඳුනාගැනීම සඳහා පමණක් රේගු ප්‍රකාශන විශ්ලේෂණය කිරීම. | 190 | 186 | 97.9% |
| | වර්ගීකරණය සඳහා පමණක් රේගු ප්‍රකාශන විශ්ලේෂණය කිරීම. | 5 | 5 | 100% |
| මුළු පූර්ව තීරණ සහ අනෙකුත් ලිපිගොනු සංඛ්‍යාව | හා.ව. ශාඛාවෙන් යොමු කරන ලද තීරණ ගොනු | 142 | 142 | 100% |
| | අනෙකුත් ශාඛා වලින් යොමු කරන ලද වෙනත් ගොනු | 102 | 100 | 98.0% |
| | **එකතුව** | **463** | **456** | **98.5%** |

රේගු ප්‍රකාශන, පූර්ව තීරණ සහ සිද්ධි ගොනු
පෙර වර්ෂ හා සැසඳීම

| | ලැබුණු | අවසන් කළ | සම්පූර්ණ කිරීමේ ප්‍රතිශතය |
|---|---|---|---|
| 2017 | 325 | 314 | 97% |
| 2018 | 497 | 471 | 95% |
| 2019 | 463 | 456 | 99% |

### 8.3.5.3 මැණික් ඒකකය

මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ ප්‍රවීනත්වයක් ලැබූ නිලධාරීන් විසින් මැණික්, වටිනා ලෝහ හා ස්වර්ණාභරණ යනාදිය සඳහා ආනයන/අපනයන ලේඛන සකස් කිරීම මෙම අංශය විසින් ඉටු කරනු ලබයි. ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ නිලධාරීන් සමඟ සම්බන්ධීකරණය වෙමින් මෙම අංශයේ නිලධාරීහු එකී භාණ්ඩ තක්සේරු කිරීම සිදු කරති.

2019 වර්ෂය තුළ සිදු කළ සියලුම ආනයන හා අපනයනවල සාරාංශය පහත සඳහන් වේ.

**අපනයන**

| අපනයන | මුළු වටිනාකම ශ්‍රී.ල.රු. | ප්‍රතිශතය % |
|---|---|---|
| මැණික් | 27,675,189,890 | 37 |
| දියමන්ති ස්වර්ණාභරණ | 226,372,075 | 0.31 |
| වෙනත් ස්වර්ණාභරණ | 2,475,858,654 | 3.35 |
| දියමන්ති | 23,678,492,830 | 32.06 |
| ගෙවුඩ සහ ඛනිජද්‍රව්‍ය | 10,443,400 | 0.01 |
| රත්රන් ප්‍රතිඅපනයනය | 0 | 0 |
| ප්‍රදර්ශන මැණික් | 19,574,537,545 | 26.50 |
| ප්‍රදර්ශන ස්වර්ණාභරණ | 213,532,770 | 0.29 |
| එකතුව | 73,854,427,164 | |

ආනයන

| ආනයන | මුළු වටිනාකම ශ්‍රී.ල.රු. | ප්‍රතිශතය % |
|---|---|---|
| ඔප නොදැමූ දියමන්ති | 10,539,182,937 | 33.32 |
| කැපූ හා ඔපදැමූ දියමන්ති | 11,519,431,103 | 36.42 |
| මැණික් | 8,456,686,603 | 26.74 |
| රිදී | 123,256,221 | 0.39 |
| රත්‍රන් | 545,413,922 | 1.72 |
| ස්වර්ණාභරණ | 350,933,639 | 1.11 |
| සොයා ගැනීම් | 7,793,730 | 0.02 |
| අනෙකුත්(පරිභෝජන ද්‍රව්‍ය) | 83,523,012 | 0.26 |
| එකතුව | **31,626,221,167** | |

- ප්‍රතිආනයන එකතුව - **රු. 3,028,029,366**
- ප්‍රතිආනයන ප්‍රතිශතය - **2.79%**

## 8.3.5.4 තාවකාලික හඳුනාගැනීමේ අංක / එකතු කළ අගය මත බදු (TIN /VAT) ලියාපදිංචි ඒකකය

රේගු ආඥා පනතේ 115(1) වගන්තිය ප්‍රකාරව ලියාපදිංචි වූ ආනයන අපනයනකරුවකු විසින් හැර කිසිම භාණ්ඩයක් ශ්‍රී ලංකාව තුළට ආනයනය කිරීම හෝ ශ්‍රී ලංකාවෙන් පිටතට අපනයනය කිරීම නොකළ යුතුය. ආනයනකරු හෝ අපනයනකරු විසින් අවශ්‍ය ලේඛන සහිතව යථා පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය ස්වකීය ලියාපදිංචිය සඳහා මෙම ඒකකය වෙත ඉදිරිපත් කළ යුතුය. අයදුම්පතේ ආකෘතිය සහ උපදෙස් රේගු වෙබ් අඩවියේ දක්වා ඇත.

තාවකාලික හඳුනාගැනීමේ අංක/ එකතු කළ අගය මත බදු (TIN /VAT) ලියාපදිංචි ඒකකය කාර්ය සාධනය - **2019**

| | | **ජන** | **පෙබ** | **මාර්තු** | **අප්‍රේ** | **මැයි** | **ජුනි** | **ජුලි** | **අගෝ** | **සැප්** | **ඔක්** | **නොවැ** | **දෙසැ** | **එකතුව** |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **1** | **ලියාපදිංචි කරන ලද බලපත්‍ර සංඛ්‍යාව** | 410 | 334 | 185 | 75 | 58 | 405 | 1771 | 1501 | 1305 | 1586 | 1580 | 1447 | 10657 |
| **2** | **පෞද්ගලික ආනයන සංඛ්‍යාව** | 26 | 18 | 29 | 19 | 32 | 25 | 17 | 26 | 16 | 22 | 33 | 35 | 298 |
| **3** | **පෞද්ගලික වාහන සංඛ්‍යාව** | 151 | 181 | 248 | 168 | 148 | 112 | 244 | 235 | 167 | 193 | 157 | 221 | 2225 |
| **4** | **ලියාපදිංචි කරන ලද පෞද්ගලික සමාගම් සංඛ්‍යාව** | 154 | 120 | 117 | 132 | 151 | 109 | 166 | 166 | 154 | 175 | 147 | 142 | 1733 |
| **5** | **ලියාපදිංචි කරන ලද තනි පුද්ගලක හවුල් ව්‍යාපාර** | 64 | 64 | 67 | 55 | 72 | 48 | 77 | 69 | 58 | 72 | 59 | 70 | 775 |
| **6** | **ලියාපදිංචි කරන ලද හවුල් ව්‍යාපාර** | 25 | 26 | 18 | 19 | 30 | 18 | 35 | 26 | 31 | 24 | 34 | 25 | 311 |
| **7** | **වෙනත් ලේඛන ,** වැට් බදු **යාවත්කාලීන, කානේ** (Carnet), මධ්‍යම අපහරණ ආදී | 8 | 5 | 2 | 2 | 2 | 4 | 5 | 4 | 6 | 4 | 4 | 4 | 50 |
| | **ලැබුණු මුළු ලේඛන සංඛ්‍යාව** | **838** | **748** | **666** | **470** | **493** | **721** | **2315** | **2027** | **1737** | **2076** | **2014** | **1944** | **16049** |

| | **එකතුව** |
|---|---|
| ලියාපදිංචි කරන ලද බලපත්‍ර සංඛ්‍යාව | 10,657 |
| පෞද්ගලික ආනයන සංඛ්‍යාව | 298 |
| පෞද්ගලික වාහන සංඛ්‍යාව | 2,225 |
| ලියාපදිංචි කරන ලද පෞද්ගලික සමාගම් සංඛ්‍යාව | 1,733 |
| ලියාපදිංචි කරන ලද තනි පුද්ගල ව්‍යාපාර | 775 |
| ලියාපදිංචි කරන ලද හවුල් ව්‍යාපාර | 311 |
| අනෙකුත් ලේඛන (වැට් බදු යාවත්කාලීන, කානේ, මධ්‍යම අපහරණ, මෝටර් රථ, ප්‍රකාශන ලි.ප) | 50 |
| ලැබුණු මුළු ලේඛන සංඛ්‍යාව | **16,049** |

| | | සැලසුම්ගත | තථ්‍ය |
|---|---|---|---|
| **1** | ලියාපදිංචි කරන ලද බලපත්‍ර සංඛ්‍යාව | 5,400 | 10,657 |
| **2** | පෞද්ගලික ආනයන සංඛ්‍යාව | 500 | 298 |
| **3** | පෞද්ගලික වාහන සංඛ්‍යාව | 6,050 | 2,225 |
| **4** | ලියාපදිංචි කරන ලද පෞද්ගලික සමාගම් සංඛ්‍යාව | 2,000 | 1,733 |
| **5** | ලියාපදිංචි කරන ලද තනි පුද්ගල ව්‍යාපාර | 1,000 | 775 |
| **6** | ලියාපදිංචි කරන ලද හවුල් ව්‍යාපාර | 400 | 311 |
| **7** | අනෙකුත් ලේඛන (VAT බදු යාවත්කාලීන, **කානේ,** මධ්‍යම අපහරණ, **මෝටර් රථ, ප්‍රකාශන ලි.ප)** | 65 | 50 |

**කාර්යසාධනය 2019 - රේගු නියෝජිත ඒකකය**

| | | ජන | පෙබ | මාර්තු | අප්‍රේ | මැයි | ජුනි | ජුලි | අගෝ | සැප් | ඔක් | නොවැ | දෙසැ |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **1** | ලියාපදිංචි වූ නව රේගු අනු නියෝජිතයන් සංඛ්‍යාව | 14 | **12** | **14** | **5** | **8** | **8** | **11** | **8** | **8** | **11** | **12** | **8** |
| **2** | ලියාපදිංචි වූ නව වාප්පු සහකාරවරුන් සංඛ්‍යාව | 15 | **12** | **13** | **5** | **9** | **15** | **13** | **15** | **8** | **11** | 13 | **8** |
| **3** | ලියාපදිංචිය අලුත් කිරීම -රේගු අනු නියෝජිතයන් | 216 | **186** | **195** | **164** | **0** | **209** | **236** | **343** | **183** | **181** | 161 | **225** |
| **4** | ලියාපදිංචිය අලුත් කිරීම- වාප්පු සහකාරවරුන් | 492 | **367** | **448** | **375** | **0** | **532** | **531** | **401** | **439** | **461** | 309 | **596** |
| **5** | ලියාපදිංචිය අවලංගු කිරීම- රේගු අනු නියෝජිතයන් | 4 | **1** | **1** | **1** | **2** | **6** | **2** | **3** | **-** | **2** | **0** | **1** |
| **6** | ලියාපදිංචිය අවලංගු කිරීම- වාප්පු සහකාරවරුන් | **56** | **37** | **38** | **32** | **38** | **43** | **46** | **27** | **27** | **44** | **20** | **38** |
| **7** | නිකුත් කරන ලද සහ අලුත් කරන ලද තාවකාලික බලපත්‍ර සංඛ්‍යාව | **50** | **56** | **68** | **45** | **0** | **63** | **62** | **43** | **58** | **55** | **52** | **76** |

| | | **කාර්තුව 1** | | **කාර්තුව 2** | | **කාර්තුව 3** | | **කාර්තුව 4** | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | සැලසුම්ගත | තථ්‍ය | සැලසුම්ගත | තථ්‍ය | සැලසුම්ගත | තථ්‍ය | සැලසුම්ගත | තථ්‍ය |
| **1** | ලියාපදිංචි වූ නව රේගු අනු නියෝජිතයන් සංඛ්‍යාව | **40** | **40** | **30** | **21** | **35** | **27** | **45** | **31** |
| **2** | ලියාපදිංචි වූ නව වාප්පු සහකාරවරුන් සංඛ්‍යාව | **30** | **40** | **25** | **29** | **25** | **36** | **40** | **32** |
| **3** | ලියාපදිංචිය අලුත් කිරීම රේගු අනු නියෝජිතයන් | **725** | **597** | **550** | **373** | **650** | **762** | **775** | **567** |
| **4** | ලියාපදිංචිය අලුත් කිරීම වාප්පු සහකාරවරුන් | **1500** | **1307** | **1400** | **907** | **1200** | **1371** | **1600** | **1366** |
| **5** | ලියාපදිංචිය අවලංගු කිරීම- රේගු අනු නියෝජිතයන් | **4** | **6** | **3** | **9** | **5** | **5** | **4** | **3** |
| **6** | ලියාපදිංචිය අවලංගු කිරීම- වාප්පු සහකාරවරුන් | **150** | **131** | **90** | **113** | **80** | **100** | **120** | **102** |
| **7** | නිකුත් කරන ලද සහ අලුත් කරන ලද තාවකාලික බලපත්‍ර සංඛ්‍යාව | **200** | **174** | **150** | **108** | **200** | **163** | **250** | **183** |

## 8.4 මානව සම්පත් පර්ෂදය

### 8.4.1 මානව සම්පත් කළමනාකරණ අංශය

**හැඳින්වීම**

රේගු දෙපාර්තමේන්තුවේ පරමාර්ථයන් සාක්ෂාත් කර ගැනිම සඳහා කාර්යක්ෂමව හා ඵලදායිව කටයුතු කරනු පිණිස අවශ්‍යවන මානව සම්පත් කළමණාකරණය කිරීම මෙම අංශයේ ප්‍රධාන කාර්යයභාරය වේ.

එහි දී දෙපාර්තමේන්තුවේ දැක්ම හා මෙහෙවර කරා ගමන් කල හැකි නිපුණතාවයෙන් යුක්ත, සුදුසුකම් සහිත පුද්ගලයන් දෙපාර්තමේන්තුව සඳහා බඳවා ගැනිමටත්, ඒ සඳහා අවශ්‍ය උපායමාර්ගික සැලසුම් සකස් කිරීමත් මෙම අංශය විසින් සිදු කරයි. එසේම පවත්නා ශ්‍රම බලකායේ හැකියාවන් හඳුනා ගනිමින් ඔවුන් අභිප්‍රේරණය කිරීමත්, ගැටළු හදුනා ගනිමින් ඒවා නිරාකරණය කොට ඔවුන්ගේ පූර්ණ දායකත්වය දෙපාර්තමේන්තුව කෙරෙහි ලබා ගැනිමටත් කටයුතු කරනු ලබයි.

එමෙන්ම, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය ආදී රාජ්‍ය ආයතනවලින් වරින් වර නිකුත් කරනු ලබන නියෝග, මාර්ගෝපදේශ හා නීති රීතින්ට ද අනුගත වෙමින් නිලධාරීන් බඳවා ගැනීම, උසස් කිරීම, ස්ථාන මාරු කිරීම, විශ්‍රාම ගැන්වීම සහ කාර්ය සාධනයන් පවත්වා ගැනීම මානව සම්පත් කළමණාකරණ අංශය මගින් ඉටු වේ.

**ප්‍රධාන කාර්යයන්**

1. බඳවා ගැනීමේ පටිපාටිවලට අනුකූලව පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම්, හා උසස් කිරීම.
2. සේවක වාර්තා තබා ගැනීම හා රහස්‍යභාවය සුරැකෙන අයුරින් පවත්වා ගැනීම.
3. කාර්ය සාධන කළමණාකරණය.
4. විශ්‍රාමික නිලධාරීන්ගේ විශ්‍රාම සැකසීම් කටයුතු.
5. අභ්‍යන්තර ස්ථාන මාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම.
6. සේවක වන්දි ගෙවීම හා සේවක ප්‍රතිලාභ කළමනාකරණය.
7. ආයතනික සැලසුම් සකස් කිරීම

2019 ට අදාළ කාර්ය සාධනය 6.1 සහ 7 වන පරිච්ඡේදවල සඳහන් වේ.

## 8.4.2 මානව සම්පත් සංවර්ධන අංශය

**හැඳින්වීම**

නවීකරණය, ගෝලීයකරණය, තාක්‍ෂණික නවෝත්පාදන, ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාදාමයන් සහ සේවක මණ්ඩල ප්‍රශස්තකරණය වැනි නැගී එන ප්‍රවණතාවන් සමඟ ලෝකයේ සෑම රටකම රේගු පරිපාලනයන් විශාල අභියෝග රැසකට මුහුණ දෙමින් සිටී. රේගු පරිපාලනයන් තුළ මානව සම්පත් සංවර්ධනයට ඉහළ ප්‍රමුඛතාවයක් ලබා දීමේ වැදගත්කම දක්වන රේගු වෘත්තීය සංවර්ධනය හා මෙකී සියලු සාධක අතර ඍජු සම්බන්ධතාවක් පවතී.

ශ්‍රී ලංකා රේගුව යනු වසර 200 කට වැඩි අත්දැකීම් සහිතව ජාතියේ දේශසීමා පාලන ආයතනයක් ලෙස කටයුතු කරන ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම දෙපාර්තමේන්තුවයි. ආදායම් එකතු කිරීම, රේගු නීතිය බලාත්මක කිරීම, වෙළඳාමට පහසුකම් සැපයීම සහ සමාජ ආරක්ෂණය යන මූලික අරමුණු පෙරදැරිව රටේ සමාජ ආර්ථික යහපැවැත්ම සඳහා ශ්‍රී ලංකා රේගුව වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබයි. ශ්‍රී ලංකා රේගුවේ වගකීම් ඵලදායී ලෙස හා කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා, සේවා ආචාර ධර්ම පිළිපදිමින් ධනාත්මක ආකල්පව සහිතව තම වගකීම් ඉටු කළ හැකි මනා දැනුමෙන් යුත් සහ ඉහළ නිපුණතා ඇති පුද්ගලයින් බිහිකිරීම අත්‍යවශ්‍ය වේ.

මෙකී පෙළඹවීම තුළ, ශ්‍රී ලංකා රේගුව සෑම විටම සිය දෙපාර්තමේන්තු නිලධාරීන්ට පමණක් නොව, රේගු සහ දේශසීමා ආරක්ෂණ විෂයෙහි නියැලී සිටින බාහිර පාර්ශවකරුවන්ට පහසුකම් සැලසීම කෙරෙහි ද අවධානය යොමු කරයි.

ඒ අනුව, ශ්‍රී ලංකා රේගුවේ මානව සම්පත් සංවර්ධන අංශය විසින් දෙපාර්තමේන්තුවේ අභිමතාර්ථ හා අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සේවකයින්ගේ දැනුම, කුසලතා සහ ආකල්ප වැඩි දියුණු කිරීම සඳහා කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

**මෙම අංශයේ ප්‍රධාන කාර්යයන්**

මානව සම්පත් සංවර්ධන අංශය විසින් ප්‍රධාන වශයෙන්ම පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන්නේ දෙපාර්තමේන්තුවේ සේවක මණ්ඩලය සඳහාය. මෙම පුහුණු වැඩසටහන් දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් වශයෙන් කොටස් දෙකකි. ජාත්‍යන්තර ස්වරූපයෙන් රේගු විෂය ක්ෂේත්‍රයට අදාළව විදේශ රටවලින් ලැබෙන පුහුණු ශිෂ්‍යත්ව විදේශීය පුහුණුව ලෙස වර්ගීකරණය වෙන අතර නිපුණතා සංවර්ධනය හා අදාළ ක්ෂේත්‍රයේ දැනුම හා දැනුවත්භාවය වැඩි දියුණු කිරීමත් සමඟම කුසලතා හා නෛසර්ගික දක්ෂතා හඳුනා ගැනීම සඳහා දේශීය පුහුණු වැඩසටහන් සකස් වේ. තවද, ලෝක රේගු සංවිධානයෙහි සහාය ඇතිව පශ්චාත් නිෂ්කාශන විගණනය පිළිබඳ රට තුළ වැඩමුළු සාර්ථකව සංවිධානය කිරීමට මානව සම්පත් සංවර්ධන අංශයට හැකි විය. දෙපාර්තමේන්තුවේ මානව සම්පත් සංවර්ධන කටයුතු වලට අමතරව, පාර්ශවකරුවන්ගේ ධාරිතා සංවර්ධනය හා පුහුණුව සම්බන්ධ කරුණු සඳහා සහාය වීමේ කටයුත්ත ද මෙම අංශයට පැවරී ඇත. අංශයෙහි ප්‍රධාන කාර්යයන් වනුයේ,

1. පුහුණු ප්‍රතිපත්ති, පද්ධති හා ක්‍රියා පටිපාටි සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.
2. දෙපාර්තමේන්තු අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සෑම මට්ටමකම සේවකයින්ගේ හැකියාවන් ඉහළ නැංවීම පිළිබඳව වගකීම
3. නවක බඳවා ගැනීම් සහ රැකියා තනතුරු වෙනස් කිරීමේදී පළපුරුදු නිලධාරීන් සඳහා ප්‍රමිතිගත පුහුණු අන්තර්ගතයන් ලබා දීම
4. සේවකයින් සඳහා යාවත්කාලීන පුහුණුව ලබා දීම සඳහා ලෝක රේගු සංවිධානය සහ ලෝක වෙළඳ සංවිධානය ඇතුළු දේශීය හා ජාත්‍යන්තර ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම
5. දෙපාර්තමේන්තු අභිලාෂයන් සපුරාලීම සඳහා නිශ්චිත පුහුණු වැඩසටහන් සකස් කිරීම සහ බෙදා හැරීම
6. උසස් මට්ටමේ පුහුණුවක් සැපයීම තුළින් වෘත්තීමය කුසලතාවයෙන් හෙබි විශිෂ්ට රේගු නිලධාරීන් බිහි කිරීම
7. නව්‍ය හා ඵලදායී ඉගෙනුම් පරිසරයක් ලබා දීම
8. රේගු නිලධාරීන් විසින් සේවා ආචාර ධර්ම පිළිපැදීමේ මට්ටම ඉහළ නැංවීම
9. මානව සම්පත් කළමනාකරණයේ ජාත්‍යන්තර අවශ්‍යතා සපුරාලීම.
10. පුහුණු සැලැස්ම සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම මගින් පුහුණු අවශ්‍යතාවයට ප්‍රමුඛතාවය දී දෙපාර්තමේන්තුවේ පුහුණු අවශ්‍යතා තක්සේරු කිරීම.
11. විෂයමාලා සංවර්ධනය, පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු සංවර්ධනය කිරීම හා පැවැත්වීම.
12. පුහුණු වැඩසටහන් අධීක්ෂණය හා ඇගයීම.
13. ශ්‍රී ලංකා යුද හමුදාව, නාවික හමුදාව සහ පොලිස් නිලධාරීන් වැනි බාහිර සංවිධාන සඳහා අවශ්‍ය පුහුණුව ඉල්ලා සිටි විට ලබා දීම.
14. රේගු නියෝජිතයින් සඳහා සහතික පාඨමාලා වැඩසටහන් පැවැත්වීම රේගු කටයුතු පිළිබඳ පාර්ශවකරුවන්ගේ පුහුණු අවශ්‍යතා සඳහා පහසුකම් සැලසීම සඳහා රේගු දෙපාර්තමේන්තුවෙන් සම්පත්දායකයින් සැපයීම.
15. රේගු කාර්ය මණ්ඩලය සඳහා පුස්තකාල පහසුකම් සැපයීම

**2019 වර්ෂයේ කාර්ය සාධනය**

2019 වර්ෂයේ පුහුණු සැලැස්ම හා රේගු අධ්‍යක්ෂ ජනරාල් නියමය පරිදි අනෙකුත් විශේෂ වැඩසටහන් වලට අනුකූලව මානව සම්පත් සංවර්ධන අංශය විසින් පවත්වන ලද දේශීය සහ විදේශ පුහුණු වැඩසටහන් යටතේ පුහුණු ලාභීන් 3,158 දෙනෙකුට පුහුණුව සලසා ඇත.

**පුහුණු වැඩසටහන් සඳහා සහභාගිත්වය 2019**

තනතුර අනුව

| තනතුර | දේශීය | විදේශ |
|---|---|---|
| රේගු අධ්‍යක්ෂ ජනරාල් | - | 3 |
| අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් | 5 | 09 |
| රේගු අධ්‍යක්ෂ | 26 | 27 |
| නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ | 131 | 59 |
| රේගු අධිකාරී | 205 | 55 |
| නියෝජ්‍ය රේගු අධිකාරී | 2433 | 32 |
| සහකාර රේගු අධිකාරී | | 87 |
| වෙනත් | 358 | 02 |
| එකතුව | 3,158 | 274 |

**දේශීය/ විදේශීය පුහුණු වැඩසටහන් 2019**

| |
|---|
| **දේශීය පුහුණු වැඩසටහන් – සමස්ත වැඩසටහන් සංඛ්‍යාව : 65** |
| **විදේශ පුහුණු වැඩසටහන් – සමස්ත වැඩසටහන් සංඛ්‍යාව : 128** |
| **සහභාගි වූවන් - දේශීය**<br>**රේගු අධිකාරී හා ඉන් ඉහළ නිලධාරීන් සඳහා වැඩසටහන් - 367**<br>**සහකාර රේගු අධිකාරී ඉන් ඉහළ නිලධාරීන් සඳහා වැඩසටහන් - 2433**<br>**වෙනත් - 358** |
| **සහභාගි වූවන් - විදේශ**<br>**සම්මන්ත්‍රණ 08**<br>**වැඩමුළු 28**<br>**වැඩසටහන් 13**<br>**පුහුණු පාඨමාලා 04**<br>**රැස්වීම් 42**<br>**පශ්චාත් උපාධි වැඩසටහන් -**<br>**සම්මන්ත්‍රණ 07**<br>**අනෙකුත් 06** |

**රේගු මූලස්ථාන අනු නියෝජිතයන් පුහුණු කිරීම හා විභාග පැවැත්වීම.**

| විභාගය | සහභාගි වූ ප්‍රමාණය | සමත් සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|---|
| 2018 කණ්ඩායම III | 118 | 94 | 80% |
| I කණ්ඩායම | 110 | 97 | 88% |
| II කණ්ඩායම | 113 | 95 | 84 % |
| III කණ්ඩායම | 117 | 106 | 90% |

*රේගු පුස්තකාලය*

මානව සම්පත් සංවර්ධන අංශය සඳහා ඉතා වැදගත් ස්ථානයක් වන රේගු පුස්තකාලය අනුබද්ධ ඒකකයක් වශයෙන් 2005.01.26 වන දින මානව සම්පත් සංවර්ධන අංශය යටතේ ස්ථාපිත කරන ලදී.

පුස්තකාලය සම්බන්ධයෙන් කාර්ය මණ්ඩලයෙන් නොසිතූ ආකාරයෙන් ධනාත්මක ප්‍රතිචාර ලැබෙන අතර, සාමාජිකත්වය ද ඉහළ ගොස් ඇත. රේගු නිලධාරීන්ගේ කළමනාකරණ හා වන්දි අරමුදල මඟින් පුස්තකාලය සඳහා පොත් මිළදී ගැනීමට පහසුකම් සපයන අතර මේ වන විට පොත් ප්‍රමාණයේ සැලකිය යුතු වර්ධනයක් දැකිය හැක.

දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරීන් සඳහා පුස්තකාල පහසුකම් පවතින අතර, සාමාජිකයන් නොවන අයට ද පුස්තකාලය භාවිතා කලහැකි ය. පොත් වලට අමතරව විවිධ සඟරා ද තිබේ. පුස්තකාලය විසින් දෙපාර්තමේන්තු නියෝග, නිලධාරීන් විසින් විදේශ සංචාර සඳහා සහභාගී වීමෙන් පසු ඉදිරිපත් කරන වාර්තා සහ අනාගතයේ විමර්ශන සඳහා දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලබන අනෙකුත් ප්‍රකාශන එකතු කරනු ලබයි.

ස්ථිර පුස්තකාලාධිපතිවරයෙකු නොමැති වුවත්, පුස්තකාලයේ කටයුතු බාධාවකින් තොරව පවත්වා ගෙන යනු ලබයි. පුස්තකාල සාමාජිකත්වය ඉහල ගොස් ඇති බව නිරීක්ෂණය වී ඇති අතර, එම නිසා ඒ සම්බන්ධයෙන් පහත සඳහන් පහසුකම් සැපයීම අවශ්‍ය වේ.

a) පුහුණු කාර්ය මණ්ඩලයක් සහිත සුදුසුකම් ලත් පුස්තකාලාධිපතිවරයෙකු අනුයුක්ත කිරීම.

(b) පුස්තකාල මෘදුකාංගයක් හඳුන්වා දීම.

(c) වැඩිදියුණු කළ පරිගණක සහිතව අන්තර්ජාල පහසුකම් ලබාදීම.

(d) කාඩ්පත් ක්‍රම යටතේ පොත් නිකුත් කිරීම හා ආපසු ලබාගැනීම ක්‍රියාත්මක කිරීම.

### 8.4.3 කාර්ය මණ්ඩල සේවා අංශය

**පරමාර්ථ**

දෙපාර්තමේන්තුමය අරමුණු ඉටු කරගැනීමේ ක්‍රියාවලියේදී සේවකයන්හට නව්‍ය ආකාරයෙන් හා නිර්මාණාත්මකව දායක විය හැකි පරිසරයක් සැපයීම

**ප්‍රධාන ක්‍රියාකාරකම්**

1. රජයේ විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම:
   සියලු අංශ සම්බනධීකරණය කරමින් විගණකාධිපති විසින් විමසන ලද විමසුම් සඳහා පිළිතුරු සැපයීම
2. සුභසාධක කළමනාකරණය:
   දැනට සැපයෙන සුභසාධන සේවා හා ඒවායේ ප්‍රමිතිය හඳුනාගෙන ගුණාත්මක සුභසාධන සේවාවක් සැපයීම පිණිස පියවර ගැනීම සෑම මට්ටමකම සේවකයින්ගේ අදහස් ලබාගෙන සුභසාධන සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීම.
3. විනය පිළිබඳ කළමනාකරණය:
   අදාළ නිලධාරීන්ට විරුද්ධව චෝදනා ඉදිරිපත් වන්නේ නම් ඒ පිළිබඳව මූලික විමර්ශන හා විනය පරීක්ෂණ පැවැත්වීම. රේගු දෙපාර්තමේන්තුවේ විනය ක්‍රියාපටිපාටියට අන්තර්ගත කොට ආචාර ධර්ම පද්ධතියක් ක්‍රියාත්මක කිරීම. සේවකයින් ආචාර ධර්ම පද්ධතිය අනුගමනය කරන්නේද යන්න නිරීක්ෂණය කිරීම හා ආචාර ධර්ම පද්ධතිය අනුගමනය නොකරන්නේ නම්, ඔවුන්ට විරුද්ධව විනය ක්‍රියාපටිපාටිය අනුගමනය කොට ආචාර ධර්ම පද්ධතිය ඵලදායී බවට පත් කිරීම.
4. දුක් ගැනවිලි කළමනාකරණය:
   කළමනාකරණය පිළිබඳව සේවකයින් අතර තෘප්තිය වර්ධනය කිරීම සහ අතෘප්තිය අවම කිරීම සඳහා දුක් ගැනවිලි කළමනාකරණය කිරීම, සබඳතා ගොඩනැගීම සඳහා පිළිගත් වෘත්තීය සමිති සමඟ නිරන්තර සාකච්ඡා පැවැත්වීම, මතභේදාත්මක කරුණු සම්බන්ධයෙන් තීරණ ගැනීමට සාකච්ඡා කමිටු ස්ථාපිත කිරීම, සේවක ගැටලු හඳුනා ගැනීම සහ සමථයකට පත් කිරීම සඳහා සාකච්ඡා පැවැත්වීම.
5. ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම:
   රේගුවේ සියළුම මට්ටම්වල නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සහ ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයේ උපදෙස් අනුගමනය කරමින් ඵලදායිතා ප්‍රවර්ධන තත්ත්ව ළඟා කර ගැනීමට අවශ්‍ය ක්‍රමවේද හා තාක්ෂණික ක්‍රම ක්‍රියාත්මක කිරීමකි පරිසරයක් සැපයීම.

## 8.4.4 සේවා හා සැපයීම් අංශය

**හැඳින්වීම**

ඵලදායී ලෙස හා විනිවිදභාවයෙන් යුතුව රේගුවේ සියලුම අංශයන් සඳහා සියලු අවශ්‍යතා සැපයීම, නඩත්තු කිරීම හා සේවා කටයුතු සිදු කිරීම සේවා හා සැපයීම් අංශයේ ප්‍රධාන පරමාර්ථය වේ.

*ප්‍රධාන කාර්යයන්*

1. දෙපාර්තමේන්තුවේ කාර්යයන් අඛණ්ඩව පවත්වාගෙන යාම පිණිස ගුණාත්මකභාවය ආරක්ෂා කරමින් නියමිත වේලාවට අදාළ අංශ වෙත සේවා හා සැපයීම් ලබාදීම.

2. ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ හා භාණ්ඩාගාර චක්‍රලේඛවලට අනුගත වෙමින් විනිවිදභාවයෙන් යුක්ත ආකාරයට භාණ්ඩ හා සේවා මිලදී ගැනීම.

3. විධිමත් ආකාරයේ තොග පාලනයක් හා කාර්යක්ෂම ගබඩා කළමනාකරණ පද්ධතියක් පවත්වාගෙන යාම සහතික කරමින්, මිලදී ගන්නා භාණ්ඩවල ආරක්ෂාව හා උපරිම ප්‍රයෝජනය සැලසෙන පරිදි ගබඩා කිරීම හා ඉන්වෙන්ට්‍රි පවත්වාගෙන යාම.

4. රේගු දෙපාර්තමේන්තුවේ චංචල හා නිශ්චල වත්කම් කළමනාකරණය

5. උපලේඛනයට අනුව නව රේගු මූලස්ථාන ගොඩනැගිල්ල තුළ ඉදිකිරීම් කටයුතු සතුටුදායක ලෙස සම්පූර්ණ කිරීම සහ විධිමත් පරිශ්‍ර කළමනාකරණ සැලැස්මක් ක්‍රියාත්මක වන බවට සහතික වීම.

6. රේගු දෙපාර්තමේන්තුවේ රථවාහන සමූහය උපරිම ධාවන තත්ත්වයෙන් පවත්වාගෙන යාම සහතික කිරීම සඳහා සුදුසු පියවර ගැනීමට වග බලා ගැනීම.

2019 වර්ෂය තුළ කාර්ය සාධනය 3.8 සහ 7 වන පරිච්ඡේදවල සඳහන් වේ

## 8.5 පළාත් පර්ෂදය

### 8.5.1 මගී සේවා (කටුනායක) අංශය

**හැඳින්වීම**

මගී සේවා (කටුනායක) අංශය, කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ පිහිටා ඇති අතර, ගුවන් තොටුපල තුළ පාලනය/අවේක්ෂණය එකී අංශය මගින් දරනු ලබයි. ගුවන් තොටුපල තුළ රේගුව යනු නීති විරෝධී ප්‍රවාහන කටයුතු වලට එරෙහි රටක පළමු ආරක්ෂක සීමාවවේ. මෙම අංශයේ කාර්යය භාරය වන්නේ,

1. සත් භාවයෙන් කටයුතු කරන මගීන්ගේ නිදහස් ගමන් බිමන් සඳහා පහසුකම් සැලසීම.
2. රජයේ ආදායම ආරක්ෂා කිරීම, සමාජ ආර්ථික, සංස්කෘතික සහ සමාජයේ පාරිසරික පැවැත්ම ආරක්ෂා කිරීම තහවුරු කිරීම.
3. රේගු ආඥා පනතේ හා අනෙකුත් අදාල නීති යටතේ පවරා දී ඇති නීති බලාත්මක කිරීමේ කටයුතු සිදු කිරීම.
4. ගුවන් මගින් සිදු කරන ගමන් බිමන් සම්බන්ධ දේශසීමා පාලන මෙහෙයුම් නියාමනය හා අධික්ෂණය කිරීම
5. ආරක්ෂක අමාත්‍යාංශය, විදුලි සංදේශන නියාමන කොමිෂන් සභාව, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, ශ්‍රී ලංකා ජාතික ඖෂධ නියාමන අධිකාරිය, ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව, විනිමය පාලන දෙපාර්තමේන්තුව, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය යනාදිය වැනි අනෙකුත් ආයතන හා අධිකාරි වලට අදාල පනත් හා රෙගුලාසි මගින් රේගුව වෙත පවරා දී ඇති බලතල ක්‍රියාත්මක කිරීම.

**ප්‍රධාන කාර්යයන්**

1. රට තුළට පැමිණෙන හා රටින් පිටවන මගීන්ගේ හා ඔවුන්ගේ ගමන් මලු අපහසුවකින් තොරව එහා මෙහා ගෙන යාම සඳහා පහසුකම් සැලසීම.
2. රජයට ලැබිය යුතු ආදායම එකතු කිරීම සහ සීමා කරන හා තහනම් කරන ලද භාණ්ඩ ආනයනය හා අපනයනය කිරීම වැළැක්වීම
3. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොලේ ප්‍රභූ ගමන් බිමන් සඳහා පහසුකම් සැලසීම.
4. ශ්‍රී ලංකාවට පැමිණෙන හා ඉන් පිටවන ගුවන් යානා හා ඒවායේ කාර්යමණ්ඩල සැලසුම් කිරීම.
5. මගී ගමන් මලු සඳහා තීරුබදු රහිත ගමන් මලු දීමනාව ප්‍රදානය කිරීම හා එවන් පහසුකම් අනිසි ලෙස භාවිතා කිරීම පිළිබඳ අධීක්ෂණය කිරීම සහ ඒ සම්බන්ධයෙන් පියවර ගැනීම
6. අවශ්‍ය අවස්ථාවලදී ATA කානේ පත්, ඇපකර හා විශේෂ තැන්පතු මත භාණ්ඩ මුදා හැරීම
7. රේගුව / ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය විසින් අනුමත කරන ලද මැණික් / ස්වර්ණාභරණ පාර්සල් හැසිරවීම
8. රට තුළට පැමිණෙන / ඉන් පිටවන මගීන්ගේ විදේශ මුදල් ප්‍රකාශ පරීක්ෂා කිරීම හා අනුමත කිරීම
9. මගියා පිට වූ පසු ඔහු විසින් රැගෙන නොගිය මලු ඇටෝනි බලපත්‍ර සහිත බලයලත් පුද්ගලයෙකු හට ඉතිරි ගමන් මලු දීමනාව ලබා දීම පිටසන් කිරීම.
10. සැකසහිත අවස්ථාවක හෝ අවශ්‍ය වෙනත් අවස්ථාවක කැටුව රැගෙන එන ගමන් මලු පරීක්ෂා කිරීම.
11. අවශ්‍ය විටකදී පුද්ගලයින් පරීක්ෂා කිරීම,වැරදි අනාවරණය කරගැනීම විමර්ශනයන් සිදු කිරීම හා අනාවරණය කොටගත් රේගු සිද්ධි පිළිබඳ විමර්ශනය කිරීම,රටින් පිටතට යන ගුවන් යානා සඳහා නිෂ්කාශන නිකුත් කිරීම, වාණිජ අන්දමේ භාණ්ඩ රැගෙන එන මගීන්ගෙන් තීරුබදු හා අනෙකුත් බදු අය කර ගැනීම.

**කාර්ය සාධනය**

**තීරුබදු සහ වෙනත් බදු එකතු කිරීම**

| | රු.මි |
|---|---|
| රේගු තීරුබදු | 19,156 |
| එකතු කළ අගය මත බදු | 108,861 |
| වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු | 18,833 |
| නිෂ්පාදන බදු | 10 |
| ආනයන සෙස් | 131,277 |
| දඩ | 136,883 |
| විශේෂ භාණ්ඩ බද්ද | 226,545 |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 15,397 |
| වෙනත් | 14 |
| ආර්ථික සේවා ගාස්තු | 7,713 |
| එකතුව | **438,372** |

**වෙනත් අය කිරීම්**

| | රු. 000 |
|---|---|
| ආරක්ෂිත කාමර ගාස්තු | 805 |
| අතිකාල | 7,421 |
| තීරුබදු නිදහස් වෙරේගු .සැ. ගාස්තු | 654 |
| Du. Sch | 10 |
| පරිගණක ගාස්තු | 5,477 |
| එකතුව | 14,369 |

**අනාවරණයන්**

| | රු.මි |
|---|---|
| හසු කර ගත් සිද්ධීන් සංඛ්‍යාව | 204 |
| රාසන්තක කරන ලද භාණ්ඩ වල වටිනාකම රු. | 670,014,923.00 |
| රාසන්තක කරන ලද මුදල් වල වටිනාකම් රු. | 69,989,013.00 |
| CIB වෙත යොමු කරන ලද සිද්ධීන් වල වටිනාකම රු . | නැත |
| රාසන්තක කළ තීරුබදු නිදහස් අයිතම වල වටිනාකම් රු. | 733,236.00 |
| රාසන්තක කළ මැණික් වල වටිනාකම් රු. | 7,391,480.00 |
| රාසන්තක කළ රත්‍රන්වල වටිනාකම් රු. | 433,345,025.00 |
| රාසන්තක කළ රිදී වල වටිනාකම් රු. | නැත |
| රාසන්තක කළ දුම්කොළ වල වටිනාකම් රු. | 89,834,900.00 |
| හසුකර ගත් තහනම් ඖෂධ ප්‍රමාණය | 4960.115g |
| රාසන්තක කළ අනෙකුත් භාණ්ඩ වල වටිනාකම් රු. | 15,883,387.00 |
| පවත්වන ලද විමර්ශන සංඛ්‍යාව | 195 |
| රඳවාගත් සීමා කරන ලද අයිතම සංඛ්‍යාව | 91 |
| රාජසන්තක කරන ලද දුම්වැටි සංඛ්‍යාව | 436797 |
| රඳවා ගත් අනෙකුත් පැකේජ සංඛ්‍යාව (මත්පැන් ආදිය) | 3587 |

## 8.5.2 ආදායම් හා සේවා (කටුනායක ) අංශය

හැඳින්වීම

ආදායම් හා සේවා (කටුනායක) කාර්යාංශය කටුනායක බන්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොලේ ගුවන් භාණ්ඩ පර්යන්තයේ ස්ථාපිත කොට ඇත. නියමිත ආදායම එකතු කර ගැනීම හා ආනයනික ගුවන් භාණ්ඩ, රේගු ආඥා පනතේ හා වෙනත් අදාල නීති හා රෙගුලාසිවල විධිවිධාන යටතේ බලාත්මක කරන ලද දේශ සීමා පාලන රෙගුලාසි සුරැකෙන ආකාරයට නිෂ්කාශනය කිරීම සඳහා පහසුකම් සැලසීම සහ කටයුතු කිරීම මෙම කාර්යාංශයේ වගකීම වේ.

ගුවන් භාණ්ඩ පර්යන්තයේ ප්‍රධානතම ගුවන් බඩු හැසුරුම්කරු ලෙස කටයුතු කරන්නේ ශ්‍රී ලන්කන් එයාර්ලයින්ස් ලිමිටඩ් ආයතනයයි. අනෙකුත් භාණ්ඩ හැසුරුම් නියෝජිතයන් ලෙස ශ්‍රී ලංකා රේගු පාලනය යටතේ සේවා සැපයිම සඳහා ගුවන් භාණ්ඩ පර්යන්ත II හි ස්වයං හැසුරුම් සේවා සපයන්නන් ලෙස SLFFA කාගෝ සර්විස් ලිමිටඩ් හා එක්ස්පෝ ඒවියේෂන් ලිමිටඩ් යන ආයතන කටයුතු කරයි. කුරියර් භාණ්ඩ වේගවත්ව නිශ්කාෂණය කිරීමේ කටයුතු ප්‍රමුඛතා පදනමින් ඩී එච් එල් හා කොළඹ කාර්ගෝ එක්ස්ප්‍රස්(ප්‍රයිවට්) ලිමිටඩ් මගින් පවත්වාගෙන යන බැඳුම්කර ගුදම්වලදී සිදු කරයි.

**ප්‍රධාන කාර්යයන්**

1. ගුවන් මගින් ආනයනය කරනු ලබන භාණ්ඩවලට අදාල රේගු තීරු බදු, සෙස් හා වෙනත් ගෙවීම් තක්සේරු කිරීම හා එකතු කිරීම
2. භාණ්ඩ ප්‍රකාශ හා නිෂ්කාශන බලපත්‍ර සකස් කිරීම.
3. කර්මාන්ත හා සේවා අංශය යටතේ ක්‍රියාත්මක විවිධ අපනයන කේන්ද්‍රිය පහසුකරණ වැඩසටහන් යටතේ ආනයනය කරනු ලබන භාණ්ඩ නිෂ්කාශනය සඳහා අනුමැතිය ලබා දීම
4. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ ලියාපදිංචි ව්‍යාපාර වෙත යැවීමට නියමිත ආනයනික භාණ්ඩ නිෂ්කාශනය සඳහා අනුමැතිය ලබා දීම
5. ඉක්මනින් නරක් වන ද්‍රව්‍ය, කුරියර් භාණ්ඩ, විදේශ දූත මණ්ඩල භාණ්ඩ හා තැපැල් ආදී ආනයනික හදිසි භාණ්ඩ කඩිනමින් නිෂ්කාශනය කිරීම සඳහා පැය 24 පුරා ක්‍රියාත්මක වීම
6. නැවත පැමිණෙන මගින් විසින් කැටුව නොයන ලද විවිධ ගමන් මළු, කැටුව නොයන ලද මගී මළු ගබඩා වෙත මාරු කර යැවීම පහසු කිරීම
7. ආයෝජන මණ්ඩල, ආයෝජන මණ්ඩල නොවන, කුරියර් හා ඉක්මනින් විනාශ විය හැකි භාණ්ඩ සඳහා ආනයන රේගු අණකර සකස් කිරීම හා නිෂ්කාශන ලබා දීම

**ආදායම් රැස් කිරිම**

| අනු අංකය | විස්තරය | කේතය | ගුවන් භාණ්ඩ | ඩී එච් එල් | කො/ කාගෝ | එකතුව |
|---|---|---|---|---|---|---|
| 01 | රේගු ආනයන තීරුබදු | CID | 3,277,052,163.00 | 254,052,049.00 | 121,488,535.00 | 3,652,592,747.00 |
| 02 | එකතු කළ අගය මත බදු | VAT | 9,597,453,417.00 | 649,790,118.00 | 361,307,432.00 | 10,590,550,967.00 |
| 03 | වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු | PAL | 8,296,542,980.00 | 411,184,005.00 | 207,482,290.00 | 8,915,209,275.00 |
| 04 | සමාජ වගකීම් බද්ද | SRL | 0.00 | 12,000.00 | 0.00 | 12,000.00 |
| 05 | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද | SCL | 252,787,862.00 | 90,816.00 | 28,992.00 | 252,907,670.00 |
| 06 | ඒකාබද්ධ ගාස්තු | CON | 68,152.00 | 0.00 | 0.00 | 68,152.00 |
| 07 | රේගු ආනයන අධිභාර | SUR | 0.00 | 0.00 | 0.00 | - |
| 08 | නිෂ්පාදන බදු | XDO | 15,224,576.00 | 154,224.00 | 26,928.00 | 15,405,728.00 |
| 09 | ආර්ථික සේවා ගාස්තු | ESC | 0.00 | 4,717.00 | 4,531.00 | 9,248.00 |
| 10 | ජාතිය ගොඩ නැගීමේ බද්ද | NBT | 3,480,591,189.00 | 151,667,657.00 | 70,954,174.00 | 3,703,213,020.00 |
| 11 | ආනයන සෙස් | EIC | 1,499,467,218.00 | 118,844,237.00 | 58,894,462.00 | 1,677,205,917.00 |
| 12 | පරිගණක ගාස්තු | COM | 23,739,750.00 | 7,251,250.00 | 4,391,060.00 | 35,382,060.00 |
| 13 | විභාග ගාස්තු | EXM | 35,482,500.00 | 8,727,800.00 | 5,247,500.00 | 49,457,800.00 |
| 14 | අතිරික්ත ගෙවීම් | OVP | 4,760,514.00 | 0.00 | 0.00 | 4,760,514.00 |
| 15 | අතිකාල ගාස්තු | OTC | 112,567,719.00 | 7,071,100.00 | 1,886,600.00 | 121,525,419.00 |
| 16 | මුද්‍රා ගාස්තු | SEL | 765,255.00 | 0.00 | 0.00 | 765,255.00 |
| 17 | දඩ | PTY | 148,628,251.00 | 55,250,668.00 | 10,426,136.97 | 214,305,055.97 |
| 18 | පරීක්ෂණ ගාස්තු | VCS | 0.00 | 8,707,860.00 | 1,033,580.92 | 9,741,440.92 |
| 19 | විවිධ | MISC | 16,197,526.00 | 0.00 | 0.00 | 16,197,526.00 |
| 20 | විශේෂ තැන්පතු | SPD | 0.00 | 0.00 | 0.00 | - |
| 21 | අනෙකුත් සංශෝධන ගාස්තු | AMD | 0.00 | 1,500.00 | 34,751.00 | 36,251.00 |
| | එකතුව (රු.) | | 26,743,329,072.00 | 1,672,810,001.00 | 843,206,972.89 | 29,259,346,045.89 |
| 22 | ලැබූ රේගු සටහන්කර සංඛ්‍යාව | | 75031 | 29005 | 17846 | 121882 |
| 23 | බැඳුම්කර, INFAC සහ TIEP අංශ හරහා රේගු සටහන්කර | | 3091 | 0 | 221 | 3312 |
| 24 | ආයෝජන මණ්ඩල හරහා රේගු සටහන්කර | | 56698 | 27153 | 8008 | 91859 |
| | අන්තරාල | 05 | 517 | 0 | 0 | 517 |
| 25 | ආරක්ෂිත කාමර අයදුම් සංඛ්‍යාව (DRA | | 0 | 0 | 0 | 0 |
| 26 | ප්‍රාදේශික/තාවකාලික යටතේ රේගු සටහන්කර | | 1 | 0 | 0 | 1 |
| 27 | නිදහස් කිරීම් යටතේ රේගු සටහන්කර 19 (අ) | | 1265 | 0 | 0 | 1265 |
| 28 | ප්‍රති නැව්ගත කිරීම් යටතේ අයදුම්පත් | | 6018 | 0 | 435 | 6453 |
| 29 | Dip/DPL භාණ්ඩ තොග සංඛ්‍යාව | | 338 | 0 | 0 | 338 |
| 30 | කානේ් අවසර පත් යටතේ රේගු සටහන්කර | 04 | 55 | 0 | 0 | 55 |
| 31 | ACT/DHL/CC) යටතේ රේගු සටහන්කර | | 0 | 0 | 0 | 0 |
| 32 | ISAFTA/SAFTA යටතේ රේගු ටසහන්කර | | 175 | 0 | 0 | 175 |
| 33 | P.G( ACT/DHL/CC) යටතේ රේගු සටහන්කර | | 0 | 0 | 0 | 0 |
| 34 | මැණික් ලේඛනය | | 540 | 0 | 0 | 540 |
| | එකතුව | | 21434 | 58504 | 31821 | 111759 |
| 35 | බෙදා හරින ලද පැකේජ සංඛ්‍යා | | 0 | 0 | 0 | 0 |

### 8.5.3 ආදායම් සහ සේවා (ප්‍රාදේශීය) අංශය

**හැඳින්වීම**

ආදායම් හා සේවා (ප්‍රාදේශීය) අංශය විසින් ගාල්ල, යාපනය, ත්‍රිකුණාමලය, මහනුවර, කුරුණෑගල, මත්තල සහ මාගම්පුර යන පිට පළාත් තොටුපලවල්හි සියලුම රේගු අනුබද්ධිත කාර්යයන් සිදු කරනු ලැබේ. එමෙන්ම භාණ්ඩ, කැටුව නොඑන මගී ගමන් මලු සහ තැපැල් පාර්සල් නිෂ්කාශනය සහ රජය වෙත ලැබිය යුතු ආදායම් ලැබෙන බව සහතික කරයි.

**ප්‍රධාන කාර්යයන්**

1. ආනයන සහ අපනයන ආදායම් එකතු කිරීම
2. රටේ සමාජ/ආර්ථික ආරක්ෂාව තහවුරු කිරිම සඳහා සීමා පාලනය පවත්වා ගැනීම
3. ආනයන සහ අපනයන භාණ්ඩ පරීක්ෂාව හා මුදා හැරීම
4. ප්‍රාදේශීය මට්ටමින් කැටුව නොයන මගී ගමන් මළු සහ තැපැල් පාර්සල් නිෂ්කාශනය කිරීමට පහසුකම් සැලසීම.
5. මගී හා මගී ගමන් මලු සංචරණය සඳහා පහසුකම් සැපයීම සහ රේගු නීති ඵලදායී ලෙස බලාත්මක කිරීම

| තීරු බදු හා වෙනත් ගාස්තු | ආනයන තීරු බදු (CID) | වරාය හා ගුවන් තොටුපල සංවර්ධන ගාස්තු | රේගු මුද්‍රා /ගාස්තු | අතිකාල ගාස්තු (OTC) | යාත්‍රා ගාස්තු (YCH) | ආරක්ෂිත කාමර ගාස්තු(SRC | එකතු කළ අගය මත බදු (VAT) | ජාතිය ගොඩ නැගීමේ බද්ද (NBT) | ආනයන සෙස් (EDB)(EIC) | නිෂ්පාදන බදු (EXD) | පරීක්ෂණ ගාස්තු(EXM) | දඩ | වරාය නිෂ්කාශන ගාස්තු | විශේෂ භාණ්ඩ බද්ද (SCL) | වෙනත් ගාස්තු | වර්ෂය සඳහා මුළු එකතුව | රාජ සන්තක කළ භාණ්ඩ වල වටිනාකම |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| යාපනය | - | - | - | 200,037.35 | - | - | - | - | - | - | - | 12,782,681.00 | - | - | 2,800.00 | 12,985,518.35 | 165,239,855.33 |
| යාපනය තැපැල් | 189,086.00 | 1307270.50 | | - | | 17900.00 | 474,760.00 | 726,819.50 | 1,482,335.00 | 745 | - | 28,581.00 | - | - | - | 4,227,497.00 | - |
| හම්බන්තොට වරාය | 215150.17 | 1576053.08 | | 1281209.00 | | 50.00 | 3,616,623.46 | 477,867.22 | - | - | 10,500.00 | 20,000.00 | 3,000.00 | - | 20,663,224.00 | 27,863,676.93 | - |
| ත්‍රි:මලේ වරාය | 38172.00 | 25024.50 | | 15285371.00 | | - | 59,060.18 | 3,232.38 | 450 | - | 1,420,000.00 | - | - | - | 7,822,211.33 | 24,653,521.39 | - |
| ත්‍රි:මලේ තැපැල් | 32121.00 | 677824.00 | | - | | 43,500.00 | 182,452.00 | 368,067.00 | 876,851.00 | - | - | - | - | - | - | 2,180,815.00 | - |
| ගාල්ල වරාය | 346054.50 | 256945.20 | | 17006680.14 | 219650.00 | 860,200.00 | 621,082.76 | 74,833.29 | 44,807.00 | - | - | 10,000.00 | - | - | - | 19,440,252.89 | - |
| ගාල්ල තැපැල් | 252897.00 | 1137303.00 | | | 6000.00 | 130,550.00 | 936,215.00 | 435,668.00 | 988,557.00 | - | - | 59,050.00 | - | - | - | 3,946,240.00 | - |
| ගාල්ල TRICO | 1388720.00 | 1258313.00 | 175500.00 | 9106290.00 | 0 | 3,800.00 | 1,319,548.00 | 497,872.00 | 2,588,875.00 | 239,797.00 | - | 442,200.00 | - | - | - | 17,020,915.00 | - |
| කොග්ගල SPO | 0 | 1797595.00 | 700.00 | 12800.00 | 0 | 0 | 0 | 560,156.00 | 836,683.00 | - | - | 100.00 | - | - | - | 3,208,034.00 | - |
| මහනුවර තැපැල් | 164907.00 | 1172733.00 | 0.00 | 0.00 | 0 | 32,750.00 | 458,539.00 | 390,966.00 | 912,283.00 | - | - | 9,250.00 | - | - | - | 3,141,428.00 | - |
| මහනුවරCSL | 1927761.00 | 2550453.00 | 43000.00 | 7444870.00 | 0 | 16,700.00 | 2,913,266.00 | 995,899.00 | 4,385,490.00 | 1,942,973.00 | - | 256,259.00 | - | 55,080.00 | 21,973.00 | 22,553,724.00 | - |
| කු:ගල TRICO | 3265431.00 | 3160802.00 | 179000.00 | 8785830.00 | 222000.00 | 47,650.00 | 4,510,198.00 | 1,318,783.00 | 7,417,802.00 | 397,338.00 | - | 342,606.00 | - | 7,680.00 | - | 29,655,120.00 | - |
| මත්තල ගු.තො. | - | - | - | 99300.00 | | - | - | - | - | - | - | - | - | - | - | 99,300.00 | - |
| පලාලි ගු.තො. | - | - | - | 21600.00 | | - | 7,845.00 | 211.00 | 28,350.00 | - | 3,300.00 | 11,780.00 | - | - | 2,750.00 | 75,836.00 | - |
| එකතුව | 7,820,299.67 | 14,920,316.28 | 398,200.00 | 59,243,987.49 | 447,650.00 | 1,153,100.00 | 15,099,589.40 | 5,850,374.39 | 19,562,483.00 | 2,580,853.00 | 1,433,800.00 | 13,962,507.00 | 3,000.00 | 62,760.00 | 28,512,958.33 | 171,051,878.56 | 165,239,855.33 |

## 8.6 සෞඛ්‍යම රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා යටතේ පවතින අංශ

### 8.6.1 පද්ධති හා ක්‍රියාපටිපාටි අනුකූලතා විගණන අංශය

අරමුණු

පද්ධති හා ක්‍රියාපටිපාටි අනුකූලතා විගණන අංශය සෞඛ්‍යම රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා යටතේ ක්‍රියාත්මක වේ. එහි ප්‍රධානියා වන්නේ ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ 1 වන පන්තියේ නිලධාරියෙකි. සුපිළිපන් බවට හෙවත් අනුකූලතාවට පටහැණිව සිදු විය හැකි අක්‍රමිකතා සහ අඩුපාඩු වලක්වා ගැනීම පිණිස ක්‍රමවත් වැඩිදියුණු කිරීමක් තුළ මෙහෙයුම් කළමනාකරණයට සහයෝගය දැක්වීම සහ ඇති විය හැකි අවදානම් තත්ත්වයන්ට අනුරූපීව අභ්‍යන්තර පාලන ක්‍රම පවත්වාගෙන යාම හා වඩාත් පුළුල් කිරීම මෙම නව අංශය ආරම්භ කිරීමේ අපේක්ෂාව විය.

දෙපාර්තමේන්තුවේ සියලුම අංශයන්හි ප්‍රධාන ක්‍රියාවලීන් හා සහාය ක්‍රියාවලීන්හි දී සම්පත් යොදා ගැනීමේ අරපිරිමැසුම් බව හා සඵලතාව තක්සේරු කිරීම සඳහා විගණනයන් පැවැත්වීම මෙම අංශයේ ප්‍රධාන විෂය පථයට අයත් වේ.

ප්‍රධාන කාර්යයන්

1. හැකි සෑම අවස්ථාවකදීම විගණනයෙන් සිදු වන සේවය ප්‍රවර්ධනය කරමින්, එමගින් ආයතනයට වටිනාකමක් එකතුවන බව සනාථ කිරීම සඳහා ඵලදායී ලෙස අභ්‍යන්තර විගණන කාර්යය කළමනාකරණය කිරීම.
2. ආයතනයේ පාලන මෙහෙයුම් හා තොරතුරු පද්ධතියට අදාළව ඒවායේ ප්‍රමාණාත්මක බව හා සඵලතාවය ඇගයීමට ලක් කිරීම ;
3. මූල්‍ය හා මෙහෙයුම් තොරතුරුවල විශ්වාසනීයත්වය හා අවංක බව ඇගයීමට ලක් කිරීම
4. මෙහෙයුම්වල කාර්යක්ෂමතාවය හා සඵලත්වය ඇගයීමට ලක් කිරීම
5. වත්කම් ආරක්ෂා කිරීම.
6. නීති, රෙගුලාසි හා ගිවිසුම්වලට අනුකූලව කටයුතු කිරීම.
7. අවදානම් කළමනාකරණය වැඩි දියුණු කිරීම සඳහා වන අවදානම් තක්සේරුව මත පදනම්ව විගණන සැළසුම් සකස් කිරීම හා ආයතනයේ මෙහෙයුම් වැඩි දියුණු කිරීම.
8. හෙළිවන්නා වූ වැදගත් අවදානම් අවස්ථා සහ පාලන ගැටළු හා අනෙකුත් අවශ්‍ය කරුණු පිළිබඳව වාර්තා කිරීම හෝ ඉහළ කළමනාකරණය විසින් ඒවා ඉල්ලා සිටි විට ලබා දීම.
9. දැනට ක්‍රියාත්මක මෙහෙයුම් හා වැඩසටහන් හෝ ඒවායින් ලද ප්‍රතිඵල අපේක්ෂිත පරිදි කෙතරම් දුරට තීරණය කරන ලද ඉලක්ක හා අරමුණු සමඟ අනුකූලදැයි නිශ්චය කර ගැනීම සඳහා මෙහෙයුම් හා වැඩසටහන් සමාලෝචනය කිරීම.
10. ඉලක්කගත අරමුණු ඉටු කරගැනීම උදෙසා පාලන ක්‍රියාවලිය වැඩි දියුණු කිරීමට අවශ්‍ය තක්සේරුකරණයන් හා ඒ අනුව සුදුසු නිර්දේශයන් ඉදිරිපත් කිරීම
11. ආයතනය තුළ සුදුසු චර්යාධර්ම හා වටිනාකම් ප්‍රවර්ධනය කිරීම.
12. ඵලදායී ආයතනික කාර්ය සාධනය කළමනාකරණය හා වගකීම සහතික කිරීම

**2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම හා කාර්ය සාධනය පෙර වර්ෂය හා සැසඳීම**

| ඉලක්කය | ඉලක්කය | තථ්‍ය | ඉටු නොකරන ලද්දේ නම් ඊට හේතු |
|---|---|---|---|
| රජයේ අපේක්ෂාවන්ට සමගාමීව උපරිම ආදායම එකතු කිරීම | 34 | 33 | සමස්ත කාර්ය සාධනය 96.87% |
| ආදායම, සමාජීය හා පාරිසරික ආරක්ෂාව සම්බන්ධයෙන් වන රේගු නීතිය සහ වෙනත් අදාල නීති හා රෙගුලාසි නිසි පරිදි බලාත්මක කිරීම තහවුරු කරමින් වෙළඳාම පහසු කරවීම | 09 | 10 | |
| කාර්ය මණ්ඩලයේ කාර්යසාධනය ඵලදායිතාවය ඉහළ දැමීම හා සුබවාදී රාජකාරි පරිසරයක් ඇති කිරීම සඳහා වන ආකල්ප ගොඩනැගීම, ඵලදායි ලෙස හා විනිවිදභාවයෙන් යුතුව නඩත්තු සහ සේවා ඇතුළුව සියලු අවශ්‍යතා සැපයීම | 02 | 02 | |
| තාක්ෂණික විසඳුම් සමගින් සමස්ත රේගු ක්‍රියාවලිය සුමට ලෙස ක්‍රියාකරවීම පිණිස අවශ්‍ය තාක්ෂණික සහාය හා මාර්ගෝපදේශකත්වය නිසි කලට වේලාවට සැපයීම | 06 | 05 | |
| වාර්ෂික අයවැය ඇස්තමේන්තු හා සමගාමීව යමින් වියදම් පාලනය කිරීම හා විවිධ අරමුදල් ඵලදායී ලෙස කළමනාකරණය කිරීම | 13 | 12 | |
| එකතුව | 64 | 62 | |

## 8.6.2 මූල්‍ය අංශය

හැඳින්වීම

රජයේ මුළු බදු ආදායමෙන් 53% කට වඩා වැඩි ප්‍රතිශතයකට දායකත්වය දරන ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව රජයට ආදායම් උපයා දෙන ප්‍රධාන ආයතනයයි. මේ සම්බන්ධයෙන් වන ප්‍රධාන භූමිකාවක් මූල්‍ය අංශයට තිබෙන අතර, දෙපාර්තමේන්තු අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මූල්‍ය මෙහෙයුම් සම්බන්ධයෙන් පහත සඳහන් ප්‍රධාන ක්ෂේත්‍රයන් පිළිබඳව වගකීම දරයි.

**ප්‍රධාන කාර්යයන්**

1. වියදම හා බදු ආදායම සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුව සකස් කිරීම
2. බදු ආදායම් එකතු කිරීම, ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා තබා ගැනීම, ගිණුම්ගත කිරීම හා වාර්තා කිරීම.
3. අනුමත අයවැය ඇස්තමේන්තුව තුළ වියදම කළමනාකරණය.
4. මහා භාණ්ඩාගාරය, විගණකාධිපතිවරයා සහ උනන්දුවක් දක්වන පාර්ශවයන් වෙත නියමිත කාල සීමාව තුළ මූල්‍ය තොරතුරු සැපයීම
5. රේගු තැන්පත් ගිණුම, රේගු නිලධාරින්ගේ ත්‍යාග අරමුදල, රේගු නිලධාරීන්ගේ අතිකාල අරමුදල බාහිර පරීක්ෂණ ගාස්තු, තොරතුරු හා සන්නිවේදන ගාස්තු අරමුදල, රේගු නිලධාරීන්ගේ වන්දි හා කළමනාකරණ අරමුදල, රාජසන්තක කළ භාණ්ඩ අත්තිකාරම් ගිණුම සහ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම පරිපාලනය කිරීම.
6. වාර්ෂික විසර්ජන ගිණුම, ආදායම් ගිණුම, රේගු තැන්පත් ගිණුම, රේගු නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම, රේගු නිලධාරීන්ගේ අතිකාල අරමුදල් ගිණුම, බාහිර පරීක්ෂණ ගාස්තු අරමුදල් ගිණුම, තොරතුරු හා සන්නිවේදන ගාස්තු අරමුදල් ගිණුම, රේගු නිලධාරීන්ගේ වන්දි හා කළමනාකරණ අරමුදල් ගිණුම, රාජසන්තක කළ භාණ්ඩ අත්තිකාරම් ගිණුම සහ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම.

ඇප සහතික නිකුත් කිරීම හා අධීක්ෂණය කිරීම සහ දෙපාර්තමේන්තුවේ සේවකයන්ගේ උපයන විට බදු ගෙවීමේ දත්ත සමුදාය (Data Base) පරිපාලනය කිරීම සම්බන්ධව වගකීම දරනු ලබන්නේ මූල්‍ය අංශයයි.

ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකු වන ප්‍රධාන මූල්‍ය නිලධාරී යටතේ මූල්‍ය අංශය ක්‍රියාත්මක වේ. මූල්‍ය අධ්‍යක්ෂවරයා වෙත දෙපාර්තමේන්තුවෙහි මූල්‍ය කළමනාකරණ කාර්යයන්හි අධීක්ෂණය සම්බන්ධීකරණය හා පරිපාලනය පැවරී ඇති අතර, දෙපාර්තමේන්තුවේ උපාය මාර්ගික මූල්‍ය කළමනාකරණය ප්‍රධාන මූල්‍ය නිලධාරියා වෙත පැවරී ඇත. ඔහුට සහායවීම සඳහා නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු 4 ක් සහ පරිපාලන නිලධාරී තනතුරක් වෙන් කර ඇත. ඊට අමතරව සේවකයන් 115 දෙනෙකුගෙන් සමන්විත සහාය කාර්ය මණ්ඩලයක් මූල්‍ය අංශය සඳහා වෙන් කර ඇත.

ඉහත කාර්යයන් ඉටු කිරීමේ අදහසින් ශ්‍රී ලංකා රේගුවේ මූල්‍ය අංශය පහත උප අංශ යටතේ සංවිධානය වී ඇත.

- ආදායම් අංශය
- ගෙවීම් අංශය
- වැටුප් සහ අතිකාල අංශය
- සරප් අංශය
- අරමුදල් කළමනාකරණ අංශය
- බදු අංශය

**2019 වර්ෂය තුළ කාර්ය සාධනය**

### 8.6.2.1 ආදායම් අංශය

ලංකා බැංකුවේ තැප්රොබේන් ශාඛාවේ පවත්වාගෙන යනු ලබන ප්‍රධාන ආදායම් ගිණුම හා සම්බන්ධිත ආදායම් රැස් කිරීමේ උප ගිණුම් 11 තුළින් රැස් කිරීමේ මධ්‍යස්ථාන 41 මගින් ආදායම් රැස් කිරීම ආදායම් අංශයේ වගකීම වේ. එසේම, රැස්කරනු ලබන ආදායම් රජයේ අවශ්‍යතා සඳහා යොදවා ගත හැකි වන පරිදි මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්ගේ ගිණුම වෙත විද්‍යුත් මාර්ගයෙන් ප්‍රේෂණය කරනු ලබයි.

දෙපාර්තමේන්තුව විසින් 2019 වර්ෂයේදී එකතු කරන ලද තථ්‍ය ආදායම පිළිබඳව විස්තර සඳහා 2.1 සහ 2.3 වගන්ති බලන්න.

### 8.6.2.2 ගෙවීම් අංශය

පාර්ලිමේන්තුව විසින් අනුමත කළ පරිදි අයවැය ඇස්තමේන්තු වල දැක්වෙන මූල්‍ය ප්‍රතිපාදන යටතේ සියළු ගෙවීම් කිරීම ගෙවීම් අංශයේ වගකීම වේ. ඊට අමතරව, රේගු නිලධාරීන්ගේ වන්දි හා කළමනාකරණ අරමුදල, රාජසන්තක කළ භාණ්ඩ අත්තිකාරම් ගිණුම, රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම යන ගිණුම් වල ප්‍රතිපාදන යටතේ ගෙවීම් කිරීම සහ රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදල සහ තැන්පතු ගිණුමෙන් ගෙවීම් කිරීම සිදු කෙරේ. 2019 වර්ෂය තුළ වාර්ෂික අයවැය ඇස්තමේන්තු යටතේ කරන ලද ගෙවීම් පහත දක්වා ඇති අතර, 2018 වර්ෂයේ සංසන්දිත අගයන් ද ඇතුළත් කර ඇත.

| වියදම් කළමනාකරණය (රු. මිලියන) | | | | |
|---|---|---|---|---|
| **විස්තරය** | **2019** | | **2018** | |
| | ඇස්තමේන්තුගත | තථ්‍ය | ඇස්තමේන්තුගත | තථ්‍ය |
| **පුනරාවර්තන වියදම්** | 2,782,500 | 2,589,200 | 3,269.07 | 2,167.95 |
| **ප්‍රාග්ධන වියදම්** | 358,450 | 90,700 | 346.33 | 109.97 |
| **මුළු එකතුව** | 3,140,950 | 2,679,900 | 3,615.40 | 2,277.92 |

### 8.6.2.3 වැටුප් සහ අතිකාල අංශය

දෙපාර්තමේන්තුවේ සේවය කරන 2455කට ආසන්න කාර්ය මණ්ඩලය සඳහා වැටුප් සහ අතිකාල ගෙවීමේ වගකීම මෙම අංශය වෙත පැවරී ඇත. එහෙයින්, සාමාන්‍ය කාර්යාල වේලාවෙන් පසුව සිය ආනයන හා අපනයන කාර්යයන් සඳහා සේවාවන් කඩිනමින් ලබා ගැනීමට අපේක්ෂා කරන ආනයන හා අපනයන කරුවන්ගෙන් එම අතිකාල ගාස්තු අයකර ගැනීමට සිදුවේ. එම අය කර ගන්නා ප්‍රමාණය රේගු නිලධාරීන්ගේ අතිකාල අරමුදල හා භාණ්ඩ පරීක්ෂණ ගාස්තු අරමුදල් ගිණුම සහ නිලධාරීන් අතර අනුමත ගෙවීම් පටිපාටියට අනුව බෙදා හරිනු ලැබේ.

ඒ අනුව පසුගිය වර්ෂ දෙක තුළ රේගු නිලධාරීන්ගේ අතිකාල අරමුදල සහ අනෙකුත් අරමුදල්වල සමස්ත මූල්‍ය ක්‍රියාකාරීත්වය පහත වගුව මඟින් දැක්වේ.

රේගු අතිකාල අරමුදල

| | **2019** | **2018** |
|---|---|---|
| | රු. | |
| **අතිකාල ආදායම් ලැබීම** | 1,083,686,410.00 | 1,013,305,174.00 |
| **රජයේ දායකත්වය** | 108,368,641.00 | 101,330,517.40 |
| **අතිකාල වියදම** | 919,607,048.06 | 621,407,526.00 |
| **අතිරික්තය** | 55,710,720.94 | 334,904,166.00 |
| **සමුච්චිත අරමුදල** | 2,233,411,922.00 | 2,179,186,497.00 |

වෙනත් අරමුදල්

| | බාහිර පරීක්ෂණ ගාස්තු අරමුදල | | තොරතුරු සහ සන්නිවේදන අරමුදල | |
|---|---|---|---|---|
| | **2019** | **2018** | **2019** | **2018** |
| **ආදායම** | 304,459,019 | 335,848,525 | 18,720,000 | 13,728,000 |
| **වියදම** | 304,459,019 | 335,848,525 | 18,720,000 | 13,728,000 |

### 8.6.2.4 අරමුදල් කළමනාකරණ අංශය

රේගු බදු හැර, තැන්පතු ආකාරයෙන් ලැබෙන සියළුම ලැබීම් භාර ගැනීම, වාර්තා කිරීම, සහ ගිණුම්ගත කිරීම මෙම අංශයේ වගකීම වේ. මෙම ලැබීම් වලට දඩ මුදල්, විකුණුම් ආදායම් සහ වෙනත් විවිධ තැන්පතු ඇතුලත්ය. මෙම දඩ මුදල් සහ විකුණුම් ලැබීම්, ප්‍රථමයෙන් ප්‍රධාන තැන්පතු ගිණුමට බැර කෙරෙන අතර, විමර්ශන හෝ අභියාචනා ක්‍රියාවලිය අවසන් කළ වහාම එකී ලැබීම් රේගු ආඥා පනතේ 152 වන වගන්තියේ පටිපාටීන් ප්‍රකාරව රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදල, රේගු නිලධාරීන්ගේ වන්දි අරමුදල සහ සංචිත අරමුදලට මාරු කෙරේ.

ඒ අනුව, රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිතීන්ට අනුකූලව පහත සඳහන් මූල්‍ය ප්‍රකාශයන් සකස් කරන අතර, එම වාර්තා විගණන කටයුතු සඳහා විගණකාධිපති වෙත ඉදිරිපත් කරනු ලැබේ.

- රේගු ත්‍යාග අරමුදල
- රේගු නිලධාරීන්ගේ වන්දි හා කළමනාකරණ අරමුදල

එසේම, නීත්‍යානුකූල නොවූ ආනයන හෝ අපනයන සම්බන්ධයෙන් තහනම් භාණ්ඩ අපහරණයේ දී දැරිය යුතු වියදම් පියවා ගැනීම සඳහා තහනම් කරන හා රාජසන්තක කරනු ලබන භාණ්ඩ අත්තිකාරම් ගිණුම නම් වූ අත්තිකාරම් ගිණුම ද මෙම අංශය මගින් පවත්වා ගෙන යනු ලබයි. මෙම වියදම් අදාල රාජසන්තක භාණ්ඩ විකිණීමෙන් ලද මුදලින් පියවා ගැනේ.

| | රේගු ත්‍යාග අරමුදල රු.මි | | රේගු නිලධාරීන්ගේ කළමනාකරණ හා වන්දි අරමුදල රු.මි | |
|---|---|---|---|---|
| | **2019** | **2018** | **2019** | **2018** |
| **ආදායම** | 1,907 | 2,316 | 732 | 885 |
| **වියදම** | 1,793 | 2,290 | 212 | 232 |
| **අතිරික්තය** | 114 | 25 | 520 | 653 |
| **ස්ථාවර වත්කම්** | | | | |
| **අරමුදල් ශේෂය** | 1,053 | 816 | 7,281 | 3,735 |
| **ගෙවිය යුතු ත්‍යාග** | 1,908 | 1,072 | | |

### 8.6.2.5 බදු අංශය

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ සේවකයන්, අතිකාල, දිරිදීමනා, ත්‍යාග, පොදු සංචිත ගෙවීම් වැනි සාමාන්‍ය වැටුපට අමතරව විවිධ මූල්‍ය ප්‍රතිලාභ ලැබීමට වරප්‍රසාද සහිත වන බැවින් රාජ්‍ය සේවය තුළ ඔවුන් ප්‍රධානතම බදු ගෙවන්නන් වේ. සෑම සේවකයෙකු සඳහාම උපයන විට ගෙවන බදු, බදු අංශය විසින් ගණනය කර එවැනි අයකර ගැනීම් අඛණ්ඩව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කරනු ලබයි.

## 8.6.3. ආදායම් කාර්යසාධක බලකාය

**හැඳින්වීම**

ආදායම් කාර්ය සාධක බලකාය (RTF) රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ. ආදායම් කාර්ය සාධක බලකාය ක්ෂණිකව ක්‍රියාත්මක වන හදිසි මෙහෙයුම් බලවේගයක් ලෙස ක්‍රියා කරන අතර සුපිළිපන්භාවය ප්‍රවර්ධනය කිරීම සහ අක්‍රමවත් පරිචයන් හා රේගු මෙහෙයුම්වල සුමට ක්‍රියාකාරිත්වයට බලපාන වෙනත් අක්‍රමිකතා තුරන් කිරීම සඳහා රේගු දෙපාර්තමේන්තුවේ සියළුම ක්‍රියාකාරකම් පිළිබඳව අවදියෙන් සිටියි.

රේගු අධ්‍යක්ෂකවරයකුගේ ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මක වන මෙහි කාර්ය මණ්ඩලය රේගු නියෝජ්‍ය අධ්‍යක්ෂ, රේගු අධිකාරී, නියෝජ්‍ය රේගු අධිකාරී, සහකාර රේගු අධිකාරී, රේගු පරීක්ෂක තනතුරු දරන නිලධාරීන්ගෙන් මෙන්ම ලිපිකරු කාර්ය මණ්ඩලයකින්ද සමන්විත වේ.

සියලුම භාණ්ඩ ගෙවිය යුතු සියලුම බදු ගෙවීමෙන් පසු හා අනෙකුත් සියලුම නීති රීතිවලට අනුකූලව නිෂ්කාශනය කර ඇති බව සහතික කිරීම සඳහා සියලු ආනයන හා අපනයන ආදායම් කාර්ය සාධක බලකාය විසින් අධීක්ෂණය කරනු ලබන අතර පුද්ගලික ගමන් මලු, තැපැල් සහ කුරියර් පාර්සල් ඇතුළුව ආනයනය කරන ලද හෝ අපනයනය කරන ඕනෑම භාණ්ඩයක් පරීක්ෂා කිරීම සඳහා බාධා කිරීමට හා නැවත පරීක්ෂා කිරීමට හෝ අත්පත් කර ගැනීමට බලය ඇත.එමෙන්ම, ගුවන්තොටුපල, ගුවන් භාණ්ඩ, කුරියර් පාර්සල් ගබඩාවන්, කැටුව නොයන මගී ගමන් මලු ගබඩාවන්, පාර්සල් පෝස්ට්, සාමාන්‍ය නැව් භාණ්ඩ , BOI භාණ්ඩ, බැඳුම්කර භාණ්ඩ සහ අපනයන භාණ්ඩ ගුදම් ආදියෙහි ආදායම් කාර්ය සාධක බලකාය විසින් අනපේක්ෂිත අයුරින් හදිසි පරීක්ෂා මෙහෙයුම් කටයුතු සිදු කරනු ලැබේ.

මෙම අංශයේ ප්‍රධාන පරමාර්ථය වන්නේ රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට පාලන හස්තයක් ලබා දීම සහ දෙපාර්තමේන්තුවේ සියලු කටයුතු පිළිබඳව සුපරීක්ෂාකාරීව සිටීමයි. ආදායම් කාර්ය සාධක බලකාය විසින් කාර්ය මණ්ඩලය විසින් රැස් කරන ලද බුද්ධි තොරතුරු සහ මහජනතාවගෙන් ලැබෙන තොරතුරු මත විවිධ බලාත්මක කිරීමේ කටයුතු සිදු කරයි.

දිගු කාමරයේ ඇති භාණ්ඩ නිෂ්කාශනය කිරීම, ගබඩාවන්, ගුවන් භාණ්ඩ, තැපැල් පාර්සල්, කුරියර් සේවා සහ භාණ්ඩ නිෂ්කාශනය කිරීම සඳහා වන විශේෂ ක්‍රියා පටිපාටි පිළිබඳව මෙම අංශය සුපරීක්ෂාකාරීව සිටිනු ලැබේ.

**ප්‍රධාන කාර්යයන්**

1. දෙපාර්තමේන්තුව තුළ අවංකභාවය ප්‍රවර්ධනය කිරීම හා අක්‍රමවත් පරිචයන් ඉවත් කිරීමට කටයුතු කිරීම.
2. පැමිණිලි හා චෝදනා සිදුකරන අවස්ථාවලදී ඒ සම්බන්ධයෙන් කඩිනමින් කටයුතු කිරීම.
3. අර්බුදකාරී අවස්ථාවන් කළමනාකරණය කර ගැනීමට සම්පත් යෙදවීම මගින් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට සහාය වීම.
4. ආනයනය කරනු ලබන හෝ අපනයනය කරනු ලබන භාණ්ඩ නවතා පරීක්ෂා කිරීම සහ නැවත පරීක්ෂා කිරීම මෙන්ම අනුගමනය කරන ලද කාර්ය පටිපාටියේ නිවැරදිභාවය සත්‍යාක්ෂණය කිරීම.
5. ගුවන් තොටුපලේදී හෝ කැටුව නොයන ගමන්මලු ගුදම්වලදී මගීන් සහ මගීන්ගේ ගමන් මලු නවතා පරීක්ෂා කිරීම සහ සෝදිසි කරබැලීම.
6. තැපැල් පාර්සල්, කුරියර් සේවා නිෂ්කාශනයේදී සහ භාණ්ඩ නිෂ්කාශනය සඳහා වන අනෙකුත් විශේෂ ක්‍රියාවලියන්හිදි සුපරීක්ෂාකාරී බව පවත්වා ගැනීම

| | කැටුව නොයන මගී ගමන් මලු | ප්‍රධාන කාර්යාලය | ජංගම ඒකකය | එකතුව |
|---|---|---|---|---|
| දණ්ඩන/ රාජසන්තක කිරීම්/ලිහිල් කරන ලද අභිමිකර | 132,112,969 | 280,545,926 | 332,070,463 | 744,729,358 |
| **තීරු බදු හා අනෙකුත් ගාස්තු** | 17,331,657 | 29,274,279 | 42,378,503 | 88,984,439 |
| **විකුණුම් ලැබීම්** | 22,389,472 | 96,323,137 | 5,683,468 | 124,396,078 |
| **එකතුව** | 171,834,098 | 406,143,32 | 380,132,434 | 958,109,875 |

## 8.6.4. නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) අංශය

**හැඳින්වීම**

1994 අංක 08 දරණ හා 1990 අංක 40 දරණ පනතින් සංශෝධිත 1989 අංක 13 දරණ නිෂ්පාදන බදු(විශේෂ විධිවිධාන) පනත, ශ්‍රී ලංකා රජයේ නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බදු ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවෙන ප්‍රධාන නෛතික මූලාශ්‍රයයි. මුදල් අමාත්‍යාංශය යටතට ගැනෙන ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන නිෂ්පාදන බදු (විශේෂ විධි විධාන) අංශය, ජාතියේ යහපත උදෙසා ඇති කරන ලද නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බදු පනතේ විධිවිධාන සහ නියෝග බලාත්මක කිරීමේ වගකීම පැවරී ඇති රජයේ නියෝජිත ආයතනයක් වශයෙන් නිෂ්පාදන බදු අංශය වැදගත් ජාතික මෙහෙවරක් ඉටු කරයි.

1. සිගරට් සහ වෙනත් නිෂ්පාදන ආයතන අධීක්ෂණය සහ පාලනය කිරීම තුළින් ආදායම නිවැරදිව එකතු කිරීම
2. නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතට අදාළව නීතිය බලාත්මක කිරීමේ අධිකාරිය ලෙස කටයුතු කිරීම හා ඒ අනුව ආනයනික හෝ දේශීයව නිෂ්පාදනය කරන ලද නිෂ්පාදන බද්දට යටත් අයිතම මත නිෂ්පාදන බදු එකතු කිරීම
3. සමාගම් මගින් ගෙවන ලද බදු මුදල්වල අගය පසුගිය සහ වත්මන් වාර්තා සමග සැසඳීම
4. නිෂ්පාදන බදු පැනවීමට අදාළ ක්‍රියාකාරකම්වල නිරත වීම

**මෙහෙවර සහ අරමුණු**

නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) අංශයේ මෙහෙවර වන්නේ ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය කරන ලද හෝ ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද භාණ්ඩ සඳහා පනවා ඇති නිෂ්පාදන බදු ආදායම කාර්යක්ෂම ලෙස එකතු කිරීම සහ එමඟින් ජාතික සංවර්ධන ක්‍රියාවලියට දායක වීමයි.

**අරමුණු;**

1. 1989 අංක 13 නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත ක්‍රියාත්මක කිරීම
2. ඛනිජ තෙල්, එල් පී ගෑස්, සිගරට්, සිසිල් බීම, තුරඟ ප්‍රකාශනය සහ වාහන ආනයනය, දේශීයව එකලස් කරන ලද වාහන, තීන්ත, පොලිතින් වැනි නිෂ්පාදන බද්දට යටත් අයිතම වලින් එන බදු ආදායම එකතු කිරීම සහ ආරක්ෂා කිරීම.

**රැස් කරන ලද ආදායම**

| අයිතමය | රු. මිලියන |
|---|---:|
| සිගරට් | 87,547.77 |
| ඛණිජ තෙල් | 12,283.37 |
| මෝටර් වාහන (දේශීයව එකලස් කළ) | 495.08 |
| සිසිල් බීම | 3,287.02 |
| තුරඟ ප්‍රකාශනය | 17.23 |
| විදුලි භාණ්ඩ (දේශීය) වෙනත් | 42.62 |
| පළතුරු බීම | 0.01 |
| පැටි අම්ලය | 4.62 |
| උසාවි ආදායම | 60.63 |
| ලියාපදිංචි ගාස්තු | 0.01 |
| එකතුව | 103,738.36 |

**2018 වර්ෂයේ කාර්ය සාධනය ක්‍රියාත්මක සැලැස්ම සමග සැසඳීම**

| ප්‍රධාන කාර්යය | ඉලක්කය (මිලියන) | සත්‍ය ආදායම (රු.) | ඉටුකර නොමැති නම් ඊට හේතු |
|---|---|---|---|
| **දුම්කොළ** | 100,000.00 | 87,547.77 | අයවැය යෝජනා අනුව මිල වැඩිවීම හේතුවෙන් |
| **ඛණිජ තෙල් (පෙට්‍රල්/ඩීසල්)** | 14,500.00 | 12,283.37 | පිරිසිදු කළ පෙට්‍රල් / ඩීසල් වැඩි ආනයනය හේතුවෙන් |
| **දේශීයව එකලස් කරන ලද වාහන** | 315 | 495.08 | |
| **අනෙකුත් (සිසිල් බීම, තරඟ ප්‍රකාශන, විදුලි උපකරණ (දේශීයව එකලස් කළ) සහ උසාවිය මගින් අයකර ගැනීම** | 8800 | 3,410.83 | සීනි මත පදනම් වූ නිෂ්පාදන බද්ද හඳුන්වා දුන් අතර නිෂ්පාදන බදු නොගෙවන සමහර පලතුරු බීම නිෂ්පාදකයින්ට එරෙහිව නීතිමය පියවර ගෙන තිබේ. |

## 8.6.5 අභියාචනා අංශය

**හැඳින්වීම**

අභියාචනා අංශය, ලෝක රේගු සංවිධානයේ සංශෝධිත කියෝතෝ සම්මුතියේ සහ ලෝක වෙළෙඳ සංවිධානයේ වෙළඳාම සඳහා පහසුකම් සැලසීමේ ගිවිසුම්වල සඳහන් කර ඇති අභියාචනා ක්‍රියාපටිපාටියේ වැදගත්කම සැලකිල්ලට ගැනීමෙන් අනතුරුව අළුතින් ඇති කරන ලද අංශයකි.

මෙම අංශය සෘජුවම රේගු අධ්‍යක්ෂ ජනරාල් යටතේ ක්‍රියාත්මක වේ.

රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට ලිඛිතව සිදුකරනු ලබන අභියාචන සැලකිල්ලට ගැනීමෙන් වෙළඳාමට පහසුකම් සැලසීමත්, එම කරුණු සත්‍යාක්ෂණය කිරීමෙන් පසුව සුදුසු නිර්දේශ සිදුකිරීමත් පසුවිපරම් ක්‍රියාමාර්ග ගැනීමත් මෙම අංශයේ අරමුණු වේ.

| | කාර්යසාධනය | ප්‍රතිශතය% |
|---|---|---|
| අභියාචනා ලියාපදිංචි කිරීම | 114 | 100% |
| ලියාපදිංචි අභියාචනය පිළිබඳ දැනුම් දීම | 114 | 100% |
| අදාළ රේ. අ. විමසා පිටපත් ගොනුව සහ අදාළ වාර්තාව ඉල්ලීම | 114 | 100% |
| සලකා බැලීම සඳහා අභියාචනා කමිටුව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනා | 84 | 73.6% |
| අභියාචනා කමිටු තීරණය පිළිබඳව රේ.අ.ජ. දැනුවත් කිරීම | 84 | 73.6% |
| කමිටු තීරණය මත රේ.අ.ජ. අනුමැතිය සහිතව අභියාචනා පසු විපරම් කටයුතු | 84 | 73.6% |